

මහාකවි ශ්‍රී දණ්ඩ්‍යාචාර්‍ය විරචිත

# කාව්‍යාදර්ශය



පූර්වාචාර්යවරප්‍රණීත ව්‍යාඛ්‍යාන සහිත

**මහාකවි ශ්‍රී දණ්ඩ්‍යාචාර්ය**

විරචිත

# කාව්‍යාදර්ශය.

විද්වජ්ජනශෙඛරායමාන පැලියගොඩ විද්‍යාලඞ්කාර

පරිවෙණාධිපති ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය

උපාධ්‍යාය ධුරන්ධර

**රත්මලානේ**

## ධර්මකීර්ති ශ්‍රී ධර්මාරාමාභිධාන

— ප්‍රධාන —

සඞ්ඝනායක මාහිමියන්වහන්සේ

විසින්

සංශොධිතයි.

විද්‍යාලඞ්කාර දායකසභාවේ ප්‍රධාන ලේකම්තැන්පත්

**ඩී. ඒ. ජයතිලක මහත්මයා විසින්**

සත්‍යසමුච්චය යන්ත්‍රාලයෙහි

අච්චුගස්වා

ප්‍රසිද්ධ කරන ලදී.

**1925**

# සංඥාපනය.

"කාව්‍යං ග්‍රාහ්‍යමලඞ්කාරාත්" යනු ශිෂ්ටෝක්ති හෙයින් කාව්‍ය තෙමෙ අලඞ්කාරයෙන් උපාදෙය වේ. මෙහි කාව්‍ය නම් මුඛ්‍යවශයෙන් ගුණාලඞ්කාරවශයෙන් සංස්කෘත වූ ගද්‍ය පද්‍ය මිශ්‍රාත්මක වූ පදාවලිය යි. ඕ වනාහි දෝෂාභාවයෙන් හා රීතිමද්භාවයෙන් ද සම්පාදිත වූවා ප්‍රාශංස්‍යාහි වෙයි. රීතිතොමෝ කාව්‍යයට ආත්ම වූවා ද එහෙයිනි. එහෙයින් කථිත මැ යි-"**රීතිරාත්මා කාව්‍යස්‍ය**"යි තදීය රීතිසංඛ්‍යාත විශිෂ්ට පදරචනා තොමෝ දේශවිශේෂ ව්‍යපදේශත්වයෙන් බහුවිධ වුව ද වෛදර්භීය ගෞඩීය ය පාඤ්චාලීය යයි ත්‍රිවිධ වන්නීය. විදර්භ ගෞඩ පාඤ්චාලදේශයන්හි සම්භාව්‍ය වූ කවීන් විසින් උපලබ්ධ හෙයිනි. ඕතොමෝ කෘතහස්තශිල්පියකු විසින් න්‍යස්ත වූ රේඛාවන් කරණකොටගෙන සිතුවමක් මෙන් ඕජඃප්‍රසාදගුණත්වයෙන් හා ඕජස්කාන්තිමත්ත්වයෙන් ද මාධුර්‍ය සෞකුමාරත්වයෙන් දැයි මෙකී කාව්‍යගුණයන් කරණකොටගෙන කාව්‍යයන් පිළිබඳ චමත්කෘතිය ඇතිකරවන්නීය. ඒ එසේමැයි. වක්තෘහු ඇත ද විද්‍යමානාර්ථය ඇත ද ශබ්දානුශාසනය ඇත ද කාව්‍යරීතිසංඛ්‍යාත ගුණයෙක් නැත්තේ වී නම් වාඞ්මධුව නො වැගිරෙන්නේය. එහෙයින් කීහ-

"සති වක්තරි සත්‍යර්ථෙ සති ශබ්දානුශාසනෙ
අසති තානන විනා යෙන පරිශ්‍රවති වාඞ්මධු"යි.

එහෙයින් රීතීහු තුමූ කාව්‍යප්‍රතිබද්ධ හ යි ද කාව්‍යයෝ අලඞ්කාරප්‍රතිබද්ධ හ යි ද මෙහි තාත්පර්‍යයෙන් දතයුතු;

මෙසේ නිෂ්පාද්‍යමාන වූ සත්කාව්‍යය තෙමැ මධුර විය යුතු ය. ලෝකවිෂයෙහි ද පුෂ්පරසය තෙමෙ රසයන් අතුරෙහි මධුරය යි පිළිගැණෙයි. එසේ වුව ඒ වනාහි පීයූෂය මෙන් මධුර නො වේ. දෙවපානවිශෙෂය වූ තද්අමෘතය සියලු රසයන් අතුරෙහි මධුරතරය සී සේස්. එයට ද වඩා සත්කාව්‍යරසයතෙමෙ මධුරවන්නේ මැ යි. කථිත මැ යි ප්‍රාක්තනයන් විසින්-

"මධුරං මධු තස්මාච්ච සුධා තස්‍යාඃ කවෙර්වචඃ"

මෙසෙයින් ලෙව්හි පතළාවූ වාග්වෛචිත්‍ර්‍යය ගුණාලඞ්කාර සංයුක්තත්වයෙන් නිබද්ධ වූ සත්කාව්‍යාලාපයෙන් විනා අන් කිසිවකින් නො ලැබිය හැක්කේ ම ය. හෙද කවීන්ගේ

උපදේශකාචාර්යයෙන් මැ සිද්ධ විය යුතු හෙයින් සත්කාව්‍යයනට ගුරූපදේශ දෙනුකැමති වූ මහාකවි ශ්‍රීමද්දණ්ඩීන් විසින් මෙ කාව්‍යාදර්ශය රචිතය. එහෙයින් මේ ග්‍රන්ථය කාව්‍යරීති කාව්‍යාලඞ්කාරයන් පිළිබඳ උපදේශකථනයෙන් අලඞ්කාරශාස්ත්‍රයට බැසගන්නවුන්ට ප්‍රවේශෝපායයක් වැනි හෙයින් භාරතදේශීයයන් අතර ද ලාඞ්කිකයන් අතර ද ප්‍රචලිත වැ භාවිත විය. එය පරිශීලනය කරන්නා වූ භාරතදෙශීයයන්ගේ පහසුව සඳහා පණ්ඩිත ශ්‍රී ජීවානන්ද විද්‍යාසාගර භට්ටාචාර්‍ය්‍ය පඬිතුමන් විසින් මනොහර ටීකාවක්ද ශ්‍රී ප්‍රෙමචන්ද්‍ර තර්කවාගීශභට්ටාචාර්‍ය්‍ය පඬිතුමන් විසින් මාලින්‍යප්‍රොඤ්ජනී ටීකාවක්දැයි මෙසේ ටීකාවෙක් රචිත යැ. මේ ටීකාවෝ එකිනෙකට අසමාන වූ නූතන රචනාවෝ වෙති. ලාඞ්කිකයන්ගේ උද්ග්‍රහණධාරණාදියෙහි පහසුව සැලකූ විචක්ෂණශෙඛරායමාණ අන්‍යතර සිංහලදෙශීය උතුමකු විසින් සිංහලභාෂායෙන් මේ මනොහර ව්‍යාඛ්‍යානය ශතවර්ෂකිහිපයකට පෙර නිපදවනලදි. එම ව්‍යාඛ්‍යානය බොහෝකලක් ස්වදෙශීන්ගේ ප්‍රයොජනය සඳහා උපකාර වුව ද ව්‍යාඛ්‍යානයාගේ ගම්භීරත්වයෙන් හා කාලාන්තර දෝෂකාලුෂ්‍යයෙනුත් අභාවිතව සමහරුන් විසින් ශාස්ත්‍රයුක්ති අනුගත නොවේය යි හෙළයුතු තරම් විය. දෙඩන්දුවේ ධර්මසෙන මහත්මයා විසින් ශ්‍රී ජීවානන්ද ටීකාව ආශ්‍රය කොටගෙන සෛංහලිය ව්‍යාඛ්‍යානයක් නිපදවනලදි. මේ පුරාතන සෛංහලීය ව්‍යාඛ්‍යානයෙන් ග්‍රන්ථයාගේ විශිෂ්ටාව බොධයෙක් වන්නේයයි සලකාවදාළ අප ආචාර්‍ය්‍යොත්තම විද්‍යාලඞ්කාර පරිවෙණාධිපති ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය්‍ය උපාධ්‍යාය ධුරන්ධර **රත්මලානේ ධර්මකීර්ති ශ්‍රී ධර්මාරාමාභිධාන** ප්‍රධාන සඞ්ඝනායක මාහිමියන්වහන්සේ විසින් කාලාන්තරයක පටන් අල්පශ්‍රැතලිපිකරප්‍රමාදජනිත ඌනාතිරික්ත විපර්‍ය්‍යස්ත පද ව්‍යඤ්ජනාදින් සමාකීර්ණව තුබූ මේ කාව්‍යාදර්ශ පුරාණ ව්‍යාඛ්‍යානය සංශොධනයෙන් යළිත් යථාස්ථානයට පමුණුවනුවස් පුරාණ පුස්කොළපොත් කීපයක් ඇසුරැකොටගෙන යමක කාණ්ඩය දක්වා ශුද්ධියට පමුණුවන අතර ස්වර්ගස්ථවිවදාළ හෙයින් එතැන්පටන් අප විසින් එහි ශෙෂව තුබූ කොටස තදුපදෙශාවලම්බනය කොට යථාවකාශයෙන් සංශොධනයට පමුණුවනලදි.

*L. SRI DHARMANANDA*
*C. H. P.*

30. 8. 25.
පැලියගොඩදීය,

නමස්තස්මෛ භගවතෝ'ර්හතෙ සම්‍යක්සම්බුද්ධාය.

# කාව්‍යාදර්ශඃ.

1 චතුර්මුඛමුඛාම්භොජවනහංසවධූර්මම *
මානසෙ රමතාං නිත්‍යං සර්වශුක්ලා සරස්වතී.

2 පූර්වශාස්ත්‍රාණි සංහෘත්‍ය ප්‍රයොගානුපලක්ෂ්‍ය ච †
යථාසාමර්ථ්‍යමස්මාභිඃ ක්‍රියතෙ කාව්‍යලක්ෂණම්.

3 ඉහ ශිෂ්ටානුශිෂ්ටානාං ශිෂ්ටානාමපි සර්වථා
වාචාමෙව ප්‍රසාදෙන ලොකයාත්‍රා ප්‍රවර්තතෙ.

---

1 චතුර්මුඛ, බ්‍රහ්මයාගේ; මුඛ, මුඛ නමැති; අම්භොජවන, පද්මවන යෙහි; හංසවධූඃ, හංසියක බඳුවූ; සර්වශුක්ලා, සර්වාඞ්ගධවලවූ (අඥනාදි මලාපගමයෙන් හෝය) සප්‍රකාරයෙන් ශුද්ධවූ-නොහොත් (දෝෂලෙශ යෙකිනුදු ස්පර්ශ නොකරනලදබැවින්) නිරවද්‍යවූ; සරස්වතී, (මූර්තිමත්වූ සකලජනානන්දකර වාඞ්මයලක්ෂණවූ) සරස්වතීතොමෝ; මම, මාගේ; මානසෙ, සිත්හි දෝ හෝ නොහොත් **මානස**නම් විල්හි; නිත්‍යම්, දීර්ඝ කාලයක්; රමතාම්, ඇලේවා.

2 පූර්වශාස්ත්‍රාණි, ( රාමශර්මාදිවූ ) පූර්වාචාර්යවරයන් කරනලද කාව්‍යලක්ෂණයන්; සංහෘත්‍ය, හකුළුවා; ප්‍රයොගාන්, (භරතාදි ශිෂ්ටයන්ගේ කාව්‍යරූපවූ) ප්‍රයොගයන්; උපලක්ෂ්‍ය ච, බලාද; අස්මාභිඃ, අපවිසින්; යථාසාමර්ථ්‍යම්, ශක්ති වූපරිද්දෙන්; කාව්‍යලක්ෂණම්, කාව්‍යයන්ගේ ලක්ෂණයතෙම; ක්‍රියතෙ, කරනුලැබේ.

3 ඉහ, මේ ජගත්හි; ශිෂ්ට, (පාණිනාදි) ශිෂ්ටයන්විසින්; අනුශිෂ්ටානාම්, (ප්‍රකෘතිප්‍රත්‍යයාදිවිභාගකල්පනායෙන්) අන්වාඛ්‍යාතවූ; ශිෂ්ටානාමපි, පරිශිෂ්ටවූද; වාචාමෙව, (සංස්කෘතාදිමයවූ) "වචනයන්ගේම; ප්‍රසාදෙන, ප්‍රසන්නතාව හෙතුකොටගෙන; ලොකයාත්‍රා, ලොකයාගේ" + අනුෂ්ඨානය; සර්වථා, සර්වප්‍රකාරයෙන්; ප්‍රවර්තතෙ, පවත්නේයි.

---

* බධූර්මම–කලිකාතා—† ලභ්‍ය ච–ක.

+ සන්නයෙහි "–" මේ අධිකාක්ෂරිතය ත්‍රුටයි.

4 ඉදමන්ධතමං * කෘත්ස්නං ජායෙත භුවනත්‍රයම්
යදි ශබ්දාහ්වයං ජ්‍යොතිරා සංසාරාන්න † දීප්‍යතෙ.

5 ආදිරාජයශොබිම්බමාදර්ශම්ප්‍රාප්‍ය වාඞ්මයම්
තෙෂාමසන්නිධානෙ'පි න ස්වයම්පශ්‍ය නශ්‍යති.

6 ගෞර්ගෞඃ කාමදුඝා සම්‍යක්ප්‍රයුක්තා ස්මර්‍යතෙ බුධෛඃ
දුෂ්ප්‍රයුක්තා පුනර්ගොත්වම්ප්‍රයොක්තුස්සෛව ශංසති.

7 තදල්පමපි නොපෙක්ෂ්‍යං කාව්‍යෙ දුෂ්ටං කථංචන
ස්‍යාද්වපුස්සුන්දරම්පි ශ්විත්‍රෙණෛකෙන දුර්භගම්.

---

4 යදි, ඉදින්; ශබ්දාහ්වයම්, ශාස්ත්‍රය යන නම්ඇත්තාවූ; ඉදම්, මේ (අනන්තරොක්තවූ); ජ්‍යොතිඃ, ආලොකය; ආ සංසාරාත්, (චතුර්විංශ අනුව යන්නාවූ) සඞ්ඛ්‍යලොකය හිම්කොට; න දීප්‍යතෙ, ප්‍රකාශ නොවේ නම්; කෘත්ස්නම්, සියලු; භුවනත්‍රයම්, (ස්වර්ගමර්ත්‍යපාතාලස්වරූපවූ) තුන් ලොව; අන්ධතමම්, නිරන්තරයෙන් අඥානාත්මකවූයේ; ජායෙත; වන්නේයි.

5 ආදිරාජ, පළමු රජදරුවන්ගේ; යශොබිම්බම්, යශශ්ශරීරයතෙම; වාඞ්මයම්, (ඉතිහාසකථාදි) වාක්ස්වරූපවූ; ආදර්ශම්, කැටපතට; ප්‍රාප්‍ය, පැමිණ; තෙෂාම්, ඒ ආදිරාජයන්ගේ; අසන්නිධානෙපි, අභාවයෙහිදු; ස්වයම්, තෙමේ; න නශ්‍යති, නොනස්නේය; පශ්‍ය, බල.

6 ගෞඃ, (කාව්‍යාදිස්වරූපවූ) වාක්තොමෝ; සම්‍යක්, මනාකොට; ප්‍රයුක්තා, ප්‍රයොග කරනලද්දී; කාමදුඝා, (ප්‍රයොග කළාහට) ඉෂ්ටාර්ථ සාධන්නාවූ; ගෞඃ, සුරභිධෙනුයයි; බුධෛඃ, ආප්තයන්විසින්; ස්මර්‍යතෙ, දන්නාලැබෙයි; සෛව, හෝම; දුෂ්ප්‍රයුක්තා පුනඃ, ශාස්ත්‍රවිරුඞ කොට ප්‍රයොග කරනලද්දී වනාහී; ප්‍රයොක්තුඃ, ප්‍රයොග කරන්නාහුගේ; ගොත්වම්, පශුභාවය හෙවත් ජඩබව; ශංසති, ප්‍රකාශ කරන්නීයි.

7 තත්, එහෙයින්; කාව්‍යෙ, කාව්‍යයෙහි ලා; දුෂ්ටම්, ශාස්ත්‍රවිරුඞවූ: අල්පමපි, (ශබ්දාත්මකවූ හෝ අර්ථාත්මකවූ හෝ) මදෙකුදු; කථංචන නොපෙක්ෂ්‍යම්, කිසිපරිද්දෙකින්දු උපෙක්ෂා කටයුතු නොවේ; (ඒ එසේමැයි.) වපුඃ, ශරීරයතෙම; සුන්දරමපි, (වර්ණසංස්ථානසම්පන්නබැවින්) ශොභනවූයේද; එකෙන ශ්විත්‍රෙණ, එක කුෂ්ඨදෘෂයෙකින්; දුර්භගං ස්‍යාත්, සැපශී නොකටනැකි වන්නේයි.

යම්සේ ශොභනද වූ ශරීරය ස්වල්පවූද කුෂ්ඨයෙකින් යුක්තවූයේ ලෝවැස්සන්විසින් ගර්හිත වන්නේද, එපරිද්දෙන්ම කවීහුගේ කාව්‍යමයවූ ශරීරය මදද වූ ශබ්දලක්ෂණවූ හෝ අර්ථලක්ෂණවූ හෝ ශාස්ත්‍රයක් වැනි දෘෂය කරණකොටගෙන නින්දිත වන්නේය යිසේයි.

---

* මන්ධං තමඃ-ක. † සංසාරං ක—ක.

8 ගුණදොෂානශාස්ත්‍රඥඃ කථං විභජතෙ ජනඃ
කිමන්ධස්‍යාධිකාරොऽස්ති රූපභෙදොපලබ්ධිෂු.

9 අතඃ ප්‍රජානාං ව්‍යුත්පත්තිමභිසන්ධාය සූරයඃ
වාචාං විචිත්‍රමාර්ගාණාං නිබබන්ධුඃ ක්‍රියාවිධිම්.

10 තෛඃ ශරීරඤ්ච කාව්‍යානාමලඞ්කාරශ්ච දර්ශිතම් *
ශරීරං තාවදිෂ්ටාර්ථව්‍යවච්ඡින්නා පදාවලී.

11 පද්‍යං ගද්‍යඤ්ච මිශ්‍රඤ්ච තත්ත්‍රිධෛව ව්‍යවස්ථිතම්
පද්‍යං චතුෂ්පදී තච්ච වෘත්තං ජාතිරිති ද්විධා.

---

8 අශාස්ත්‍රඥඃ, ශාස්ත්‍රය නොදන්නාවූ; ජනඃ, ජනතෙම; ගුණ, (විශෙෂයෙන් ගතයුතුවූ පුරුෂාර්ථසාධනභූතවූ) අර්ථයන්ද; දොෂාන්, (උකතස්වරූපවූ අර්ථයට විරුද්ධවූ) දොෂයන්ද; (කාව්‍යාපෙක්ෂායෙන් වනාහි-) ගුණ, (ශබ්දාර්ථසංස්කාරස්වරූපවූ) ගුණයන්ද; දොෂාන්, (අපාර්ථකාදිවූ වක්ෂ්‍යමාණ) දොෂයන්ද; කථං විභජතෙ, කෙසේ විභාග කරන්නේද; (ඒ එසේ මැයි.) අන්ධස්‍ය, ඇස්නැත්තාහට; රූපභෙදොපලබ්ධිෂු, (නීලපීතාදිවූ) රූපවිශෙෂයන් දක්මෙහි; අධිකාරඃ, යොග්‍යබවෙක්; අස්ති කිම්, ඇද්ද; (නැත්මය සීසේයි).

යම්සේ ලොචනවිකල පුරුෂතෙම නීලපීතාදි රූපයන්ගේ දක්මෙහි සමර්ථ නොවේද, එපරිද්දෙන් ශාස්ත්‍රලොචනවිකලයාද ගුණදොෂයන් විවෙක කරන්නට නොපොහොසතැයි සේයි.

9 අතඃ, මෙයින් හෙවත් ශාස්ත්‍රයෙන්ම ගුණදොෂවිභාගය වනහෙයින්; සූරයඃ, පූර්වාචාර්‍ය්‍යයෝ; ප්‍රජානාම්, සත්වයන්ගේ; ව්‍යුත්පත්තිම්, (කාව්‍යයෙහි ගුණදොෂපරිඥනලක්‍ෂණවූ) ව්‍යුත්පත්තිය; අභිසන්ධාය, උදෙසා; විචිත්‍රමාර්ගාණාම්, (ශබ්දාලඞ්කාර අර්ථාලඞ්කාරවශයෙන්) නානාප්‍රකාරවූ සම්පත්ඇති; වාචාම්, කාව්‍යයන් සම්බන්ධවූ; ක්‍රියාවිධිම්, ක්‍රියාකල්පය හෙවත් කාව්‍යලක්‍ෂණශාස්ත්‍රය; නිබබන්ධුඃ, බැන්දෝ.

10 තෛඃ, ඒ පූර්වාචාර්‍ය්‍යයන් විසින්; කාව්‍යානාම්, කවිප්‍රයොගයන්ගේ; ශරීරඤ්ච, ශරීරයද; අලඞ්කාරශ්ච, (ඒ කාව්‍යශරීරයෙහි ශොභාවූ) අලඞ්කාරයද; දර්ශිතම්, දක්වනලද; (ඒදෙදෙනාකෙරෙහි ලා-) ශරීරම් තාවත්, කාව්‍යශරීරය වනාහි; ඉෂ්ටාර්ථ, කිවිහුවිසින් කැමැතිවනලද (රසභාවාදිවූ කියි) අර්ථයෙක්හි; ව්‍යවච්ඡින්නා, (මේ කවිනිවයෙන්) පිහිටුවනලද්දාවූ; පදාවලී, (සුබඋච්චාරණවූ) පදයන්ගේ සමූහයයි.

11 තත්, ඒ (කාව්‍යශරීරය) තෙම; පද්‍යම්, කෙවලපද්‍යාත්මකය; ගද්‍යම්, කෙවලගද්‍යාත්මකය; මිශ්‍රඤ්ච, ගද්‍යපද්‍යමිශ්‍රාත්මකයයි; ත්‍රිධෛව, තුන්

---

* මලඞ්කාරාශ්ච දර්ශිතාඃ– ක.

12 ඡන්දෝවිචිත්‍යාං සකලස්තත්ප්‍රපඤ්චෝ නිදර්ශිතඃ
සා විද්‍යා නෞස්තිතීර්ෂූණාං * ගම්භීරං කාව්‍යසාගරම්.

13 මුක්තකං කුලකං කෝශස්සඞ්ඝාත ඉති තාදෘශඃ
සර්ගබන්ධාංශ † රූපත්වාදනුක්තඃ පද්‍යවිස්තරඃ.

14 සර්ගබන්ධෝ මහාකාව්‍යමුච්‍යතෙ තස්‍ය ලක්ෂණම්
ආශීර්නමස්ක්‍රියා වස්තුනිර්දේශෝ වාපි තන්මුඛම්.

---

පරිච්ඡේදකින්ම; ව්‍යවස්ථිතම්, පිහිටියේයයි (දතයුත්තේය); (එහි-) චතුෂ්පදී, සතරපදකෙනකුන්ගේ සමාහාරයම; පද්‍යම්, පද්‍යනම් (වන්නේය); තච්ච, ඒ පද්‍යයද; වෘත්තම්, වෘත්තය; ජාතිරිති, ජාතියයිද; ද්විධා, ද්විප්‍රකාර (වන්නේයි).

12 සකලඃ, සියලු; තත්ප්‍රපඤ්චඃ, ඒ (වෘත්තජාතිදෙදෙනාගේ) විස්තරය; ඡන්දෝවිචිත්‍යාම්, ඡන්දශ්ශාස්ත්‍රයෙහි; නිදර්ශිතඃ, (ලක්ෂණහෙයින්ද ලක්ෂ්‍යහෙයින්ද) දක්වනලදද; සා විද්‍යා, ඒ (ඡන්දෝවිචිති) විද්‍යාතොමෝ; ගම්භීරම්, ගැඹුරුවූ; කාව්‍යසාගරම්, කාව්‍ය නමැති සමුද්‍රයට; තිතීර්ෂූණාම්, බස්නාකැමැත්තවුන්ට; නෞඃ, නැවකි.

13 මුක්තකම්, මුක්තකය; කුලකම්, කුලකය; කෝශඃ, කෝශය; සඞ්ඝාතඃ ඉති, සඞ්ඝාතයයිද; තාදෘශඃ, එබඳුවූ; පද්‍යවිස්තරඃ. පද්‍යප්‍රකාරය තෙම; සර්ගබන්ධාංශරූපත්වාත්, සර්ගබන්ධයාගේ ඒකදේශස්වභාවයක්හෙයින්; අනුක්තඃ, නොකියනලදද; (සර්ගබන්ධයෙන් වෙන්කොට ලක්ෂණහෙයින් නොකියනලදී).

මෙහි නිමුණු අර්ථ ඇති අනික් සොලොවක් අපේක්ෂා නොකරන එක සොලොවෙක් **මුක්තක** නම් වෙයි. ඒකක්‍රියාචාරයෙන් බඳුනොවුන් අපේක්ෂාකොට නිමුණු අර්ථ ඇති වෙන වෙන නිමුණු අර්ථ නැති බොහෝ සොලෝ **කුලක**නම් වෙයි. නොයෙක් කීර්ත්ති ඇති භින්නවූ ක්‍රියා ඇති කෝශාකාරයෙන් පිහිටුවනලද ස්වප්‍රධානවූ බොහෝසොලෝ **කෝශ**නම් වෙයි. සන්ධ්‍යාදිවූ ඒක කීර්ත්තියක් වර්ණනා කරනුපිණිස සමුදායෙන් පවත්වනලද භින්නවූ ක්‍රියා ඇති බොහෝසොළෝ **සඞ්ඝාත**නම් වන්නේයයි දතයුතු.

14 මහාකාව්‍යම්, (ගුණහෙයින්ද සන්නිවේශහෙයින්ද) මහත්වූ කාව්‍යය; සර්ගබන්ධඃ, සර්ගබන්ධයයි (දතයුත්තේය); අස්‍ය තු, මේ මහාකාව්‍යයාගේ වනාහි; ලක්ෂණම්, ස්වරූපයතෙම; උච්‍යතෙ, කියනුලැබේ; තන්මුඛම්, ඒ (මහාකාව්‍යයාගේ) මුඛයතෙම; ආශීඃ, ඉෂ්ටාශංසනය හෝය; නමස්ක්‍රියා, ප්‍රණාමය හෝය; වස්තුනිර්දේශෝ වාපි, ප්‍රබන්ධස්වරූප අර්ථ සැත්තුගේ කීම හෝ [illegible]මෙයි; --

---

* නෞස්තිතීර්ෂූණාං—කා. † සර්ගබන්ධාඞ්ග—කා.

15 ඉතිහාසකථොද්භූතමිතරද්වා සදාශ්‍රයම්.
චතුර්වර්ගඵලායත්තං * චතුරෝදාත්තනායකම්.

16 නගරාර්ණවශෛලර්තුචන්ද්‍රාර්කෝදයවර්ණනෛඃ †
උද්‍යානසලිලක්‍රීඩා මධුපානරතෝත්සවෛඃ.

17 විප්‍රලම්භෛර්විවාහෛශ්ච කුමාරෝදයවර්ණනෛඃ
මන්ත්‍රදූතප්‍රයාණාජිනායකාභ්‍යුදයෛරපි.

---

"ශ්‍රමවිශුද්ධගුණරත්නසමෘද්ධකීර්ති-
බ්‍රහ්මේන්ද්‍රශේඛරිතපාදසරෝජරේණුඃ
ශෞද්ධෝදනිස්සකලසත්ත්වහිතෛකදීක්ෂඃ
පායාදපායබහුලං ජගදා විමුක්තෙඃ".

මෙබඳු වූයේ **ආශිස්** නම් වේ.

"නමස්ත්‍රයාය රත්නානාං ත්‍රෛලෝක්‍යාභීෂ්ටමාත්මනෙ
ක්ෂපිතාය සුරනමෛවරිනරනාගෙන්ද්‍රමෞලිභිඃ".

මෙබඳු වූයේ නමස්ක්‍රියා නම්.

"ශ්‍රියඃ පතිශ්ශ්‍රීමති ශාසිතුං ජගජ්ජගන්නිවාසො වසුදෙවසද්මනි
වසන්දදර්ශාවතරන්තමම්බරාද්ධිරණ්‍යගර්භාඞ්ගභුවං මුනිං හරිඃ".

මෙබඳු වූයේ **වස්තුනිර්දේශ** නමැයි දතයුතු.

15 ඉතිහාසකථොද්භූතම්, පුරාවෘත්තප්‍රතිපාදනය කරන (රාමායණාදී) කථාවන් ආශ්‍රය කළාවූ හෝ; ඉතරද්වා, (ඉතිහාසාශ්‍රයෙන්) අන්‍යවූ හෝ; සදාශ්‍රයම්, ශොභන (රාජචරිතාදී) භිත්තිඇති; චතුර්වර්ගඵලායත්තම්, චතුර්වර්ගලක්ෂණවූ පුරුෂාර්ථයෙහි ප්‍රතිබද්ධවූ; චතුර, (ශූරවිශිෂ්ටගුණයොගයෙන්) කුශලවූ; උදාත්ත; (ත්‍යාගාතිශයෙන්) උදාරවූ; නායකම්, ප්‍රපක්ෂ නායකයන් ඇති;—

16 නගර, නුවරය; අර්ණව, සාගරය; ශෛල, පර්වතය; ඍතු, (හිම ශිශිරාදී) ඍතුය; චන්ද්‍රාර්කෝදය, චන්ද්‍රෝදය සූර්යෝදය යන මොවුන්ගේ; වර්ණනෛඃ, වර්ණනයෙන්ද; උද්‍යානසලිලක්‍රීඩා, උද්‍යානක්‍රීඩා ජලක්‍රීඩාය; මධුපාන, ආසවපානය; රතොත්සවෛඃ, සුරතයාගේ උත්සවය යන මෙයින්ද;—

17 විප්‍රලම්භෛඃ, (විරහාත්මකවූ) ශෘඞ්ගාරයෙන්ද; විවාහෛශ්ච, (ගාන්ධර්වාදී) විවාහයෙන්ද; කුමාර, බාලයන්ගේ; උදය, ජන්මයෙන් හා; වර්ධනෛඃ, බාල්‍යාදී වයසට පැමිණීමෙන්ද; මන්ත්‍ර, මන්ත්‍රයෙන්ද; දූත, දූතයන්විසින්ද; ප්‍රයාණ, (යුද්ධාදිය පිණිස) ගමනයෙන්ද; ආජි, විග්‍රහයෙන්ද හෙවත් යුද්ධයෙන්ද; නායක, (ප්‍රපක්ෂ) නායකයන්ගේ; අභ්‍යුදයෛරපි, (විජයාදී ලක්ෂණවූ) උත්සවයෙන්ද;—

---

* ඵලොපෙතං—ක. † වර්ණනෛඃ—ක,

18 අලඞ්කෘතමසංක්ෂිප්තං රසභාවනිරන්තරම්
සර්ගෛරනතිවිස්තීර්ණෛශ්‍රව්‍යවෘත්තෛස්සුසන්ධිභිඃ.

19 සර්වත්‍ර භින්නවෘත්තාන්තෛ * රුපෙතං ලොකරඤ්ජකම් †
කාව්‍යං කල්පාන්තරස්ථායි ජායෙත සදලඞ්කෘති.

20 න්‍යූනමප්‍යත්‍ර යෛඃ කෛශ්චිදඞ්ගෛඃ කාව්‍යං න දුෂ්‍යති
යද්‍යුපාත්තෙෂු සම්පත්තිරාරාධයති තද්විදඃ.

21 ගුණතඃ ප්‍රාගුපන්‍යස්‍ය නායකං තෙන විද්විෂාම්
නිරාකරණමිත්‍යෙෂ මාර්ගඃ ප්‍රකෘතිසුන්දරඃ.

---

18 අලඞ්කෘතම්; හෙබියාවූ; අසංක්ෂිප්තම්, නොහකුළුවනලද හෙවත් බොහෝවූ; රස, (ශෘඞ්ගාරවීරාදි) රසයෙන් හා; භාව, (රත්‍යුත්සාහාදි) භාවයෙන්; නිරන්තරම්, ව්‍යාප්තවූ; අනතිවිස්තීර්ණෛඃ, ඉතා මහත් නොවූ හෙවත් මධ්‍යමවූ; ශ්‍රව්‍යවෘත්තෛඃ, ශ්‍රැතිසුභගවූ (ඉන්ද්‍රවජ්‍රා උපෙන්ද්‍රවජ්‍රාදිවූ) පද්‍යඇති; සුසන්ධිභිඃ, (ස්පෂ්ටබැවින්) ශොභනවූ පරස්පර සංහති ඇති;—

19 සර්වත්‍ර, සියලුසර්ගයෙහිම; භින්නවෘත්තාන්තෛඃ, (ආදියෙහි පටන් කියාඑමින් සිටි වෘත්තයට) වෙන්වූ අවසානවෘත්තඇති; සර්ගෛඃ, සර්ගයෙන්; උපෙතම්, යුක්තවූ; සදලඞ්කෘති, ශොභනවූ ශබ්දාලඞ්කාර අර්ථාලඞ්කාරඇති; කාව්‍යම්, කාව්‍යයතෙම; ලොකරඤ්ජකම්, (යථොක්ත ගුණසම්පත්තිය හෙතුකොටගෙන) කවිජනයා සතුටුකරන්නේය; කල්පාන්තරස්ථායි ජායෙත, (ප්‍රතිග්‍රාහක ජනයාගේ බාහුල්‍යය හෙතුකොටගෙන) කල්පාන්තරයක් සිටිනේ වේ.

20 අත්‍ර, මෙකියනලද (නගරවර්ණනාදිවූ) අඞ්ගයන්කෙරෙහි; යෛඃ කෛශ්චිදඞ්ගෛඃ, (කුමාරොදයපඨිතවර්ණනාදිවූ) යම්කිසි අඞ්ගයෙකින්; න්‍යූනම්පි, රහිතද වූ; කාව්‍යම්, මහාකාව්‍යයතෙම; න දුෂ්‍යති, දුෂ්‍ය නොවන්නේය හෙවත් නපුරු නොවන්නේය; යදි, ඉදින්; උපාත්තෙෂු, බඳනාලද අඞ්ගයන්කෙරෙහි; සම්පත්තිඃ, (ශබ්දාර්ථගුණලක්ෂණවූ) විභූතිතොමෝ; තද්විදඃ, ඒ කාව්‍යසම්පත්ති දන්නවුන්; ආරාධයති, ඇලවන්නීනම්. (ගන්නාලද අඞ්ගයෝද ගුණරහිත වූනම් ඒ කවිහු සිත් නාරයන්නේය යනු භාවයි).

21 නායකම්, ප්‍රධානනායකයා; ගුණතඃ, ගුණයෙන් උපලක්ෂිතවූ වහු; ප්‍රාක්, පළමුකොට; උපන්‍යස්‍ය, කියා; තෙන, ඒ පූර්වවර්ණිතවූ නායකයා ලවා; විද්විෂාම්, විපක්ෂයන්ගේ; නිරාකරණම්ත්, අභිභවය (කියනු ලැබෙයි) යන; එෂ මාර්ගඃ, මේ ක්‍රමයතෙම; ප්‍රකෘතිසුන්දරඃ, ස්වභාවයෙන් ශොභනයි.

---

* සර්ගාන්තෛ-සි, † රඤ්ජනම්-සි.

22 වංශවීර්‍යශ්‍රුතාදීනි වර්ණයිත්වා රිපොරපි
තජ්ජයාන්නායකොත්කර්ෂකථනඤ්ච * ධිනොති නඃ.
23 අපාදඃ පදසන්තානො ගද්‍යමාඛ්‍යායිකා කථා
ඉති තස්‍ය ප්‍රභෙදෞ ද්වෞ තයොරාඛ්‍යායිකා කිල.
24 නායකෙනෛව වාච්‍යාන්‍යා නායකෙනෙතරෙණ වා
ස්වගුණාවිෂ්ක්‍රියා දොෂො නාත්‍ර භූතාර්ථශංසිනඃ.
25 අපි ත්වනියමො දෘෂ්ටස්තත්‍රාප්‍යන්‍යෛරුදීරණාත්
අන්‍යො වක්තා ස්වයං වෙති කීදෘග්වා භෙදකාරණම්. †
26 (වක්ත්‍රඤ්චාපරවක්ත්‍රඤ්ච සාශ්වාසත්වඤ්ච ‡ භෙදකම්
චිහ්නමාඛ්‍යායිකායාශ්චෙත් ප්‍රසඞ්ගෙන කථාස්වපි.) +

---

22 රිපොරපි, විපක්ෂයාගේද; වංශ, අන්වයය; වීර්‍ය, වික්‍රමය; ශ්‍රුතාදීනි, ශාස්ත්‍රකලායෙහි දක්ෂබවය යන මේආදි ගුණවස්තූන්; වර්ණයිත්වා, ප්‍රකාශ කොට; තජ්ජයාත්, ඒ (වර්ණනාකරනලද වංශාදි ඇති විපක්ෂයාගේ) දිනීමෙන්; නායක, ප්‍රපක්ෂනායකයාගේ; උත්කර්ෂකථනංච, අතිශයක් කීමද; නඃ, අප; ධිනොති, පිනවා.

23–24 අපාදඃ, පාදරහිතවූ; පදසන්තානඃ, සුප්තිඞන්තපදයන්ගේ ප්‍රබන්ධයතෙම; ගද්‍යම්, ගද්‍යයයි (දතයුත්තේය); තස්‍ය, ඒ ගද්‍යයාගේ; ආඛ්‍යායිකා කථා ඉති, ආඛ්‍යායිකාය කථායයි; ප්‍රභෙදෞ, ප්‍රකාරයෝ; ද්වෞ, දෙදෙනෙක; තයොඃ, ඒ (ආඛ්‍යායිකා කථා) දෙන්නා අතුරෙහි; ආඛ්‍යායිකා, ආඛ්‍යායිකාතොමෝ: නායකෙනෛව, නායකයාවිසින්ම; වාච්‍යා, කියයුත්තීය; අන්‍යා, (ආඛ්‍යායිකායෙන්) අන්‍යවූ කථාතොමෝ; නායකෙන, නායකයා විසින් හෝ; ඉතරෙණ වා, (ඔහුගේ සහායාදිවූ) අනිකෙක්හු විසින් හෝ; වාච්‍යා කිල, කියයුත්තී ලු; අත්‍ර, මේ (ආඛ්‍යායිකා කථා) දෙක්හි; ස්වගුණ; තමාගේ ශෞර්‍ය්‍යාදිගුණයන්ගේ; ආවිෂ්ක්‍රියා, (ප්‍රශංසාවශයෙන්) කීම; භූතාර්ථශංසිනඃ, (යථාප්‍රවෘත්ත ස්වචරිතලක්ෂණවූ) භූතාර්ථය කියන්නාවූ නායකයාහට; න දොෂඃ, දොෂ නැති.

25 අපි තු, එකෙක් මත් නූ; තත්‍රාපි, ඒ ආඛ්‍යායිකායෙහිදූ; අන්‍යෛඃ, (නායකයාකෙරෙන්) අන්‍යවූ ඔහුගේ අනුවාදීන්විසිනුදු; උදීරණාත්, කීම හෙතුකොටගෙන; අනියමඃ, (ආඛ්‍යායිකාතොමෝ නායකයාවිසින්ම කියයුත්තීය යන මේ) නියමයාගේ අභාවයතෙම; දෘෂ්ටඃ, දක්නාලද; වක්තා, (කථාව) කියන්නේ; අන්‍යඃ. අනිකෙක; ස්වයං වෙති, (ආඛ්‍යායිකාව කියන්නේ) තෙමේය යනු; කීදෘග් වා, කෙබඳුනම්; භෙදකාරණම්. ආඛ්‍යායිකා කථාදෙන්නාගේ භෙදයට හෙතුවේද; (මේ භෙදයට කාරණ නොවන්නේය සිසේයි).

(26 වක්ත්‍රඤ්ච, වක්ත්‍රනම් ඡන්දොවිශෙෂයද; අපරවක්ත්‍රඤ්ච, අපරවක්ත්‍රනම් ඡන්දොවිශෙෂයද; සාශ්වාසත්වඤ්ච, ආශ්වාසනම්වූ කථාංශව්‍යවච්ඡෙද

---

* වර්ණනඤ්ච-ක. † භෙදලක්ෂණම්-ක. ‡ සොච්ඡ්වාසත්වඤ්ච-ක.

\+ මේ ශ්ලොකය හා සන්නයත් සිංහලපොත්හි හුණුයි.

27 ආර්‍යාදිවත් ප්‍රවේශඃ කිං න වක්ත්‍රාපරවක්ත්‍රයෝඃ
භේදශ්ච දෘෂ්ටෝ ලම්භාදිරාශ්වාසෝ * වාස්තු කින්තතඃ.

28 තත්කථාඛ්‍යායිකෙත්‍යේකා ජාතිඃ සංඥාද්වයාඞ්කිතා
අත්‍රෛවාන්තර්භවිෂ්‍යන්ති ශේෂාශ්චාඛ්‍යානජාතයඃ.

28 කන්‍යාහරණසඞ්ග්‍රාමවිප්‍රලම්භෝදයාදයඃ
සර්ගබන්ධසමා ඒව නෛතේ වෛශේෂිකා ගුණාඃ.

30 කවිභාවකෘතං චිහ්නමන්‍යත්‍රාපි න දුෂ්‍යති
මුඛමිෂ්ටාර්ථසංසිද්ධ්‍යෛ † කිං හි න ස්‍යාත්කෘතාත්මනාම්.

යෙන් යුක්තබවද; ආඛ්‍යායිකායාඃ, ආඛ්‍යායිකාවගේ; භේදකම්, (කථායෙන්) වෙන්කරන්නාවූ; චිහ්නං වෙත්; ඉදින් අසාධාරණලක්‍ෂණයෙකැයි (දන්නාලැබේ) නම්; ප්‍රසඞ්ගේන, ප්‍රාසඞ්ගිකවශයෙන්; කථාසු අපි, කථායෙහිදු;—)

27 ආර්‍යාදිවත්, ආර්‍යාදියෙහි මෙන්; වක්ත්‍රාපරවක්ත්‍රයෝඃ, වක්ත්‍ර අපරවක්ත්‍රදෙදෙනාගේ; ප්‍රවේශඃ, ප්‍රවේශයතෙම; කිං න, කුමක්හෙයින් නොවේද; (වේමය යනු අර්ථයි.) ලම්භාදිඃ, ලම්භ පර්‍ව විශ්‍රාමාදිවූ; භේදශ්ච, (ආඛ්‍යායිකාවිෂයවූ ව්‍යවහාර) විශේෂයද; දෘෂ්ටඃ, (කථායෙහි) දක්නාලද; (එහෙයින්–) ආශ්වාසෝ වාස්තු, (කථායෙහි) ආශ්වාසව්‍යවහාරද වේවා; තතඃ, ඒ ව්‍යවහාරභේදමාත්‍රයෙකින්; කිම්, (මේ දෙදෙනාගේ) කෙනම් (විජාතියබවෙක් වන්නේද නොවෙයි සේයි).

28 තත්, එහෙයින්; එකා ජාතිඃ, එක (ගද්‍ය) ජාතිතොමෝ; කථාඛ්‍යායිකෙති, කථාය ආඛ්‍යායිකායයි; සංඥාද්වයාඞ්කිතා, නම්දෙකෙකින් දක්වනලද්දී (ව්‍යවහාර කටයුතුයි); ශේෂා, (මේ ආඛ්‍යායිකාකථායෙන්) අන්‍යවූ; ආඛ්‍යානජාතයශ්ච, (ශකුනතලෝපාඛ්‍යානාදිවූ) ආඛ්‍යානප්‍රකාරයෝද; අත්‍රෛව, (මේ ආඛ්‍යායිකා කථා) දෙක්හිම; අන්තර්භවිෂ්‍යන්ති; ඇතුළත් වෙත්.

29 කන්‍යාහරණ, කන්‍යාග්‍රහණය; සඞ්ග්‍රාම, (ඒ කන්‍යාග්‍රහණයට හේතුවූ හෝ අන්‍යවූ හෝ) යුද්ධය; විප්‍රලම්භ, වියෝගය; උදයාදයඃ, (රිපුවිජයාදිවූ) අභ්‍යුදය යන මේ ආදිහු; සර්ගබන්ධ, මහාකාව්‍යයෙහිදු; සමාඃ ඒව, සාධාරණයෝමය; (එහෙයින්;) තෙ ගුණාඃ, ඒ ගුණයෝ; වෛශේෂිකාඃ න, (කථායෙන් ආඛ්‍යායිකාව) භින්න කරන්නාහු නොවෙත්.

30 කවි, කාව්‍යප්‍රයෝග කරන්නාහුගේ; භාවකෘතම්, අභිප්‍රායෙන් කරනලද; චිහ්නම්, අඞ්කය; අන්‍යත්‍රාපි, (ආඛ්‍යායිකායෙන්) පිටත්වූ (කථායෙහිදු සර්ගබන්ධයෙහිදු); න දුෂ්‍යති, දොෂ පිණිස නොවන්නේයි; කෘතාත්මනාම්, ව්‍යුත්පන්නවිද්‍යාවූ ප්‍රාඥයන්ට; ඉෂ්ටාර්ථසංසිද්ධ්‍යෛ, අභිමතාර්ථ සිද්ධියෙහි ලා; කිං හි මුඛං න ස්‍යාත්, කිමෙක් නම් උපාය නොවන්නේද; (වේමයයි සේයි).

* රුච්ඡ්වාසෝ-ක. † සංසිද්ධෞ-ක.

31 මිශ්‍රාණි නාටකාදීනි තෙෂාමන්‍යත්‍ර විස්තරඃ
ගද්‍යපද්‍යමයී කාපි * චම්පූරිත්‍යභිධීයතෙ.

32 තදෙතවාඞ්මයම්භූයඃසංස්කෘතම්ප්‍රාකෘතන්තථා
අපභ්‍රංශශ්ච මිශ්‍රඤ්චෙත්‍යාහුරාප්තා † ශ්චතුර්විධම්.

33 සංස්කෘතං නාම දෛවී වාගන්වාඛ්‍යාතා මහර්ෂිභිඃ
තද්භවං තත්සමං දෙශීත්‍යනෙකඃ ප්‍රාකෘතක්‍රමඃ.

34 මහාරාෂ්ට්‍රාශ්‍රයාම්භාෂාම්ප්‍රකෘෂ්ටං‡ ප්‍රාකෘතං විදුඃ
සාගරස්සූක්තිරත්නානාං සෙතුබන්ධාදි යන්මයම්.

---

31 නාටකාදීනි, නාටකප්‍රකරණාදීහු; මිශ්‍රාණි, ගද්‍යපද්‍යමයහයි දත යුත්තාහ; තෙෂාම්, ඒ (නාටකාදි) මිශ්‍රබන්ධනයන්ගේ; විස්තරඃ, ප්‍රපඤ්චතෙම; අන්‍යත්‍ර, භරතාදි නාටකශාස්ත්‍රයෙහියයි (දතයුත්තේය); ගද්‍යපද්‍යමයී, ගද්‍යපද්‍යමයවූ; චම්පූරිත්‍යපි, චම්පූ නම්ඇත්තාවූද; කාපි, කිසිවක්; විද්‍යතෙ, ඇති. (මෙහි අපිශබ්දයෙන් හුදෙක් පූර්වෝක්තප්‍රකාරයම නොවෙයි චම්පූයයි මේ මිශ්‍රප්‍රකාරයද ඇතැයි හඟවනලදී. ඒ චම්පූකාව්‍ය නම් **ජාතකමාලා-දමයන්ති** ආදියයි දතයුතු).

32 තදෙතවාඞ්මයම්, ඒ මේ (ත්‍රිවිධවූ) කාව්‍යශරීරය; භූයඃ, නැවත; සංස්කෘතම්, ශුද්ධසංස්කෘතය; ප්‍රාකෘතම්, ශුද්ධප්‍රාකෘතය; තථා, එසේම; අපභ්‍රංශශ්ච, ශුද්ධ අපභ්‍රංශය; මිශ්‍රඤ්චෙති, (ඒ සංස්කෘතාදියෙන් හා පෛශාචියෙන්) මිශ්‍රයයිද මෙසේ; චතුර්විධම්, චතුෂ්ප්‍රකාරවූවහු; ආප්තාඃ, ආර්‍ය්‍යයෝ; ආහුඃ, කියත්.

33 මහර්ෂිභිඃ, (දිව්‍යභාෂා දන්නාවූ පාණිනාදි) මහාමුනීන්විසින්; අන්වාඛ්‍යාතා, (ප්‍රකෘතිප්‍රත්‍යයාදි විභාගකල්පනායෙන්) අනුශිෂ්ටවූ; දෛවී වාක්, දෙවභාෂාතොමෝ; සංස්කෘතං නාම, සංස්කෘතනම් වන්නීය; ප්‍රාකෘතක්‍රමඃ, ප්‍රාකෘතක්‍රමයතෙම; තද්භවම්, ඒ සංස්කෘතයෙන් උපන්නේය; තත්සමම්, ඒ සංස්කෘත හා සමය; දෙශීති, දෙශියයි; අනෙකඃ, නානාප්‍රකාර (වන්නේයි).

34 සූක්තිරත්නානාම්, (ශබ්ද අර්ථ දෙදෙනාගේ උත්කර්ෂය හෙතුකොට ගෙන ප්‍රීතිකරබැවින්) සුභාෂිතරත්නයන්ට; සාගරඃ, පිහිටවූ; සෙතුබන්ධාදි, (**ප්‍රවරසෙන**යන්විසින් කරනලද) සෙතුබන්ධාදි කාව්‍යයතෙම; යන්මයම්, යම් ප්‍රාකෘතයක්හුගේ විකාරද හෙවත් හුදෙක් යම් ප්‍රාකෘතයෙකින්ම කරනලද්ද (එබඳුවූ); මහාරාෂ්ට්‍රාශ්‍රයාම් භාෂාම්, (කුන්තලමුරලාදී) මහාරාෂ්ට්‍ර පිහිටකොට ඇති තෙප්ල; ප්‍රකෘෂ්ටප්‍රාකෘතම්, ප්‍රාකෘතයන් කෙරෙහි ශොභනතරවූ ප්‍රාකෘතයයි; විදුඃ, දනිත්.

---

* කාචිත්-ක. වාණී—ඛචිත්. † රාඥා-ක. ‡ ප්‍රකෘෂ්ටං-ක.

35 ශෞරසෙනී ච ගෞඩී ච ලාටී චාන්‍යාපි* තාදෘශී
යාති ප්‍රාකෘතමිත්‍යෙව† ව්‍යවහාරෙෂු සන්නිධිම්.

36 ආභීරාදිගිරඃ කාව්‍යෙෂ්වපභ්‍රංශ ඉති ස්මෘතාඃ
ශාස්ත්‍රෙෂු සංස්කෘතාදන්‍යදපභ්‍රංශතයොදිතම්.

37 සංස්කෘතං සර්ගබන්ධාදි ප්‍රාකෘතං ස්කන්ධකාදි යත්
ආසාරාදී‡න්‍යපභ්‍රංශො නාටකාදි තු මිශ්‍රකම්.

38 කථාදි+ සර්වභාෂාභිස්සංස්කෘතෙන ච බධ්‍යතෙ
භූතභාෂාමයීන්ත්වාහු ** රද්භුතාර්ථාං බෘහත්කථාම්.

39 ලාස්‍යච්ඡලිතශම්‍යාදි †† ප්‍රෙක්ෂාර්ථමිතරත්පුනඃ
ශ්‍රව්‍යමෙවෙති සෛෂාපි ද්වයී ගතිරුදාහෘතා.

---

35 ශෞරසෙනී ච, ශූරසෙනාශ්‍රයවූ භාෂාවද; ගෞඩී ච, ගෞඩාශ්‍රය වූ භාෂාවද; ලාටී ච, ලාටාශ්‍රයවූ භාෂාවද; අන්‍යාපි තාදෘශී, (පාංචාලී මාගධී ආදිවූ) එබඳු සාමාන්‍යභාෂාවද; ප්‍රාකෘතමිත්‍යෙව, ප්‍රාකෘතය යන නමින්ම; ව්‍යවහාරෙෂු, නාටකාදියෙහි ලා; සන්නිධිම්, ප්‍රයොගයට; යාති, යන්නීයි.

36 ආභීරාදිගිරඃ, වාශිකකිරාතාදින්ගේ භාෂාවෝ; කාව්‍යෙෂු, ගද්‍ය පද්‍ය මිශ්‍රාත්මකවූ කාව්‍යප්‍රයොගයෙහි ලා; අපභ්‍රංශඃ ඉති; අපභ්‍රංශයයි; ස්මෘතාඃ, දන්නාලදහ; ශාස්ත්‍රෙෂු, ව්‍යාකරණාදියෙහි ලා; සංස්කෘතාදන්‍යත්, (ලක්‍ෂණස්වරූපවූ) සංස්කෘතයෙන් පිටත් වචනය; අපභ්‍රංශතයා, අපභ්‍රංශ බැවින්; උදිතම්, ව්‍යවහාර කරනලදී.

37 සර්ගබන්ධාදි, සර්ගබන්ධ පෘථක්සඞ්ඝාතාදිවූ යම් කාව්‍යයෙක් ඇද්ද (හෙතෙම;) සංස්කෘතම්, සර්වසංස්කෘතයයි (දතයුත්තේය); ස්කන්ධකාදි, ස්කන්ධක සෙතුබන්ධාදිවූ; යත්, යම්කාව්‍යයෙක් ඇද්ද හෙද; ප්‍රාකෘතම්, සර්වප්‍රාකෘතයයි (දතයුත්තේය); (යානි) ආසාරාදීනි, ආසාර රාසකාදිවූ (යම් කාව්‍යකෙනෙක් ඇද්ද ඔහු); අපභ්‍රංශඃ, අපභ්‍රංශයයි (දතයුත්තාහ); නාටකාදි තු, නාටක භාණ ප්‍රකරණාදිවූ යම් වාඞ්මයෙක් ඇද්ද හෙතෙම; මිශ්‍රකම්, සංස්කෘතාදියෙන් මිශ්‍රයයි (දතයුත්තේයි)

38 කථාදිඃ, කථා ආඛ්‍යානකාදිවූ ප්‍රබන්ධයතෙම; සර්වභාෂාභිඃ, සියලු (සංස්කෘත ප්‍රාකෘත අපභ්‍රංශ පෛශාචික) භාෂායෙන්ද; සංස්කෘතෙන ච; සංස්කෘතයෙන්ද; බධ්‍යතෙ, (යථාස්වභාවයෙන්) බඳනාලැබෙයි; අද්භුතාර්ථාම්, ප්‍රකෘෂ්ටවූ සූත්‍රාර්ථඇති; බෘහත්කථාන්තු, බෘහත්කථා වනාහි; භූතභාෂාමයීම්, පෛශාචිකවාඞ්මය එයයි; ආහුඃ, (තජ්ඥයෝ) කියත්.

39 ලාස්‍ය, ශෘඞ්ගාරප්‍රධානවූ නෘත්‍යය; ඡලිත, ඡද්මප්‍රධානවූ නෘත්‍යය; ශම්‍යාදි, තාලවිශෙෂප්‍රතිපාදක නෘත්‍යය යන මේ ආදි(නෘත්‍යයන් ප්‍රතිපාදනය කරන්නාවූ කාව්‍යය)තෙම; ප්‍රෙක්ෂාර්ථම්, ප්‍රෙක්ෂාවම ප්‍රයොජන කොට

---

* චාන්‍යාච-ක. † ත්‍යෙවං-ක. ‡ ඔෞසරා-සිං. + කථා හි—ක.
** සීම්ප්‍රාහු-ක. †† ශල්‍යාදි-ක.

40 අස්ත්‍යනෙකො ගිරාං මාර්ගස්සූක්ෂ්මභෙදඃ පරස්පරම්
තත්‍ර වෛදර්භගෞඩීයෞ වර්ණ්‍යෙතෙ ප්‍රස්ඵුටාන්තරෞ.

41 ශ්ලෙෂඃ ප්‍රසාදස්සමතා මාධුර්‍ය්‍යං සුකුමාරතා
අර්ථව්‍යක්තිරුදාරත්වමොජඃකාන්තිසමාධයඃ.

42 ඉති වෛදර්භමාර්ගස්‍ය ප්‍රාණා දශ ගුණාඃ ස්මෘතාඃ
එෂාං විපර්‍ය්‍යයඃ ප්‍රායො දෘශ්‍යතෙ ගෞඩවර්ත්මනි.

43 ශ්ලිෂ්ටමස්පෘෂ්ටශෛථිල්‍යමල්පප්‍රාණාක්ෂරොත්තරම්
ශිථිලං, මාලතීමාලා ලොලාලිකලිලා යථා.

---

ඇත්තේයයි දතයුත්තේය; ඉතරත්පුනඃ, ඒ ලාස්‍යාදීන්කෙරෙන් අන්‍යවූ සර්ගබන්ධාදිතෙමේ වනාහි; ශ්‍රව්‍යමෙවෙති, අභිනය නොකටහැකිබැවින් ඇසියයුත්තේමයයි; සෛෂාපි වයි ගතිඃ, ඒමේ ත්‍රිප්‍රකාරවූ ව්‍යවස්ථාද; උදාහෘතා, කියනලද්දු.

මෙහි අපිශබ්දයතෙම ඒ ත්‍රිවිධ කාව්‍යයාගේ භූෂෙදක් සංස්කෘත ප්‍රාකෘත අපභ්‍රංශ මිශ්‍රය යන චතුර්විධත්වය මතු නොවන්නේය ප්‍රෙක්ෂ්‍ය ශ්‍රව්‍යයයි ද්විවිධත්වයද හඟවා.

40 අනෙකඃ, නොඑක්ප්‍රකාරවූ; පරස්පරම්, ඔවුනොවුන් හා; සූක්ෂ්මභෙදඃ, ස්වල්පවූ අන්තරඇත්තාවූ; ගිරාං මාර්ගඃ, කාව්‍යයන්ගේ රචනාප්‍රකාරය තෙම; අස්ති, ඇත; තත්‍ර, ඒ අනෙකමාර්ගයෙහි ලා; ප්‍රස්ඵුටාන්තරෞ, මහත්වූ භෙදඇති, වෛදර්භගෞඩීයෞ, වෛදර්භගෞඩීයමාර්ගයෝ දෙද්දෙනා; වර්ණ්‍යෙතෙ, (විභාගභෙයින්) වර්ණනා කරනුලැබෙත්.

41 ශ්ලෙෂඃ, (බන්ධගෞරවලක්ෂණවූ) ශ්ලිෂ්ටතාවය හෙවත් අශෛථිල්‍යය; ප්‍රසාදඃ, (ප්‍රකාශාර්ථතාලක්ෂණවූ) ප්‍රසන්නතාවය; සමතා, (පද්‍යගද්‍යයන් සම්බන්ධිවූ පාදයන්ගේ) සමානජාතිවූ බන්ධය; මාධුර්‍ය්‍යම්, (ශබ්දාර්ථදෙක්හි) රසවත්බවය; සුකුමාරතා, අපරුෂාක්ෂරබාහුල්‍යය; අර්ථව්‍යක්තිඃ, අභිප්‍රායාගේ (ශබ්දයෙන් හෝ න්‍යාසයෙන් හෝ) ග්‍රහණය; උදාරත්වම්, (එක්තරා අර්ථයෙකින්) සනාථබවය; ඔජඃ, සමාසවෘත්තිබාහුල්‍යය; කාන්තිඃ, සර්වලොකමනොහරබවය; සමාධයඃ, ගෞණවෘත්තිබවය යන;—

42 ඉති, මෙබඳුවූ; දශ ගුණාඃ, දශධර්මයෝ; වෛදර්භමාර්ගස්‍ය, දක්ෂිණාත්‍යකාව්‍යයට; ප්‍රාණාඃ, ජීවිතයහයි; ස්මෘතාඃ, දන්නාලදහ; එෂාම්, මේ ශ්ලෙෂාදීන්ට; විපර්‍ය්‍යයඃ, විපක්ෂවූ අශ්ලෙෂාදියතෙම; ගෞඩවර්ත්මනි, ගෞඩකාව්‍යයෙහි; ප්‍රායඃ, බොහෝසේ; ලක්ෂ්‍යතෙ, දක්නාලැබේ.

48 ශ්ලිෂ්ටම්, සිලුටුවූ; අස්පෘෂ්ට, ස්පර්ශනොකරනලද; ශෛථිල්‍යම්, බන්ධලාඝවය ඇති; අල්පප්‍රාණාක්ෂරොත්තරම්, වර්ගප්‍රථමාදිවූ අල්පප්‍රාණවූ

44 අනුප්‍රාසධියා ගෞඩෛස්තදිෂ්ටං බන්ධගෞරවාත්
වෛදර්භෛර්මාලතීදාම ලඞ්ඝිතං භ්‍රමරෛරිති.

45 ප්‍රසාදවත් ප්‍රසිද්ධාර්ථමින්දෝරින්දීවරද්‍යුති
ලක්ෂ්ම ලක්ෂ්මීං තනෝතීති ප්‍රතීතිසුභගං වචඃ.

46 ව්‍යුත්පන්නමිති ගෞඩීයෛර්නාතිරූඪමපීෂ්‍යතෙ
යථානත්‍යර්ජුනාබ්ජන්මසදෘක්ෂාඞ්කො වලක්ෂගුඃ.

---

අක්ෂරයන්ම අධිකකොට ඇති කාව්‍යයතෙම; ශිථිලම්, ශිථිලනම් වන්නේ යඃ (ඒ ශිථිලකාව්‍යය තෙම;) මාලතීමාලා ලොලාලිකලිලා යථා, "මාලතීමාලා ලොලාලිකලිලා" යනු මෙති–මාලතීමාලා, දෑසමන්මල්දම; ලොල, පුෂ්පසුගන්ධයෙහි ලොල්වූ; අලි, භෘඞ්ගයන් විසින්; කලිලා, ව්‍යාප්තයි.

44 තත්, ඒ ශිථිලකාව්‍යයතෙම; ගෞඩෛඃ, පෞරස්ත්‍යයන් විසින්; අනුප්‍රාසධියා, අනුප්‍රාසබුද්ධීන්; ඉෂ්ටම්, කැමැතිවනලද; වෛදර්භෛඃ, දාක්ෂිණාත්‍යයන් විසින්; බන්ධගෞරවාත්, රචනාවගේ අශෛථිල්‍යය හෙතුකොටගෙන; මාලතීදාම ලඞ්ඝිතං භ්‍රමරෛරිති, "මාලතීදාම ලඞ්ඝිතං භ්‍රමරෛඃ"යි මෙබඳුවූ කාව්‍යයතෙම; ඉෂ්ටම්, කැමැතිවනලදී–මාලතීදාම, ජාතිකුසුමදාමයතෙම, භ්‍රමරෛඃ, භෘඞ්ගයන් විසින්; ලඞ්ඝිතම්, ඉක්මෙනලදී.

45 ප්‍රසිද්ධාර්ථම්, ප්‍රකාශඅර්ථ ඇත්තාවූ කාව්‍යයතෙම; ප්‍රසාදවත්, ප්‍රසාදගුණ ඇත්තා නම්වේ; (ඒ ප්‍රසාදවත්වූ කාව්‍ය නම්)–ඉන්දෝරින්දීවරද්‍යුති ලක්ෂ්ම ලක්ෂ්මීං තනොති ඉති, "ඉන්දෝරින්දීවරද්‍යුති ලක්ෂ්ම ලක්ෂ්මීං තනොති"යි යන මෙබඳුවූ; ප්‍රතීතිසුභගම්, වහාම අර්ථාවබොධය කරනහෙයින් මනොහරවූ; වචඃ, වචනයයි–ඉන්දොඃ, චන්ද්‍රයාගේ; ඉන්දීවරද්‍යුති, නීලොත්පලයට බඳුවූ ශොභාඇති; ලක්ෂ්ම, චිහ්නයතෙම; ලක්ෂ්මීම්, ශ්‍රිය; තනොති, පතුරුවන්නේයි.

46 ගෞඩීයෛඃ, පෞරස්ත්‍යයන්විසින්; ව්‍යුත්පන්නමිති, ව්‍යුත්පන්නයයි; නාතිරූඪමපි, අර්ථයෙන් අප්‍රසිද්ධවූ අර්ථඇත්තේද; ඉෂ්‍යතෙ, කැමැති වනුලැබේ (හෙතෙම); අනත්‍යර්ජුනාබ්ජන්මසදෘක්ෂාඞ්කො වලක්ෂගුඃ යථා, "අනත්‍යර්ජුනාබ්ජන්මසදෘක්ෂාඞ්කො වලක්ෂගුඃ"යනු මෙති–වලක්ෂගුඃ, චන්ද්‍රතෙම; අනත්‍යර්ජුනාබ්ජන්ම, නීලොත්පලයක් හා; සදෘක්ෂ, සදෘශවූ; අඞ්කඃ, චිහ්න ඇත්තේයි.

47 සමං බන්ධෂ්වවිෂමං තෙ මෘදුස්ඵුටමධ්‍යමාඃ
බන්ධා මෘදුස්ඵුටොන්මිශ්‍රවර්ණවින්‍යාසයොනයඃ.

48 කොකිලාලාපවාචාලො මාමෙති මලයානිලඃ
උච්ඡලච්ඡීකරාච්ඡාච්ඡ නිර්ඣරාම්භඃකණොක්ෂිතඃ.

49 චන්දනප්‍රණයොද්ගන්ධිර්මන්දො මලයමාරුතඃ
ස්පර්ධතෙ රුද්ධමද්ධෛර්යො වරරාමාමුඛානිලෛඃ.

---

47 බන්ධෙෂු, රචනාවිෂයෙහි ලා; අවිෂමම්, (සතරපාදයන්ගේම අදි යෙහිද මධ්‍යයෙහිද කෙළවරෙහිද සමානජාතියබන්ධබැවින්) විෂමනොවූ කාව්‍යයතෙම; සමම්, සමකාව්‍යයයි (දතයුත්තේය); තෙ බන්ධාඃ, ඒ සම බන්ධයෝ; මෘදු, මෘදුශ්‍රැතිවූ ගකාරාදිවූග; ස්ඵුට, අතිමාත්‍රශ්‍රැතිවූ ජකාරාදි වූග; උන්මිශ්‍ර, මෘදුස්ඵුටසංසෘෂ්ටයග යන; වර්ණ, අක්ෂරයන්ගේ; වින්‍යාසයොනයඃ, රචනාවම ප්‍රභවකොට ඇත්තාහු; මෘදුස්ඵුටමධ්‍යමාඃ, මෘදුබන්ධය ස්ඵුටබන්ධය මධ්‍යමබන්ධයයි ත්‍රිවිධ වන්නාහුයි.

48 (මේ උදාහරණයතෙම පූර්වාර්ධයෙහි (මෘදුවූද අපරාර්ධයෙහි)* ස්ඵුට වූද අක්ෂරයන්ගේ විජාතියවූ බන්ධසංස්කාරය හෙතුකොටගෙන විෂම නම් වන්නේයි).

කොකිල, පරපුෂ්ටයන්ගේ; ආලාප, හඬින්; වාචාලඃ, මුඛරවූ; උච්ඡලත්, නැඟෙන්නාවූ; ශීකර, ජලබින්දුඇති; අච්ඡාච්ඡ, අතිප්‍රසන්නවූ; නිර්ඣර, ගඟුල්ගැල්ලන්ගේ; අම්භඃකණ, ජලකණිකායෙන්; උක්ෂිතඃ, තෙමනලද්දාවූ; මලයානිලඃ, දක්ෂිණපවනතෙමේ; මාම්, මාකරා; එති, පැමිණේ.

සජාතියබන්ධයෙන් පුරනලද මෙම අර්ධදෙක (හුදෙක්) මෘදුබන්ධය හුදෙක් ස්ඵුටබන්ධයයි ශ්ලොකවශයෙන් වන්නේයි.

එහි මෘදුබන්ධය මෙසේයි—

"කොකිලාලාපවාචාලො මාමෙති මලයානිලඃ
අනුමුද්‍ධමකාලස්‍ය කාමස්‍ය කථයන්නිව" යි.

ස්ඵුටබන්ධය මෙසේයි—

"බිභර්ත්ති භ්‍රාන්තිමුද්භූතාං භ්‍රමරාණං ප්‍රභඤ්ජනඃ
උච්ඡලච්ඡීකරාච්ඡාච්ඡ නිර්ඣරාම්භඃකණොක්ෂිතඃ" යි.

49 (මෙහි ස්ඵුටබන්ධබැවින් විජාතියවූ තුන්වනපාදය හා මධ්‍යමපාදත්‍රය සංසෘෂ්ටහෙයින් මෙබඳුවූ කාව්‍යයද විෂමයයි දතයුතු).

චන්දන, චන්දනවෘක්ෂයන්ගේ; ප්‍රණය, පර්චයෙන්; උද්ගන්ධිඃ, උද්ගතවූ සෞරභ්‍යඇති; මන්දඃ, මොලොක්වූ; මලයමාරුතඃ, දක්ෂිණපවනතෙම; රුද්ධ, දුරුකරනලද; මද්ධෛර්යඃ, මාගේ ධීරබවඇත්තේ; වර

---

* මේ රේඛාන්තරිතය පොත්හි නැතයි.

50 ඉත්‍යනාලොච්‍ය වෛෂම්‍යමර්ථාලඞ්කාරඩම්බරෞ,
අපෙක්ෂමාණා වවෘධෙ* පෞරස්ත්‍යා කාව්‍යපද්ධතිඃ.

51 මධුරං රසවද්වාචි වස්තුන්‍යපි රසස්ථිතඃ †
යෙන මාද්‍යන්ති ධීමන්තො මධුනෙව මධුව්‍රතාඃ.

52 යයා කයාචිච්ඡ්‍රුත්‍යා යත් සමානමනුභූයතෙ
තද්‍රූපාදි ‡ පදාසත්තිස්සානුප්‍රාසා රසාවහා.

53 එෂ රාජා යදා ලක්ෂ්මීං ප්‍රාප්තවාන් බ්‍රාහ්මණප්‍රියඃ
තදා+ප්‍රභෘති ධර්මස්‍ය ලොකෙ'ස්මින්නුත්සවො'භවත්.

---

රාමා, උත්තමස්ත්‍රීන්ගේ; මුඛාබ්ජලෙඃ, මුඛනිඃශ්වාස හා; ජයවීතෙ, ජයවීකරන්නේයි.

මෙම සජාතියවූ එකපාදයෙකින් මිශ්‍රිතවූයේ සම්බන්ධ වන්නේයි. එය මෙසේයි—

"චන්දනප්‍රණයොද්ගන්ධිර්මන්දො මලයමාරුතඃ
ස්පර්ධතෙ රුද්ධමද්ධෛර්‍ය්‍යො වරරාමාමුඛානිලෛඃ" යි.

50 ඉති, මෙබඳුවූ; වෛෂම්‍යම්, (විජාතීයබන්ධයන්ගේ මිශ්‍රත්වලක්ෂණවූ)අසාම්‍යය; අනාලොච්‍ය, නොබලා; පෞරස්ත්‍යා, ගෞඩීයවූ; කාව්‍යපද්ධතිඃ, කාව්‍යරචනාතොමෝ; අර්ථාලඞ්කාරඩම්බරෞ, ජාත්‍යාදිවූ අර්ථාලඞ්කාරහා අක්ෂරාඩම්බරදෙන්න; අපෙක්ෂමාණා, අපෙක්ෂාකරන්නී; වවෘධෙ, පවත්නීයි.

51 රසවත්, රසඇත්තාවූ කාව්‍යයතෙම; මධුරම්, මධුර වන්නේය; යෙන, යම්රසයක් කරණකොටගෙන; ධීමන්තඃ, කවීහු; මධුනා, මකරන්ද රසය හෙතුකොටගෙන; මධුව්‍රතාඃ ඉව; භෘඞ්ගයන්මෙන්; මාද්‍යන්ති, මත් වෙද්ද; රසඃ, ඒ රසයතෙම; වාචි, ශබ්දයෙහිද; වස්තුන්‍යපි, අර්ථයෙහිද; ස්ථිතඃ, සිටිනේයි.

52 යත්, යම්පදයෙක්තෙම; යයා කයාපි ශ්‍රුත්‍යා, (සමානය සමාන්‍යය සංයොගය යන මේආදියෙන් කරනලද සදෘශබවඇති) යම්කිසි වර්ණයෙකින් ලක්ෂිතවූ ශ්‍රුතිය හෙතුකොටගෙන; සමානම්, (පදාන්තරයක් හා) සදෘශකොට; අනුභූයතෙ, අසනුලැබේද; තද්‍රූපාදි, එබඳුවූ පදය ආදි කොටඇති; පද, පදයන්ගේ; ආසත්තිඃ, ආසන්නතාතොමෝ; සානුප්‍රාසා, අනුප්‍රාසසහිතවී; රසාවහා, ශ්‍රැතිසුභගතාවක් එළවන්නීයි.

53 (යනමේ සමානපදාසත්තියට උදාහරණයි.) බ්‍රාහ්මණප්‍රියඃ, (ශාස්ත්‍රවිහිතවූ ධර්මයාගේ පැවැත්වීමෙන්)බ්‍රාහ්මණයන්ට ප්‍රියවූ; එෂ රාජා, මේ රජතෙම; යදා, යම්කාලෙක්හි; ලක්ෂ්මීම්, නරාධිපබවට; ප්‍රාප්තවාන්, පැමි

---

* වවෘධෙ-ක. † රසස්ථිතිඃ-ක. ‡ තද්‍රූපා හි-ක. + තතඃ-ක.

54 ඉතීදං නාදෘතං ගෞඩෛරනුප්‍රාසස්තු තත්ප්‍රියඃ
අනුප්‍රාසාදපි ප්‍රායො වෛදර්භෛරිදමිෂ්‍යතෙ.
55 වර්ණාවෘත්තිරනුප්‍රාසඃ පාදෙෂු ච පදෙෂු ච
පූර්වානුභවසංස්කාරබොධිනී යද්‍යදූරතා.
56 චන්ද්‍රෙ ශරන්නිශොත්තංසෙ කුන්දස්තබකවිභ්‍රමෙ'
ඉන්ද්‍රනීලනිභං ලක්ෂ්ම සන්දධාත්‍යලිනශ්ශ්‍රියම්.
57 චාරු චාන්ද්‍රමසං භීරු! බිම්බං පශ්‍යෛතදම්බරෙ
මන්මනො මන්මථාක්‍රාන්තං නිර්දයං ඝත්*මුද්‍යතම්.

---

-ණීයේද; තද ප්‍රභෘති, එතැන්පටන්කොට; අස්මින් ලොකෙ, මේ(වර්ණා ශ්‍රමලක්ෂණවූ) ජගත්හි; ධර්මස්‍ය, ශ්‍රැතියමෘතියෙන් කරනලද වර්ණා ශ්‍රමාචාරමාර්ගයාගේ; උත්සවඃ, නිෂ්ප්‍රතිපක්ෂවූ ප්‍රවෘත්තිය; අභවත්, වී-මෙහි "එෂ රාජා" යන තන්හි ෂකාරරේඵදෙන්නාගේ ස්ථානහෙයින් කරනලද සමබවයැ. ඒකාරආකාරදෙන්නාගේ මාත්‍රාහෙයින් කරනලද සමබවයැ. "ලක්ෂ්මීං ප්‍රාප්තවාන් බ්‍රාහ්මණප්‍රියඃ"යන තන්හි සංයොගයෙන් හා මාත්‍රායෙන් හා ප්‍රයත්නයෙන් කරනලද සමබවයැ. උත්තරාර්ධයෙහිදු මෙසේම සුදුසුපරිද්දෙන් ගතයුතු.

54 ඉතීදම්, මෙබඳුවූ (සමානපදසත්තිලක්ෂණ මාධුර්‍ය්‍යීය)තෙම; ගෞඩෛඃ, ගෞඩයන්විසින්; ආදෘතං න, ආදර නොකරනලද; අනුප්‍රාසස්තු, අනුප්‍රාසශබ්දරසයම; තත්ප්‍රියඃ, ඒ ගෞඩයන්ට ප්‍රියවන්නේයි; වෛදර්භෛඃ, දක්ෂිණාත්‍යයන්විසින්; අනුප්‍රාසාදපි, අනුප්‍රාසයටද වඩා; ඉදම්, (මේ සමානපදසත්තිලක්ෂණවූ මාධුර්‍ය්‍යීය) තෙම; ප්‍රායඃ, බොහෝසේ; ඊප්සිතම්, කැමැතිවනලදි.

55 යදි, ඉදින්; පූර්ව, පළමුකොට කියනලද අක්ෂරයන්ගේ; අනුභව සංස්කාරබොධිනී, ශ්‍රොත්‍රග්‍රහණසංස්කාරය ප්‍රබොධ කරන්නාවූ; අදූරතා, ආසන්නතාවක් වූනම්; පාදෙෂු ච, පාදයෙහිද; පදෙෂු ච, පදයෙහිද; වර්ණාවෘත්තිඃ, (ස්වරව්‍යඤ්ජනලක්ෂණවූ)වර්ණයන්ගේ පුනරුච්චාරණය තෙම; අනුප්‍රාසඃ, අනුප්‍රාසයයි (දතයුත්තේයි).

56 (මෙහි "චන්ද්‍ර-කුන්ද-ඉන්ද්‍ර-සන්ද"යන ශබ්දයන්ගේ පාදයෙහි අනුප්‍රාස වියයි දතයුතු.) කුන්දස්තබකවිභ්‍රමෙ, කොඳමල්කැනට බඳු ලීලාඇති; (එහෙයින්ම) ශරන්නිශා, ශරත්කල්හි රාත්‍රියට; උත්තංසෙ, ශෙඛරයක් බඳුවූ; චන්ද්‍රෙ, චන්ද්‍රයාකෙරෙහි ලා; ඉන්ද්‍රනීලනිභම්, ඉන්ද්‍රනීලමණිසදෘශවූ; ලක්ෂ්ම, චිහ්නයතෙම; අලිනඃ, භෘඞ්ගයක්හුගේ; ශ්‍රියම්, ශොභාව; සන්දධාති, උසුලන්නේයි.

57 (මෙහි චකාරයාගේද මකාරසහිත බකාරයාගේද නකාරසහිත මකාරයාගේද රේඵයාගේද යථාසම්භවයෙන් සෙස්සවුන්ගේද ආවෘත්තිය පදානුප්‍රාසයයි දතයුතු.)

---

* හන්තු—ක,

58 ඉත්‍යනුප්‍රාසමිච්ඡන්ති නාතිදූරාන්තරශ්‍රුතිම්
න තු රාමාමුඛාම්භොජසදෘශශ්චන්ද්‍රමා ඉති.

59 ස්මරඃ ඛරඃ ඛලඃ කාන්තඃ කායඃ කොපශ්ච නඃ කෘශඃ
ච්‍යුතො මානො'ධිකො රාගො මොහො ජාතො'සවො ගතාඃ.

60 ඉත්‍යාදි බන්ධපාරුෂ්‍යං ශෛථිල්‍යඤ්ච ප්‍රයච්ඡති *
අතො නෛවමනුප්‍රාසං දාක්ෂිණාත්‍යාඃ ප්‍රයුඤ්ජතෙ.

61 ආවෘත්තිමෙව † සඞ්ඝාතගොචරාං යමකං විදුඃ
තත්තු නෛකාන්තමධුරමතඃ පශ්චාද්විධාස්‍යතෙ.

---

ගිරඃ, ප්‍රියාව; මන්මනඃ, මාගේ චිත්තය; නිර්දයම්, දයාරහිතව; මන්මථ, අනඞ්ගයාවිසින්; ආක්‍රාන්තම්, මඩනාලද්ද; කතුම්, කරන්නට; අම්බරෙ, ආකාශයෙහි; උද්‍යතම්, පැනනැංගාවූ; චාරු, මනොහරවූ; චාන්ද්‍රමසම්, චන්ද්‍රමස්හු ප්‍රතිබඩවූ; එතද්බිම්බම්, මෙමණ්ඩලය; පශ්‍ය, බල.

58 ඉති,මෙසේ(අනන්තරොක්තප්‍රකාරවූ);නාතිදූර, ඉතාදුරුනොවූ;අන්තරශ්‍රුතිම්, ව්‍යවධානශ්‍රුතියක් ඇත්තාවූ; අනුප්‍රාසම්,අනුප්‍රාසය; ඉච්ඡන්ති, (වෛදර්භගෞඩීය දෙපක්ෂයෙහිම ඇත්තෝ)කැමැත්තාහ;රාමාමුඛාම්භොජසදෘශශ්චන්ද්‍රමා ඉති, "රාමාමුඛාම්භොජසදෘශශ්චන්ද්‍රමාඃ"යි (මෙබඳු දූරාන්තරශ්‍රුතිඅනුප්‍රාසය); න තු ඉච්ඡන්ති, නොකැමැතිවෙත්. (නොහොත් වෛදර්භයෝ ඒකාන්තයෙන් නොකැමැත්තාහ. ගෞඩයන්විසින් එබඳුවූයේද කැමැතිවනුලැබෙයි කියා හෝ දතයුතු).

ඉක්බිති සොලොවෙකින් මෙබඳුවූ අනුප්‍රාසය දාක්ෂිණාත්‍යයන්ට අනභිමත පරිදි දක්වත්.

59 ස්මරඃ, අනඞ්ගතෙම; ඛරඃ, ක්‍රූරය: කාන්තඃ, වල්ලභතෙම; ඛලඃ; දුර්ජනය; නඃ, අපගේ; කායඃ, ශරීරයතෙම; කෘශඃ, ක්ෂීණය; කොපශ්ච, රොෂයද; කෘශඃ, මඳය; මානඃ, මානයතෙම; ච්‍යුතඃ, ගිලිහිණි; රාගඃ, අනුරාගයතෙම; අධිකඃ, බලවත; මොහඃ, මූර්ඡාව; ජාතඃ, විය; අසවඃ, ප්‍රාණයෝ; ගතාඃ, ගියෝයි.

60 ඉත්‍යාදි, මේආදිවූ කාව්‍යයතෙම; බන්ධපාරුෂ්‍යම්, (සුකුමාරතාවට විපක්ෂවූ) බන්ධපරුෂතාවද; ශෛථිල්‍යඤ්ච, (ශ්ලෙෂයට විපක්ෂවූ) ශිථිලතාවද; ප්‍රයච්ඡති, කැමැතිවන්නේය; අතඃ, මෙයින්; එවමනුප්‍රාසම්, මෙබඳුවූ අනුප්‍රාසය; දාක්ෂිණාත්‍යාඃ, වෛදර්භයෝ; න ප්‍රයුඤ්ජතෙ, ප්‍රයොග නොකෙරෙත්.

61 සඞ්ඝාතගොචරාම්, වර්ණසමුදාය විෂය කොට ඇති; ආවෘත්තිමෙව, ආවෘත්තියම; යමකං විදුඃ, යමකයයි දනිති; තත්තු, ඒ යමකය වනාහි; ඒකාන්තමධුරම් න, ඒකාන්තයෙන් මධුර නොවන්නේය; අතඃ, එහෙයින්; පශ්චාත්, පසුව; විධාස්‍යතෙ, ප්‍රතිපාදනය කරනුලැබේ.

---

* නියච්ඡති-ක, † ආවෘත්තිං වර්ණ-ක.

62 කාමං සර්වෝ'ප්‍යලඞ්කාරො රසමර්ථෙ නිෂිඤ්චතු
තථාප්‍යග්‍රාම්‍යතෛවෛනං භාරං වහති භූයසා.

63 කන්‍යෙ! කාමයමානං මාං ත්‍වං න * කාමයසෙ කථම්
ඉති ග්‍රාම්‍යො'යමර්ථාත්මා වෛරස්‍යායෛව කල්පතෙ.†

64 කාමං කන්‍දර්පචණ්ඩාලො + මයි වාමාක්ෂි! නිර්‍දයඃ
ත්‍වයි නිර්මත්සරො දිෂ්ට්‍යෙත්‍යග්‍රාම්‍යො'ර්ථො රසාවහඃ.

65 ශබ්දෙ'පි ග්‍රාම්‍යතාස්ත්‍යෙව සා සභ්‍යෙතරකීර්තනා ‡
යථා යකාරාදිපදං රත්‍යුත්සවනිරූපණෙ.

---

62 කාමම්, ඉදින්; සර්වෝ'ප්‍යලඞ්කාරඃ, (ජාත්‍යාදිප්‍රභෙද වූ) සියලු අලඞ්කාරයද; රසම්, මාධුර්‍ය්‍යලක්ෂණ වූ රසය; අර්ථෙ, වස්තුයෙහි; නිෂිඤ්චතු, පමුණුවාවයි; තථාපි, එතකුදු වුවත්; අග්‍රාම්‍යතෛව, අග්‍රාම්‍යබව ම; භූයසා, බොහෝසේ; එනං භාරම්, මේ (රසනිෂෙකලක්ෂණ වූ) ධුරය; වහති, උසුලන්නේයි.

63 කන්‍යෙ, කන්‍යකාව! කාමයමානම්, තී කැමැති වන්නාවූ; මාම්, මා; ත්‍වම්, තෝ; කථං න කාමයසෙ, කුමකැයි නොකැමැත්තෙහිදැයි; ඉති, මෙබඳුවූ; ග්‍රාම්‍යඃ, ග්‍රාම්‍යවූ; අයම් අර්ථාත්මා, මේ වස්තුරූපයතෙමේ; වෛරස්‍යායෛව, වෛරස්‍යය පිණිස ම හෙවත් අමාධුර්‍ය්‍යය පිණිස ම; කල්පතෙ, සමර්ථ වන්නේයි.

64 වාමාක්ෂි! මනොඥවූ ඇස් ඇත්තිය! කාමම්, ඉදින්; කන්‍දර්පචණ්ඩාලඃ, අනඞ්ග නමැති චණ්ඩාලයතෙම; මයි, මාකෙරෙහි; නිර්‍දයඃ, කරුණා නැත්තේ වීනමුදු; ත්‍වයි, තීකෙරෙහි; නිර්මත්සරඃ, වෛර නැත්තේය; (එහෙයින් මට); දිෂ්ට්‍යා, යෙහෙකැයි; ඉති, මෙබඳුවූ; අග්‍රාම්‍යඃ, ග්‍රාම්‍ය නුවූ; අර්ථඃ, අර්ථයතෙම; රසාවහඃ, (ඒකාන්තමධුරබැවින්) රස එළවන්නේයි.

65 ශබ්දෙපි, (හුදෙක් අර්ථයෙහි මතු නොවෙයි) ශබ්දයෙහිදු; ග්‍රාම්‍යතා, ග්‍රාම්‍යබව; අස්ත්‍යෙව, ඇත්තේ මය; සා, ඒ ග්‍රාම්‍යතාතොමෝ; සභ්‍යෙතරකීර්තනම්, අසභ්‍යවූ රළුපුරුෂයන්ගේ වචනයයි; (හෙනෙම); රත්‍යුත්සවනිරූපණෙ, සුරතයෙහි සන්තොෂප්‍රකාශ කිරීමෙහි ලා; යකාරාදිපදං යථා, යකාරය ආදිකොට ඇතිපදය මෙනි.

---

* න ත්‍වං-ක. † වෛරස්‍යාය ප්‍රකල්පතෙ-ක. + චාණ්ඩාලො-ක.
‡ කීර්තිතාත්-ක. ප.

66 පදසන්ධානවෘත්ත්‍යා වා වාක්‍යාර්ථත්වෙන වා පුනඃ
දුෂ්ප්‍රතීතිකරං ග්‍රාම්‍යං යථා යා භවතඃ ප්‍රියා.

67 පරං * ප්‍රහෘත්‍ය විශ්‍රාන්තඃ පුරුෂො වීර්‍ය්‍යවානිති
එවමාදි න ශංසන්ති මාර්ගයොරුභයොරපි.

68 භගිනීභගවත්‍යාදි සර්වත්‍රෛවානුමන්‍යතෙ
විභක්තමිති මාධුර්‍ය්‍යමුච්‍යතෙ සුකුමාරතා.

69 අනිෂ්ඨුරාක්ෂරප්‍රායං සුකුමාරමිහෙෂ්‍යතෙ
බන්ධශෛථිල්‍යදොෂො හි දර්ශිතඃ සර්වකොමලෙ.

---

66 පදසන්ධානවෘත්ත්‍යා වා, කිසිපදයන් දෙන්නක්හුගේ ආනන්තර්‍ය්‍යයෙන් සම්ධිය හෙතුකොටගෙන හෝ; වාක්‍යාර්ථත්වෙන වා, ක්‍රියාපදසහිත වූ පදසමූහයාගේ ක්‍රියාකාරකලක්ෂණ වූ අර්ථයෙන් හෝ; දුෂ්ප්‍රතීතිකරම්, දුෂ්ටාර්ථාවගමය කරන්නාවූ වාක්‍යයතෙම; ග්‍රාම්‍යම්, ග්‍රාම්‍යනම් වන්නේයි; (හෙතෙම); යා භවතඃ ප්‍රියා යථා, "යා භවතඃ ප්‍රියා" යනු මෙනි.

මෙහි යා යන රූපයට ඉක්බිත්කොට ප්‍රයුක්තවූ භවත්ශබ්දයා හෙතුකොටගෙන මෛථුනවත්තාලක්ෂණ වූ දුෂ්ප්‍රතීතිය පදසන්ධානග්‍රාම්‍ය නමැයි දතයුතු.

67 වීර්‍ය්‍යවාන්, ශෞර්‍ය්‍යසම්පන්නවූ; පුරුෂඃ, පුරුෂතෙම; පරම්, සතුරා; ප්‍රහෘත්‍ය, පැහැර; විශ්‍රාන්තඃ, වැලැක්ක; (යනු කවිහු විසින් විවක්ෂිත වූ අර්ථය.) වීර්‍ය්‍යවාන්, රෙතස් ඇත්තාවූ; පුරුෂඃ, පුරුෂතෙම; පරම්, අන්‍යර්ථයෙන්; ප්‍රහෘත්‍ය, පැහැර; විශ්‍රාන්තඃ, වැලැක්ක; (යන මෙ බඳුවූ අනික් අර්ථයකුදු ප්‍රතීයමාන වනහෙයින් මේ වාක්‍යාර්ථග්‍රාම්‍ය නමැයි දතයුතු.) එවමාදී, මේ ආදි වූ ශබ්දග්‍රාම්‍ය වූ ද අර්ථග්‍රාම්‍ය වූ ද කාව්‍යය; උභයොරපි මාර්ගයොඃ, වෛදර්භී ගෞඩීය මාර්ගදෙක්හි ම; න ශංසන්ති, ප්‍රශංසා නොකෙරෙත්.

68 භගිනීභගවත්‍යාදි, භගිනීය භගවතීය යන මේ ආදිතෙම; සර්වත්‍රෛව, ශාස්ත්‍රය කාව්‍යය යන මේ හැමතන්හි ම; අනුමන්‍යතෙ, ආදර කරනුලැබේ; ඉති, මේ ආකාරයෙන්; මාධුර්‍ය්‍යම්, මාධුර්‍ය්‍යයතෙම; විභක්තම්, විභාග කරනලද; සුකුමාරතා, සුකුමාරබව; උච්‍යතෙ, දැන් කියනුලැබේ.

69 අනිෂ්ඨුරාක්ෂරප්‍රායම්, අපරුෂාක්ෂර බහුල කොට ඇති කාව්‍යය තෙම; සුකුමාරම්, සුකුමාරයයි; ඉහ, මේ වෛදර්භීමාර්ගයෙහි; ඉෂ්‍යතෙ, කැමැතිවන ලබන්නේයි; කුමක් හෙයින? යත්; සර්වකොමලෙ, සියලු සුකුමාරාක්ෂරයන් ඇති කාව්‍යයෙහි; බන්ධශෛථිල්‍යදොෂඃ, බන්ධයාගේ ශිථිලතාදොෂයතෙම; දර්ශිතො හි, දක්වනලද මැයි.

---

* බරං-කා:

70 මණ්ඩලීකෘත්‍ය බර්හාණි කණ්ඨෛර්මධුරගීතිභිඃ
කලාපිනඃ ප්‍රනෘත්‍යන්ති කාලෙ ජීමූතමාලිනි.

71 ඉත්‍යනූර්ජිත එවාර්ථො නාලඞ්කාරො'පි තාදෘශඃ
සුකුමාරතයෛවෛතදාරොහති සතාං මුඛම් *.

72 දීප්තමිත්‍යපරෛර්භූම්නා කෘච්ඡ්‍රොද්‍යමපි බධ්‍යතෙ
න්‍යක්ෂෙණ පක්ෂඃ ක්ෂපිතඃ † ක්ෂත්‍රියාණාං ක්ෂණාදිති.

73 අර්ථව්‍යක්තිරනෙයත්වමර්ථස්‍ය හරිණොද්ධෘතා
භූඃ ක්ෂුරක්ෂුණ්ණ ‡ නාගාසෘග්ලොහිතාදුදධෙරිති.

---

70 කලාපිනඃ, මයූරයෝ; ජීමූතමාලිනි කාලෙ, මෙඝමාලායෙන් යුක්ත කාලයෙහි හෙවත් ප්‍රාවෘට්කාලයෙහි; බර්හාණි, පිඤ්ඡයන්; මණ්ඩලී කෘත්‍ය, ඡත්‍රාකාරයෙන් කොට පහරා; මධුර, මනොහරවූ; ගීතිභිඃ, කෙකා ස්වරූප වූ ගීතිඇති; කණ්ඨෛඃ, කණ්ඨයෙන් උපලක්ෂිත වූවාහු; ප්‍රනෘත්‍යන්ති, නටත්.

71 ඉති, මෙබඳුවූ; අර්ථඃ, අභිධෙයශරීරයතෙම; අනූර්ජිත එව, දීප්ත නොවන්නේ මය; තාදෘශඃ, එබඳු වූ; අලඞ්කාරොපි න, ස්වභාවොක්ති ලක්ෂණ වූ අලඞ්කාරයෙකුදු නැත; එතත්, මේ කාව්‍යයතෙම (හුදෙක්); සුකුමාරතයෛව, සුකුමාරත්වලක්ෂණ වූ ගුණය කරණකොටගෙන ම; සතාං මුඛම්, විදග්ධයන්ගේ මුඛයට; ආරොහති, නැඟෙන්නේයි–මෙබඳු වූ කාව්‍යය සුකුමාරයයි කවීන්විසින් ග්‍රාහ්‍යයැ යනු අර්ථයි.

72 අපරෛඃ, පෞරස්ත්‍යයන්විසින්; දීප්තමිති, ඖර්ජිතයයි හෙවත් සාටොපයයි; කෘච්ඡ්‍රොද්‍යමපි, දුකසේ උච්චාරණ කටහැකි අත්‍යර්ථයෙන් සුකුමාර නොවන්නා වූ ද කාව්‍යය; භූම්නා, බොහෝසේ; බධ්‍යතෙ, බඳනා ලැබේ; (හෙතෙම) න්‍යක්ෂෙණ පක්ෂඃ ක්ෂපිතඃ ක්ෂත්‍රියාණාං ක්ෂණාදිති, "න්‍යක්ෂෙණ පක්ෂඃ ක්ෂපිතඃ ක්ෂත්‍රියාණාං ක්ෂණාත්" කියායි; ක්ෂත්‍රියාණාම් පක්ෂඃ, රාජවර්ගයතෙම; න්‍යක්ෂෙණ, + නෑක්ෂයාවිසින් හෙවත් ජාමදග්න්‍යයා විසින්; ක්ෂණාත්, ක්ෂණයෙකින්; ක්ෂපිතඃ, නසනලදී.

73 අර්ථස්‍ය, කාව්‍යාභිධෙයයාගේ; අනෙයත්වම්, ශබ්දයෙන් හෝ අර්ථයෙන් හෝ ප්‍රතීතිය; අර්ථව්‍යක්තිඃ, අර්ථව්‍යක්ති නමු; හේ මෙසේයි; හරිණා, වරාහරූපධාරි වූ විෂ්ණුහුවිසින්; භූඃ, පෘථිවිතොමෝ; ක්ෂුර, කුරාගේ ක්ෂුරයෙන්; ක්ෂුණ්ණ, සුනුකරනලද; නාගාසෘක්, උරගරුධිරයෙන්; ලොහිතාත්, රත්වූ; උදධෙඃ, සාගරයෙන්; උද්ධෘතා, උදුරනලදු.

---

* මනඃ-ක. † ක්ෂපිතඃ පක්ෂඃ-ක. ‡ ඛුරක්ෂුණ්ණ-ක.
+ "නිශ්ශෙෂකොට" යනු පුරාතනාර්ථයි.

74 මයි මහාවරාහෙණ ලොහිතාදුද්ධෘතොදධෙඃ
ඉතීයත්‍යෙව නිර්දිෂ්ටෙ නෙයත්වමුරගාසෘජඃ.

75 නෙදෘශං බහුමන්‍යන්තෙ මාර්ගයොරුභයොරපි
න හි ප්‍රතීතිඃ සුභගා ශබ්දන්‍යායවිලඞ්ඝිනී.

76 උත්කර්ෂවාන් ගුණඃ කශ්චිදුක්තෙ යස්මින් * ප්‍රතීයතෙ
තදුදාරාහ්වයං තෙන සනාථා කාව්‍යපද්ධතිඃ.

77 අර්ථිනාං කෘපණා දෘෂ්ටිස්ත්වන්මුඛෙ පතිතා සකෘත්
තදවස්ථා පුනර්දේව! නාන්‍යස්‍ය මුඛමීක්ෂතෙ.

78 ඉති ත්‍යාගස්‍ය වාක්‍යෙ'ස්මින්නුත්කර්ෂස්සාධු ලක්ෂ්‍යතෙ
අනෙනෛව පථාන්‍යච්ච † සමානන්‍යායමුහ්‍යතාම්.

---

74 මයි, පෘථිවිතොමෝ; මහාවරාහෙණ, වරාහරූපධාරී වූ විෂ්ණුහු විසින්; ලොහිතාත්, රත්වූ; උදධෙඃ, සාගරයෙන්; උද්ධෘතෙ, උද්ධරන ලදැයි; ඉයත්‍යෙව, මෙපමණක්ම; නිර්දිෂ්ටෙ, දක්වනලදකල්හි; උරගාසෘජඃ, සර්පරුධිරයාගේ; නෙයත්වම්, නෙයබවයි හෙවත් සාමර්ථ්‍යගම්‍ය බවයි.

75 ඊදෘශම්, මේ අනන්තරෝක්තප්‍රකාරවූ නෙය්‍යය; උභයොරපි මාර්ගයොඃ, වෛදර්භි ගෞඩීය මාර්ගදෙක්හිම; න බහුමන්‍යන්තෙ, (තජ්ඥයෝ ආදර නොකෙරෙත්; (කුමක්හෙයින්? යත්.) ශබ්දන්‍යායවිලඞ්ඝිනී, වාචක ශබ්දය හා සාමර්ථ්‍යය ඉක්මෙන්නාවූ; ප්‍රතීතිඃ, අර්ථාවගතියක්; න සුලභා හි, සුලභ නොවන්නී මැයි.

76 යස්මින්, යම්කිසි කාව්‍යයක්; උක්තෙ, ප්‍රයුක්තකල්හි; උත්කර්ෂවාන්, අතිශයවත් වූ; කශ්චිත් ගුණඃ, කිසි ගුණයෙක්; ප්‍රතීයතෙ, දන්නා ලැබේද: තත්, ඒ කාව්‍යය; උදාරාහ්වයම්, උදාර නම් වන්නේය: තෙන, ඒ උත්කර්ෂවත් වූ ගුණය කරණකොටගෙන; කාව්‍යපද්ධතිඃ, සියලු කාව්‍ය පද්ධතිතොමෝ; සනාථා, සනාථ වන්නීයි.

77 දෙව, රජ; අර්ථිනාම්, යාචකයන්ගේ; කෘපණා, (දෛන්‍යගතෙක පහත බැවින්) දීන වූ; දෘෂ්ටිඃ, දෘෂ්ටිතොමෝ; ත්වන්මුඛෙ, තාගේ මුඛයෙහි; සකෘත්, එකවරෙක; පතිතා, ප්‍රවෘත්ත වී; පුනඃ, නැවත; තදවස්ථා, ඒ කෘපණාවස්ථාව ඇත්තී; අන්‍යස්‍ය, අනිකෙක්හුගේ; මුඛම්, මුඛය; නෙක්ෂතෙ, නොබලන්නීයි-තෝ යාචකයන්ගේ ආකාරමාත්‍රයෙන් ම ධනාර්ථිත්වය දැන උන්ගේ කෘපණ වූ බස පහළ නොවනතුරු ම උන් කෘතාර්ථ කෙරෙහි යනු භාවයි.

78 ඉත්, මෙබඳුවූ; අස්මින් වාක්‍යෙ, මේ කාව්‍යයෙහි; ත්‍යාගස්‍ය, ත්‍යාගගුණයාගේ; උත්කර්ෂඃ, අතිශයෙක්; සාධු, මනාකොට; ලක්ෂ්‍යතෙ,

---

* කශ්චිද්‍යස්මිනුක්තෙ-ක. † පථාන්‍යත්‍ර-ක.

79 ශ්ලාඝ්‍යෛර්විශේෂණෛර්යුක්තමුදාරං කෛශ්චිදිෂ්‍යතේ
යථා ලීලාම්බුජක්‍රීඩාසරෝහේමාඞ්ගදාදයඃ.

80 ඔජඃ සමාසභූයස්ත්වමෙතද්ගද්‍යස්‍ය ජීවිතම්
පද්‍යේ'ප්‍යදාක්ෂිණාත්‍යානාමිදමේකම්පරායණම්.

81 තද්ගුරූණං ලඝූනාඤ්ච බාහුල්‍යාල්පත්වමිශ්‍රණෛඃ
උච්චාවචප්‍රකාරං සද් * දෘශ්‍යමාඛ්‍යායිකාදිෂු.

82 අස්තමස්තකපර්‍යස්තසමස්තාර්කාංශුසංස්තරා
පීනස්තනස්ථිතාතාම්‍රකම්‍රවස්ත්‍රේව වාරුණී.

---

දක්නාලැබේ; අනෙනෛව පථා, මෙකියනලද මාර්ගයෙන් ම; සමානන්‍යායම්, සදෘශ වූ ප්‍රකාර ඇති; අන්‍යච්ච, සෙස්සද ඌහ්‍යතාම්, ඌහා කරනු ලැබේවා.

79 කෛශ්චිත්, සමහර කෙනකුන් විසින් හෙවත් පෞරස්ත්‍යයන් විසින්; ශ්ලාඝ්‍යෛඃ, උත්කෘෂ්ට වූ; විශේෂණෛඃ, විශේෂණයෙන්; යුක්තම්, සහිත වූයේ; උදාරම්, උදාරයයි; ඉෂ්‍යතෙ, කැමැතිවනුලැබේ; යථා, ඒ මෙසේයි; ලීලාම්බුජ, ලීලාපිණිස වූ පද්මය; ක්‍රීඩාසරඃ, ක්‍රීඩාපිණිස වූ විලය; හේමාඞ්ගදාදයඃ, කනකමය අඞ්ගදය යන මේ ආදීහුයි. මෙහි ලීලාදිශබ්දයෝ අම්බුජාදිශබ්දයන්ට ශ්ලාඝ්‍යවිශේෂණත්වයෙන් සිටියහයි දතයුතු-මෙහි ආදිශබ්දයෙන් ආදර්ශයෂ්ටිය මණිමෙඛලාය කුසුමදාමය විභ්‍රමමණ්ඩනය අනඞ්ගරඞ්ගය යන මේ ආදීන්ගේ ග්‍රහණය කටයුතු.

80 සමාසභූයස්ත්වම්, සමාසබාහුල්‍යය; ඔජඃ, ඔජස් නම් වෙයි; එතත්, මේ ඔජස්තෙම; ගද්‍යස්‍ය, උක්තස්වරූප වූ ගද්‍යයාගේ; ජීවිතම්, හෘදයයැ; අදාක්ෂිණාත්‍යානාම්, ගෞඩයන්ට; පද්‍යේපි, (හුදෙක් ගද්‍යයෙහි මතු නොවෙයි) පද්‍යයෙහිද; ඉදම්, මේ ඔජස්; ඒකං පරායණම්, එකම ශරණ යෙකි.

81 තත්, ඒ ඔජස්තෙම; ගුරූණම්, සංයෝගපරයන් හා දීර්ඝයන් ගේද; ලඝූනාම්, හ්‍රස්වාක්ෂරයන්ගේද; බාහුල්‍යාල්පත්වමිශ්‍රණෛඃ, බොහෝ බැවින් හා මඳබැවින් හා සමබැවින්; උච්චාවචප්‍රකාරං සත්, ව්‍යාකුල වූ යති ඇත්තේ හෙවත් අනියතප්‍රකාරවූ ප්‍රයෝග ඇත්තේ වෙයි; ආඛ්‍යායිකාදිෂු, ආඛ්‍යායිකාදියෙහි; දෘශ්‍යතාම්, දක්නයුත්තේයි.

82 වාරුණී, පශ්චිමදික්තොමෝ; අස්තමස්තක, අස්තපර්වතයාගේ මුදුන්හි; පර්‍යස්ත, පතළ; සමස්ත, නිරවශේෂ වූ; අර්කාංශුසංස්තරා, සූර්‍ය්‍ය රශ්මිසන්තාන ඇත්තී; පීනස්තන, පීවර වූ පයෝධරයෙක්හි; ස්ථිත, පිහිටියාවූ; ආතාම්‍ර, මඳරත්වූ; කම්‍ර, මනොහර වූ; වස්ත්‍රේව, වස්ත්‍ර ඇත්තියක මෙන් (සොබනීයි).

---

* තද්-ක.

83 ඉති පද්‍යේ'පි පෞරස්ත්‍යා බධ්නන්ත්‍යොජස්විනීර්ගිරඃ
අන්‍යෙ ත්වනාකුලං හෘද්‍යමිච්ඡන්ත්‍යොජො ගිරාං යථා.
84 පයොධරතටොත්සඞ්ගලග්නසන්ධ්‍යාතපාංශුකා
කස්‍ය කාමාතුරං චෙතො වාරුණී න කරිෂ්‍යති.
85 කාන්තං සර්වජගත්කාන්තං ලෞකිකාර්ථානතික්‍රමාත්
තච්ච වාර්තාභිධානෙෂු වර්ණනාස්වපි විද්‍යතෙ. *
86 ගෘහාණි නාම තාන්‍යෙව තපොරාශිර්භවාදෘශඃ
සම්භාවයති යාන්‍යෙව † පාවනෛඃ පාදපාංශුභිඃ.
87 අනයොරනවද්‍යාඞ්ගි! ස්තනයොර්ජෘම්භමාණයොඃ
අවකාශො න පර්‍යාප්තස්තව බාහුලතාන්තරම් ‡.

---

83 ඉති, මේ උක්තප්‍රකාර වූ; ඔජස්විනීඃ, සමාසබාහුල්‍යය ඇතිඃ ගිරඃ, ශබ්දයන්; පෞරස්ත්‍යාඃ, ගෞඩයෝ; පද්‍යෙපි, (හුදෙක් ගද්‍යයෙහි මතු නොවෙයි) පද්‍යයෙහිදු; බධ්නන්ති, රචනා කෙරෙති; අන්‍යෙ තු, දක්ෂිණත්‍යයෝ වනාහි; අනාකුලම්, ගහන නොවූ; හෘද්‍යම්, මනොඥ වූ; ගිරාම් ඔජඃ, කාව්‍යයන් සම්බන්ධී වූ සමාසබාහුල්‍යය; ඉච්ඡන්ති, කැමැති වෙත්; යථා, ඒ මෙසේයි.

84 පයොධරතටොත්සඞ්ග, මේඝතටම්සනකයෙහි දෙ ශෝ නොහොත් ස්තනතටමස්තකයෙහි; ලග්න, යක්ත වූ; සන්ධ්‍යාතපාංශුකා, දිනපරිණතරාග නමැති වස්ත්‍රඇති; වාරුණී, පශ්චිමදික්තොමෝ; කස්‍ය චෙතඃ, කවරකුගේ නම් සිත; කාමාතුරම්, මන්මථකුලාතන වූව; න කරිෂ්‍යති, නොකරන්නීද.

85 ලෞකිකාර්ථානතික්‍රමාත්, ලොකප්‍රසිඞ වූ අර්ථය අනු ව පැවැත්මෙන්; සර්වජගත්, විදග්ධ අවිදග්ධ සකලලොකයහට; කාන්තම්, මනොහර වූයේ; කාන්තම්, කාන්තනම්; තච්ච, ඒ කාන්තයද; වාර්තාභිධානෙෂු, ප්‍රවෘත්තිනිවෙදනයෙහිද; වර්ණනාස්වපි, ස්ත්‍රීආදි වස්තූන්ගේ ගුණෝද්භාවනයෙහිද; විද්‍යතෙ, ඇති. ඉක්බිති මෙයට උදාහරණයි.

86 භවාදෘශඃ, තාබදෘ වූ; තපොරාශිඃ, ප්‍රත්‍යක්ෂ වූ තපස්වයෙක්; යානි ගෘහාණි, යම් ගෘහකෙනකුන්; පාවනෛඃ, පවිත්‍රවූ; පාදපාංශුභිඃ, පාදධූලියෙන්; එවං සම්භාවයති, මෙසේ පවිත්‍ර කෙරේද; ගෘහාණි නාම, ගෘහයෝ නම්; තාන්‍යෙව, ඔහු මැයි. මෙබඳු වාර්තාභිධානයනෙම උක්ත ප්‍රකාර වූ අර්ථයාගේ ලෞකිකත්වය කරණ කොටගෙන සර්වජගත්කාන්තයයි දතයුතු.

87 අනවද්‍යාඞ්ගි! සර්වාඞ්ගසුන්දරිය! ජෘම්භමාණයොඃ, වඩනාවූ; අනයොඃ ස්තනයොඃ, මේ ස්තනවයට; තව, තීගේ; බාහුලතාන්තරම්, හස්ත

---

* දෘශ්‍යතෙ-ක. † යාන්‍යෙව-ක. ‡ ලතාන්තරෙ-ක.

88 ඉති සම්භාව්‍යමෙවෛතද්විශෙෂාඛ්‍යානසංස්කෘතම්
කාන්තං භවති සර්වස්‍ය ලොකයාත්‍රානුසාරිණඃ*.

89 ලොකාතීත ඉවාත්‍යර්ථමධ්‍යාරොප්‍ය විවක්ෂිතඃ
යො'ර්ථස්තෙනාතිතුෂ්‍යන්ති විදග්ධා නෙතරෙ යථා †.

90 දෙවධිෂ්ණ්‍යමිවාරාධ්‍යමද්‍යප්‍රභෘති නො ගෘහම්
යුෂ්මත්පාදරජඃපාතධෞතනිශ්ශෙෂකල්මෂම් ‡.

91 අල්පං නිර්මිතමාකාශමනාලොච්‍යෛව වෙධසා
ඉදමෙවංවිධං භාවි භවත්‍යාඃ ස්තනජෘම්භණම්.

---

ලතාවයන්ගේ මධ්‍යය හෙවත් හෘදයතෙම; පර්‍ය්‍යාප්තඃ, සම්පූර්ණ වූ; අවකාශො න, ස්ථාන නොවේ. ස්වල්පයයි සේයි. තිගේ බාහුලතාන්තර යෙහි ස්තනයෝ දෙන්න නොසෑහෙන්නාහයි මෙද සර්වජනයාකාන්ත වූ ලෞකිකාර්ථයයි.

88 ඉතෙෘතත්, මෙබඳුවූ කාව්‍යයතෙම; (ප්‍රකෘතාපෙක්ෂාවෙන්) විශෙෂ, (තපොවිශෙෂය හා පාදපාංශුපාවනත්වය තාදෘශපයොධර විජෘම්භණය යන) අතිශයන්ගේ; ආඛ්‍යාන, උද්භාවනායෙන්: සංස්කෘතම්, සුප්‍රයුක්තවූයේ; සම්භාව්‍යම් එව, සම්භාවනීය මැයි (එහෙයින් ම); ලොකයාත්‍රානුසාරිණඃ, ලෞකිකාර්ථානුසාරි වූ; සර්වස්‍ය, විදග්ධ අවිදග්ධ සියල්ලහට; කාන්තං භවති. මනොහර වන්නේයි.

89 ලොකාතීත ඉව, අලෞකිකයක් වැනිවූ; යොර්ථඃ, යම් අර්ථයෙක්; අත්‍යර්ථම්, අත්‍යර්ථයෙන්; අධ්‍යාරොප්‍ය, කල්පනා කොට; විවක්ෂිතඃ, කාව්‍ය රූපයෙන් ප්‍රයොග කරනලදද; තෙන, ඒ අර්ථය කරණ කොටගෙන හෙවත් ඒ අර්ථානුවර්ත්ති වූ කාව්‍යය කරණ කොටගෙන; විදග්ධාඃ, ව්‍යුත්පන්නයෝ; අතිතුෂ්‍යන්ති, අතිශයෙන් අනුරක්ත වන්නාහ; ඉතරෙ, අවිදග්ධයෝ; න (තුෂ්‍යන්ති), සතුටු නොවෙත්; යථා, හේ මෙසේයි.

90 යුෂ්මත්, තොපගේ; පාදරජඃපාත, චරණධූලිසංසර්ගයෙන්; ධෞතනිශෙෂකල්මෂම්, සෝධනලද හෙවත් දුරුකරනලද සියලු පාප ඇති; නො ගෘහම්, අපගේ ගෙය; අද්‍යප්‍රභෘති, අද පටන් කොට; දෙව ධිෂ්ණ්‍යමිව, දෙවාලයක් මෙන්; ආරාධ්‍යම්, එළඹ පිදියයුත්තේයි–අලෞකිකයක් වැනිවූ මෙබඳුවූ ව්‍යාජාභිධානයතෙම සර්වජනකාන්ත නොවන්නේයි.

91 ඉදම්, මේ ප්‍රත්‍යක්ෂ වූ; එවංවිධම්, මෙබඳුවූ; භාවි, මතු වන්නාවූ; භවත්‍යාඃ, තීගේ; ස්තනජෘම්භණම්, පයොධරවෘද්ධිය; අනාලොච්‍යෛව, (තත්කාලාපෙක්ෂාවෙන්) නොදැක ම; වෙධසා, බ්‍රහ්මයා විසින්; ආකාශම්, ආකාශයතෙම; අල්පම්, සංකීර්ණ කොට; නිර්මිතම්, නිමවනලදී–මේ වර්ණනාක්‍රම නම් අඥ විඥ උභයපක්ෂය ප්‍රීතිපරවශ නොකරනහෙයින් සර්වජනකාන්තනම් නොවේ.

---

* වර්ණිතඃ–ක. † ජනාඃ–ක, ‡ කිල්බිෂම්–ක.

92 ඉදමත්‍යුක්තිරිත්‍යුක්තමේතද් ගෞඩෝපලාලිතම්
ප්‍රස්ථානං ප්‍රාක් ප්‍රණීතන්තු සාරමන්‍යස්‍ය වර්ත්මනඃ.

93 අන්‍යධර්මස්තතෝ'න්‍යත්‍ර ලෝකසීමානුරෝධිනා
සම්‍යගාධීයතේ යත්‍ර ස සමාධිඃ ස්මෘතෝ යථා.

94 කුමුදානි නිමීලන්ති කමලාන්‍යුන්මිෂන්ති ච
ඉති නේත්‍රක්‍රියාධ්‍යාසාල්ලබ්ධා තද්වාචිනී ශ්‍රුතිඃ.

95 නිෂ්ඨ්‍යූතෝද්ගීර්ණවාන්තාදි ගෞණවෘත්තිව්‍යපාශ්‍රයම්
අතිසුන්දරමන්‍යත්තු * ග්‍රාම්‍යකක්ෂ්‍යාං විගාහතේ.

---

92 ඉදම්, මේ අනන්තරෝක්ත කාව්‍යයතෙම; අත්‍යුක්තමිති, අත්‍යුක්ත යයි; උක්තම්, (තජ්ඥයන් විසින්)කියනලද; එතත්, මේ අනන්තරෝක්තය; ගෞඩොපලාලිතම්, පෞරස්ත්‍යයන්විසින් සෙවුනාලද; ප්‍රාක්ප්‍රණීතන්තු, පළමුකොට (ශාස්ත්‍රාණීත්‍යාදියෙන්)කියනලද; ප්‍රස්ථානම්, ප්‍රකාරය තෙම: අන්‍යස්‍ය වර්ත්මනඃ, වෛදර්භිමාර්ගයාගේ; සාරම්,ජීවිතයයි-මෙබඳුවූ සදය දාක්ෂිණාත්‍යයෝ ප්‍රයොගකෙරෙති යනු භාවයි.

93 අන්‍යධර්මඃ, වස්ත්වන්තරයක්හු සම්බන්ධි වූ ප්‍රසිද්ධ ගුණයතෙම; තතඃ, ඒ මුඛ්‍යවිෂය වූ ධර්මීහු කෙරෙන්; අන්‍යත්‍ර, ගෞණවිෂයෙහි; යත්‍ර, යම් ධර්මයක්හු කෙරෙහි; සම්‍යක්, මනාකොට; ලෝකසීමානුරෝධිනා, ලෝකප්‍රතීතිය අනුවර්තීහු විසින්; ආධීයතෙ, අධ්‍යාරොප කරනුලැබේද; සඃ, හෙතෙම; සමාධිඃ ස්මෘතඃ, සමාධි නමැයි දන්නාලදී; ගෞණශබ්ද ව්‍යාපාරය සමාධි නමැයි සේයි. යථා, හේ මෙසේයි.

94 කුමුදානි, කෙරවයෝ; නිමීලන්ති, නිමෙෂයට පැමිණෙන්නාහ; කමලානි, පද්මයෝ; උන්මිෂන්ති ච, උන්මෙෂය වන්නාහුයි; ඉති, මෙසේ; නෙත්‍රක්‍රියාධ්‍යාසාත්, නයනයාගේ නිමෙෂොන්මෙෂලක්ෂණවූ ධර්මාධ්‍යාරොපය හෙතුකොටගෙන; තද්වාචිනී, ඒ නෙත්‍රක්‍රියාව කියන්නාවූ; ශ්‍රුතිඃ, නිමීලනශ්‍රුතිතොමෝ; ලබ්ධා, සුප්‍රයුක්තයි.

95 නිෂ්ඨ්‍යූතොද්ගීර්ණවාන්තාදි, නිෂ්ඨ්‍යූතය උද්ගීර්ණය උද්වාන්තය යන මේ ආදි වචනයතෙම; ගෞණවෘත්තිව්‍යපාශ්‍රයම්, ගෞණ වූ හෙවත් විෂයාන්තරපරිග්‍රහලක්ෂණ වූ ප්‍රයොග ආශ්‍රය කොට ඇත්තේ; අතිසුන්දරම්, අත්‍යන්තමනොහරයි; අන්‍යත්තු, ගෞණවෘත්ත්‍යව්‍යපාශ්‍රයා භාවයෙන් මුඛ්‍යාර්ථප්‍රතිපාදක වූයේ වනාහි; ග්‍රාම්‍යකක්ෂ්‍යාම්, අසභ්‍යපදවී යට; විගාහතෙ,අවගාහනය කරන්නේය හෙවත් බස්නේයි; මනොහර නොවෙයි සේයි.

---

* මන්‍යත්‍ර-ක.

96 පද්මාන්‍යර්කාංශුනිෂ්ඨ්‍යූතාඃ පීත්වා පාවකවිප්‍රුෂඃ
භූයො වමන්තීව මුඛෛරුද්ගීර්ණාරුණරෙණුභිඃ.

97 ඉති හෘද්‍යමහෘද්‍යන්තු නිෂ්ඨීවති වධූරිති
යුගපන්නෛකධර්මාණමධ්‍යාසශ්ච මතො * යථා.

98 ගුරුගර්භභරාක්ලාන්තාස් † ස්තනන්ත්‍යො මෙඝපඞ්ක්තයඃ
අචලාධිත්‍යකොත්සඞ්ගමිමාස්සමධිශෙරතෙ.

99 උත්සඞ්ගශයනං සඛ්‍යුස්ස්තනනං ගෞරවං ක්ලමඃ
ඉතීහ ‡ ගර්භිණීධර්මා බහවො'න්‍යත්‍ර + දර්ශිතාඃ.

---

96 පද්මානි, පද්මයෝ; අර්කාංශුනිෂ්ඨ්‍යූතාඃ, හිරුරැසින් නගනලද; පාවකවිප්‍රුෂඃ, ගිනිපුපුරු; පීත්වා, බී; භූයඃ, නැවත; උද්ගීර්ණාරුණරෙණුභිඃ, නගනලද ලොහිතපුෂ්පරජස් කරණ කොටගෙන; මුඛෛඃ, ගර්භරූපවූ වදනයෙන්; වමන්තීව, නගන්නවුන් වැන්නෝයි-නිෂ්ඨීවනාදී තෙමේ සචෙතනකර්තෘය ශ්ලෙෂ්මාදි කර්මයි. හේ මුඛ්‍යාර්ථනම් වෙයි. කාව්‍යයෙහි අනුචිතයි.

මේ උදාහරණයෙහි "අර්කාංශුනිෂ්ඨ්‍යූතාඃ" යන්නෙහි අර්කාංශුකර්තෘකයි. "පද්මානි වමන්තීව" යන්නෙහි පද්මකර්තෘකයි. "උද්ගීර්ණාරුණරෙණුභිඃ" යන්නෙහි තන්මුඛකර්තෘකයි. තෙජඃකණරෙණුකර්මකයි. එහෙයින් ගෞණවී වූයේ අතිසුන්දරයි. සචෙතනකර්තෘක වූයේද ගෞණකර්මක විනම් අදූෂ්‍ය මැයි.

97 ඉති, මෙබඳුවූ ගෞණයතෙම; හෘද්‍යම්, මනොහරය; වධූඃ, ස්ත්‍රීතොමෝ; නිෂ්ඨීවති, නගන්නීය; ඉති, මෙබඳුවූ මුඛ්‍යය; අහෘද්‍යම්, මනොඥ නොවේ; යුගපත්, එකවට; නෛකධර්මාණම්, ක්‍රියා ආදිවූ නොයෙක් ධර්මයන්ගේ; අධ්‍යාසශ්ච, ආරොපයද; මතඃ, කැමැතිවනු ලැබේ; යථා, ඒ මෙසේයි.

98 ගුරු, ගුරුවූ; ගර්භභර, ගර්භභාරයෙන්; ආක්ලාන්තාඃ, ග්ලානවූ; ස්තනන්ත්‍යඃ, ක්ලාන්තානුරූපවූ නාද කරන්නාවූ; ඉමා මෙඝපඞ්ක්තයඃ, මේ මෙඝමාලාවෝ; අචලාධිත්‍යකොත්සඞ්ගම්, පර්වතයාගේ උපරිභූමි නමැති අඞ්කය; සමධිශෙරතෙ, පිහිටත්.

99 සඛ්‍යුඃ, කිසි සඛියකගේ; උත්සඞ්ගශයනම්, අඞ්කදෙශයෙහි ශයනය; ස්තනනම්, ආර්තස්වරය; ගෞරවම්, ගර්භයෙන් කරනලද අඞ්ගසාදලක්ෂණවූ ශරීරගුරුත්වය; ක්ලමම ඉති, තත්කෘතවූ ක්ලාන්තිය යන මේ; බහවඃ, බොහෝවූ; ගර්භිණීධර්මාඃ, ගර්භිණීන්ගේ ධර්මයෝ; අන්‍යත්‍ර, ගර්භිණිය කෙරෙන් අන්‍යවූ මෙඝපඞ්ක්තියෙහි පවත්නාහු; ඉහ, මේ අනන්තරොක්ත පද්‍යයෙහි; දර්ශිතාඃ, දක්වනලදහ; අධ්‍යාසිතයහයි සේයි- මෙසෙයින් මේ අනෙකධර්මසමාධියයි දතයුතු.

---

* සම්මතො-ක. † හරක්ලාන්තාඃ-ක. ‡ ඉතිමෙ-ක. + 'ප්‍යත්‍ර-ක.

100 තදේතත්කාව්‍යසර්වස්වං සමාධිර්නාම යෝ ගුණඃ
කවිසාර්ථස්සමග්‍රෝ'පි තමේනමනුගච්ඡති.

101 ඉති මාර්ගද්වයං භින්නං තත්ස්වරූපනිරූපණාත්
තද්භේදාස්තු න ශක්‍යන්තෙ වක්තුං ප්‍රතිකවිස්ථිතාඃ.

102 ඉක්ෂුක්ෂීරගුඩාදීනාං මාධුර්‍ය්‍යස්‍යාන්තරං මහත්
තථාපි න තදාඛ්‍යාතුං සරස්වත්‍යාපි ශක්‍යතෙ.

103 නෛසර්ගිකී ච ප්‍රතිභා ශ්‍රුතඤ්ච බහු නිර්මලම්
අමන්දශ්චාභියෝගෝ'ස්‍යාඃ කාරණං කාව්‍යසම්පදඃ.

---

100 සමාධිර්නාම, (අනන්තරෝක්ත) සමාධිනම්වූ; යෝ ගුණඃ, යම් ධර්මයෙක් ඇද්ද; තදේතත්, ඒ මේ; කාව්‍යසර්වස්වම්, (යථොක්තවූ ගද්‍ය පද්‍ය මිශ්‍රාත්මකවූ) කාව්‍යයාගේ සාරයයැ; (එහෙයින්) සමග්‍රෝ'පි කවිසාර්ථඃ, සියලු කවිජනතෙම; තමේනම්, ඒ මේ සමාධිනම් ගුණය; අනුගච්ඡති; අනුව යන්නේයි; ප්‍රයොගකරන්නේය යිසේයි.

101 ඉති, මෙසේ (යථෝක්ත ප්‍රකාරයෙන්); මාර්ගද්වයම්, වෛදර්භ ගෞඩිය මාර්ග දෙක; තත්ස්වරූපනිරූපණාත්, ඒ මාර්ගද්වයාගේ අවිපරීත ස්වභාවය දැක්වීමෙන්; භින්නම්, අතිව්‍යක්තවූ අන්තර ඇත්තේය; ප්‍රතිකවිස්ථිතාඃ, කවීන්කෙරෙහි පිහිටියාවූ; තද්භේදාස්තු, ඒ මාර්ගද්වයාගේ අවාන්තර ප්‍රකාරයෝ වනාහි; වක්තුම්, ශාකල්‍යයෙන් ප්‍රකාශ කරන්නට; න ශක්‍යන්තෙ, නොපිළිවන්හුයි; අනන්තහෙයින යනු භාවයි.

102 ඉක්ෂුක්ෂීරගුඩාදීනාම්, ඉක්ෂුය ක්ෂීරය ගුඩය යන මේ ආදී මධුර ද්‍රව්‍යයන්ට සාධාරණවූ; මාධුර්‍ය්‍යස්‍ය, මාධුර්‍ය්‍යයාගේ; අන්තරම්, භෙදය හෙම; මහත්, පරිස්ඵුටය; තථාපි, එතකුදු වුවත්; තත්, ඒ අන්තරය; සරස්වත්‍යාපි, වාගධිදෙවතාව විසින්ද; ආඛ්‍යාතුම්, (විභාගයෙන් මේ ද්‍රව්‍යයාගේ මෙබඳු මාධුර්‍ය්‍යයෙකැයි) කියන්නට; න ශක්‍යතෙ, නොපිළිවනී–මෙපරිද්දෙන් ප්‍රතිකවිස්ථිතවූ භෙදයෝද කියන්නට නොපිළිවන්හුයි.

103 නෛසර්ගිකී, (ජන්මාන්තරාභ්‍යාසභාවීහෙයින්) ස්වාභාවිකවූ; ප්‍රතිභා ච, (හෙයොපාදෙයපරිච්ඡෙදලක්ෂණවූ කාව්‍යවිෂයවූ) ප්‍රඥාවද; බහු, (ව්‍යාකරණ ක්‍රියාකල්පවිකල්පඡන්දෝවිචිත්‍යාදි අනෙකවිද්‍යා විෂය කොට ඇතිහෙයින්) පර්‍ය්‍යාප්තවූ සම්පූර්ණවූ; නිර්මලම්, (සන්දෙහ විපර්‍ය්‍යාසවිරහයෙන්) පරිශුද්ධවූ; ශ්‍රුතඤ්ච, (කාව්‍යාඞ්ගවිද්‍යා) ශ්‍රවණයද; අමන්දඃ, අනල්පවූ; අභියොගශ්ච, (උගනාපොහාමුඛයෙන් සද්‍රූපදෙශනොඉක්ම ශ්‍රුතයාගේ අවිපරීතවිනතාවය අභිනිශ්චයය නිශ්චිතාර්ථයාගේ ස්ථිරීකරණලක්ෂණවූ භාවනාදියයි මෙසේ විවිධවූ) අභ්‍යාසයද්‍යයි මෙකී අධ්‍යාත්‍රයතෙම; අස්‍යාඃ කාව්‍යසම්පදඃ, මේ නිරවද්‍යවූ කාව්‍යරචනාවට; කාරණම්, හෙතුයි.

104 න විද්‍යතෙ යද්‍යපි පූර්වවාසනා
ගුණානුබන්ධි ප්‍රතිභානමද්භුතම්
ශ්‍රැතෙන යත්නෙන ච වාගුපාසිතා
ධ්‍රැවං කරොත්‍යෙව කමප්‍යනුග්‍රහම්.

105 තදස්තතන්ද්‍රෛරනිශං සරස්වතී
ක්‍රමා * දුපාස්‍යා ඛලු කීර්ත්තිමීප්සුභිඃ
කෘශෙ කවිත්වෙ'පි කෘතශ්‍රමා ජනා †
විදග්ධගොෂ්ඨීෂු විහර්තුමීශතෙ.

ඉත්‍යාචාර්‍ය්‍යදණ්ඩිනඃ කෘතෞ කාව්‍යාදර්ශෙ

මාර්ගවිභාගො නාම ප්‍රථමඃ පරිච්ඡෙදඃ.

---

104 පූර්වවාසනාගුණ, ජන්මාන්තරාභ්‍යාසයෙන් ආහිතවූ සංස්කාරරූප විශෙෂය; අනුබන්ධි, අපෙක්ෂා කරන්නාවූ; අද්භුතම්, ආශ්චර්‍ය්‍යවූ; ප්‍රතිභානම්, කාව්‍යවිෂයවූ ප්‍රඥාව; යද්‍යපි න විද්‍යතෙ, ඉදින් නැත් නමුදු; ශ්‍රැතෙන, (කාව්‍යාඞ්ගවිද්‍යාවිෂයවූ) ශ්‍රවණයෙන්ද; යත්නෙන ච, අභියොගයෙන්ද; උපාසිතා, (පුරුෂයාවිසින්) සමාරාධිතවූ හෙවත් අභ්‍යස්තවූ; වාක්, (කාව්‍යාඞ්ගක්‍රියාකල්පවිකල්පාදිවිද්‍යාලක්ෂණවූ) වාක්තොමෝ; කමප්‍යනුග්‍රහම්, එක්තරා කාව්‍යරචනාසාමර්ථ්‍යලක්ෂණවූ අනුග්‍රහයක්; ධ්‍රැවම්, අවශ්‍යයෙන්; කරොති එව, (ආරාධනා කරන පුරුෂයාහට) කෙරේමැයි.

105 තත්, එහෙයින් හෙවත් ඒ වාගුපාසනය නිෂ්ඵල නොවන හෙයින්; අස්තතන්ද්‍රෛඃ, අනලසයන්විසින්; අනිශම්, (අභියොගාවිච්ඡෙදය හෙතුකොටගෙන) නිරන්තරයෙන්; ක්‍රමාත්, ශ්‍රැතචින්තනාභාවනානුක්‍රමයෙන්; සරස්වතී, (කාව්‍යාඞ්ගවිද්‍යාලක්ෂණවූ) භාරතීතොමෝ; ඛලු, ඒකාන්තයෙන්; කීර්ත්තිම්, (කාව්‍යක්‍රියාසම්භවවූ අවශෙෂජනාසුලභවූ) ඛ්‍යාතියට; ඊප්සුභිඃ, පැමිණෙනු කැමතියවුන්විසින්; උපාස්‍යා, සමාරාධ්‍යයි හෙවත් අභ්‍යාස කටයුත්තීයි; කවිත්වෙ, (මුක්තකකුලකාදිවූ) කාව්‍යකරණසාමර්ථ්‍යය; කෘශෙපි, මඳකල්හිදු; නොහොත් නැතිකල්හිදු; කෘතශ්‍රමාඃ, කරනලද (අධ්‍යයන) පරිශ්‍රමඇති; ජනාඃ, පුරුෂයෝ; විදග්ධ, කවීන්ගේ; ගොෂ්ඨීෂු, (විද්‍යානමැති රමණීයගේ මණිමෙඛලාශබ්ද හා නූපුරශබ්ද කොලාහලයක් බඳුවූ) කාව්‍යාලාපයෙහි; විහර්තුම්, ඇතුලත්වන්නට; හෙවත් කෙලනට; ඊශතෙ, සමර්ථ වෙත්—අකෘතශ්‍රමයන්ගේ විදග්ධගොෂ්ඨීවිහාරය අපහාසාස්පදය යනු කිවා වෙත්.

---

* ශ්‍රමා-ක. † ජනාඃ කෘතශ්‍රමා-ක.

ද්විතීයඃ පරිච්ඡේදඃ.

1 කාව්‍යශෝභාකරාන් ධර්මානලඞ්කාරාන් ප්‍රචක්ෂතෙ
තෙ චාද්‍යාපි විකල්ප්‍යන්තෙ කස්තාන් කාර්ත්ස්න්‍යෙන වක්ෂ්‍යති.

2 කින්තු බීජං විකල්පානාං පූර්වාචාර්යෛඃ ප්‍රදර්ශිතම්
තදෙව ප්‍රතිසංස්කර්තු * මයමස්මත්පරිශ්‍රමඃ.

3 කාශ්චින්මාර්ගවිභාගාර්ථමුක්තාඃ ප්‍රාගප්‍යලඞ්ක්‍රියාඃ
සාධාරණමලඞ්කාරජාතමන්‍යත් † ප්‍රදර්ශ්‍යතෙ.

4 ස්වභාවාඛ්‍යානමුපමා රූපකං දීපකාවෘතී
ආක්ෂෙපෝ'ර්ථාන්තරන්‍යාසෝ ව්‍යතිරෙකෝ විභාවනා.

---

1 කාව්‍ය, ගද්‍යපද්‍යමිශ්‍රාත්මකවූ කාව්‍යයට; ශෝභාකරාන්, සෞන්දර්‍යය කරන්නාවූ; ධර්මාන්, ගුණයන්; අලඞ්කාරාන්, අලඞ්කාරයනැයි; ප්‍රචක්ෂතෙ, (තජ්ඥයෝ) කියන්නාහ; තෙ ච, ඒ අලඞ්කාරයෝද; අද්‍යාපි, අද දක්වාත්; විකල්ප්‍යන්තෙ, (අභියුක්තයන් විසින්) ප්‍රභෙදකරනු ලැබෙත්; කඃ, කවරෙක්; තාන්, ඒ අලඞ්කාරයන්; කාර්ත්ස්න්‍යෙන, සාකල්‍යයෙන්; වක්ෂ්‍යති, කියන්නේද?

2 කින්තු, එකෙක් මතු; විකල්පානාම්, ජාත්‍යුපමාරූපකාදිවූ අලඞ්කාර ප්‍රභෙදයන්ට; බීජම්, බීජයතෙම හෙවත් ප්‍රතිනියතවූ සකලව්‍යක්තීයෙහි ව්‍යාප්තවූ සාමාන්‍යරූපයතෙම; පූර්වාචාර්යෛඃ, මෙධාවි ශ්‍රමදෙවාදිවූ කාව්‍යලක්ෂණකාරයන්විසින්; ප්‍රදර්ශිතම්, දක්වනලද; තදෙව, ඒ ම; ප්‍රතිසංස්කර්තුම්, ස්ඵුට කොට ස්වරූප කියන්නට; අයම්, මේ; අස්මත්පරිශ්‍රමඃ, අපගේ යත්නය (පවත්නේයි).

3 කාශ්චිත් අලඞ්ක්‍රියාඃ, (ශ්ලෙෂප්‍රසාදාදිවූ) කිසි අලඞ්කාරකෙනෙක්; මාර්ගවිභාගාර්ථම්, වෛදර්භ ගෞඩීය මාර්ගදෙන්නාගේ විවෙක පිණිස; ප්‍රාගපි, පළමුකොටද හෙවත් ප්‍රථම පරිච්ඡේදයෙහි; උක්තාඃ, කියන ලදහ; අන්‍ය, අන්; සාධාරණමලඞ්කාරජාතම්, (වෛදර්භාදි සකලමාර්ගයට) සාමාන්‍යවූ අලඞ්කාරසමූහයතෙම; ප්‍රදර්ශ්‍යතෙ, දක්වනුලැබේ මතු කියන ශ්ලෝක සතරින් වක්ෂ්‍යමාණවූ අලඞ්කාරයෝ උද්දෙශයෙයින් දක්වනු ලැබෙත්.

4 ස්වභාවාඛ්‍යානම්, ස්වභාවොක්තිය; උපමා, උපමාය; රූපකම්, රූපකය; දීපකාවෘත්තී, දීපක ආවෘත්ති දෙදෙනය; ආක්ෂෙපඃ, ආක්ෂෙපය; අර්ථාන්තරන්‍යාසඃ, අර්ථාන්තරන්‍යාසය; ව්‍යතිරෙකඃ, ව්‍යතිරෙකය; විභාවනා, විභාවනාය.

---

* පරිසංස්කර්තු-ක. † මන්‍යත්-ක. මතු-ප.

5 සමාසාතිශයොත්ප්‍රෙක්‍ෂා හෙතුඃ සූක්‍ෂ්මො ලවඃ ක්‍රමඃ
ප්‍රෙයො රසවදූර්ජස්වි පර්‍යායොක්තං සමාහිතම්.

6 උදාත්තාපහ්නුතිශ්ලිෂ්ට * විශෙෂාස්තුල්‍යයොගිතා
විරොධාප්‍රස්තුතස්තොත්‍රෙ ව්‍යාජස්තුතිනිදර්ශනෙ.

7 සහොක්තිඃ පරිවෘත්ත්‍යාශීස්සඞ්කීර්ණමථ භාවිකම්
ඉති වාචාමලඞ්කාරාස්සමාම්නාතා † පූර්වසූරිභිඃ.

8 නානාවස්ථං පදාර්ථානාං රූපං සාක්‍ෂාද්විවෘණ්වතී
ස්වභාවොක්තිශ්ච ජාතිශ්චෙත්‍යාද්‍යා සාලඞ්කෘතිර්යථා.

9 තුණ්ඩෛරාතාම්‍රකුටිලෛඃ පක්‍ෂෛර්හරිතකොමලෛඃ
ත්‍රිවර්ණරාජිභිඃ කණ්ඨෛරෙතෙ මඤ්ජුගිරඃ ශුකාඃ.

---

5 සමාස, සමාසොක්තිය; අතිශය, අතිශයොක්තිය; උත්ප්‍රෙක්‍ෂාඃ, උත්ප්‍රෙක්‍ෂාය යන මොහුය; හෙතුඃ, හෙතුය; සූක්‍ෂ්මඃ, සූක්‍ෂ්මය: ලවඃ, ලවය; ක්‍රමඃ, ක්‍රමය; ප්‍රෙයඃ, ප්‍රෙයස්ය; රසවත්, රසවත්ය; ඌර්ජස්වි, ඌර්ජස්විය; පර්‍යායොක්තම්, පර්‍යායොක්තය; සමාහිතම්, සමාහිතය.

6 උදාත්ත, උදාත්තය; අපහ්නුති, අපහ්නුතිය; ශ්ලිෂ්ට, ශ්ලෙෂය; විශෙෂාඃ, විශෙෂොක්තිය යන මොහුය; තුල්‍යයොගිතා, තුල්‍යයොගිතාය; විරොධාප්‍රස්තුතස්තොත්‍රෙ, විරොධ හා අප්‍රස්තුතස්තුති දෙන්නය; ව්‍යාජස්තුතිනිදර්ශනෙ, ව්‍යාජස්තුති නිදර්ශන දෙන්නය.

7 සහොක්තිඃ, සහොක්තිය; පරිවෘත්ත්‍යාශීඃ, පරිවෘත්ති ආශිස් දෙන්නය; සංකීර්ණම්, සංකීර්ණය; අථ, නැවත; භාවිකම්, භාවිකයයි; ඉති, මෙසේ; වාචාම්, කාව්‍යයන් සම්බන්ධිවූ; අලඞ්කාරාඃ, අලඞ්කාරයෝ; පූර්වසූරිභිඃ, (රාමශර්මප්‍රභෘතිවූ) ආද්‍යාචාර්‍ය්‍යයන් විසින්; සමාම්නාතා, දන්නා ලැබෙත්.

8 පදාර්ථානාම්, (ජාති ක්‍රියා ගුණ ද්‍රව්‍යාත්මකවූ) පදාර්ථයන්ගේ; නානාවස්ථම්, අනෙකප්‍රකාරවූ; රූපම්, ස්වභාවය; සාක්‍ෂාත්, ඉදුරා; විවෘණ්වතී, ප්‍රකාශ කරන්නාවූ; ස්වභාවොක්තිශ්ච, ස්වභාවොක්තිය යන නම්වූද; ජාතිශ්චෙති. ජාතිය යන නම්වූද; ආද්‍යා, (සියලු අලඞ්කාරයන්ට) ප්‍රථමවූ; සාලඞ්කෘතිඃ, ඒ අලඞ්කෘතිතොමෝ; යථා, මෙසේයි.

9 ආතාම්‍රකුටිලෛඃ, රත්ව වක්‍රවූ; තුණ්ඩෛඃ, තුඩින්ද; හරිතකොමලෛඃ, පලාවන්ව මෘදුවූ; පක්‍ෂෛඃ, පියාපයන්ද; ත්‍රිවර්ණරාජිභිඃ, තුන් පැහැරාජි ඇති; කණ්ඨෛඃ, ග්‍රීවායෙන්ද උපලක්‍ෂිතවූ; එතෙ ශුකාඃ, මේ ගිරවු; මඤ්ජුගිරඃ, මනොඥවූ ස්වර ඇත්තෝයි- මෙබඳුවූ උක්තිතොමෝ ශුකජාතිපදාර්ථයාගේ විචිත්‍රවූ ස්වරූපය කියනහෙයින් ජාතිස්වභාවොක්තියයි දතයුතු.

---

* ශ්ලෙෂ-කා, † දර්ශිතාඃ-කා.

10 කලක්වණිතගර්භේණ කණ්ඨේනාඝූර්ණිතේක්ෂණඃ
පාරාපතඃ * පරික්ෂිප්‍ය † රිරංසුශ්චුම්බති ප්‍රියාම්.

11 බධ්නන්නඞ්ගෙෂු රොමාඤ්චං කුර්වන් මනසි නිර්වෘතිම්
නෙත්‍රෙ චාමීලයන්නෙෂ ප්‍රියාස්පර්ශඃ ප්‍රවර්තතෙ.

12 කණ්ඨෙ කාලඃ කරස්ථෙන කපාලෙනෙන්දුශෙඛරඃ
ජටාභිස්ස්නිග්ධතාම්‍රාභිරාවිරාසීද්වෘෂධ්වජඃ.

13 ජාතික්‍රියාගුණද්‍රව්‍යස්වභාවාඛ්‍යානමීදෘශම්
ශාස්ත්‍රෙෂ්වස්‍යෛව සාම්‍රාජ්‍යං කාව්‍යෙෂ්වප්‍යෙතදීප්සිතම්.

14 යථා කථඤ්චිත් සාදෘශ්‍යං යත්‍රොද්භූතම්ප්‍රතීයතෙ
උපමා නාම සා තස්‍යාඃ ප්‍රපඤ්චො'යම්ප්‍රදර්ශ්‍යතෙ ‡.

---

10 රිරංසුඃ, කෙළිප්‍රියවූ; පාරාපතඃ, පරෙවියතෙම; කලක්වණිතගර්භේණ, මනොඥවූ ශබ්දයම ගර්භයෙහි ඇති; කණ්ඨේන, කණ්ඨයෙන් උපලක්ෂිතවූයේ; ආඝූර්ණිතේක්ෂණඃ, බමවනලද ඇස්ඇත්තේ; ප්‍රියාම්, ප්‍රියාව; පරික්ෂිප්‍ය, සිසාරා; චුම්බති, සිඹියි.

මෙහි ක්වණිතාඝූර්ණනාදික්‍රියාපදාර්ථස්වභාවයන් සාක්ෂාද්කථන හෙයින් මේතොමෝ ක්‍රියාස්වභාවොක්ති නමැයි දතයුතු.

11 අඞ්ගෙෂු, ශරීරයෙහි; රොමාඤ්චම්, රොමහර්ෂය, බධ්නන්, බඳනාවූ හෙවත් උපදවන්නාවූ; මනසි, අන්තශ්චිත්තයෙහි; නිර්වෘතිම්, සන්තොෂයක්; කුර්වන්, කරන්නාවූ; නෙත්‍රෙ ච, ලොචනයුග්මයද; ආමීලයන්, පියන්නාවූ; එෂඃ ප්‍රියාස්පර්ශඃ, මේ ප්‍රණයිනීස්පර්ශගුණයතෙම; ප්‍රවර්තතෙ, පවත්නේයි-මෙහි ප්‍රියාස්පර්ශගුණපදාර්ථයගේ රොමාඤ්චකාරිත්වාදිය විචිත්‍ර කොට ප්‍රකාශ කරනහෙයින් මෙබඳුවූයේ ගුණස්වභාවොක්තියයි දතයුතු.

12 කණ්ඨෙ, කණ්ඨයෙහි; කාලඃ, කාලකූටලක්ෂණවූ කළුව ඇති; කරස්ථෙන, හස්තගතවූ; කපාලෙන, භික්ෂාපාත්‍රයෙන්ද; ස්නිග්ධතාම්‍රාභිඃ, මසෘණ රත්වූ; ජටාභිඃ, ජටායෙන්ද උපලක්ෂිතවූ; ඉන්දුශෙඛරඃ, අඩ චන්ද්‍රයාම උත්තංසකොට ඇති; වෘෂධ්වජඃ, ඊශ්වරතෙම; ආවිරාසීත්, පහළවී-මෙහි ඊශ්වරාඛ්‍යද්‍රව්‍යයාගේ නානාප්‍රකාරවූ ස්වභාවය කියන ලදහෙයින් මෙබඳුවූයේ ද්‍රව්‍යස්වභාවොක්තියයි දතයුතු.

13 ජාති, ජාතිය; ක්‍රියා, ක්‍රියාය; ගුණ, ගුණය; ද්‍රව්‍ය, ද්‍රව්‍යය යන මොවුන්ගේ; ස්වභාවාඛ්‍යානම්, ස්වභාවකථනය; ඊදෘශම්, මෙබඳු වූයේ දතයුත්තේය; ශාස්ත්‍රෙෂු, ආන්වීක්ෂික්‍යාදි විද්‍යාස්ථානයෙහි; අස්‍යෛව, මේ ස්වභාවාඛ්‍යානයාගේම; සාම්‍රාජ්‍යම්, ප්‍රධානැයැ; එතත්, මේ ස්වභාවාඛ්‍යානයතෙම; කාව්‍යෙෂ්වපි, සර්ගබන්ධාදියෙහිද; ඊප්සිතම්, ඉෂ්ටයි.

14 යත්‍ර, යම් විෂයයෙක්හි; සාදෘශ්‍යම්, (කිසිපදාර්ථයන් දෙන්නක්හු ගේ) සාම්‍යය; යථා කථඤ්චිත්, ගුණාදිවූ කිසියම් ප්‍රකාරයෙකින්; උද්භූතම්,

---

* පාරාවතඃ-ක. † පරිභ්‍රම්‍ය-ක. ‡ නිදර්ශ්‍යතෙ-ක.

15 අම්භොරුහමිවාතාම්‍රං මුග්ධෙ! කරතලං තව
ඉති ධර්මොපමා සාක්‍ෂාත් තුල්‍යධර්මප්‍රදර්ශනාත්.

16 රාජීවමිව තෙ වක්ත්‍රං නෙත්‍රෙ නීලොත්පලෙ ඉව
ඉති * ප්‍රතීයමානෛකධර්මා වස්තූපමෛව සා.

17 ත්වදානනමිවොන්නිද්‍රමරවින්දමභූදිති
සා ප්‍රසිද්ධිවිපර්‍ය්‍යාසාද්විපර්‍ය්‍යාසොපමෙෂ්‍යතෙ.

18 තවානනමිවාම්භොජමම්භොජමිව තෙ මුඛම්
ඉත්‍යන්‍යොන්‍යොපමා සෙයමන්‍යොන්‍යොත්කර්ෂශංසිනී.

---

ව්‍යක්තවූයේ; ප්‍රතීයතෙ, දන්නාලැබේද; සා, ඒ සාදෘශ්‍යඛ්‍යාතිතොමෝ; උපමා නාම, උපමානම් අලඞ්කාරයයි දතයුත්තේය; තස්‍යාඃ, එබඳුවූ ඒ උපමාලඞ්කෘතියගේ; අයං ප්‍රපඤ්චඃ, මේ විචිත්‍ර ප්‍රභෙදයතොම; ප්‍රදර්ශ්‍යතෙ, දක්වනුලැබේ.

15 මුග්ධෙ! බාලාව! තව, තීගේ; කරතලම්, අත්ල; අම්භොරුහමිව, පද්මයක්මෙන්; ආතාම්‍රම්, රතී; ඉති, මෙබඳුවූයේ; සාක්‍ෂාත්, ඉඳුරා; තුල්‍ය ධර්මප්‍රදර්ශනාත්, කරතලාම්භොරුහ දෙන්නාට සමානවූ ආතාම්‍රත්වලක්‍ෂණවූ ගුණයාගේ ප්‍රතිපාදනය හෙතුකොටගෙන; ධර්මොපමා, ධර්මොපමා නම් වන්නීයි.

16 තෙ, තීගේ; වක්ත්‍රම්, මුඛය; රාජීවමිව, පද්මයක් වැන්න; නෙත්‍රෙ, ලොචනමය; නීලොත්පලෙ ඉව, ඉන්දීවරයුග්මයක් වැන්නාහුයි; ඉති, මෙබඳුවූ; ප්‍රතීයමානෛකධර්මා, අව්‍යභිචාරය හෙතුකොටගෙන අර්ථයෙන් ගම්‍යමානවූ උභයසමානකාන්ත්‍යාදිවූ ගුණ ඇති; සා, ඒ උපමාතොමෝ; වස්තූපමා, වස්තූපමානම් වන්නීයි-වස්තූපමායි.

17 උන්නිද්‍රම්, ප්‍රබුද්ධවූ; අරවින්දම්, පද්මයතෙම; ත්වදානනමිව, තීගේ මුඛයමෙන්; අභූත්, වී; ඉති, මෙබඳුවූ; සා, ඒ උපමාතොමෝ; ප්‍රසිද්ධි විපර්‍ය්‍යාසාත්, පද්මය උපමානය මුඛය උපමෙයය යන මේ ප්‍රසිද්ධියට විපර්‍ය්‍යස්තත්වය හෙතුකොටගෙන; විපර්‍ය්‍යාසොපමා, විපර්‍ය්‍යාසොපමායයි; ඉෂ්‍යතෙ, කැමතිවනුලැබේ-විපර්‍ය්‍යාසොපමායි.

18 අම්භොජම්, පද්මයතෙම; තවානනමිව, තීගේ මුඛය වැන්න; තෙ මුඛම්, තීගේ මුඛය: අම්භොජමිව, පද්මයක් වැනි; ඉති, මෙබඳුවූ; සෙයම්, ඒ මේ උපමාතොමෝ; අන්‍යොන්‍යොත්කර්ෂශංසිනී, ඔවුනොවුන් ගේ අතිශය ප්‍රකාශකරන්නී; අන්‍යොන්‍යොපමා, අන්‍යොන්‍යොපමානම් වන්නීයි-අන්‍යොන්‍යොපමායි.

19 ත්වන්මුඛම්, තීගේ මුඛය; කමලෙනෛව, පද්මයක්හා ම; තුල්‍යම්, සමය; අන්‍යෙන කෙනචිත් න (තුල්‍යම්), පද්මව්‍යතිරික්තවූ අනික් කිසිවක්

---

* ඉදං-කා.

19 ත්වන්මුඛං කමලෙනෛව තුල්‍යං නාන්‍යෙන කෙනචිත්
ඉත්‍යන්‍යසාම්‍යව්‍යාවෘත්තෙරියං සා නියමොපමා.

20 පද්මං තාවත්තවාන්වෙති මුඛමන්‍යච්ච තාදෘශම්
අස්ති චෙදස්තු තත්කාරීත්‍යසාවනියමොපමා.

21 සමුච්චයොපමාප්‍යස්ති න කාන්ත්‍යෛව මුඛං තව
හ්ලාදනාඛ්‍යෙන චාන්වෙති කර්මණෙන්දුමිතීදෘශී.

22 ත්වය්‍යෙව ත්වන්මුඛං දෘෂ්ටං දෘශ්‍යතෙ දිවි චන්ද්‍රමාඃ
ඉයත්‍යෙව භිදා නාන්‍යෙත්‍යසාවතිශයොපමා.

23 මය්‍යෙවාස්‍යා මුඛශ්‍රීරිත්‍යලමින්දොර්විකත්ථනෛඃ
පද්මෙ'පි සා යදස්ත්‍යෙවෙත්‍යසාවුත්ප්‍රෙක්ෂිතොපමා.

---

හා සම නොවේ; ඉති, මෙබඳුවූ; සෙයම්, ඒ මේ උපමාතොමෝ; අන්‍ය සාම්‍යව්‍යාවෘත්තෙඃ, පද්මයෙන් පිටත් අනික් කිසි වස්තුවක් හා සාදෘශ්‍ය ව්‍යවච්ඡෙදය හෙතුකොටගෙන; නියමොපමා, නියමොපමානම් වන් නීයි-නියමොපමායි.

20 තව මුඛම්, තීගේ මුඛයතෙම; පද්මම්, පද්මය; අන්වෙති තාවත්, අනුව යන්නේය හෙවත් පද්ම සමානය; තාදෘශම්, පද්මසමවූ; තත්කාරි, ත්වන්මුඛානුකාරිවූ; අන්‍යච්ච, අනික් කිසි වස්තුවෙකුදු; අස්ති චෙත්, ඉදින් ඇත්නම්; අස්තු, වේවා; ඉති, මෙබඳුවූ; අසෞ, මේ උපමාතොමෝ; අනියමොපමා, අනියමොපමානම් වන්නීයි-අනියමොපමායි.

21 තව මුඛම්, තීගේ මුඛයතෙම; කාන්ත්‍යෛව, හුදෙක් සෞම්‍යගුණ යෙන්ම; ඉන්දුම්, චන්ද්‍රයා; නාන්වෙති, අනු නොවන්නේය; හ්ලාදනාඛ්‍යෙන ච කර්මණා, ප්‍රීණනක්‍රියායෙන්ද; අන්වෙති, අනුවන්නේයි; ඉතීදෘශී, මෙබඳු වූව; සමුච්චයොපමාප්‍යස්ති, සමුච්චයොපමානම් සාදෘශ්‍යාකාරියකුදු ඇති-ක්‍රියාදිවූ කිසි එක්තැනෙක්හි නොයෙක් පදාර්ථයන්ගේ අත්සජිනය සමුච්චය නම් වන්නේය. ඒ සමුච්චයමුඛයෙන් වූ උපමාතොමෝ සමුච්ච යොපමානම් වන්නීයි-සමුච්චයොපමායි.

22 ත්වන්මුඛම්, තීගේ මුඛය; ත්වය්‍යෙව, තීකෙරෙහිම; දෘෂ්ටම්, දක්නා ලද; චන්ද්‍රමාඃ, චන්ද්‍රතෙම; දිවි, ආකාශයෙහි; දෘශ්‍යතෙ, දක්නාලැබෙන් නේයයි; ඉයතී එව, එපමණවූ; භිදා, වෙනසෙක; නාන්‍යෙති, අනික් කිසි භිදාවක් නැතැයි; අසෞ, මෝ; අතිශයොපමා, අතිශයොපමා නම්-අනෙකභෙද ඇතද මෙබඳු අතිශයක්හුගේ විවක්ෂායෙන් පද්ම මුඛ දෙන්නාගේ සාම්‍යකථනයෙන් වූ අතිශයපරත්වය හෙතුකොටගෙන මෝතොමෝ අතිශයොපමානම් වන්නීය යිසේයි-අතිශයොපමායි.

23 අස්‍යාඃ, මැයගේ; මුඛශ්‍රීඃ, වදනකාන්තිතොමෝ; මය්‍යෙව, මා කෙරෙහිම පවත්නීයයි; ඉන්දොඃ, චන්ද්‍රයාගේ; විකත්ථනෛඃ, ශ්ලාඝායෙන්; අලම්, පමණී; යත්, යම්හෙයකින්; සා, ඒ මුඛශ්‍රීතොමෝ; පද්මෙ'පි,

24 යදි කිඤ්චිද්භවෙත් පද්මමුද්භ්‍රු! * විභ්‍රාන්තලොචනම්
තත් තෙ මුඛශ්‍රියං ධත්තාමිත්‍යසාවද්භුතොපමා.

25 ශශීත්‍යුත්ප්‍රෙක්‍ෂ්‍ය තන්වඞ්ගි! ත්වන්මුඛං ත්වන්මුඛාශයා
ඉන්දුමප්‍යනුධාවාමීත්‍යෙෂා මොහොපමා ස්මෘතා.

26 කිං පද්මමන්තර්භ්‍රාන්තාලි කිං වා † ලොලෙක්‍ෂණං මුඛම්
මම දොලායතෙ චිත්තමිතීයං සංශයොපමා.

---

(භුදෙක් චන්ද්‍රයා කෙරෙහි නොවෙයි) පද්මයෙහිදු; අසත්‍යව, ඇත්මය; එහෙයින්ම චන්ද්‍රයාගේ ශ්ලාඝායෙන් පමණයි; අසෞ, මේතොමෝ; උත්ප්‍රෙක්ෂිතොපමා, උත්ප්‍රෙක්ෂිතොපමා නමු-චන්ද්‍රයාකෙරෙහි නැත්තා වූද විකත්ථනය උත්ප්‍රෙක්ෂායෙන් අධ්‍යාසිතකොට චන්ද්‍රයා හා මුඛය සාදෘශ්‍ය කොට කීමෙන් මේ උත්ප්‍රෙක්ෂිතොපමා නමැ යිසේයි-උත්ප්‍රෙක්ෂි තොපමායි.

24 උද්භ්‍රු, උද්ගතවූ බැමඇති; විභ්‍රාන්තලොචනම්, විභ්‍රමත්වූ ඇස් ඇති; කිඤ්චිත් පද්මම්, කිසි පද්මයෙක්; යදි භවෙත්, ඉදින් වේනම්; තත්, ඒ පද්මයතෙම; තෙ, තීගේ; මුඛශ්‍රියම්, වදනකාන්තිය; ධත්තාම්, උසුලා වයි; ඉත්‍යසෞ, මෙබඳුවූ මේතොමෝ; අද්භුතොපමා, අද්භුතොපමායයි දතයුතු-උක්තප්‍රකාරවූ පද්මයක්හුගේ අභාවය හෙතුකොටගෙන අද්භු තොද්භාවනායෙන් මුඛ පද්ම යන දෙන්නාගේ සාදෘශ්‍යකථනයෙන් මේ තොමෝ අද්භුතොපමා නමැ යිසේයි-අද්භුතොපමායි.

25 තන්වඞ්ගි! කෘශවූ ශරීරඇති තැනැත්තිය! ත්වන්මුඛම්, තිගේ මුඛය; ශශීති, චන්ද්‍රයා දොහොයි; උත්ප්‍රෙක්ෂ්‍ය, උත්ප්‍රෙක්ෂා කොට; ත්වන්මුඛාශයා, තීගේ මුඛය දොහෝ යන භ්‍රාන්තියෙන්; ඉන්දුමපි, චන්ද්‍රයා වද; අනුධාවාමි, අනුව දිවෙමි; ඉති, මෙසේ (මොහයෙන් චන්ද්‍ර මුඛ දෙදෙ නාගේ උපමානොපමෙයභාවය ප්‍රතීත වන්නේයයි); එෂා, මෙබඳුවූ මේ උපමාතොමෝ; මොහොපමා ස්මෘතා, මොහොපමායයි දන්නාලදු-මොහොපමායි.

26 අන්තර්භ්‍රාන්තාලි, ඇතුළත්හි බමන භෘඞ්ගයන් ඇති; පද්මං කිම්, පද්මයෙක් දොහෝ; ලොලෙක්ෂණම්, චපලවූ ඇස්ඇති; මුඛං කිං වා, මුඛ යෙක් දොහොයි; මම, මාගේ; චිත්තම්, සිත; දොලායතෙ. දොලාවක් සේ පවත්නේයයි; ඉතීයම්, මෙබඳුවූ මේ උපමාතොමෝ; සංශයොපමා, සංශයාවේශයෙන් පද්ම මුඛ දෙන්නාගේ ඖපම්‍යාවගමය හෙතුකොට ගෙන සංශයොපමා නමු-සංශයොපමායි.

---

* පද්මං සුභ්‍රු-ක. † කිමෙතත්-ක. ප.

27 න පද්මස්‍යෙන්දුනිග්‍රාහ්‍යස්‍යෙන්දුලජ්ජාකරී ද්‍යුතිඃ
අතස්ත්වන්මුඛමෙවෙදමිත්‍යසෞ නිර්ණයොපමා.

28 ශිශිරාංශුප්‍රතිද්වන්ද්වි * ශ්‍රීමත් සුරභිගන්ධි ච
අම්භොජමිව තෙ වක්ත්‍රමිති ශ්ලෙෂොපමා මතා. †

29 සරූපශබ්දවාච්‍යත්වාත් සා සන්තානොපමා ‡ යථා
බාලෙවොද්‍යානමාලෙයං සාලකානනශොභිනී.

30 පද්මං බහුරජශ්චන්ද්‍රඃ ක්ෂයී තාභ්‍යාං තවානනම්
සමානමපිසොත්සෙකමිති නින්දොපමා මතා †.

---

27 ඉන්දුනිග්‍රාහ්‍යස්‍ය. චන්ද්‍රයාවිසින් අභිභවනීයවූ; පද්මස්‍ය, පද්මය හට; ඉන්දුලජ්ජාකරී, චන්ද්‍රයාහට ලජ්ජා කරන්නාවූ; ද්‍යුතිර්න, කාන්තියක් නැත; අතඃ, මෙහෙයින්; ඉදම්, මේතෙම; ත්වන්මුඛමෙව, (පද්මයෙක් නොවෙයි) තිගේ මුඛයමයයි; ඉති, මෙබඳුවූ; අසෞ, මේ තොමෝ; නිර්ණයොපමා, (මේ පද්ම නොවෙයි මුඛයමයයි නිශ්චයෙන් සාදෘශ්‍යාවගතිය හෙතුකොටගෙන සංශයච්ඡෙදයෙන් නිශ්චය කිරීම) නිර්ණයොපමා නම් වන්නීයි-නිර්ණයොපමායි.

28 තෙ වක්ත්‍රම්, තිගේ මුඛයතෙම; අම්භොජමිව, පද්මයක් වැන්නේයි; කෙසේදයත්? ශිශිරාංශුප්‍රතිද්වන්ද්වි, (සමානකාන්තිත්වය හෙතු කොටගෙන) චන්ද්‍රයාහට ප්‍රත්‍යනීකවූ; නොහොත් චන්ද්‍රොදයෙහි සඞ්කොච සෙවනය හෙතුකොටගෙන චන්ද්‍රයාහට ප්‍රතිපක්ෂවූ; ශ්‍රීමත්, කාන්තිමත් වූ; නොහොත් ශ්‍රීදෙවතාවගේ වාසය හෙතුකොටගෙන ශ්‍රීමත්වූ; සුරභිගන්ධි ච, (හෙද) ශොභනවූ සුවඳ ඇත්තාවූද; තෙ, තිගේ; වක්ත්‍රම්, මුඛය; අම්භොජමිව, පද්මයක් වැන්නේයි; ඉති, මෙසේ (ශ්ලෙෂොපාදානයෙන් චන්ද්‍ර වක්ත්‍ර දෙන්නාකෙරෙහි උපමා ප්‍රයොගය හෙතුකොටගෙන); ශ්ලෙෂොපමා, ශ්ලෙෂොපමානමැයි; මතා, දන්නාලදු-ශ්ලෙෂොපමායි.

29 සරූපශබ්දවාච්‍යත්වාත්, සමානවූ ශබ්දයෙන් ප්‍රකාශහෙයින්; සන්තානොපමා, සන්තානොපමානමැයි කියනුලැබෙයි; සා, හෝ තොමෝ; යථා, මෙසේයි; ඉයං උද්‍යානමාලා, මේ උද්‍යානපඞ්ක්තිතොමෝ; බාලෙව, බාලස්ත්‍රියක මෙන්; සාලකානන, සල්වනයෙන් ද්‍යොහෝ නොහොත්; සාලකා, කියඹු සහිතවූ; ආනන, මුඛයෙන්; ශොභිනී, හොබනීයි-සන්තානොපමායි.

30 පද්මම්, පද්මයතෙම; බහුරජඃ, බොහෝවූ රේණුඇත්තේ ද්‍යෝහෝ නොහොත් බොහෝ දොෂ ඇත්තේය; චන්ද්‍රඃ, චන්ද්‍රතෙම; ක්ෂයී, අපචය ඇත්තේය; තවානනම්, තිගේ මුඛය; තාභ්‍යාම්, ඒ පද්ම චන්ද්‍ර

---

* ප්‍රතිස්පර්ධි-ක. † සම්මතා-ක. ‡ සමානොපමා-ක.

31 බ්‍රහ්මණෝ'ප්‍යුද්භවඃ පද්මශ්චන්ද්‍රශ්ශම්භුශිරොධෘතඃ
තෞ තුල්‍යෞ ත්වන්මුඛෙනෙති සා ප්‍රශංසොපමොච්‍යතෙ.

32 චන්ද්‍රෙණ ත්වන්මුඛං තුල්‍යමිත්‍යාචිඛ්‍යාසු මෙ මනඃ
ස ගුණෝ වාස්තු දෝෂෝ වෙත්‍යාචිඛ්‍යාසොපමාං විදුඃ.*

33 ශතපත්‍රං ශරච්චන්ද්‍රස්ත්වදානනමිති ත්‍රයම්
පරස්පරවිරොධීති සා විරොධොපමා මතා.

---

දෙදෙනා හා; සමානමපි, සදෘශවූයේද; සොත්කර්ෂකම්, උත්කර්ෂසහිත යයි; ඉති, මෙබඳු වී; නින්‍දොපමා, නින්‍දොපමායයි; මතා, දන්නාලද- නින්‍දාකරනලද පද්මාදි වස්තු හා විවක්ෂිතවූ උත්කර්ෂඇති මුඛයට උපමාන විධානය හෙතුකොටගෙන මෝතොමෝ නින්‍දොපමා නමැ යිසේයි- නින්‍දොපමායි.

31 පද්මඃ, පද්මයතෙම; බ්‍රහ්මණෝ'පි, බ්‍රහ්මයාහටද; උද්භවඃ, උත්පත්තිස්ථානයැ; චන්ද්‍රඃ, චන්ද්‍රතෙම; ශම්භු, ඊශ්වරයාගේ; ශිරොධෘතඃ, මෞලියෙන් ධරනලද; තෞ, ඒ ශ්ලාඝනීයවූ පද්ම චන්ද්‍ර දෙදෙනා; ත්වන් මුඛෙන, තිගේ මුඛය හා; තුල්‍යෞ, සදෘශයහයි; ඉති, මෙබඳුවූ යම් උපමා වක් ඇද්ද; සා, හෝ තොමෝ; ප්‍රශංසොපමා, ප්‍රශංසොපමා නමැයි; උච්‍යතෙ, කියනුලැබේ-උක්තප්‍රකාරයෙන් ප්‍රශංසාස්පදවූ පද්ම චන්ද්‍ර දෙන්නා හා මුඛයාගේ උපමානකරණය හෙතුකොටගෙන මෝතොමෝ ප්‍රශංසොපමා නම් වන්නීය යිසේයි-ප්‍රශංසොපමායි.

32 ත්වන්මුඛම්, තිගේ මුඛය; චන්ද්‍රෙණ, චන්ද්‍රයා හා; තුල්‍යමිති, සදෘශයයි; මෙ මනඃ, මාගේ චිත්තය; ආචිඛ්‍යාසු, කියපියැ; සඃ, ඒ තුල්‍ය වාදයතෙම; ගුණෝ වාස්තු, උචිත හෝ වේවයි; දෝෂො වා (අස්තු), අනුචිත හෝ වේවයි; ඉති, මෙබඳුවූ උපමාව; ආචිඛ්‍යාසොපමාම්, ආචිඛ්‍යා සොපමායයි; විදුඃ, දනිත්- උක්තප්‍රකාරයෙන් ආචිඛ්‍යාසාමුඛයෙන් චන්ද්‍රයා හා මුඛයාගේ සාදෘශ්‍යකථනයෙන් මේ ආචිඛ්‍යාසොපමාය යිසේයි-ආචිඛ්‍යා සොපමායි.

33 ශතපත්‍රම්, පද්මයැ; ශරච්චන්ද්‍රඃ, ශරත්කල්හි චන්ද්‍රයැ; ත්වදානනමිති, තිගේ මුඛයයි; ත්‍රයම්, තුන; පරස්පරවිරොධි, (කාන්ත්‍යාදිගුණවිශෙෂ යොගයෙන් සමානගුණහෙයින්) අන්‍යොන්‍යවෛරීයයි; ඉති, මෙබඳුවූ යම් උපමාවක් ඇද්ද; සා, යෝතොමෝ; විරොධොපමා මතා, (විරො ධොද්භාවනායෙන් සාදෘශ්‍යකථනය හෙතුකොටගෙන) විරොධොපමා නම් වන්නීයි-විරොධොපමායි,

---

* සොපමෙත්‍යන්‍යෙ-පා.

34 න ජාතු ශක්තිරින්දොස්තෙ මුඛෙන ප්‍රතිගර්ජිතුම්
කලඞ්කිනො ජඩස්‍යෙති ප්‍රතිෂෙධොපමෛව සා.

35 මෘගෙක්ෂණාඞ්කං තෙ වක්ත්‍රං මෘගෙණෛවාඞ්කිතශ්ශශී
තථාපි සම එවාසෞ නොත්කර්ෂීති චටූපමා.

36 න පද්මං මුඛමෙවෙදං න භෘඞ්ගෞ චක්ෂුෂී ඉමෙ
ඉති විස්පෂ්ටසාදෘශ්‍යාත් තත්ත්වාඛ්‍යානොපමෛව සා.

37 චන්ද්‍රාරවින්දයොඃ කක්ෂ්‍යා * මතික්‍රම්‍ය මුඛං තව
ආත්මනෛවාභවත්තුල්‍යමිත්‍යසාධාරණොපමා.

---

34 කලඞ්කිනඃ, ශශකලඞ්ක ඇත්තාවූ දෙ හෝ නොහොත් දොෂ ඇති; ජඩස්‍ය, ශීතලවූ දෙ හෝ නොහොත් අකර්මණ්‍යවූ; ඉන්දොඃ, චන්ද්‍රයාහට; තෙ මුඛෙන, තිගේ මුඛය හා; ප්‍රතිගර්ජිතුම්, ස්පර්ධාකරන්නට; ජාතු, කිසිකලෙක්හි; ශක්තිර්න, පොහොසත්බවෙක් නැතැයි; ඉති, මෙබඳුවූ යම් උපමාවක් ඇද්ද; සා, හෝ තොමෝ; ප්‍රතිෂෙධොපමෛව, ප්‍රතිෂෙධොපමා නම් ම වන්නීයි-උක්තප්‍රකාරයෙන් නිෂෙධවාරයෙන් සාධර්ම්‍යාවගමය හෙතුකොටගෙන මෝතොමෝ ප්‍රතිෂෙධොපමා නම් වේ-ප්‍රතිෂෙධොපමායි.

35 තෙ වක්ත්‍රම්, තිගේ මුඛය; මෘගෙක්ෂණාඞ්කම්, මෘගයාගේ එක දෙශවූ නෙත්‍රයම චිහ්නකොට ඇත්තේය: ශශී, චන්ද්‍රතෙම; මෘගෙණෛව, සියලු මෘගයා විසින්ම; අඞ්කිතඃ, චිහ්නිතය; තථාපි, එතකුදු වුවත්; අසෞ, මේ චන්ද්‍රතෙම; සම එව, සදෘශමය; නොත්කර්ෂී, අතිශයක් නොවෙයි; ඉති, මෙබඳුවූ උපමාතොමෝ; චටූපමා, (ප්‍රියාලාපප්‍රකාරවූ මෙබඳුවූ චාටුවෙන් සාදෘශ්‍යාවගමය හෙතුකොටගෙන) චටූපමානම් වන්නීයි-චටූපමායි.

36 ඉදම්, මේ; පද්මං න, පද්මයෙක් නොවෙයි; මුඛමෙව, මුඛයෙක් මැයි; ඉමෙ, මොහු දෙන්න; න භෘඞ්ගෞ, භෘඞ්ගයෝ දෙන්නෙක් නොවෙති; චක්ෂුෂී, නෙත්‍රයෝ දෙන්නෙකැයි; ඉති, මෙබඳුවූ යම් උපමාවක් ඇද්ද; සා, හෝතොමෝ; විස්පෂ්ටසාදෘශ්‍යාත්, පරිස්ඵුටවූ කාන්ති චලත්වාදිලක්ෂණවූ සාම්‍යය හෙතුකොටගෙන; තත්ත්වාඛ්‍යානොපමෛව, විපර්‍ය්‍යාසනිරාසයෙන් නිශ්චය කිරීම තත්ත්වාඛ්‍යානොපමා නම් වන්නීයි-තත්ත්වාඛ්‍යානොපමායි.

37 තව මුඛම්, තිගේ මුඛයතෙම; චන්ද්‍රාරවින්දයොඃ, චන්ද්‍ර පද්ම දෙන්නාගේ; කක්ෂ්‍යාම්, පදවිය හෙවත් චන්ද්‍ර පද්ම දෙන්නා හා සමබව; අතික්‍රම්‍ය, ඉක්ම; ආත්මනෛව, තමා හා ම; තුල්‍යම් අභවත්, සදෘශ වියයි; ඉති, මෙබඳුවූ උපමාතොමෝ; අසාධාරණොපමා, (අසාධාරණත්වකථනවාරයෙන් සාදෘශ්‍යවූ ප්‍රතීතිය හෙතුකොටගෙන) අසාධාරණොපමා නම් වන්නීයි-අසාධාරණොපමායි.

---

* කාන්ති-ක.

38 සර්වපද්මප්‍රභාසාරස්සමාහෘත ඉව ක්වචිත්
ත්වදානනං විභාතීති තාමභූතොපමාං විදුඃ.

39 චන්ද්‍රබිම්බාදිව විෂං චන්දනාදිව පාවකඃ
පරුෂා වාගිතො වක්ත්‍රාදිත්‍යසම්භාවිතොපමා.

40 චන්දනොදකචන්ද්‍රාංශුචන්ද්‍රකාන්තාදිශීතලඃ
ස්පර්ශස්තවෙත්‍යතිශයං බොධයන්තී බහූපමා.

41 චන්ද්‍රබිම්බාදිවොත්කීර්ණං පද්මගර්භාදිවොද්ධෘතම්
තව තන්වඞ්ගි! වදනමිත්‍යසෞ වික්‍රියොපමා.

---

38 තවානනම්, තීගේ මුඛය; ක්වචිත්, කිසිතැනෙක්හි; සමාහෘතඃ, රැස්කරනලද; සර්වපද්මප්‍රභාසාරඃ ඉව, සියලු පද්මයන්ගේ ප්‍රභාසාරයක් මෙන්; විභාතිති, හොබනේයයි; ඉති, මෙබඳුවූ යම් උපමාවක් ඇද්ද; තාම්, ඒ උපමාව; අභූතොපමාම්, (අවිද්‍යමානවූ පද්මප්‍රභාසාරය හා සාදෘශ්‍යාභිධානය හෙතුකොටගෙන) අභූතොපමායයි; විදුඃ, දනිත්-අභූතොපමායි.

39 චන්ද්‍රබිම්බාත්, (අමෘතමයවූ) චන්ද්‍රමණ්ඩලයෙන්; විෂම්ව, විෂයක් මෙන්ද; චන්දනාත්, (ඒකාන්තශිශිරවූ) චන්දනද්‍රුමයෙකින්; පාවකම්ව, ගින්නක් මෙන්ද; ඉතො වක්ත්‍රාත්, මේ මුඛයෙන්; පරුෂා, නිෂ්ඨුරවූ; වාක්, වාණීතොමෝ (නික්මුනායි); ඉති, මෙබඳුවූ උපමාතොමෝ; අසම්භාවිතොපමා, (අසම්භාවනාභිප්‍රායයෙන් සාරූප්‍යදර්ශනය හෙතුකොට ගෙන) අසම්භාවිතොපමා නම් වන්නීයි-අසම්භාවිතොපමායි.

40 තව, තීගේ; ස්පර්ශඃ, ස්පර්ශයතෙම; චන්දනොදක, චන්දනරසය; චන්ද්‍රාංශු, චන්ද්‍රරශ්මිය; චන්ද්‍රකාන්තාදී, සඳකත්මිණිය යන මේ ආදී සේ; ශීතලම්, සිහිලැයි; ඉති, මෙසේ; අතිශයම්, අතිශයක්ම (ප්‍රියාවගේ ශරීරස්පර්ශය සම්බන්ධවූ උත්කර්ෂය); ප්‍රථයන්ති, ප්‍රකාශකරන්නාවූ මෝ තොමෝ; බහූපමා, (බොහෝදෙනා හා උපමාන කරණය හෙතුකොට ගෙන) බහූපමානම් වන්නීයි-බහූපමායි.

41 තන්වඞ්ගි! කෘශාඞ්ගිය! තව වදනම්, තීගේ මුඛය; චන්ද්‍රබිම්බාත්, චන්ද්‍රමණ්ඩලයෙන්; උත්කීර්ණම්ව, මවා නඟා ගත්තාක් වැන්න; පද්මගර්භාත්, පද්මගර්භයක් ඇතුළතින්; උද්ධෘතම්ව, නිර්මාණමාරයෙන් උත්කීර්ණයක් වැන්නැයි; ඉති, මෙබඳුවූ යම් උපමාවක් ඇද්ද; අසෞ, මෝතොමෝ; වික්‍රියොපමා, (චන්ද්‍රාදිවිකාරවිශෙෂග්‍රහණයෙන් උපමානොපමෙයභාවයාගේ ප්‍රකාශය හෙතුකොටගෙන) වික්‍රියොපමා නම් වන්නීයි-වික්‍රියොපමායි.

42 පූෂ්ණ්‍යාතප ඉවාහ්නීව පූෂා ව්‍යොම්නීව වාසරඃ
වික්‍රමස්ත්වය්‍යධාල්ලක්ෂ්මීමිති මාලොපමාක්‍රමඃ.*

43 වාක්‍යාර්ථෙනෛව වාක්‍යාර්ථඃ කො'පි යද්‍යුපමීයතෙ
ඒකානෙකෙවශබ්දත්වාත් සා වාක්‍යාර්ථොපමා ද්විධා.

44 ත්වදානනමධීරාක්ෂමාවිර්දශනදීධිති
භ්‍රමද්භෘඞ්ගමිවාලක්ෂ්‍යකෙසරං භාති පඞ්කජම්.

45 නලින්‍යා ඉව තන්වඞ්ග්‍යාස්තස්‍යාඃ පද්මමිවානනම්
මයා මධුව්‍රතෙනෙව පායම්පායමරම්‍යත.

46 වස්තු කිඤ්චිදුපන්‍යස්‍ය න්‍යසනාත්තත්සධර්මණඃ
සාම්‍යප්‍රතීතිරස්තීති ප්‍රතිවස්තූපමා යථා.

---

42 පූෂ්ණි, සූර්ය්‍යයා කෙරෙහි; ආතප ඉව, ආතපය මෙන්ද; අහ්නි, දිවසයෙහි; පූෂෙව, සූර්ය්‍යයා මෙන්ද; ව්‍යොම්නි, ආකාශයෙහි; වාසර ඉව, දිවසය මෙන්ද; ත්වයි, තා කෙරෙහි; වික්‍රමඃ, වික්‍රමයතෙම; ලක්ෂ්මීම්, ශ්‍රීය; අධාත්, පිහිටිවී; ඉති, මෙසේ (උපමාවස්තූන්ගේ පූර්වාපරත්වයෙන් ඝටනාව හෙතුකොටගෙන); මාලොපමාක්‍රමඃ, මාලොපමාප්‍රකාරය තෙම (දතයුත්තේයි).

43 කො'පි වාක්‍යාර්ථඃ, කිසි ක්‍රියාකාරකසම්බන්ධවිශෙෂවූ වාක්‍යාර්ථයෙක්; වාක්‍යාර්ථෙනෛව, එබඳුවූ වාක්‍යාර්ථයක්හා ම; යදි, ඉදින්; උපමීයතෙ, සදෘශ කරනුලැබේද; සා, ඒ වාක්‍යාර්ථොපමා තොමෝ; ඒකානෙකෙවශබ්දත්වාත්, එක ඉවශබ්දයක් ඇතිබැවින්ද නොයෙක් ඉවශබ්ද ඇති බැවින්ද; ද්විධා, ද්විප්‍රකාර වන්නීයි.

44 අධීරාක්ෂම්, චපලවූ ඇස් ඇති; ආවිර්දශනදීධිති, පහළවූ දන්තමරීචි ඇති; ත්වදානනම්, තීගේ මුඛයතෙම; භ්‍රමද්භෘඞ්ගම්, බමන භෘඞ්ගයන් ඇති; අලක්ෂ්‍යකෙසරම්, පැනෙන කෙසුරු ඇති; පඞ්කජමිව, පද්මයක් මෙන්; භාති, හොබනේයි–මෝතොමෝ ඒකෙවශබ්දවූ වාක්‍යාර්ථොපමායයි දතයුතු-වාක්‍යාර්ථොපමායි.

45 නලින්‍යා ඉව, නෙළුඹුවිලක් † වැනිවූ; තස්‍යාස්තන්වඞ්ග්‍යාඃ, ඒ කෘශගාත්‍රියගේ; පද්මමිව, කමලයක් වැනිවූ; ආනනම්, මුඛය; මධුව්‍රතෙනෙව, භෘඞ්ගයකු වැනිවූ; මයා, මාවිසින්; පායම්පායම්, බිබී, අරම්‍යත, කෙළීමයි–අනෙකෙවවාක්‍යාර්ථොපමායි.

46 කිඤ්චිද්වස්තු, විවක්ෂිතවූ කිසි පුරුෂාදි වස්තුවක්; උපන්‍යස්‍ය, උපක්ෂිප්ත කොට හෙවත් කියා; තත්සධර්මණඃ, ඒ උපන්‍යස්තවස්තුහු හා

---

* ඉතිමාලොපමා මතා—ක. ඉමාං මාලොපමාං විදුඃ—ප.

† "නෙළුඹුදලියක්" පොත්.

47 නෛකෝ'පි තාදෘශෝ'ද්‍යාපි ජායමානේෂු රාජසු
නනු ද්විතීයෝ නාස්ත්‍යේව පාරිජාතස්‍ය පාදපඃ.

48 අධිකේන සමාහෘත්‍ය * හීනමේකක්‍රියාවිධෞ
යද්බ්‍රුවන්ති ස්මෘතා සේයං තුල්‍යයෝගෝපමා යථා.

49 දිවෝ ජාගර්ති රක්ෂායෛ පුලෝමාරිර්භුවෝ භවාන්
අසුරාස්තේන හන්‍යන්තේ සාවලේපා නෘපාස්ත්වයා †.

---

සමාන වස්තුවක්හුගේ; න්‍යසනාත්, අභිධානය හේතුකොටගෙන; සාම්‍යප්‍රතීතිඃ, ඔවුන් දෙදෙනාගේ සාදෘශ්‍යාවගතිතොමෝ; අස්ති, ඇත්නුයි; (හෝතොමෝ) ප්‍රතිවස්තූපමා, ප්‍රතිවස්තූමානම් වන්නීයි; යථා, ඒ මෙසේයි.

47 ජායමානේෂු, උපදනාවූ; රාජසු, රජදරුවන් කෙරෙහි; අද්‍යාපි, අද දක්වාත්; තාදෘශඃ, තා බඳුවූ; ඒකෝ'පි න, එකරජෙකුදු නැත; (එසේ මැයි.) පාරිජාතස්‍ය, පාරිජාත නම් දිව්‍යවෘක්ෂයට; ද්විතීයඃ, දෙවනුවූ; පාදපඃ, වෘක්ෂයෙක්; නාස්ත්‍යේව'නනු, නැත්තේම වේද?—මෙහි පළමුකොට භූපාලලක්ෂණවූ වස්තුව උපන්‍යස්ත කොට නැවත ඔහු හා සමානගුණ ඇති පාරිජාත නම් වස්තුහුගේ කථනයෙන් සාදෘශ්‍යාවගමනය වූන ගෙයින් මෝතොමෝ ප්‍රතිවස්තූපමා නමු–ප්‍රතිවස්තූපමායි.

48 හීනම්, ජාත්‍යාදියෙන් හීනවූ කිසිවක්හු; අධිකේන, ජාත්‍යාදියෙන් අධිකවූ කිසිවක්හු හා; සමීකෘත්‍ය, සමකොට; ඒකක්‍රියාවිධෞ, එක ක්‍රියාවකගේ සම්පාදනයෙහි; බ්‍රුවන්ති යත්, කියති යන යමෙක් ඇද්ද; සේයම්, හේ මේ උපමාතොමෝ; තුල්‍යයෝගෝපමා ස්මෘතා, තුල්‍යයෝගෝපමා නම් වන්නීයයි දන්නාලදු; යථා, ඒ මෙසේයි.

49 පුලෝමාරිඃ, ශක්‍රතෙම; දිවඃ, සුරලෝකයාගේ; රක්ෂායෛ, රක්ෂාපිණිස; ජාගර්ති, ප්‍රමාදනිද්‍රාවක් නැතිහෙයින් ජාගරණය කරන්නේය; භවාන්, භවත්තෙම; භුවඃ, පෘථිවියගේ; රක්ෂායෛ, රක්ෂාපිණිස; ජාගර්ති, ප්‍රමාදනිද්‍රාපගමයෙන් ජාගරණය කරන්නේය; තේන, ඒ ශක්‍රයා විසින්; සාවලේපාඃ, දර්පසහිතවූ; අසුරාඃ, අසුරයෝ; හන්‍යන්තේ, නසනු ලැබෙති; ත්වයා, තා විසින්; සාවලේපාඃ, එඩිවැඩියාවූ; නෘපාඃ, රජ දරුවෝ; හන්‍යන්තේ, නසනුලැබෙත්–මෙහි අධිකවූ දෙවරාජයා හා තදපේක්ෂායෙන් ජාත්‍යාදිහීනවූ කිසි රජක්හුගේ රක්ෂාදිවූ එකක්‍රියායෝගය සමහෙයින් තද්වාරයෙන් සාම්‍යාවගතිය හේතුකොට මෙබඳු වී තුල්‍යයෝගෝපමායයි දතයුතු–තුල්‍යයෝගෝපමායි.

---

* සමීකෘත්‍ය–ක. † ත්වයා නෘපාඃ–ක.

50 කාන්ත්‍යා චන්ද්‍රමසං ධාම්නා සූර්‍ය්‍යං ධෛර්‍ය්‍යෙණ චාර්ණවම්
රාජන්නනුකරොෂීති සෛෂා හෙතූපමා සම්මතා *.

51 න ලිඞ්ගවචනෙ භින්නෙ න හීනාධිකතාපි වා
උපමාදූෂණායාලං යත්‍රොද්වෙගො න ධීමතාම්.

52 ස්ත්‍රීව ගච්ඡති ෂණ්ඪො'යං † වක්ත්‍යෙෂා ස්ත්‍රී පුමානිව
ප්‍රාණා ඉව ප්‍රියො'යං මෙ විද්‍යා ධනමිවාර්ජිතා.

53 භවානිව මහීපාල! දෙවරාජො විරාජතෙ
අලමංශුමතඃ කක්ෂ්‍යා ‡ මාරොඪුං තෙජසා නෘපඃ.

---

50 රාජන්! රජ! කාන්ත්‍යා, සෞම්‍යගුණයෙන්; චන්ද්‍රමසම්, චන්ද්‍රයාද; ධාම්නා, තෙජසින්; සූර්‍ය්‍යම්, හිරුද; ධෛර්‍ය්‍යෙණ ච, ධීරබැවින්; අර්ණවම්, සාගරයද; අනුකරොෂීති, අනුකරන්නෙහියයි; සෛෂා, ඒ මේ උපමාතොමෝ; හෙතූපමා. හෙතූපමානම් වන්නීයයි; සම්මතා, දන්නාලද්ද-කාන්ත්‍යාදිහෙතූන්ගේ කථනය හෙතුකොටගෙන වූතොමෝ හෙතූපමා නම් වන්නීයි-හෙතූපමායි.

51 යත්‍ර, යම්කිසි විෂයයෙක්හි; ධීමතාම්, කවීන්ට; උද්වෙගො න, අප්‍රීතියක් නැද්ද; තත්‍ර, එසේවූ විෂයයෙහි; ලිඞ්ගවචනෙ, ස්ත්‍රීයාදිලිඞ්ගය එකවචනාදිවචනය යනමොහු; භින්නෙ, විජාතියවූ නමුදු; උපමාදූෂණාය, උපමාවට දූෂණය පිණිස; නාලම්, සමර්ථ නොවන්නාහ; හීනාධිකතාපි වා, උපමාවස්තුහුගේ හීනත්වය හා අධිකත්වයද; (උපමාදූෂණාය) නාලම්, (උපමාවට විරොධය පිණිස) සමර්ථ නොවේ.

52 අයං ෂණ්ඪඃ, මේ ෂණ්ඪකතෙම; ස්ත්‍රීව ගච්ඡති, ස්ත්‍රියක මෙන් යන්නේය; එෂා ස්ත්‍රී, මේ ස්ත්‍රීතොමෝ; පුමානිව, (ප්‍රාගල්භ්‍යයොගය හෙතුකොටගෙන) පුරුෂයක්හු මෙන්; වක්ති, බණින්නීය; අයම්, මේතෙම; මේ, මට; ප්‍රාණා ඉව, ජීවිතයන් මෙන්; ප්‍රියඃ, ඉෂ්ටයැ; විද්‍යාඃ, ව්‍යාකරණාදිවූ විද්‍යාවෝ; ධනමිව, ධනයක් මෙන්; අර්ජිතාඃ, රැස්කරනලදහුයි-මෙහි පූර්වාර්ධයෙහි උපමානොපමෙය දෙන්නාගේ ලිඞ්ගනානාත්වය දක්වනලද, අපරාර්ධයෙහි වචනභෙදය දක්වනලදී, එහෙයින් මෙබඳු විෂයයෙහි ලිඞ්ගභෙද වචනභෙද දෙන්නා රසාවහත්වය කරත් මුත් උපමා දූෂණය නොකරන්නාහුයයි දතයුතු.

53 මහීපාල! රජ! දෙවරාජඃ, ශක්‍රතෙම; භවානිව, තා මෙන්; විරාජතෙ, හොබනේය; නෘපඃ, රජතෙම; තෙජසා, තෙජස හෙතුකොටගෙන; අංශුමතඃ, සූර්‍ය්‍යයාගේ; කක්ෂ්‍යාම්; පදවියට; ආරොඪුම්, නැඟෙන්නට; අලම්, පොහොසති-මෙහි පූර්වාර්ධයෙන් හීනවූ රජහු හා අධිකවූ ශක්‍රතෙම උපමා කරනලද; අපරාර්ධයෙහි අධිකවූ සූර්‍ය්‍යයා හා හීනවූ රජතෙම උපමා කරනලදී; මෙබඳු වූයේ ද ධීමතුන්ට ප්‍රීතිජනනය කරනහෙයින් අත්‍යර්ථයෙන් ශොභනයයි දතයුතු-මෙ මැ අනන්තරශ්ලොකයෙන් දක්වත්.

---

* මතා-ක. † ෂණ්ඩො'යං-ක. ‡ කක්ෂා-ක.

54 ඉත්‍යෙවමාදි * සෞභාග්‍යං න ජහාත්‍යෙව ජාතුචිත්
අස්ත්‍යෙව ක්වචිදුද්‍රෙකඃ ප්‍රයොගෙ වාග්විදං යථා.

55 හංසීව ධවලශ්චන්ද්‍රස්සරාංසීවාමලං නභඃ
භර්තෘභක්තා භටශ්ශ්වෙව ඛද්‍යොතො භාති භානුවත්.

56 ඊදෘශං වර්ජ්‍යතෙ සද්භිඃ කාරණං තත්‍ර † චින්ත්‍යතාම්
ගුණදොෂවිචාරාය ස්වයමෙව මනීෂිභිඃ.

57 ඉවවද්වායථාශබ්දාස්සමානනිභසන්නිභාඃ
තුල්‍යසඞ්කාශනීකාශප්‍රකාශප්‍රතිරූපකාඃ.

---

54 ඉත්‍යෙවමාදි, අනන්තරොක්තවූ මේ ලිඞ්ගවිජාත්‍යාදියතෙම; ජාතුචිත්, කිසිකලෙක්හිම; සෞභාග්‍යම්, සුභගත්වය; න ජහාත්‍යෙව, නො හරින්නේමය; ක්වචිත් ප්‍රයොගෙ, කිසි ප්‍රයොගයෙක්හි; වාග්විදම්, ශබ්ද තත්වය දන්නා කවීන්ට; උද්‍රෙකඃ, විමුඛත්වයතෙම; අස්ත්‍යෙව, ඇත්මැයි; යථා, හේ මෙසේයි.

55 චන්ද්‍රඃ, චන්ද්‍රතෙම; හංසීව, හංසවධූවකමෙන්; ධවලඃ, සුදුය; නභඃ, ආකාශයතෙම; සරාංසීව, විලුත් මෙන්; අමලම්, නිර්මලය; භර්තෘභක්තඃ, ස්වාමිහුකෙරෙහි ආදරඇති; භටඃ, සෙවකතෙම; ශ්වෙව, බල්ලකු වැන්න; ඛද්‍යොතඃ, කණමැදිරි; භානුවත්, සූර්‍ය්‍යයා මෙන්; භාති, හොබනේයි-මෙහි "හංසීව ධවලශ්චන්ද්‍රඃ" යන්නෙන් ලිඞ්ගභෙදයද, "සරාංසීවාමලං නභඃ" යන්නෙන් වචනභෙදයද, "භර්තෘභක්තා භටශ්ශ්වෙව" යන්නෙන් ජාත්‍යාදිහීනයාගේ අධිකයා හා උපමානවිධානයද, "ඛද්‍යොතො භාති භානුවත්" යන්නෙන් ජාත්‍යධිකයා හා හීනයාගේ උපමානකරණයද දක්වනලදි. ඉක්බිති ශ්ලොකාර්ධයෙන් මෙබඳු වූයේ ග්‍රාහ්‍ය නොවන්නේයයි දක්වත්.

56 සද්භිඃ, ඖචිත්‍යාභිඥවූ කවීන්විසින්; ඊදෘශම්, මෙබඳු වූයේ; වර්ජ්‍යතෙ, හරනාලැබෙයි; තත්‍ර, මෙබඳු වූවහුගේ පරිත්‍යාගයෙහි; කාරණම්, හෙතුතෙම (හෙවත් උද්වෙගානුද්වෙගස්වරූප කාරණය; ගුණදොෂවිචාරාය; ගුණදොෂවිමර්ශය පිණිස; මනීෂිභිඃ, ස්ථානොචිතබුද්ධි ඇති කවීන්විසින්; ස්වයමෙව, තමන්විසින්ම; ‡) චින්ත්‍යතාම්, සිතනු ලැබේවා.

මෙයින් මතු ඉවශබ්දයා සේ උපමාසූචකවූ ශබ්දයෝ දක්වනුලැබෙත්.

57 ඉවවද්වායථා, ඉවය වත්ය වාය යථාය යන; ශබ්දාඃ, ශබ්දයෝද; සමානනිභසන්නිභාඃ, සමානය නිභය සන්නිභය යන ශබ්දයෝද; තුල්‍යසඞ්කාශනීකාශප්‍රකාශප්‍රතිරූපකාඃ, තුල්‍යය සඞ්කාශය නීකාශය ප්‍රකාශය ප්‍රතිරූපකය යන ශබ්දයෝද-

---

* මාදෘශ-ක. † තස්‍ය-ප. ‡ සන්නයෙහි ඌනයි.

58 ප්‍රතිපක්ෂප්‍රතිවන්විප්‍රත්‍යනීකවිරොධිනඃ
සදෘක්සදෘශසංවාදිසජාතීයානුවාදිනඃ.

59 ප්‍රතිබිම්බප්‍රතිච්ඡන්දසරූපසමසම්මිතාඃ
සලක්ෂණසදෘක්ෂාභසපක්ෂොපමිතොපමාඃ.

60 කල්පදෙශීයදෙශ්‍යාදිඃ ප්‍රඛ්‍යප්‍රතිනිධී අපි
සවර්ණතුලිතෞ ශබ්දෞ යෙ චාන්‍යූනාර්ථවාදිනඃ.

61 සමාසශ්ච බහුව්‍රීහිශ්ශශාඞ්කවදනාදිෂු
ස්පර්ධතෙ ජයති ද්වෙෂ්ටි ද්‍රුහ්‍යති ප්‍රතිගර්ජති.

62 ආක්‍රොශත්‍යවජානාති කදර්ථයති නින්දති
විඩම්බයති සංරුන්ධෙ * හසතීර්ෂ්‍යත්‍යසූයති.

63 තස්‍ය මුෂ්ණාති සෞභාග්‍යං තස්‍ය කාන්තිං විලුම්පති
තෙන සාර්ධං විගෘහ්ණාති තුලාං තෙනාධිරොහති.

---

58 ප්‍රතිපක්ෂප්‍රතිවන්විප්‍රත්‍යනීකවිරොධිනඃ, ප්‍රතිපක්ෂය ප්‍රතිවන්විය ප්‍රත්‍යනීකය විරොධින්ය යන ශබ්දයෝද; සදෘක්සදෘශසංවාදිසජාතීයානුවාදිනඃ, සදෘක්ය සදෘශය සංවාදින්ය සජාතීයය අනුවාදින්ය යන මේ ශබ්දයෝද–

59 ප්‍රතිබිම්බප්‍රතිච්ඡන්දසරූපසමසම්මිතාඃ, ප්‍රතිබිම්බය ප්‍රතිච්ඡන්දය සරූපය සමය සම්මිතය යන මේ ශබ්දයෝද; සලක්ෂණසදෘක්ෂාභසපක්ෂොපමිතොපමාඃ, සලක්ෂණය සදෘක්ෂය ආභය සපක්ෂය උපමිතය උපමාය යන මේ ශබ්දයෝද–

60 කල්පදෙශීයදෙශ්‍යාදිඃ, කල්පය දෙශීයය දෙශ්‍යය යනාදි ප්‍රත්‍යයද; ප්‍රඛ්‍යප්‍රතිනිධී අපි, ප්‍රඛ්‍යය ප්‍රතිනිධිය යන මේ ශබ්දයෝ දෙදෙනද; සවර්ණතුලිතෞ ශබ්දෞ, සවර්ණය තුලිතය යන ශබ්දයෝ දෙදෙනද; යෙ චාන්‍යූනාර්ථවාචිනඃ, යම් සාදෘශ්‍යාර්ථවාචිවූ ශබ්දකෙනෙක් ඇද්ද ඔහුද–

61 ශශාඞ්කවදනාදිෂු, චන්ද්‍රවදනය යන මේ ආදිතන්හි; බහුව්‍රීහිස්සමාසශ්ච, අන්‍යපදාර්ථසමාසයද; ස්පර්ධතෙ, ස්පර්ධා කරන්නේය; ජයති, දිනන්නේය; ද්වෙෂ්ටි, ද්වෙෂ කරන්නේය; ද්‍රුහ්‍යති, ද්‍රොහ කරන්නේය; ප්‍රතිගර්ජති, ප්‍රතිගර්ජනය කරන්නේය–

62 ආක්‍රොශති, ආක්‍රොශ කරන්නේය; අවජානාති, අවඥා කරන්නේය; කදර්ථයති, ගර්හා කරන්නේය; නින්දති, නින්දා කරන්නේය; විඩම්බයති, විඩම්බනා කරන්නේය; සංරුන්ධෙ, වලකන්නේය; හසති, හාස කරන්නේය; ඊර්ෂ්‍යති, ඊර්ෂ්‍යා කරන්නේය; අසූයති, අසූයා කරන්නේය–

63 තස්‍ය, ඔහුගේ; සෞභාග්‍යම්, සුභගත්වය; මුෂ්ණාති, පැහැර ගන්නේය; තස්‍ය, ඔහුගේ; කාන්තිම්, සෞම්‍යතාව; විලුම්පති, නසන්

---

* සන්ධතෙ-ක.

64 තත්පදව්‍යාං පදං ධත්තෙ තස්‍ය කක්‍ෂ්‍යාං විගාහතෙ
තමන්වෙත්‍යනුබධ්නාති තච්ඡීලං තන්නිෂෙධති.

65 තස්‍ය චානුකරොතීති ශබ්දාඃ සාදෘශ්‍යසූචිනඃ *
(උපමායාමිමෙ ප්‍රොක්තාඃ කවීනාං බුද්ධිසෞඛ්‍යදාඃ.) †

ඉත්‍යුපමාචක්‍රම්.

66 උපමෛව තිරොභූතභෙදා රූපකමිෂ්‍යතෙ ‡
යථා බාහුලතා, පාණිපද්මං, චරණපල්ලවම්.

67 අඞ්ගුල්‍යඃ පල්ලවාන්‍යාසන් කුසුමානි නඛාර්චිෂඃ
බාහූ ලතෙ වසන්තශ්‍රීස්ත්වං නඃ ප්‍රත්‍යක්‍ෂචාරිණී.

---

න්නේය; තෙන සාර්ධම්, ඔහු හා එක්ව; විගෘහ්ණාති, කලහ කරන්නේය; තෙන, ඔහු හා; තුලාම්, තුලාවට හෙවත් සාදෘශ්‍යයට; අධිරොහති, නැඟෙන්නේය–

64 තත්පදව්‍යාම්, ඔහුගේ පදවියෙහි; පදං ධත්තෙ, පදන්‍යාසය කරන්නේය; තස්‍ය, ඔහුගේ; කක්‍ෂ්‍යාම්, පදවියට; විගාහතෙ, බස්නේය; තම්, ඔහු; අන්වෙති, අනුවෙයි; තච්ඡීලම්, ඔහුගේ ස්වභාවය; අනුබධ්නාති, අනුබඳනේය; තම්, ඔහු; නිෂෙධති; වළකන්නේය–

65 තස්‍ය, ඔහු සම්බන්ධව; අනුකරොතීති ච, අනුකරන්නේයයිද යන මේ; ශබ්දාඃ, ශබ්දයෝ; සාදෘශ්‍යසූචිනඃ, උපමා උපමෙය දෙදෙනාගේ සාම්‍යය ප්‍රකාශ කරන්නාහුයි; (ඉමෙ, යථොක්ත ඉවාදිවූ මේ ශබ්දයෝ; උපමායාම්, උපමාවිෂයයෙහි; කවීනාම්, කවීන්ගේ; බුද්ධිසෞඛ්‍යදාඃ, බුද්ධියට සුව දෙන්නාහයි; ප්‍රොක්තාඃ, කියනලදහ +.)

66 උපමෛව, යථොක්තලක්‍ෂණවූ උපමා මැ; තිරොභූතභෙදා, අප්‍රකටවූ උපමාඋපමෙයයන්ගේ නානාත්ව ඇත්තී; රූපකමිෂ්‍යතෙ, රූපකාලඞ්කාරයයි කැමැතිවනුලැබේ; යථා, මෙසේයි; බාහුලතා, හස්ත නමැති ලියය; පාණිපද්මම්, හස්තතලනමැති පියුමය; චරණපල්ලවම්, පාදනමැති පලුපතයි–මේ අලඞ්කාරයෙහි උපමාන උපමෙය දෙදෙනාගේ අභෙදාරොපණය කෙරේනුයි රූපක නමැ: මෙහි බාහුප්‍රභෘති ශබ්දයෝ ලතාදීන් හා අභෙදය හෙතුකොටගෙන රූපකයහයි දතයුතු.

67 අඞ්ගුල්‍යඃ, අඞ්ගුලීහු; පල්ලවානි ආසන්, පලුපත් වූහ; නඛාර්චිෂඃ, නඛශොභාවෝ; කුසුමානි ආසන්, පුෂ්පවූහ; බාහූ, බාහුහු දෙදෙන; ** ලතෙ, ලතා වූහ; (එහෙයින්); ත්වම්, තෝ; නඃ, අපට; ප්‍රත්‍යක්‍ෂචාරිණී, ප්‍රත්‍යක්‍ෂව ඇවිදිනාවූ; වසන්තශ්‍රීඃ, වසන්තලක්‍ෂ්මියෙහි.

---

* සූචකාඃ–ක. වාචිනඃ–ප.

† "උපමායාමිමෙ ඉත්‍යාද්‍යර්ධං න සර්වත්‍ර පුස්තකෙෂු දෘශ්‍යතෙ"
මාලින්‍යප්‍රොඤ්ජනී.

‡ "මුච්‍යතෙ"–ක. + සන්නයෙහි නොමැතියි. ** බාහුවයෝ–පෙ.ත්.

69 ඉත්‍යාඛණ්ඩසමස්තාඛ්‍යං සමස්තං පූර්වරූපකම්
ස්මිතං මුඛෙන්දෝර්ජ්‍යොත්ස්නෙති සමස්තව්‍යස්තරූපකම්.

69 තාම්‍රාඞ්ගුලිදලශ්‍රෙණි නඛදීධිතිකෙසරම්
ධ්‍රියතෙ මූර්ධ්නි භූපාලෛර්භවච්චරණපඞ්කජම්.

70 අඞ්ගුල්‍යාදෞ දලාදිත්වං, පාදෙ චාරොප්‍ය පද්මතාම්
තද්යොග්‍යස්ථානවින්‍යාසාදෙතත් සකලරූපකම්.

71 අකස්මාදෙව තෙ චණ්ඩි! ස්ඵුරිතාධරපල්ලවම්
මුඛං මුක්තාරුචො ධත්තෙ ඝර්මාම්භඃකණමඤ්ජරීඃ.

72 මඤ්ජරීකෘත්‍ය ඝර්මාම්භඃ, පල්ලවීකෘත්‍ය චාධරම්
නාන්‍යථාකෘතමිත්‍යස්‍යමතො'වයවරූපකම්.

---

68 ඉත්‍යතත්, මෙබඳුවූ රූපකය; අසමස්තාඛ්‍යම්, අසමස්ත නමැ; පූර්වරූපකම්, පළමුකොට දක්වනලද "බාහුලතා" යන මේ ආදිවූ රූපකය තෙම; සමස්තම්, සමස්ත නමැ; ස්මිතම්, ස්මිතයතෙම; මුඛෙන්දොඃ, මුඛචන්ද්‍රයාගේ; ජ්‍යොත්ස්නෙති, සඳරැස යන මේ; සමස්තව්‍යස්තරූපකම්, ("මුඛෙන්දොඃ" කියා සමස්ත කළහෙයින්ද "ස්මිතං ජ්‍යොත්ස්නා"යි ව්‍යස්ත කළහෙයින්ද) සමස්තව්‍යස්තරූපක නම්-සමස්තව්‍යස්තරූපකයි;

69 තාම්‍රාඞ්ගුලි, රත්වූ ඇඟිලි නමැති; දලශ්‍රෙණී, පත්‍රපඞ්ක්තිඇති. නඛදීධිති, නඛරශ්මි නමැති; කෙසරම්, කෙසුරුඇති; භවච්චරණ පඞ්කජම්, තොපගේ පාදනමැති පද්මය; භූපාලෛඃ, රජදරුවන්විසින්; මූර්ධ්නි, සිරස්හි ලා; ධ්‍රියතෙ, ධරනුලැබේ.

70 අඞ්ගුල්‍යාදෞ, අඞ්ගුලිආදියෙහි; දලාදිත්වම්, පත්‍රාදිභාවයද; පාදෙ, පාදයෙහි; පද්මතාඤ්ච, පද්මභාවයද; ආරොප්‍ය, ආරොපණය කොට; තද්යොග්‍ය, එබඳුවූ පද්මයට උචිතවූ: ස්ථානවින්‍යාසාත්, (රජදරුවන්ගේ ශිරොලක්ෂණවූ) ස්ථානයෙහි නිවෙශය හෙතුකොටගෙන; එතත්, මේ අනන්තරොක්තවූ රූපකය: සකලරූපකම්, සකලරූපක නම්-සකල රූපකයි.

71 චණ්ඩි! කිපෙනසුලු තැනැත්තිය! තෙ, තිගේ; ස්ඵුරිතාධර පල්ලවම්, කොපයෙන් වෙවුලන්නාවූ අධර නමැති පල්ලවඇති; මුඛම්, වක්ත්‍රය; මුක්තාරුචඃ, මුක්තාවකට බඳුවූ ශොභාඇති; ඝර්මාම්භඃකණ, ප්‍රණයකොපයෙන් උපන්නාවූ ස්වෙදබින්දු නමැති; මඤ්ජරීඃ, කුසුමස්තබකයන්; අකස්මාදෙව, නිෂ්කාරණයෙහිම; ධත්තෙ, උසුලා.

72 අත්‍ර, මේ ප්‍රයොගයෙහි ලා; ඝර්මාම්භඃ, ස්වෙදජලය; මඤ්ජරීකෘත්‍ය, පුෂ්පස්තබකභාවයෙන් කල්පනා කොට; අධරම්, මුඛයාගේ එක දෙශවූ අධරයද; පල්ලවීකෘත්‍ය, පල්ලවභාවයෙන් රූපිත කොට; ආස්‍යම්, අඞ්ගීවූ මුඛය; නාන්‍යථාකෘතම්, අන්‍යථාභාවයෙන් කරනලද්දේ නොවේ;

73 වල්ගිතභ්‍රු ගලද්ඝර්මජලමාලොහිතෙක්ෂණම්
විවෘණොති මදාවස්ථාමිදං වදනපඞ්කජම්.

74 අවිකෘත්‍ය මුඛාඞ්ගානි මුඛමෙවාරවින්දතාම්
ආසීද්ගමිතමත්‍රෙදමතො'වයවිරූපකම්.

75 මදපාටලගණ්ඩෙන රක්තනෙත්‍රොත්පලෙන තෙ
මුඛෙන මුග්ධෙසො'ප්‍යෙෂ ජනො රාගමයඃ කෘතඃ.

76 එකාඞ්ගරූපකඤ්චෛතදෙවං ද්විප්‍රභෘතීන්‍යපි
අඞ්ගානි රූපයන්ත්‍යත්‍ර යොගායොගෞ භිදාකරෞ.

77 ස්මිතපුෂ්පොජ්ජ්වලං ලොලනෙත්‍රභෘඞ්ගමිදං මුඛම්
ඉති පුෂ්පද්විරෙඵාණං සඞ්ගත්‍යා යුක්තරූපකම්.

---

හෙවත් පද්මාදිත්වයෙන් රූපිත නොවෙයි; අතඃ, මෙහෙයින්; අවයව රූපකම්, (අවයවිවූ මුඛයාගේ රූපණය නොකොට අවයවවූ අධරාදීන්ගේ රූපණය කළහෙයින්) අවයවරූපක නම් වේ.

73 වල්ගිතභ්‍රු, නැඟනලද්දාවූ බැමඇති; ගලද් ඝර්මජලම්, වැහෙන්නාවූ ස්වෙදජලඇති; ආලොහිතෙක්ෂණම්, රත්වූ ඇස්ඇති; ඉදං වදනපඞ්කජම්, මේ මුඛ නමැති පද්මය; මදාවස්ථාම්, මද්‍යපානයෙන් ජනිතවූ මදයාගේ අවස්ථාව; විවෘණොති, ප්‍රකාශ කෙරේ.

74 අත්‍ර, මේ ප්‍රයොගයෙහි ලා; මුඛාඞ්ගානි, අඞ්ගිවූ මුඛයාගේ නෙත්‍රාදිවූ අවයවයන්; අවිකෘත්‍ය, රූපිත නොකොට; මුඛමෙව, අඞ්ගිවූ මුඛයම; අරවින්දතාම්, පද්මබවට; ගමිතමාසීත්, පමුණුවනලද්දේ විය හෙවත් පද්මත්වයෙන් රූපිතය; අතඃ, මෙහෙයින්: ඉදම්, මේ අනන්තරොක්තවූ රූපකය; අවයවිරූපකම්, අවයවිරූපක නම්–අවයවිරූපකයි.

75 මුග්ධෙ! බාලාව! මදපාටලගණ්ඩෙන, මදයෙන් රත්වූ කපොල ඇති; රක්ත, රත්වූ; නෙත්‍රොත්පලෙන, ලොචන නමැති ඉන්දීවරයන් ඇති; තෙ, තීගේ; මුඛෙන, මුඛයෙන්; සොප්‍යෙෂ ජනඃ, හේ මේ ජන තෙම; රාගමයඃ, රාගමය වූයේ; කෘතඃ, කරනලදී.

76 එතත්, මේ අනන්තරකථිතරූපකය; එකාඞ්ගරූපකම්, (එකාඞ්ගවූ නෙත්‍රයාගේ ම උත්පලත්වයෙන් රූපණය කළහෙයින්) එකාඞ්ගරූපක නමැ; එවම්, එපරිද්දෙන්ම; ද්විප්‍රභෘතීන්‍යපි, ද්‍ව්‍යඞ්ගත්‍ර්‍යඞ්ගාදිවූද; අඞ්ගානි, අවයවයන්; රූපයන්ති, රූපිත කරන්නාහ; අත්‍ර, මේ අඞ්ගරූපණයෙහි; යොගායොගෞ, අඞ්ගයන්ගේ සඞ්ගති විරොධ දෙදෙන; භිදාකරෞ, රූපකභෙදකයන්ගේ ව්‍යවස්ථාව කරන්නාහුයි.

77 ස්මිතපුෂ්පොජ්ජ්වලම්, සිනා නමැති මලින් සුභගවූ; තවානනම්, තීගේ මූඛයතෙම; ලොලනෙත්‍රභෘඞ්ගම්, චඤ්චලාදිත්වයෙන් ලොල්වූ ඇස්

78 ඉදමාර්ද්‍රස්මිතජ්‍යොත්ස්නං ස්නිග්ධනෙත්‍රොත්පලං මුඛම්
ඉති ජ්‍යොත්ස්නොත්පලායොගාදයුක්තං නාම රූපකම්.

79 රූපණාදඞ්ගිනො'ඞ්ගානාං රූපණාරූපණාශ්‍රයාත්
රූපකං විෂමං නාම ලලිතං ජායතෙ යථා.

80 මදරක්තකපොලෙන මන්මථස්ත්වන්මුඛෙන්දුනා
නර්තිතභ්‍රූලතෙනාලං මර්දිතුං භුවනත්‍රයම්.

81 හරිපාදශ්ශිරොලග්නජහ්නුකන්‍යාජලාංශුකඃ
ජයත්‍යසුරනිශ්ශඞ්කසුරානන්දොත්සවධ්වජඃ.

---

නමැති බමරුන් ඇත්තේයි; ඉති, මෙබඳුවූ රූපකය තෙම; පුෂ්පච්රෙඵාණම්, මල් හා බමරුන්ගේ; සඞ්ගත්‍යා, පරස්පරසම්බන්ධය හෙතුකොටගෙන; යුක්තරූපකම්, යුක්තරූපකයයි කියනුලැබේ-යුක්තරූපකයි.

78 ආර්ද්‍රස්මිතජ්‍යොත්ස්නම්, ආර්ද්‍රවූ සිනානමැති සඳරැස්ඇති; ඉදං මුඛම්, මේ මුඛයතෙම; ස්නිග්ධනෙත්‍රොත්පලම්, සිනිඳුවූ ඇස්නමැති නිලුපුල්ඇත්තේය; ඉති, මෙබඳු වූයේ; ජ්‍යොත්ස්නොත්පලායොගාත්, සඳරැස් හා උත්පලයන්ගේ අයොගය හෙතුකොටගෙන හෙවත් සඳරැස්හි උත්පලයන්ගේ හැකිළීම හෙතුකොටගෙන දිනවිරොධයෙන්; අයුක්තං රූපකං නාම, අයුක්තරූපකයයි දතයුතුයි-අයුක්තරූපකයි.

79 අඞ්ගිනඃ, අවයවිහුගේ; රූපණාත්, රූපණය හෙතුකොටගෙන; අඞ්ගානාම්, අවයවයන්ගේ; රූපණාරූපණාශ්‍රයාත්, රූපණය හා අරූපණය අපෙක්ෂාව හෙතුකොටගෙන හෙවත් අවයවයන්ගේ රූපණය හා අරූපණය හෙතුකොටගෙන; විෂමං නාම, විෂම නම්වූ; ලලිතම්, චාරුවූ; රූපකම්, රූපකයතෙම; ජායතෙ, වන්නේය; යථා, හේ මෙසේයි.

80 මන්මථඃ, අනඞ්ගතෙම; මදරක්තකපොලෙන, මදයෙන් රත්වූ ගණ්ඩඇති; නර්තිතභ්‍රූලතෙන, නටවනලද බැම නමැති ලතාඇති; ත්වන් මුඛෙන්දුනා, තිගෙ මුඛ නමැති චන්ද්‍රයා කරණකොටගෙන, භුවනත්‍රයම්, තුන්ලොව; මර්දිතුම්, දනන්නට; අලම්, පොහොසති-මෙහි අඞ්ගිවූ මුඛය චන්ද්‍රබයෙන් රූපිත කොට තදඞ්ගවූ භ්‍රූ හා කපොලයෝ දෙන්න රූපිත නොකරනලදහු-විෂමරූපකයි.

81 ශිරඃ, අග්‍රපාදයෙහි හෙවත් අඞ්ගුලිදෙශයෙහි; ලග්න, පිහිටිපාවූ; ජහ්නුකන්‍යා, ආකාශගඞ්ගාවගේ; ජල, දිය නමැති; අංශුකඃ, පතාකාරූප වස්ත්‍රඇති; අසුර, අසුරයන්කෙරෙහි; නිශ්ශඞ්ක, සැකනැති; සුර, දෙවතාවන්ගේ; ආනන්දොත්සව, සන්තොෂොත්සවයෙහි; ධ්වජඃ, නඟනලද කෙතුවක්වූ; හරිපාදඃ, වික්‍රමමාණවූ විෂ්ණුහුගේ චරණයතෙම; ජයති, දෙනේ-පෙර විෂ්ණුහු ත්‍රිපදවික්‍රම කරනකල්හි බ්‍රහ්මයාවිසින් ආකාශගඞ්ගාජලය ඔහට අභිකරනලද යනු කථායැ එහෙයින් "ශිරොලග්න" යනාදි කියනලදී.

82 විශෙෂණසමග්‍රස්‍ය රූපං කෙතොර්‍ය්‍යදීදෘශම්
පාදෙ තදර්පිණාදෙතත් සවිශෙෂණරූපකම්.

83 න මීලයති පද්මානි න නභො'ප්‍යවගාහතෙ
ත්වන්මුඛෙන්දුර්මමාසූනාං හරණාය ව්‍යවස්‍යති. *

84 අක්‍රියා චන්ද්‍රකාර්‍ය්‍යාණාමන්‍යකාර්‍ය්‍යස්‍ය ච ක්‍රියා
අත්‍ර සන්දෘශ්‍යතෙ † යස්මාද්විරුද්ධං නාම රූපකම්.

85 ගාම්භීර්‍ය්‍යෙණ සමුද්‍රො'සි ගෞරවෙණාසි පර්වතඃ
කාමදත්වාච්ච ලොකානාමසි ත්වං කල්පපාදපඃ.

86 ගාම්භීර්‍ය්‍යප්‍රමුඛෛරත්‍ර හෙතුභිස්සාගරො ගිරිඃ
කල්පද්‍රුමශ්ච ක්‍රියතෙ තදිදං හෙතුරූපකම්.

---

82 විශෙෂණසමග්‍රස්‍ය, පතාකොත්සවස්වරූපවූ විශෙෂණයෙන් යුක්තවූ; කෙතොඃ, ධ්වජයාගේ; යදීදෘශං රූපම්, යම් මේ අනන්තරොක්ත ප්‍රකාරවූ ස්වභාවයෙක් ඇද්ද; පාදෙ, විෂ්ණුචරණයෙහි ලා; තදර්පිණාත්, ඔහුගේම ධ්වජයයි ආරොපණය හෙතුකොටගෙන; එතත්, මෙබඳු වූයේ; සවිශෙෂණරූපකම්, සවිශෙෂණරූපකයයි කියනුලැබේ-සවිශෙෂණ රූපකයි.

83 ත්වන්මුඛෙන්දුඃ, තිගේ මුඛ නමැති චන්ද්‍රතෙම; පද්මානි, පද්මයන්; න මීලයති, නොහකුළුවන්නේයි; නභො'පි, ආකාශයටද; නාවගාහතෙ, නොබස්නේය; (වැළි කුමක් කෙරේද යත්;) මමාසූනාම්, මාගේ ප්‍රාණයන්ගේ; හරණාය, ගැන්මට; ව්‍යවස්‍යති, උත්සාහ කරන්නේයි.

84 යස්මාත්, යම්හෙයකින්; අත්‍ර, මේ ප්‍රයොගයෙහි; චන්ද්‍රකාර්‍ය්‍යාණාම්, චන්ද්‍රයාවිසින් කටයුතුවූ පද්මනිමීලනාදීන්ගේ; අක්‍රියා, නොකිරීමද; අන්‍යකාර්‍ය්‍යස්‍ය ච ක්‍රියා, ආයුධාදියෙන් කටයුතුවූ ප්‍රාණහරණලක්‍ෂණවූ අන්‍යකාර්‍ය්‍යයාගේ කිරීමද; සන්දෘශ්‍යතෙ, දක්නාලැබේද; තස්මාත්, එහෙයින්; විරුද්ධං නාම රූපකම්, මේතෙම විරුද්ධරූපක නම් වන්නේයි- විරුද්ධරූපකයි.

85 ත්වම්, තෝ; ගාම්භීර්‍ය්‍යෙණ, උත්තාන නොවූ සිත්ඇතිබව හෙතු කොටගෙන; සමුද්‍රො'සි, සාගරයෙහි; ගෞරවෙණ, ගෞරවගුණයෙන්; පර්වතො'සි, පර්වතයෙහි; ලොකානාම්, ලෝවැස්සන්ට; කාමදත්වාච්ච, ඉෂ්ටදායිබව හෙතුකොටගෙන, කල්පපාදපො'සි, කල්පවෘක්‍ෂයෙහි.

86 අත්‍ර, මේ ප්‍රයොගයෙහි ලා; ගම්භීර්‍ය්‍යප්‍රමුඛෛඃ, ගම්භීරත්වාදිවූ; හෙතුභිඃ, කාරණයෙන් (විවක්‍ෂිතවූ කිසි පුරුෂයෙක්); සාගරඃ, සාගරයයිද; ගිරිඃ, පර්වතයයිද; කල්පද්‍රුමශ්ච, කල්පවෘක්‍ෂයයිද; ක්‍රියතෙ, යම්හෙය

---

* "හරණායෛව කල්පතෙ" ක. † "සන්දෘශ්‍යතෙ"-ක.

87 රාජහංසොපභොගාර්හං භ්‍රමරප්‍රාර්ථ්‍යසෞරභම්
සඛි! * වක්ත්‍රාම්බුජමිදං තවෙති ශ්ලිෂ්ටරූපකම්.

88 ඉෂ්ටං සාධර්ම්‍යවෛධර්ම්‍යදර්ශනාද්ගෞණමුඛ්‍යයොඃ
උපමාව්‍යතිරෙකාඛ්‍යං රූපකද්විතයං යථා.

89 අයමාලොහිතච්ඡායො මදෙන මුඛචන්ද්‍රමාඃ
සන්නද්ධොදයරාගස්‍ය චන්ද්‍රස්‍ය ප්‍රතිගර්ජති.

90 චන්ද්‍රමාඃ පීයතෙ දෙවෛර්මයා ත්වන්මුඛචන්ද්‍රමාඃ
අසමග්‍රො'ප්‍යසෞ ශශ්වදයමාපූර්ණමණ්ඩලඃ.

---

කිය් රූපිත කරනුලැබේද; තත්, එහෙයින්; ඉදම්, මෙබඳු වූයේ; හෙතුරූපකම්, හෙතුරූපක නම් වන්නේයි; තදිදම්, හේ මේ අනන්තරොක්ත වූයේ; හෙතුරූපකම්, හෙතුරූපක නමැයි; සෙදියයුතු-හෙතුරූපකයි.

87 සඛි! යෙහෙළිය! තව, තිගේ; ඉදං වක්ත්‍රාම්බුජම්, මේ මුඛ නමැති පද්මය; රාජහංස, නරොත්තමයන්විසින්; උපභොගාර්හම්, අනුභවයට සුදුස්සේය; නොහොත්-රාජහංස, රාජහංස්යන්විසින්; උපභොගාර්හම්, නිෂෙවණයට සුදුස්සේය; හේද-භ්‍රමරප්‍රාර්ථ්‍යසෞරභම්, (කාමුකයන්විසින් ද්‍රොහෝ නොහොත් †) භෘඞ්ගයන්විසින් පැතියයුතු සුවඳ ඇත්තේයි; ඉති, මෙබඳු වූයේ; ශ්ලිෂ්ටරූපකම්, උක්තප්‍රකාර අර්ථය ශ්ලෙෂානුවිධහෙයින් ශ්ලිෂ්ටරූපකයයි දන්නාලදී-ශ්ලිෂ්ටරූපකයි.

88 ගෞණමුඛ්‍යයොඃ, ආරොප්‍යමාණ ප්‍රධාන දෙන්නාගේ; සාධර්ම්‍යවෛධර්ම්‍යදර්ශනාත්, සාදෘශ්‍ය අසාදෘශ්‍ය දෙන්නාගේ දක්ම හෙතුකොටගෙන; උපමාව්‍යතිරෙකාඛ්‍යම්, උපමාරූපක නම්වූද ව්‍යතිරෙකරූපක නම්වූද; රූපකද්විතයම්, රූපක දෙක; ඉෂ්ටම්, කැමැතිවනලදී; යථා, හේ මෙසේයි.

89 මදෙන, මදය හෙතුකොටගෙන; ආලොහිතච්ඡායඃ, රත්වූ ශොභා ඇති; අයං මුඛචන්ද්‍රමාඃ, මේ මුඛ නමැති චන්ද්‍රතෙම; සන්නද්ධොදයරාගස්‍ය, අවස්ථිතවූ උදයකාලයෙහි රත්පැහැඇති; චන්ද්‍රස්‍ය, චන්ද්‍රයාහට; ප්‍රතිගර්ජති, ගර්ජනා කරන්නේයි; හෙවත් චන්ද්‍රයා හා සදෘශයි-මෙහි ගෞණමුඛ්‍ය දෙන්නාගේ රක්තසාදෘශ්‍යය හෙතුකොටගෙන මෙබඳු වූයේ උපමාරූපකයයි දතයුතු-උපමාරූපකයි.

90 අසෞ චන්ද්‍රමාඃ, මේ චන්ද්‍රතෙම; අසමග්‍රො'පි, අසම්පූර්ණවූයේද; දෙවෛඃ, දෙවතාවන්විසින්; ශශ්වත්, අනවරතයෙන්; පීයතෙ, බොනු ලැබෙයි; අයං ත්වන්මුඛචන්ද්‍රමාඃ, මේ තිගේ මුඛ නමැති චන්ද්‍රතෙම; ආපූර්ණමණ්ඩලඃ, අඛණ්ඩවූ මණ්ඩල ඇත්තේ; මයා, මාවිසින්;

---

* "ආලි"-ප. † මෙය සන්නයෙහි ඌනයි.

91 මුඛචන්ද්‍රස්‍ය චන්ද්‍රත්වමිත්ථමන්‍යෝපතාපිනඃ
න තෙ සුන්දරි! සංවාදීත්‍යෙතදාක්ෂෙපරූපකම්.

92 මුඛෙන්දුරපි තෙ චණ්ඩි! මාං නිර්දහති නිර්දයම්
භාග්‍යදෝෂෝ * මමෛවෙති තත් සමාධානරූපකම්.

93 මුඛපඞ්කජරඞ්ගෙ'ස්මින් භ්‍රූලතානර්තකී තව
ලීලානෘත්‍යං කරොතීති රම්‍යං රූපකරූපකම්.

94 නෛතන්මුඛමිදං පද්මං න නෙත්‍රෙ භ්‍රමරාවිමෞ
එතානි කෙසරාණ්‍යෙව නෛතා දන්තාර්චිෂස්තව.

---

91 සුන්දරි!, සුන්දර තැනැත්තිය!; ඉත්ථම්, මෙසේ; අන්‍යොපතාපිනඃ, පරසන්තාපකර වූ; තෙ, තිගේ; මුඛචන්ද්‍රස්‍ය, වදන නමැති චන්ද්‍රයාගේ; චන්ද්‍රත්වම්, චන්ද්‍රබව; න සංවාදි, යථාර්ථ නොවේ හෙවත් සබා නොවේ; ඉති, මෙබඳුවූ; එතත්, මේතෙම; ආක්ෂෙපරූපකම්, (චන්ද්‍රයාගේ නිෂෙධය හෙතුකොටගෙන) ආක්ෂෙපරූපකයයි (දතයුතු)–ආක්ෂෙපරූපකයි.

92 චණ්ඩි!, දයානැති තැනැත්තිය!; තෙ, තිගේ; මුඛෙන්දුරපි, (ප්‍රීති කරවූ) මුඛචන්ද්‍ර පවා; නිර්දයම්, දයා නැත්තේ හෙවත් අත්‍යර්ථයෙන්; මාම්, මා; නිර්දහති, දවන්නේය; (මේතෙම;) මමෛව, මාගේම; භාග්‍ය දෝෂඃ, භාග්‍යදෝෂයයි; (මුඛචන්ද්‍රයාගේ දෝස නොවෙයි යනු භාවයි.) ඉති, මෙබඳුවූ යම්රූපකයෙක් ඇද්ද; තත්, ඒ රූපකයතෙම; සමාධාන රූපකම්, (උක්තප්‍රකාරයෙන් සමාධානය හෙතු කොටගෙන) සමාධාන රූපක නම් වන්නේයි-සමාධානරූපකයි.

93 තව, තිගේ; භ්‍රූලතානර්තකී, භ්‍රූලතා නමැති නර්තකීතොමෝ; අස්මින් මුඛපඞ්කජරඞ්ගෙ, මේ මුඛපද්ම නමැති නෘත්‍යභූමියෙහි; ලීලා නෘත්‍යම්, ලීලානර්තනය; කරොතීති, කරන්නීයයි; ඉති, මෙබඳුවූ රූපකය තෙම; රම්‍යම්, මනොඥවූ; රූපකරූපකම්, (ලතා කරනලද භ්‍රූදෙන්නාගේ නර්තකීකරණය හෙතු කොටගෙනද පඞ්කජ කරනලද මුඛයාගේ රඞ්ගීකරණය හෙතු කොටගෙනද) රූපකරූපක නම් වන්නේයි–රූපකරූපකයි.

94 තව, තිගේ; එතත්, මේතෙම; මුඛම් න, මුඛය නොවෙයි; ඉදම්, මේතෙම; පද්මම්, පද්මයෙක; ඉමෞ, මොහු දෙන්න; න නෙත්‍රෙ, නෙත්‍රයෝ දෙන්නෙක් නොවෙති; භ්‍රමරෞ, භෘඞ්ගයෝ දෙන්නෙක; එතාඃ, මොහු; දන්තාර්චිෂො න, දශනශොභාවෝ නොවෙති; එතානි, මොහු; කෙසරාණ්‍යෙව, කෙසරයෝ මැයි.

---

* "භාග්‍යදෝෂාන්"–ක.

95 මුඛාදිත්වං නිවර්ත්‍යෛව පද්මාදිත්වෙන රූපණාත්
උද්භාවිතගුණොත්කර්ෂං තත්ත්වාපහ්නවරූපකම්.

96 න පර්‍ය්‍යන්තො විකල්පානාං රූපකොපමයොරතඃ
දිඞ්මාත්‍රං දර්ශිතං ධීරෛරනුක්තමනුමීයතාම්.

ඉති රූපකචක්‍රම්.

---

97 ජාතික්‍රියාගුණද්‍රව්‍යවාචිනෛකත්‍රවර්ත්තිනා
සර්වවාක්‍යොපකාරශ්චෙත්තදාහුර් * දීපකං යථා.

98 පවනො දක්ෂිණඃ පර්ණං ජීර්ණං හරති වීරුධාම්
ස නවාය † නතාඞ්ගීනාං මානභඞ්ගාය කල්පතෙ.

---

95 මුඛාදිත්වම්, මුඛාදිභාවය; නිවර්ත්‍යෛව, සඟවා ම; පද්මාදිත්වෙන, පද්මාදිභාවයෙන්; රූපණාත්, පරිකල්පනය හෙතු කොටගෙන; උද්භාවිතගුණොත්කර්ෂම්, ප්‍රකාශිතවූ ගුණාතිශය ඇති මේතෙම; තත්ත්වාපහ්නව රූපකම්, (මුඛාදිත්වයාගේ සැඟවීම හෙතුකොටගෙන) තත්ත්වාපහ්නව රූපක නම් වන්නේයි–තත්ත්වාපහ්නවරූපකයි.

96 රූපකොපමයොඃ, රූපක උපමා දෙන්නාගේ; විකල්පානාම්, ප්‍රභෙදයන්ගේ; පර්‍ය්‍යන්තො න, කෙළවරෙක් නැත; අතඃ, එහෙයින්; දිඞ්මාත්‍රම්, දිඞ්මාත්‍රයෙක්; දර්ශිතම්, දක්වනලද; අනුක්තම්, (මෙහි ලා) නොකියනලද දෙය; ධීරෛඃ, කවින් විසින්; අනුමීයතාම්, ඌහා කරනු ලැබේවා.

97 ජාතික්‍රියාගුණද්‍රව්‍යවාචිනා, ජාතිය ක්‍රියාය ගුණය ද්‍රව්‍යය යන මොවුන් කියන්නාවූ; එකත්‍රවර්ත්තිනා, (වාක්‍යයාගේ ආදිය මධ්‍යය අන්තය යන මෙයින්) එක් තැනෙක්හි පවත්නාවූ වාක්‍යාවයවවූ (කිසි ශබ්දයක්හු) විසින්; සර්ව, සියලු; වාක්‍ය, අභිමතවූ ක්‍රියාකාරකසම්බන්ධාභිධායිවූ පද සන්තානයට; උපකාරශ්චෙත්, (සාධ්‍යසාධනභාවයෙන්) තදපෙක්ෂා ලක්ෂණයෙක් ඇත්නම්; තත්, එබඳු වූවහු; දීපකම් ආහුඃ, (තජ්ඥයෝ) දීපකයයි කියත්; යථා, ඒ මෙසේයි.

98 දක්ෂිණඃ පවනඃ, මලයානිලයතෙම; වීරුධාම්, ලතාවන්ගේ හෝ ගුල්මයන්ගේ; ජීර්ණම්, දිරූණු; පර්ණම්, පත්‍රය; හරති, දුරු කරන්නේය; සඃ, හෙතෙම; නතාඞ්ගීනාම්, නතාඞ්ගීන්ගේ; නවාය, අලුත්වූ; මානභඞ්ගාය, මන්බිඳීම් පිණිස; කල්පතෙ, සමර්ථ වන්නේය— මෙහි වාක්‍යාදියෙහි පවත්නාවූ දක්ෂිණපවනජාතිවාචිවූ ශබ්දයාවිසින් සියලු වාක්‍යය උපකෘතනුයි මේතෙම ජාත්‍යාදිදීපක නම්–ජාත්‍යාදිදීපකයි.

---

* “චාරශ්චෙත් තමාහුර්”–ක. † “ස එවාචා”–ක. “නවාය”–සිං.

99 චරන්ති චතුරම්භෝධිවේලෝද්‍යානේෂු දන්තිනඃ.
චක්‍රවාලාද්‍රිකුඤ්ජේෂු කුන්දභාසෝ ගුණාශ්ච තේ.

100 ශ්‍යාමලාඃ ප්‍රාවෘෂේණ්‍යාභිර්දිශෝ ජීමූතපඞ්ක්තිභිඃ
භුවශ්ච සුකුමාරාභිර්නවශාද්වලරාජිභිඃ.

101 විෂ්ණුනා වික්‍රමස්ථේන දානවානාං විභූතයඃ
ක්වාපි නීතාඃ කුතෝ'ප්‍යාසන්නානීතා දෙවතර්ද්ධයඃ *

102 ඉත්‍යාදිදීපකාන්‍යුක්තාන්‍යේවං මධ්‍යාන්තයෝරපි
වාක්‍යයෝර්දර්ශයිෂ්‍යාමඃ කානිචිත්තානි තද්‍යථා.

---

99 තේ, තාගේ; දන්තිනඃ, ජයවාරණයෝ; චතුරම්භෝධි, චතුස්සාගරයාගේ; වේලෝද්‍යානේෂු, තටවනයෙහි; චරන්ති, ඇවිදිති; කුන්දභාසඃ, කොඳමලට බඳු ශෝභාඇති; ගුණාශ්ච, (දානශෞර්‍ය්‍යාදි) ගුණයෝද; චක්‍රවාලාද්‍රිකුඤ්ජේෂු, ලෝකාලෝකපර්වතයාගේ අවට භූමියෙහි; චරන්ති, හැසිරෙති; හෙවත් එහි හිඳිනා සිද්ධයන්ගේ ශ්‍රැතිපථයට බස්නාහ. මෙහි වාක්‍යාදිවර්තිවූ ක්‍රියාවාචීහුවිසින් සියලු වාක්‍යෝපකාරය කරන ලද, එහෙයින් මෙබඳු වූයේ ක්‍රියාදිදීපකයයි දතයුතු-ක්‍රියාදිදීපකයි.

100 දිශඃ, දික්හු; ප්‍රාවෘෂේණ්‍යාභිඃ, මේඝකාලයෙහිවූ; ජීමූතපඞ්ක්තිභිඃ, මේඝමාලාකරණකොටගෙන; ශ්‍යාමලාඃ, නිල්වූවාහු පවතිති; භුවශ්ච, භූමිහුද; සුකුමාරාභිඃ, ලාවූ; නවශාද්වලරාජිභිඃ, අලුත් තණපතරින්; ශ්‍යාමලාඃ, නිල්වූවාහු පවතිත්-මෙහි වාක්‍යාදිගතවූ ගුණවාචීහු විසින් සර්වවාක්‍යෝපකාරය කරනලද, එහෙයින් මෙබඳු වූයේ ගුණාදිදීපකයයි දතයුතු-ගුණාදිදීපකයි.

101 වික්‍රමස්ථේන, වික්‍රමයෙහි පිහිටි හෙවත් බලිවධසන්නද්ධවූ; විෂ්ණුනා, විෂ්ණුහු විසින්; දානවානාම්, අසුරයන්ගේ; විභූතයඃ, සම්පත්තිහු; ක්වාපි නීතාඃ ආසන්, කොට දෝ හෝ පමුණුවනලද්දාහු වූහ හෙවත් නසනලදහ; දෙවතර්ද්ධයඃ, දෙවතාවන්ගේ සම්පත්තිහු; කුතෝ'පි, කොයින් දෝ හෝ; ආනීතාඃ ආසන්, එළවනලද්දාහු වූහු හෙවත් උපදවනලදහු-මෙහි ආදිවර්තිවූ ද්‍රව්‍යවාචීහුවිසින් සර්වවාක්‍යෝපජීවනය හෙයින් මේ ද්‍රව්‍යාදිදීපක නමැයි දතයුතු-ද්‍රව්‍යාදිදීපකයි.

102 ඉති, මෙසේ; ආදිදීපකානි, ආදිදීපකයෝ; උක්තානි, කියනලදහ; එවම්, මෙපරිද්දෙන්; වාක්‍යයෝඃ, වාක්‍ය දෙක්නාගේ; මධ්‍යාන්තයෝරපි, මධ්‍ය අන්ත දෙක්හිදු; තානි කානිචිත්, ඒ කිසි දීපක කෙනකුන්; දර්ශයිෂ්‍යාමඃ, උදාහරණ කරම්හ; තද්‍යථා, ඒ මෙසේයි.

---

* "දෛවතර්ද්ධයඃ"-ක.

103 නෘත්‍යන්ති නිචුලොත්සඞ්ගෙ ගායන්ති ච කලාපිනඃ
බධ්නන්ති ච පයොදෙෂු දෘශො හර්ෂාශ්‍රුගර්භිණීඃ.

104 මන්දො ගන්ධවහඃ ක්ෂාරො වහ්නිරින්දුශ්ච ජායතෙ
චර්චාචන්දනපාතශ්ච ශස්ත්‍රපාතඃ ප්‍රවාසිනාම්.

105 ජලං ජලධරොද්ගීර්ණං කුලං ගෘහශිඛණ්ඩිනාම්
චලඤ්ච තඩිතාං දාම බලං කුසුමධන්වනඃ *.

106 ත්වයා කර්ණොත්පලං † කර්ණෙ ස්මරෙණාස්ත්‍රං ශරාසනෙ
මයාපි මරණෙ චෙතස්ත්‍රයමෙතත් සමං කෘතම්.

---

103 කලාපිනඃ, මයූරයෝ; නිචුලොත්සඞ්ගෙ, දියඹිදෙල්ගස්මුදුන්හි; නෘත්‍යන්ති, නටන්නාහ; ගායන්ති ච, ගායනාත් කරන්නාහ; පයොදෙෂු, මෙඝයෙහි ලා; හර්ෂාශ්‍රුගර්භිණීඃ, සතුටුකඳුළු ඇතුලත්කොට ඇති; දෘශශ්ච, නෙත්‍රයන්ද; බධ්නන්ති, බඳිත්-මෙහි මධ්‍යවර්තිවූ ජාතිවාචිවූ කලාපිශබ්දයාවිසින් සකලවාක්‍යොපකාරය වනහෙයින් මේ ජාතිමධ්‍ය දීපකයයි දතයුතු-ජාතිමධ්‍යදීපකයි.

104 මන්දො ගන්ධවහඃ, මෘදු පවනතෙම; ප්‍රවාසිනාම්, විරහීන්ට; ක්ෂාරඃ ජායතෙ, (ව්‍යථාහෙතු හෙයින්) ක්ෂාර වන්නේය; ඉන්දුශ්ච, චන්ද්‍රද; වහ්නිර්ජායතෙ, (දැවීම හෙතුකොටගෙන) ගිනි වන්නේය; චර්චාචන්දන පාතශ්ච, තිලකස්වභාවවූ සඳුන්ගැල්වීමද; ශස්ත්‍රපාතො ජායතෙ, (දුක් එළවනහෙයින්) ඛඩ්ගපාත වන්නේයි-මෙහි මධ්‍යවර්තිවූ "ජායතෙ" යන ක්‍රියාපදයෙන් සර්වවාක්‍යොපකාර වනහෙයින් මේ ක්‍රියාමධ්‍යදීපකයයි. දතයුතු-ක්‍රියාමධ්‍යදීපකයි.

105 ජලධරොද්ගීර්ණම්, මෙඝයන් විසින් හරනාලද; ජලම්, දියද; ශිඛණ්ඩිනාං කුලම්, ගෘහමයූරසමූහයද; චලම්, චපලවූ; තඩිතාං දාම, විද්‍යුද්දාමයද; කුසුමධන්වනඃ, අනඞ්ගයාගේ; බලම්, සෙනායි-මෙහි ජලධරොද්ගීර්ණවූ ජලාදීන්ගේ භෙදයද අනුව අපෙක්ෂා නොකරනලද විශෙෂඇති විවක්ෂිතවූ බලමාත්‍රයෙන් සර්වවාක්‍යොපකාර වනහෙයින් මේ ජාත්‍යන්තදීපකයයි දතයුතු-ජාත්‍යන්තදීපකයි.

106 ත්වයා, තාවිසින්; කර්ණෙ, ශ්‍රවණයෙහි; කර්ණොත්පලම්, අවතංසොත්පලයද; ස්මරෙණ, අනඞ්ගයාවිසින්; ශරාසනෙ, දුන්නෙහි; අස්ත්‍රම්, ශරයද; මයා, මාවිසින්; මරණෙ, මරණයෙහි; චෙතඃ, සිතද යන; එතත් ත්‍රයම්, මෙතුන; සමං කෘතම්, එකවට කරනලදි-මෙහි අන්තස්ථවූ "කෘතම්" යන ක්‍රියාපදයෙන් සර්වවාක්‍යොපකාර වනහෙයින් මේ ක්‍රියාන්තදීපකයයි දතයුතු-ක්‍රියාන්තදීපකයි.

---

* "ගන්ධිනඃ"-සිං. † "නීලොත්පලං"-ක.

107 ශුකලශ්ශොවතාර්චිශො වෘමෙධඃ පක්‍ෂඃ පචශරසඃ සඃ
සංච රාගසය රාගො'පි යූනාං රතයුත්සවශ්‍රියඃ.

108 ඉත්‍යාදිදීපකත්වෙ'පි පූර්වපූර්වව්‍යපෙක්‍ෂිණී
වාක්‍යමාලා ප්‍රයුක්තෙති තන්මාලාදීපකං මතම්. *

109 අවලෙපමනඞ්ගස්‍ය වර්ධයන්ති වලාහකාඃ
කර්ශයන්ති තු ඝර්මස්‍ය මාරුතොද්ධූතශීකරාඃ.

110 අවලෙපපදෙනාත්‍ර වලාහකපදෙන ච
ක්‍රියෙ විරුද්ධෙ සංයුක්තෙ තද්විරුද්ධාර්ථදීපකම්.

111 හරත්‍යාභොගමාශානාං ගෘහ්ණාති ජ්‍යොතිෂාං ගණම්
ආදත්තෙ චාසඃ † මෙ ප්‍රාණානසෞ ජලධරාවලී.

---

107 ශුක්ලඃ පක්‍ෂඃ, ශුක්ලපක්‍ෂපතෙව; ශොවතාර්චිශො වෘමෙධඃ, චන්‍ද්‍රයාගේ උපචය පිණිස වන්නේය; සඃ, ඒ චන්‍ද්‍රතෙම; පචශරසඃ වෘමෙධ්‍ය, අනඞ්ගයාට වෘඩිය පිණිස වන්නේය; ස ච, ඒ අනඞ්ගද; රාගස්‍ය වෘමෙධ්‍ය, රාගයාගේ වෘඩිය පිණිස වන්නේය; රාගො'පි, රාගයද; යූනාම්, ළදරුවන්ගේ; රත්‍යුත්සවශ්‍රියො වෘමෙධඃ, සම්භොගොත්සව ශ්‍රියගේ වෘඩිය පිණිස (සමර්ථ වන්නේයි).

108 ඉති. මෙබඳු වූයේ; ආදිදීපකත්වෙ'පි,(වාක්‍යාදිවර්තිවූ "වෘමෙධඃ" යන මේ ක්‍රියාවාචීහු කරණකොටගෙන) ආදිදීපකත්වයක් ඇතිකල්හිදු; පූර්වපූර්වව්‍යපෙක්‍ෂිණී, පළමු පළමුවහු අපෙක්‍ෂා කරන්නාවූ; වාක්‍යමාලා, වාක්‍යපඞ්ක්තිතොමෝ; ප්‍රයුක්තෙති, ප්‍රයොග කරනලදනුයි; තත්, එහෙයින්; මාලාදීපකං මතම්, මාලාදීපකයයි දන්නාලදී–මාලාදීපකයි.

109 මාරුත, පවනින්; උද්ධූත, විසුරුවනලද; ශීකරාඃ, ජලකණ ඇති; වලාහකාඃ, මෙඝයෝ; අනඞ්ගස්‍ය, අනඞ්ගයාගේ; අවලෙපම්, එඩි; වර්ධයන්ති, වඩන්නාහ; ඝර්මස්‍ය තු, නිදාඝයාගේ වනාහි; අවලෙපම්, දර්පය; කර්ශයන්ති, නසත්.

110 අත්‍ර, මේ ප්‍රයොගයෙහි; අවලෙපපදෙන, කර්මභූත වූ අවලෙප පදයා හා ද; වලාහකපදෙන ච, කර්තෘභූත වූ වලාහකපදයා හා ද; විරුද්ධෙ, පරස්පරවිරුද්ධ වූ; ක්‍රියෙ, වර්ධන කර්ශන ලක්‍ෂණ වූ ක්‍රියාවෝ දෙදෙන; සංයුක්තෙ, ‡ සම්බන්ධයෙකින් සංයුක්තයෝද; තත්, එහෙයින්, විරුද්ධාර්ථ දීපකම්, මෙබඳු වූයේ විරුද්ධාර්ථදීපකයයි (දතයුතු)–විරුද්ධාර්ථදීපකයි.

111 අසෞ ජලධරාවලී, මේ මෙඝපඞ්ක්තිතොමෝ; ආශානාම්, දිගුන්ගේ; ආභොගම්, විස්තාරය; හරති, ගන්නිය; ජ්‍යොතිෂාං ගණම්,

---

* "විදුඃ"–ප. † "වාද්‍ය"-ක. ‡ "සම්බන්ධෙ"–ස.

112 අනෙකශබ්දොපාදනාත් ක්‍රියෛවෛකාත්‍ර දීප්‍යතෙ
යථා ජලධරාවල්‍යා තස්මාදෙකාර්ථදීපකම්.

113 හෘද්‍යගන්ධවහාස්තුඞ්ගාස්තමාලශ්‍යාමලත්විෂඃ
දිවි භ්‍රමන්ති ජීමූතා භුවි චෛතෙ මතඞ්ගජාඃ.

114 අත්‍ර ධර්මෛරභින්නානාමභ්‍රාණාං හස්තිනාමපි *
භ්‍රමණෙනෛව සම්බන්ධ ඉති ශ්ලිෂ්ටාර්ථදීපකම්.

115 අනෙනෛව ප්‍රකාරෙණ ශෙෂාණාමපි දීපකෙ
විකල්පානාමනුගතිර් † විධාතව්‍යා විචක්ෂණෛඃ.

ඉති දීපකචක්‍රම්.

---

තාරකාසමූහය; ගෘහ්ණන්ති, ගන්නීය; අස්‍ය ච මෙ, (විරහි වූ) මේ මාගේද; ප්‍රාණාන්, ප්‍රාණයන්; ආදදතෙ, ගන්නියි.

112 යථා, යම්සෙයකින්; අනෙකශබ්දොපාදනාත්, නොයෙක් (හරත්‍යාදි) ශබ්දයන්ගේ ප්‍රයොගය හෙතු කොටගෙන; ජලධරාවල්‍යා, මෙඝාවලියවිසින්; එකෛව ක්‍රියා, එක උපඝාතලක්ෂණ වූ ක්‍රියාවම; අත්‍ර, මේ ප්‍රයොගයෙහි; දීප්‍යතෙ, උපකාර කරනුලැබේද; තස්මාත්, එහෙයින් (මෙබඳු වූයේ); එකාර්ථදීපකම්, එකාර්ථදීපකයයි (දතයුතු)-එකාර්ථ දීපකයි.

113 හෘද්‍යගන්ධවහාඃ, මනොහරවූ පවන්ඇති නොහොත් මනොහර වූ මදගන්ධවහ වූ; තුඞ්ගාඃ, උස්වූ, තමාලශ්‍යාමලත්විෂඃ, තමාල සේ නිල්පැහැ ඇති; ජීමූතාඃ, මෙඝයෝ; දිවි භ්‍රමන්ති, ආකාශයෙහි බමන් නාහ; භුවි ච, පෘථිවියෙහිද; එතෙ මතඞ්ගජාඃ (භ්‍රමන්ති), මේ (මදත) හස්තිහු බමත්.

114 අත්‍ර, මේ ප්‍රයොගයෙහි; ධර්මෛරභින්නානාම්, (ගන්ධවහත්වාදි) ගුණයෙන් සමානවූ; අභ්‍රාණාම්, මෙඝයන්ගේද; හස්තිනාමපි, වාරණයන්ගේද; භ්‍රමණෙනෛව, (දීපක වූ) භ්‍රමණක්‍රියායෙන්ම; සම්බන්ධඃ, (සාධ්‍යසාධනලක්ෂණ වූ) සම්බන්ධය (දන්නාලබන්නේය); ඉති, මෙහෙයින්; ශ්ලිෂ්ටාර්ථදීපකම්, ශ්ලිෂ්ටාර්ථදීපකයයි (දතයුතු). ශ්ලිෂ්ටාර්ථ දීපකයි.

115 අනෙනෛව ප්‍රකාරෙණ; මේ (අනන්තරොක්ත) ප්‍රක්‍රමයෙන් ම; දීපකෙ, දීපකවිෂයෙහි ලා; ශෙෂාණාමපි විකල්පානාම්, සෙසු භෙද යන්ගේද; අනුගතිඃ, දැනුම්තොමෝ; විචක්ෂණෛඃ, කවීන්විසින්; විධාතව්‍යා, කටයුත්තීයි.

---

* “දන්තිනාං තථා”–ක.  † “මවගතිර්”–ක.

116 අර්ථාවෘත්තිඃ පදාවෘත්තිරුභයාවෘත්තිරිත්‍යපි *
දීපකස්ථාන එවෙෂ්ටමලඞ්කාරත්‍රයං යථා.

117 විකසන්ති කදම්බානි ස්ඵුටන්ති කුටජොද්ගමාඃ †
උන්මීලන්ති ච කන්දල්‍යො දලන්ති කකුභානි ච.

118 උත්කණ්ඨයති මෙඝානාං මාලා වර්ගං + කලාපිනාම්
යූනාංචොත්කණ්ඨයත්‍යද්‍ය ‡ මානසං මකරධ්වජඃ.

119 ජිත්වා විශ්වං භවානත්‍ර විහරත්‍යවරොධනෛඃ
විහරත්‍යප්සරොභිස්තෙ රිපුවර්ගො දිවං ගතඃ.

ඉත්‍යාවෘත්තිගණඃ.

116 අර්ථාවෘත්තිඃ, අර්ථයාගේ නැවත ප්‍රකාශකිරීමය; පදාවෘත්තිඃ, පදයන්ගේ නැවත ප්‍රකාශකිරීමය; උභයාවෘත්තිඃ ඉති අපි, අර්ථ පද දෙදෙනාගේ නැවත ප්‍රකාශකිරීමයයිද මෙබඳුවූ; අලඞ්කාරත්‍රයම්, අලඞ්කාර තුන; දීපකස්ථාන එව, දීපකවිෂයෙහි ම; ඉෂ්ටම්, කැමැතිවනලදි; යථා, හේ මෙසේයි.

117 කදම්බානි, කදම්බකුසුමයෝ; විකසන්ති, පිපෙන්නාහ; කුටජොද්ගමාඃ, කුටජකුට්මලයෝ; ස්ඵුටන්ති, පිපෙන්නාහ; කන්දල්‍යශ්ච, කන්දලිකුසුමයෝද; උන්මිලන්ති, පිපෙන්නාහ; කකුභානි ච, කකුභවෘක්ෂයෝද; දලන්ති, පිපෙන්නාහුයි-මෙහි විකාසලක්ෂණ වූ එක අර්ථය නොයෙක් පර්‍ය්‍යායයෙන් සතතයෙන් පහළකිරීම හෙතු කොටගෙන මෙබඳු වූයේ අර්ථාවෘත්තියයි දතයුතු-අර්ථාවෘත්තියි.

118 අද්‍ය, දැන් හෙවත් මේ මේඝකාලයෙහි; මෙඝානාං මාලා, මෙඝපඞ්ක්තිතොමෝ; කලාපිනාං වර්ගම්, මයූරසමූහයා; උත්කණ්ඨයති, සන්තොෂයෙන් උද්ගතවූ ග්‍රීවා ඇත්තා කෙරෙයි; මකරධ්වජශ්ච, අනඞ්ගද; යූනාම්, ළදරුවන්ගේ; මානසම්, සිත; උත්කණ්ඨයති, උකටලී කරවා-මෙතෙම "උත්කණ්ඨයති" යන මේ පදයාගේ නැවත ප්‍රකාශ කිරීම හෙතුකොටගෙන පදාවෘත්තියයි දතයුතු-පදාවෘත්තියි.

119 භවාන්, භවත්තෙම; විශ්වං ජිත්වා, සියලු භුවනය දිනා; අත්‍ර, මේ පෘථිවීමණ්ඩලයෙහි; අවරොධනෛඃ, අන්තඃපුරසුන්දරීන් හා එක්ව; විහරති, කෙළනේය; දිවං ගතඃ, දිව්‍යලොකයට ගියාවූ; තෙ, තාගේ; රිපුවර්ගඃ, සතුරු සමූහයතෙම; අප්සරොභිඃ, දිව්‍යාඞ්ගනාවන් හා එක්ව; විහරති, කෙළනේයි-මෙහි "විහරති" යන මෙයින් අර්ථ පද දෙදෙනාගේ ආවෘත්තිය හෙතු කොටගෙන මේ උභයාවෘත්තියයි දතයුතු-උභයාවෘත්තියි.

* "රෙව ච"-ක. † "කුටජද්‍රුමාඃ"-ක. + "වෘන්දං"-ක.
‡ "යතොෂ"-ක.

120 ප්‍රතිෂෙධොක්තිරාක්ෂෙපස්ත්‍රෛකාල්‍යාපෙක්ෂයා ත්‍රිධා
අථාස්‍ය පුනරාක්ෂෙප්‍යභෙදානන්ත්‍යාදනන්තතා,

121 අනඞ්ගඃ පඤ්චභිඃ පෞෂ්පෛර් * විශ්වං ව්‍යජයතෙෂුභිඃ
ඉත්‍යසම්භාව්‍යමථවා විචිත්‍රා වස්තුශක්තයඃ.

122 ඉත්‍යනඞ්ගජයායොගබුද්ධිර්හෙතුබලාදිහ
ප්‍රවෘත්තෛව යදාක්ෂිප්තා වෘත්තාක්ෂෙපස්තදීදෘශඃ †.

123 කුතඃ කුවලයං කර්ණෙ කරොෂි කලභාෂිණි!
කිමපාඞ්ගමපර්‍ය්‍යාප්තමස්මින් කර්මණි මන්‍යසෙ.

---

120 ප්‍රතිෂෙධොක්තිඃ, නිෂෙධවචනය; ආක්ෂෙපඃ, ආක්ෂෙප නම් වන්නේය; (ඒ ආක්ෂෙපයද;) ත්‍රෛකාල්‍යාපෙක්ෂයා, භූතභවිෂ්‍යද්වර්ත්තමාන යන කාලත්‍රයාගේ ආශ්‍රය හෙතුකොටගෙන; අථ, නැවත; ත්‍රිධා, (භූතාක්ෂෙපය භවිෂ්‍යදාක්ෂෙපය වර්ත්තමානාක්ෂෙපයයි) ත්‍රිප්‍රකාර වන්නේය; ආක්ෂෙප්‍යභෙදානන්ත්‍යාත්, නිෂෙධ්‍ය වූ අර්ථවිකල්පයන්ගේ කෙළවරක් නැතිබව හෙතු කොටගෙන; පුනඃ, නැවත; අස්‍ය, මේ ආක්ෂෙපයාගේ; අනන්තතා, කෙළවරක් නැතිබවයි.

121 අනඞ්ගඃ, අනඞ්ගතෙම; පෞෂ්පෛඃ, කුසුමමය වූ; ඉෂුභිඃ පඤ්චභිඃ, ශර පසින්; විශ්වම්, සකලලොකය; ව්‍යජයත, දිනීයයි; අසම්භාව්‍යම්, සම්භාවනීය නොවේ; යුක්ත නොවෙයි සේයි. අථ වා, එසේ කුමටදැ හෙවත් සම්භාවනා කටයුතු නොවෙයි යනු කුමටදැ; වස්තුශක්තයඃ, පදාර්ථයන්ගේ ශක්තීහු; විචිත්‍රාඃ, නානාප්‍රකාරයෝයි හෙවත් අචින්ත්‍යයෝයි-යම්හෙයකින් වස්තුශක්ති අචින්ත්‍යද එහෙයින් අනඞ්ගයාගේ තුන්ලොව දිනීම හැදහිය යුත්තේය යනු භාවයි.

122 ඉහ, මේ ප්‍රයොගයෙහි; ඉති, මේ අනන්තරොක්තප්‍රකාර වූ; හෙතුබලාත්, (පෞෂ්පපඤ්චශරත්වාදි) කාරණයාගේ සාමර්ථ්‍යයෙන්; ප්‍රවෘත්තෛව, පැවැත්තාම වූ; අනඞ්ගජයායොගබුද්ධිඃ, අනඞ්ගයාගේ විශ්වලොකවශීකරණලක්ෂණ වූ ජයයාගේ අසම්භාවනාබුද්ධිතොමෝ; යත්, යම්හෙයකින්; ආක්ෂිප්තා, දුරු කරනලදද; තත්, එහෙයින්; ඊදෘශඃ, මෙබඳු වූයේ; වෘත්තාක්ෂෙපඃ, භූතකාලාක්ෂෙපයයි දතයුතු-භූතකාලාක්ෂෙපයි.

123 කලභාෂිණි, මනොඥ කොට බණන්නිය; කර්ණෙ, ශ්‍රවණයෙහි; කුවලයම්, අවතංසොත්පලය; කුතඃ කරොෂි, කුමක් හෙයින් කෙරෙහිද; අපාඞ්ගම්, නෙත්‍රාන්තය; අස්මින් කර්මණි, මේ අවතංසොත්පලකෘත්‍යයෙහි; අපර්‍ය්‍යාප්තං මන්‍යසෙ කිම්, අසමර්ථයයි සිතහිද-තීගේ කණිය දක්වා ගිය ලොචනය ම අවතංසොත්පලකෘත්‍යය කරත් නැවත කණීයෙහි උත්පලන්‍යාස කුමට කෙරෙහිද? යනු භාවයි.

---

* "පුෂ්පෛර්"–ක. † "ස ඊදෘශඃ"–ක.

124 ස වර්තමානාක්ෂෙපෝ'යං කුර්වත්‍යෙවාසිතොත්පලම්
කර්ණෙ කාචිත් ප්‍රියෙණෛවං චාටුකාරෙණ රුධ්‍යතෙ.

125 සත්‍යං බ්‍රවීමි න ත්වං මාං ද්‍රෂ්ටුං වල්ලභ! ලප්ස්‍යසෙ
අන්‍යචුම්බනසඞ්ක්‍රාන්තලාක්ෂාරක්තෙන චක්ෂුෂා.

126 සෝ'යං භවිෂ්‍යදාක්ෂෙපඃ ප්‍රාගෙවාතිමනස්විනී
කදාචිදපරාධෝ'ස්‍ය භාවීත්‍යෙවමරුන්ධ යත්.

127 තව තන්වඞ්ගි! මිථ්‍යෛව රූඪමඞ්ගෙෂු මාර්දවම්
යදි සත්‍යං මෘදූන්‍යෙව කිමකාණ්ඩෙ රුජන්ති මාම්,

---

124 කාචිත්, කිසි ස්ත්‍රියක් තොමෝ; කර්ණෙ, (තමාගේ) ශ්‍රවණයෙහි; අසිතොත්පලම්, නීලොත්පලය; කුර්වත්‍යෙව, කරන්නී ම; ප්‍රියෙණ, වල්ලභයාවිසින්; චාටුකාරෙණ, නැළවිමෙන්; එවම්, මේ අනන්තරොක්ත ප්‍රකාරයෙන්; රුධ්‍යතෙ, වලකනු ලැබෙයි; එහෙයින්; සො'යම්, ඒ මේ අනන්තරොක්තප්‍රකාර වූ ආක්ෂෙපය තෙම; වර්තමානාක්ෂෙපඃ, වර්තමානාක්ෂෙපයයි (දතයුතු)-වර්තමානාක්ෂෙපයි.

125 වල්ලභ, ප්‍රියය; සත්‍යං බ්‍රවීමි, සැබවක් කියමි; ත්වම්, තෝ; අන්‍යචුම්බන, ප්‍රතියුවතියගේ චුම්බනයෙන්; සඞ්ක්‍රාන්ත, පැමිණි; ලාක්ෂාරක්තෙන, ලාරසයෙන් රත්වූ; චක්ෂුෂා, ඇසින්; මාම්, මා; ද්‍රෂ්ටුම්, දක්නට; න ලප්ස්‍යසෙ, නොලබන්නෙහියි.

126 යත්, යම්හෙයකින්; අතිමනස්විනී, සර්වප්‍රකාරයෙන් දෙෂක්ෂමා කිරීමෙහි පරාඞ්මුඛවූ අත්‍යර්ථයෙන් මනස් ඇත්තාවූ කිසි ස්ත්‍රියක්තොමෝ; අස්‍ය, මේ වල්ලභයාගේ; අපරාධඃ, ව්‍යලීකයෙක් හෙවත් නොකටයුත්තෙක්; කදාචිත්, කිසිකලෙක්හි; භාවී, වන්නේයයි; ප්‍රාගෙව, පළමු කොට ම; එවම්, මෙසේ (අනන්තරොක්තප්‍රකාරයෙන්); අරුන්ධ, වැළකූද; තත්, එහෙයින්; සො'යම්, ඒ මේ ආක්ෂෙපය තෙම; භවිෂ්‍යදාක්ෂෙපඃ, (මතු වන්නාවූ ම දයිතාලාභාදීහුගේ වැලකීම හෙතුකොටගෙන) භවිෂ්‍යදාක්ෂෙපයයි (දතයුතු)-භවිෂ්‍යදාක්ෂෙපයි.

127 තන්වඞ්ගි! කෘශවූ ගාත්‍ර ඇත්තිය; තව, තීගේ; අඞ්ගෙෂු, ශරීරයෙහි ලා; මාර්දවම්, සුකුමාරත්වය; මිථ්‍යෛව, බොරුවටම; රූඪම්, ප්‍රසිද්ධය; යදි සත්‍යම්, ඉදින් සැබවෙක් විනම්; මෘදූනි, (තීගේ ශරීරයෝ) සුකුමාර වූවාහු; අකාණ්ඩෙ, නොකරුණෙහි; මාම්, මා; කිං රුජන්ති, කුමැයි පෙළද්ද-පීඩන නම් ක්‍රූරයන් විසින් කටයුතුය මොළකුන්විසින් නොයෙදෙයි යනු භාවයි.

128 ධර්මාක්ෂෙපො'යමාක්ෂිප්තමඞ්ගනාගාත්‍රමාර්දවම්
කාමුකෙන යදෙතස්‍යාං කර්මණා තද්විරොධිනා.

129 සුන්දරී සා නවෙත්‍යෙෂ විවෙකඃ කෙන ජායතෙ
ප්‍රභාමාත්‍රං හි තරලං දෘශ්‍යතෙ තත්‍ර නාශ්‍රයඃ.*

130 ධර්ම්‍යාක්ෂෙපො'යමාක්ෂිප්තො ධර්මී ධර්මං ප්‍රභාහ්වයම්
අනුඥායාත්‍ර † යද්‍රූපමත්‍යාශ්චර්‍ය්‍යං විවක්ෂතා.

131 චක්ෂුෂී තව රජ්‍යෙතෙ ස්ඵුරත්‍යධරපල්ලවම් ‡
භ්‍රැවෞ ච භුග්නෙ + න තථාප්‍යදුෂ්ටස්‍යාස්ති මෙ භයම්.

---

128 අත්‍ර, මේ අනන්තරොක්ත ප්‍රයොගයෙහි ලා; යත්, යම්හෙය කින්; කාමුකෙන, කාමිහු විසින්: අඞ්ගනාගාත්‍රමාර්දවම්; ස්ත්‍රියගේ ශරීර සෞකුමාර්‍ය්‍යයතෙම; තද්විරොධිනා, ඒ මාර්දවයට ප්‍රතිපක්ෂවූ; කර්මණා, (රෑජරෑපවූ) ක්‍රියායෙන්; එවම්, මෙසේ; ආක්ෂිප්තම්, දුරුකරනලදද; තත්, එහෙයින්; අයම්, මේ අනන්තරොක්ත වූ ආක්ෂෙපයතෙම; ධර්මාක්ෂෙපඃ, ධර්මාක්ෂෙපයයි (දතයුතු).

129 හි (යස්මාත්), යම්හෙයකින්; තරලම්, උජ්ජ්වලවූ; ප්‍රභාමාත්‍රම්, ශොභාමාත්‍රයෙක්; දෘශ්‍යතෙ, දක්නාලැබේද; තත්‍ර, ඒ විෂයෙහි; ආශ්‍රයඃ, ඒ ප්‍රභාමාත්‍රයට ආශ්‍රයවූ ශරීරයතෙම; න දෘශ්‍යතෙ, නොදක්නාලැබේද; (තස්මාත්, එහෙයින්;) සා, තෝතොමෝ; සුන්දරී න වෙති, සුන්දරස්ත්‍රීයක් නොවන්නියයි; එෂ විවෙකඃ, මේ විභාගපරිඥානයතෙම; කෙන ජායතෙ, කවරහෙයකින් වන්නේද?

130 අත්‍ර, මෙහි ලා; යත්, යම්හෙයකින්; රූපම්, වර්ණසංස්ථානාත්මකවූ රූපය; අත්‍යාශ්චර්‍ය්‍යම්, ඉතා අද්භූත වූවා; විවක්ෂතා, කියනු කැමැත්තහුවිසින්; ප්‍රභාහ්වයම්, ශොභාය යන නම් ඇති: ධර්මම්, ගුණය; අනුඥාය, අනුදැන හෙවත් ආක්ෂිප්ත නොකොට; ධර්මී, ශරීර ලක්ෂණ වූ ආශ්‍රයතෙම; ආක්ෂිප්තඃ, වලකනලදද; තත්, එහෙයින්; අයම්, මේ අනන්තරොක්ත වූ ආක්ෂෙපයතෙම; ධර්ම්‍යාක්ෂෙපඃ, ධර්ම්‍යාක්ෂෙපයයි (දතයුතු)-ධර්ම්‍යාක්ෂෙපයයි.

131 තව, තිගේ; චක්ෂුෂී, නෙත්‍රුවය; රජ්‍යෙතෙ, (රැහැණීයෙන්) රත්වන්නාහ; අධරපල්ලවම්, ඔෂ්ඨපල්ලවතෙම; ස්ඵුරති, (කොපයෙන්) සෙලවෙන්නේය; භ්‍රැවෞ ච, භ්‍රැවයද; භුග්නෙ, බිඳුණාහ; තථාපි, එතෙකුදු වත්, අදුෂ්ටස්‍ය, නිරපරාධ වූ; මෙ, මට; භයං නාස්ති, භයෙක් නැති.

---

* "න තදාශ්‍රයඃ"-ක. † "අනුඥායෛව"-ක. ‡ "පල්ලවඃ"-ක.
\+ "භුග්නෞ"-ක.

132 ස එෂ කාරණාක්ෂෙපඃ ප්‍රධානං කාරණං භියඃ
ස්වාපරාධො නිෂිද්ධො'ත්‍ර යත් ප්‍රියෙණ පටීයසා.

133 දූරෙ ප්‍රියතමඃ සො'යමාගතො ජලදාගමඃ
දෘෂ්ටාශ්ච ඵුල්ලා නිචුලා න මෘතා චාස්මි කිං ත්විදම්.

134 කාර්‍ය්‍යාක්ෂෙපඃ ස කාර්‍ය්‍යස්‍ය මරණස්‍ය නිවර්ත්තනාත්
තත්කාරණමුපන්‍යස්‍ය දාරුණං ජලදාගමම්.

135 න චිරං මම තාපාය තව යාත්‍රා භවිෂ්‍යති
යදි යාස්‍යසි යාතව්‍යමලමාශඞ්කයා'ත්‍ර තෙ.

136 ඉත්‍යනුඥාමුඛෙනෛව කාන්තස්‍යාක්ෂිප්‍යතෙ ගතිඃ
මරණං සූචයන්ත්‍යෙව සො'නුඥාක්ෂෙප උච්‍යතෙ.

---

132 අත්‍ර, මෙහි ලා; පටීයසා, දොෂපරිහාරයෙහි චතුර වූ; ප්‍රියෙණ, වල්ලභයාවිසින්; භියඃ, භයට; ප්‍රධානං කාරණම්, මුඛ්‍යහෙතු වූ; ස්වාපරාධඃ, තමාගේ දොෂයතෙම; යත්, යම්හෙයකින්; නිෂිද්ධඃ, වලකනලද්ද; තත්, එහෙයින්; ස එෂඃ, ඒ මේ (අනන්තරොක්තප්‍රකාර වූ ආක්ෂෙපය) තෙම; කාරණාක්ෂෙපඃ, කාරණාක්ෂෙපයයි (දතයුතු)-කාරණාක්ෂෙපයි.

133 ප්‍රියතමඃ, වල්ලභතෙම; දූරෙ, (විරහීහෙයින්) දුරුව පවත්නේය; සො'යම් ජලදාගමඃ, ඒ මේ මේඝකාලයතෙම; ආගතඃ, පැමිණියේය; ඵුල්ලාඃ, පිපිමල්ඇති; නිචුලාශ්ච, දියඹුදෙල්රුක්හුද; දෘෂ්ටාඃ, දක්නාලද්දහ; අහංච, මමද; න මෘතා අස්මි, නොමළෙමි; ඉදම්, මේ; කිං නු, කිමෙක් දෝ හෝ—මෙතෙක් චිරනොද්භූත කාරණ ඇතිකල්හිද මා නොමෙළේ කවර දෛවවිලසිතයෙකින් දෝ හෝ යනු භාවයි.

134 තත්කාරණම්, ඒ මරණහෙතු වූ; දාරුණම්, දරුණු වූ; ජලදාගමම්, මේඝකාලය; උපන්‍යස්‍ය, දක්වා; කාර්‍ය්‍යස්‍ය, (ඒ මේඝකාලයාවිසින්) කටයුතුවූ; මරණස්‍ය, මරණයාගේ; නිවර්ත්තනාත්, වැලකීම හෙතුකොට ගෙන; සඃ, ඒ අනන්තරොක්තවූ ආක්ෂෙපයතෙම; කාර්‍ය්‍යාක්ෂෙපඃ, කාර්‍ය්‍යාක්ෂෙපයයි (දතයුතු)-කාර්‍ය්‍යාක්ෂෙපයි.

135 තව, තාගේ; යාත්‍රා, ගමන; චිරම්, බොහෝ කලක්; මම, මට; තාපාය, දුඃඛ පිණිස; න භවිෂ්‍යති, නොවන්නේය; යදි, ඉදින්; යාස්‍යසි, යෙහි නම්; යාතව්‍යම්, යායුතුය; අත්‍ර, මෙහි; තෙ, තාගේ; ආශඞ්කයා, සැකයෙන්; අලම්, පමණි—තාවිසින් නොරකරනලද මට තත්ක්ෂණ යෙහි මරණ වනු ඊනා අනික් කුමක්ද? සන්තාපයක් වනද නැත; එහෙයින් සැක නොකොට යෙහි නම් යා-යනු භාවයි.

136 ඉති, මෙසේ (අනන්තරොක්තප්‍රකාරයෙන්); අනුඥාමුඛෙනෛව, අනුඥාවාරයෙන් ම; මරණම්, (තමාගේ) මරණය; සූචයන්ත්‍යෙව, ප්‍රකාශ කරන්නියවිසින් ම; කාන්තස්‍ය, වල්ලභයාගේ; ගතිඃ, ගමන;

137 ධනඤ්ච බහු ලභ්‍යං තෙ සුඛං ක්ෂෙමඤ්ච වර්ත්මනි
න ච මෙ ප්‍රාණසන්දෙහස්තථාපි ප්‍රිය! මාස්ම ගාඃ.

138 ප්‍රත්‍යාචක්ෂාණයා * හෙතූන් ප්‍රියයාත්‍රාවිරොධිනඃ
ප්‍රභුත්වෙනෛව රුද්ධස්තත් † ප්‍රභුත්වාක්ෂෙප ඊදෘශඃ. ‡

139 ජීවිතාශා බලවතී ධනාශා දුර්බලා මම
ගච්ඡ වා තිෂ්ඨ වා කාන්ත! ස්වාවස්ථා තු නිවෙදිතා.

140 අසාවනාදරාක්ෂෙපො යදනාදරවද්වචඃ
ප්‍රියප්‍රයාණං රුන්ධත්‍යා ප්‍රයුක්තමිහ රක්තයා.

---

ආක්ෂිප්‍යතෙ, වලකනුලැබෙයි (එහෙයින්); සඃ, ඒ අනන්තරොක්ත වූ ආක්ෂෙපයතෙම; අනුඥාක්ෂෙපඃ ඉෂ්‍යතෙ, අනුඥාක්ෂෙපයයි කැමැතිවනු ලැබේ-අනුඥාක්ෂෙපයි.

137 ප්‍රිය, වල්ලභය; තෙ, තට; බහු, බොහෝවූ; ධනඤ්ච, ධනයද; ලභ්‍යම්, ලැබෙන්නේය; වර්ත්මනි, මාර්ගයෙහි; සුඛම්, සුවද; ක්ෂෙමඤ්ච, (ලබ්ධධනරක්ෂණලක්ෂණ වූ) ක්ෂෙමයද; ලභ්‍යම්, ලැබෙන්නේය; මෙ, මාගේ; ප්‍රාණසන්දෙහශ්ච න, ජීවිතයෙහි ශඞ්කාද නැත; තථාපි, එතෙකුදු වත්; මාස්ම ගාඃ, නොගමන් යා.

138 ප්‍රියයාත්‍රාවිරොධිනඃ, වල්ලභයාගේ ගමනට ප්‍රතිපක්ෂවූ; හෙතූන්, අයොගක්ෂෙමාදි කාරණයන්; ප්‍රත්‍යාචක්ෂාණයා, වලකන්නාවූ කිසි ස්ත්‍රියකවිසින්; ප්‍රභුත්වෙනෛව, ස්වප්‍රධානබැවින් ම; රුද්ධඃ, (ප්‍රියතෙම) වලකනලද; තත්, එහෙයින්; ඊදෘශඃ, මෙබඳු වූයේ; ප්‍රභුත්වාක්ෂෙපඃ, ප්‍රභුත්වාක්ෂෙපයයි (දතයුතු)-ප්‍රභුත්වාක්ෂෙපයි.

139 කාන්ත, වල්ලභය; මම, මාගේ; ජීවිතාශා, ප්‍රාණයෙහි ආශා තොමෝ; බලවතී, බලවත; ධනාශා, ධනයෙහි ආශාව; දුර්බලා, දුර්බලය; ගච්ඡ වා තිෂ්ඨ වා, යෙහිවා සිටිහිවා; ස්වාවස්ථා තු, තමාගේ අවස්ථාව වනාහි; නිවෙදිතා, ප්‍රකාශ කරනලදී.

140 යත්, යම්හෙයකින්; ඉහ, මේ ප්‍රයොගයෙහි; ප්‍රියප්‍රයාණම්, වල්ලභයාගේ ගමන; රුන්ධත්‍යා, වලකන්නාවූ; රක්තයා, වල්ලභයා කෙරෙහි අනුරක්තවූ කිසි ස්ත්‍රියකවිසින්; අනාදරවත්, ආස්ථා නැත්තාවූ; වචඃ, "ගච්ඡ වා තිෂ්ඨ වා" යන මේ වචන; ප්‍රයුක්තම්, ප්‍රයොග කරනලදද; තත්, එහෙයින්; අසෞ, මේතෙම; අනාදරාක්ෂෙපඃ, අනාදරාක්ෂෙපයයි (දතයුතු)-අනාදරාක්ෂෙපයි.

---

* "ඉත්‍යාචක්ෂාණයා"-ක. † "රුද්ධවාන්"-ප. ‡ "උච්‍යතෙ"-ක.

141 ගච්ඡ ගච්ඡසි චෙත් කාන්ත! පන්ථානස්සන්තු තෙ ශිවාඃ
මමාපි ජන්ම තත්‍රෛව භූයාද්‍යත්‍ර ගතො භවාන්.

142 ඉත්‍යාශීර්වචනාක්ෂෙපො යදාශීර්වාදවර්ත්මනා
ස්වාවස්ථාං සූචයන්ත්‍යෙව කාන්තයාත්‍රා නිෂිධ්‍යතෙ.

143 යදි සත්‍යෛව යාත්‍රා තෙ කාප්‍යන්‍යා ගෘහ්‍යතාං * ත්වයා
අහමද්‍යෛව රුද්ධාස්මි රන්ධ්‍රාපෙක්ෂෙණ මෘත්‍යුනා.

144 ඉත්‍යෙෂ පරුෂාක්ෂෙපඃ පරුෂාක්ෂරපූර්වකම්
කාන්තස්‍යාක්ෂිප්‍යතෙ යස්මාත් ප්‍රස්ථානං ප්‍රෙමනිඝ්නයා.

145 ගන්තා චෙද්ගච්ඡ තූර්ණං තෙ කර්ණං යාන්ති පුරාරවාඃ.
ආර්තබන්ධුමුඛොද්ගීර්ණාඃ ප්‍රයාණප්‍රතිබන්ධකාඃ. †

---

141 කාන්ත! වල්ලභය; ගච්ඡසි චෙත්, යන්නෙහි වී නම්; ගච්ඡ, යා; පන්ථානඃ, මාර්ගයෝ; තෙ, තට; ශිවාස්සන්තු, සුව එළවන්නාහු වෙත්වයි; භවාන්, භවත්තෙම; යත්‍ර ගතඃ, යම් දෙශයෙක්හි ගියේද; මමාපි, මාගේද; ජන්ම, උත්පත්තිය; තත්‍රෛව, එහි ම; භූයාත්, වේවා.

142 යත්, යම්හෙයකින්; ඉති, මෙසේ; ආශීර්වාදවර්ත්මනා, ඉෂ්ටාශංසනමුඛයෙන්; ස්වාවස්ථාම්, තමාගේ අවස්ථාව හෙවත් විනාශප්‍රාප්තිය; සූචයන්ත්‍යෙව, ප්‍රකාශ කරන්නියවිසින් ම, කාන්තයාත්‍රා, ප්‍රියයාගේ ගමන; නිෂිධ්‍යතෙ, වළකනුලැබේද; තත්, එහෙයින්; ආශීර්වචනාක්ෂෙපඃ, (මෙතෙම) ආශීර්වචනාක්ෂෙපයයි (දතයුතු)-ආශීර්වචනාක්ෂෙපයි.

143 තෙ, තාගේ; යාත්‍රා, ගමන; යදි, ඉදින්; සත්‍යෛව, සැබෑම වීනම්; ත්වයා, තාවිසින්; අන්‍යා කාපි, අනික් කිසි ප්‍රියාවක්ඃ ගෘහ්‍යතාම්, ගන්නාලැබේවා; අහම්, මම; රන්ධ්‍රාපෙක්ෂෙණ, (තාගේ විරහාදිලක්ෂණ වූ) අවකාශ සොයන; මෘත්‍යුනා, මරහුවිසින්; අද්‍යෛව, අද ම; රුද්ධාස්මි, වළකනලදිමි; හෙවත් මෘත්‍යුමුඛප්‍රාප්තයෙමි.

144 යස්මාත්, යම්හෙයකින්; ප්‍රෙමනිඝ්නයා, අනුරාගපරවශස්ත්‍රිය විසින්; ඉති, මෙසේ (අනන්තරොක්තප්‍රකාරයෙන්); පරුෂාක්ෂරපූර්වකම්, පරුෂවචන පුරස්සර කොට; කාන්තස්‍ය, වල්ලභයාගේ; ප්‍රස්ථානම්, ගමන; ආක්ෂිප්‍යතෙ, වළකනුලැබේද; (තස්මාත්, එහෙයින්;) එෂඃ, මේ තෙම; පරුෂාක්ෂෙපඃ, පරුෂාක්ෂෙපයයි (දතයුතු)-පරුෂාක්ෂෙපයි.

145 ගන්තා චෙත්, යන්නෙහි වීනම්; තූර්ණම්, ශීඝ්‍ර වැ; ගච්ඡ, යා; (කුමක්හෙයින්ද යත්?) ආර්තබන්ධුමුඛොද්ගීර්ණාඃ, (මාගේ මරණින්) ශොකාතුර වූ බන්ධූන්ගේ මුඛයෙන් හරනලද; ප්‍රයාණප්‍රතිබන්ධකාඃ, (තාගේ) ගමනට ප්‍රතිපක්ෂ වූ; ආරවාඃ, ස්වරයෝ; පුරා, ඇසිල්ලෙකින්; තෙ, තාගේ; කර්ණම්, කනට; යාන්ති, යන්නාහුයි.

---

* "මෘගෘහ්‍යතාං"-ක. † "පර්පතමිනඃ"-ක.

146 සාචිව්‍යාක්ෂෙප එවෛෂ යදත්‍ර ප්‍රතිෂිධ්‍යතෙ ,
ප්‍රියප්‍රයාණං සාචිව්‍යං කුර්වත්‍යෛවාතිරක්තයා. *

147 ගච්ඡෙති වක්තුමිච්ඡාමි මත්ප්‍රිය! ත්වත්ප්‍රියෛෂිණී †
නිර්ගච්ඡති මුඛාද්වාණී මා ගා ඉති කරොමි කිම්.

148 යත්නාක්ෂෙපස්ස යත්නස්‍ය කෘතස්‍යානිෂ්ටවස්තුනි
විපරීතඵලොත්පත්තෙරානර්ථක්‍යොපදර්ශනාත්.

149 ක්ෂණ ‡ දර්ශනවිඝ්නාය චක්ෂුඃස්පන්දාය + කුප්‍යතඃ
ප්‍රෙම්ණඃ ප්‍රයාණං ත්වං බ්‍රූහි මයා තස්‍යෙෂ්ටමිෂ්‍යතෙ.

---

146 යත්, යම්හෙයකින්; අත්‍ර, මේ ප්‍රයෝගයෙහි ලා; සාචිව්‍යම්, සහාය භාවය; කුර්වත්‍යෛව, කරන්නා ම වූ; අතිරක්තයා, අත්‍යර්ථයෙන් (වල්ලභයා කෙරෙහි) අනුරක්තවූ කිසි ස්ත්‍රියකවිසින්; ප්‍රියප්‍රයාණම්, වල්ලභයාගේ ගමන; ප්‍රතිෂිධ්‍යතෙ, වලකනුලැබේද; (තැ:මාත්, එහෙයින්:) එෂඃ, මේතෙම; සාචිව්‍යාක්ෂෙපඃ එව, සාචිව්‍යාක්ෂෙප නමැයි ම (දතයුතු)- සාචිව්‍යාක්ෂෙපයි.

147 මත්ප්‍රිය, මට ප්‍රියවූ වල්ලභය; ත්වත්ප්‍රියෛෂිණී, තට ප්‍රියයක් කැමැත්තාවූ මම; (තට ගමන් ප්‍රියහෙයින්;) ගච්ඡති, යායි; වක්තුම්, කියන්නට; ඉච්ඡාමි, කැමැත්තෙමි; එතෙකුදු වත්; මුඛාත්, (මාගේ) මුඛයෙන්; මාගා ඉති, නහමක් යායි යන; වාණී, වාක්තොමෝ; නිර්ගච්ඡති, නික්මෙන්නීය; කිං කරොමි, කුමක් කෙරෙම්ද ?

මේ ශ්ලොකයෙහි "ත්වත්ප්‍රියං මත්ප්‍රියෛෂිණී"ය යන පාඨයෙකුදු ඇත. එහි අර්ථ මෙසේ කියයුතු-ගච්ඡති, යායි; ත්වත්ප්‍රියම්, තට ප්‍රියයක්; වක්තුමිච්ඡාමි, කියනු කැමැත්තෙමි; එතෙකුදු වත්; මත්ප්‍රියෛෂිණී, මට ප්‍රියයක් කැමැත්තාවූ; වාණී, තෙපුල්තොමෝ; මාගා ඉති, නහමක් යායි; නිර්ගච්ඡති, නික්මෙන්නීය; කිං කරොමි, කුමක් කෙරෙම්ද?

148 අනිෂ්ටවස්තුනි, අනභිමතවූ අර්ථයෙහි හෙවත් ප්‍රියප්‍රයාණයෙහි; කෘතස්‍ය, කරනලද; යත්නස්‍ය, "යවයි කියනු කැමැත්තෙමි" යන ශ්‍රමයට; විපරීතඵලොත්පත්තෙඃ, විරුද්ධවූ "නොයව" යන මේ කාර්‍ය්‍යයාගේ උත්පත්තිය හෙතුකොටගෙන ඒ යත්නය නිරර්ථක වූය එහෙයින්; ආනර්ථක්‍යොපදර්ශනාත්, නිරර්ථකබවයාගේ ප්‍රකාශනය හෙතු කොටගෙන; සඃ, හෙතෙම; යත්නාක්ෂෙපඃ, යත්නාක්ෂෙප නම් (වන්නේ යයි දතයුතු)-යත්නාක්ෂෙපයි.

149 ක්ෂණදර්ශනවිඝ්නාය, ඇසිල්ලක් දැක්මට විඝ්න වූ; චක්ෂුඃස්පන්දාය, නෙත්‍රනිමෙෂයට; කුප්‍යතඃ, කිපෙන්නාවූ; ප්‍රෙම්ණඃ, ප්‍රෙමාග

---

* "චාතුරක්තයා"-ක, † "ත්වත්ප්‍රියං මත්ප්‍රියෛෂිණී"-ක.
‡ "ක්ෂණං"-ක. + "පක්ෂ්මස්පන්දය"-ක.

150 අයං * පරවශාක්ෂෙපො යත් ප්‍රෙමපරතන්ත්‍රයා
තයා නිෂිධ්‍යතෙ යාත්‍රෙත්‍යස්‍යාභීස්‍යොපසූචනාත්. †

151 සහිෂ්‍යෙ විරහං නාථ! දෙහ්‍යදෘශ්‍යාඤ්ජනං මම
යදඤ්ජනනෙත්‍රාං කන්දර්පඃ ප්‍රහර්තා ‡ මාං න පශ්‍යති.

152 දුෂ්කරං ජීවනොපායමුපන්‍යස්‍යොප + රුධ්‍යතෙ
පත්‍යුඃ ප්‍රස්ථානමිත්‍යාහුරුපායාක්ෂෙපමීදෘශම්.

153 ප්‍රවෘත්තෛව ප්‍රයාමීති වාණී වල්ලභ! තෙ මුඛාත්
අයතාපි ත්වයෙදානීං මන්දප්‍රෙම්ණා මමාස්ති කිම්.

---

සට; තෙ ප්‍රයාණම්, තාගේ ගමන; බ්‍රූහි, කිය; මයා, මා විසින්; තස්‍ය, ඒ ප්‍රෙමියට; ඉෂ්ටම්, අභිමතයෙක්; ඉෂ්‍යතෙ, කැමැතිවනුලැබේ-මම ප්‍රෙම පරවශබැවින් ස්වතන්ත්‍රයෙක් නොවෙමි, එහෙයින් තොපගේ ගමන් මට නොකියා මාගේ ප්‍රෙමියහට කියව ඉදින් ප්‍රෙමයාවිසින් අනුදත හොත් අපි තොපගේ ගමන වලකන්නට සමුරුමෝද ? යනු භාවයි.

150 යත්, යම්හෙයකින්; ප්‍රෙමපරතන්ත්‍රයා, ස්නෙහපරවශ වූ; තයා, ඒ ස්ත්‍රියවිසින්; යාත්‍රා, ගමන; නිෂිධ්‍යතෙ ඉති, වලකනුලැබන්නේය යන; අස්‍ය අභීස්‍ය, මේ අභීසාගේ: උපසූචනාත්, ප්‍රකාශ කිරීම හෙතු කොටගෙන; අයම්, මේතෙම; පරවශාක්ෂෙපඃ, පරවශාක්ෂෙපයයි (දත යුතු)-පරවශාක්ෂෙපයි.

151 නාථ, ස්වාමිය; විරහම්, (තාගේ දුසන වූ) විශෝගය; සහිෂ්‍යෙ, ක්ෂමා කෙරෙමි; (එසෙක් මතු;) ප්‍රහර්තා, පහරනාවූ; කන්දර්පඃ, අනඞ්ගතෙම; යදඤ්ජනනෙත්‍රාම්, යම් (අදෘශ්‍යාඤ්ජනයෙකින්) රඤ්ජිතවූ ඇස්ඇති; මාම්, මා; න පශ්‍යති, නොදක්නේද; (තත්) අදෘශ්‍යාඤ්ජනම්, (ඒ) අදෘශ්‍යාඤ්ජනය; මම, මට; දෙහි, දෙ.

152 දුෂ්කරම්, නොකට හැක්වූ හෙවත් දුලීහවූ; ජීවනොපායම්, (අදෘශ්‍යාඤ්ජනස්වරූප වූ) ජීවනොපායයක්; උපන්‍යස්‍ය, උපන්‍යස්ත කොට හෙවත් කියා; පත්‍යුඃ, වල්ලභයාගේ: ප්‍රස්ථානම්, ගමන; උපරුධ්‍යතෙ, වලකානුලබන්නේය; ඉති, මෙසෙයින්; ඊදෘශම්, මෙබඳු වූයේ; උපායාක්ෂෙපම්, උපායාක්ෂෙපයයි; ආහුඃ, කියත්-උපායාක්ෂෙපයි.

153 වල්ලභ, ප්‍රියය; තෙ මුඛාත්, තාගේ මුඛයෙන්: ප්‍රයාමීති, යෙමි යන; වාණී, වාක්තොමෝ; ප්‍රවෘත්තෛව, පැවැත්තීමය; ඉදානීම්, දැන්; අයතාපි, නොයන්නාද වූ; මන්දප්‍රෙම්ණා, මඳවූ සෙනෙහ ඇති; ත්වයා, තා විසින්; මම, මට; කිමස්ති, කුමන කාර්‍ය්‍යයෙක් ඇද්ද?

---

* "නොයං"-ක. † "ය්‍යන්‍යාභිසෙස්‍යාපදශීනාත්"-ක. ‡ "ප්‍රහර්තුං"-ක.
+ "න්‍යස්‍යාව"-ස.

154 රොෂාක්ෂෙපො'යමුද්‍රික්තස්නෙහනිර්‍යන්ත්‍රිතාත්මයා *
සංරබ්ධයා ප්‍රියාරබ්ධං ප්‍රයාණං යන්නිවාර්‍ය්‍යතෙ. †

155 මුග්ධා කාන්තස්‍ය යාත්‍රොක්තිශ්‍රවණාදෙව මූර්ච්ඡිතා
බුද්ධ්වා ‡ වක්ති ප්‍රියාශ්ලිෂ්ටා + කිං චිරෙණාගතො භවාන්.

156 ඉති තත්කාලසම්භූතමූර්ච්ඡයාක්ෂිප්‍යතෙ ගතිඃ
කාන්තස්‍ය කාතරාක්ෂ්‍යෙව ** මූර්ච්ඡාක්ෂෙපසස ඊදෘශඃ.

157 නාඝ්‍රාතං න කෘතං කර්ණෙ ස්ත්‍රීභිර්මධුනි නාර්පිතම්
ත්වද්විෂාං දීර්ඝිකාස්වෙව විශීර්ණං නීලමුත්පලම්.

---

154 උද්‍රික්ත, අධිකවූ; ස්නෙහ, ප්‍රෙමයෙන්; නිර්‍යන්ත්‍රිතාත්මයා, නොහැම්මෙන සිත් ඇති; සංරබ්ධයා, කිපුණාවූ ස්ත්‍රියවිසින්; ප්‍රිය, වල්ලභයාවිසින්; ආරබ්ධම්, පටන් ගන්නාලද; ප්‍රයාණම්, ගමන; යත්, යම්හෙයකින්; නිවාර්‍ය්‍යතෙ, වලකනුලැබේද; එහෙයින්; අයම්, මේතෙම; රොෂාක්ෂෙපඃ, රොෂාක්ෂෙපයයි (දතයුතු)-රොෂාක්ෂෙපයි.

155 "මුග්ධා, බොළඳ තැනැත්ති; කාන්තස්‍ය, වල්ලභයාගේ; යාත්‍රොක්තිශ්‍රවණාදෙව, ගමනොක්තිය ඇසීමෙන් ම; මූර්ච්ඡිතා, මුසපත් වූවා; ප්‍රියාශ්ලිෂ්ටා, වල්ලභයාවිසින් වැලඳගන්නාලද්දී; බුද්ධ්වා, පිබිද; (සිහිසන්ලැබ;) කිම්, කිම; භවාන්, පින්වත්තෙම; චිරෙණ, කලෙකින්; ආගතඃ, ආයේයයි: වක්ති, කියා.

156 ඉති, මෙසේ; තත්කාලසම්භූතමූර්ච්ඡයා, එකෙණෙහි හටගත් මූර්ච්ඡාඇති; කාතරාක්ෂ්‍යා, බැගෑඇස්ඇත්තියකවිසින්; කාන්තස්‍ය, වල්ලභයාගේ; ගතිඃ, ගමන; ආක්ෂිප්‍යතෙ එව, වලක්වනුලැබේමය (යන යමෙක් ඇද්ද); ඊදෘශඃ, මෙබඳුවූ; සඃ, ඒ ආක්ෂෙපයතෙම; මූර්ච්ඡාක්ෂෙපඃ, මූර්ච්ඡාක්ෂෙප නම් වන්නේයි."a-මූර්ච්ඡාක්ෂෙපයි.

157 උත්පලම්, උත්පලය; ස්ත්‍රීභිඃ, ස්ත්‍රීන්විසින්; නාඝ්‍රාතම්, නොගිඹිනාලද; කර්ණෙ, කන්හි; න කෘතම්, නොකරනලද හෙවත් අවතංසොත්පලකෘත්‍යයෙහි නොයොදනලද; මධුනි, සුරායෙහි; නාර්පිතම්, නොපිහිටුවනලද; වැළි කුමක් විද යත්? ජීර්ණම්, දිරාගියේ; ත්වද්විෂාම්, තාගේ සතුරන්ගේ; දීර්ඝිකාස්වෙව; ගෘහොද්‍යානයෙහි විල්හිම; විශීර්ණම්, විසිර ගියේ.

---

* "නිෂ්ධ්‍යතෙ"-ක. † "නිර්‍යන්ත්‍රිතාත්මනා"-ක.
‡ "බුධ්වා"-ක. + "ප්‍රියං දෘෂ්ට්වා"-ක. ** "කාතරාක්ෂ්‍යා යත්"-ක.

a "ශ්ලොකමවයම්දං න බහුෂු පුස්තකෙෂු දෘශ්‍යතෙ"යි ආචාර්‍ය්‍ය ප්‍රෙමචන්ද්‍රයන් කිලෙසින් ම සන්නයෙහිද මෙදෙකට සන්න නොලියනලදින් ශ්ලොක පමණෙක් ම ආයේය. එහෙයින් ඊට සන්නය අපවිසින් ලියන ලදී.

158 අසාවනුක්‍රොශාක්ෂෙපස්සානුක්‍රොශමිවොත්පලෙ
ව්‍යාවර්ත්‍ය කර්ම තද්‍යොග්‍යං ශොච්‍යාවස්ථොපසූචනාත්. *

159 අමෘතාත්මනි පද්මානාං ද්වෙෂ්ටරි ස්නිග්ධතාරකෙ
මුඛෙන්දෞ තව සත්‍යස්මින්නිතරෙණ † කිමින්දුනා.

160 ඉති මුඛෙන්දුරාක්ෂිප්තො ගුණාන් ගෞණෙන්දුවර්තිනඃ
තත්සමාන් දර්ශයිත්වෙහ ශ්ලිෂ්ටාක්ෂෙපස්තථාවිධඃ.

161 අර්ථො න සම්භෘතඃ කශ්චින්න විද්‍යා කාචිදර්ජිතා
න තපස්සඤ්චිතං කිඤ්චිද්ගතඤ්ච සකලං වයඃ.

162 අසාවනුශයාක්ෂෙපො යස්මාදනුශයොත්තරම්
අර්ථාර්ජනාදෙර්ව්‍යාවෘත්තිර්දර්ශිතෙහ ගතායුෂා.

---

158 උත්පලෙ, උත්පලයෙහි; සානුක්‍රොශමිව, කරුණාසහිත ව මෙන්; තද්‍යොග්‍යං, ඒ උත්පලයට සුදුසුවූ; කර්ම, ආඝ්‍රාණක්‍රියාව; ව්‍යාවර්ත්‍ය, වළකා; ශොච්‍යාවස්ථොපසූචනාත්, අනුකම්පාවට සුදුසුවූ ජීර්ණාවස්ථාවගේ දැක්වීම හෙතුකොටගෙන; අසෞ, මේ අනන්තරොක්තවූ ආක්ෂෙපය; අනුක්‍රොශාක්ෂෙපඃ, අනුක්‍රොශාක්ෂෙපයයි (දතයුතු)-අනුක්‍රොශාක්ෂෙපයි.

159 අමෘතාත්මනි, අමෘතයට බඳු වූ ස්වරූප ඇති නොහොත් අමෘත මැ ශරීර කොට ඇති; පද්මානාං ද්වෙෂ්ටරි, පද්මයන්ට සතුරුවූ; ස්නිග්ධතාරකෙ, රක්ත වූ නෙත්‍රමධ්‍යභාග ඇති නොහොත් ස්නිග්ධ වූ රොහිණ්‍යාදි තාරකාවන් ඇති; තව, තිගේ; අස්මින් මුඛෙන්දෞ සති, මේ මුඛචන්ද්‍රයා ඇතිකල්හි; ඉතරෙණ ඉන්දුනා කිම්, අනික් මුඛ්‍යචන්ද්‍රයාවිසින් කුමන ප්‍රයොජනයෙක්ද?

160 ඉති, මෙසේ (අනන්තරොක්ත ක්‍රමයෙන්): තත්සමාන්, ඒ මුඛ්‍යචන්ද්‍රයා හා සමවූ; ගුණාන්, අමෘතමයත්වාදි ගුණයන්; ගෞණෙන්දුවර්තිනඃ, අමුඛ්‍යවූ මුඛචන්ද්‍රයා කෙරෙහි පවත්නාවුන්; දර්ශයිත්වා, දක්වා; මුඛෙන්දුඃ, මුඛ්‍යචන්ද්‍රතෙම; ආක්ෂිප්තඃ, (වක්තෘයාවිසින් කිම්දැයි) දුරුකරන ලද; ඉති, මෙසෙයින්; තථාවිධඃ, එබඳුවූයේ: ශ්ලිෂ්ටාක්ෂෙපඃ, ශ්ලෙෂ ප්‍රයොග හෙතුකොටගෙන ශ්ලිෂ්ටාක්ෂෙපයයි (දතයුතු)-ශ්ලිෂ්ටාක්ෂෙපයි.

161 කශ්චිත් අර්ථඃ, කිසි ධනයෙක්; න සම්භෘතඃ, රැස් නොකරනලද: කාචිත් විද්‍යා, තර්කවිද්‍යාදි වූ කිසි විද්‍යාවක්; නාර්ජිතා, රැස් නොකරනලද; කිඤ්චිත් තපඃ, කිසි තපසෙක්ද; න සඤ්චිතම්, රැස් නොකරනලද; සකලං වයශ්ච, සියලු වයසද; ගතම්, ගියේ.

162 යස්මාත්, යම්හෙයකින්; ගතායුෂා, ගතවයස්කවූවිසින් හෙවත් මහල්ලාවිසින්; අනුශයොත්තරම්, පශ්චාත්තාපය මැ අධික කොට; අර්ථාර්ජ

---

* "දර්ශිතාත්"-ක. † "න්නපරෙණ"-ක.

163 කිමයං ශරදම්භොදඃ කිං වා හංසකදම්බකම්
රුතං නූපුරසංවාදි ශ්‍රූයතෙ තන්න තොයදඃ.

164 ඉත්‍යයං සංශයාක්ෂෙපස්සංශයො යන්නිවර්ත්‍යතෙ
ධර්මෙණ හංසසුලභෙනාස්පෘෂ්ටඝනජාතිනා.

165 චිත්‍රමාක්‍රාන්තවිශ්වොපි වික්‍රමස්තෙ න තෘප්‍යති *
කදා වා දෘශ්‍යතෙ තෘප්තිරුදීර්ණස්‍ය හවිර්භුජඃ.

166 අයමර්ථාන්තරාක්ෂෙපඃ ප්‍රක්‍රාන්තො යෙන වාර්‍ය්‍යතෙ †
විෂමයො'ර්ථාන්තරස්‍යෙහ දර්ශිතාත්තත්සධර්මණඃ.

---

නාදෙඃ, ධනරැස්කිරීම්ආදීහුගේ; ව්‍යාවෘත්තිඃ, නිෂෙධය; එවම්, මෙසේ (අනන්තරොක්තක්‍රමයෙන්); දර්ශිතා, දක්වනලද්ද; (එහෙයින්); අසෞ, මේ අනන්තරොක්ත වූ ආක්ෂෙපය; අනුශයාක්ෂෙපඃ, අනුශයාක්ෂෙපයයි (දතයුතු)-අනුශයාක්ෂෙපයි.

163 අයම්, මේතෙම; ශරදම්භොදඃ කිම්, ශරත්කාලයෙහි මෙඝයෙක් දෝ හෝ නොහොත්; නූපුරසංවාදි, නූපුරධ්වනිය හා සදෘශ වූ; රුතම්, නාදය; ශ්‍රූයතෙ, අසනුලැබෙයි; තත්, එහෙයින්; තොයදෙ න, මෙඝයෙක් නොවේ; හංසසමූහයෙක යනු භාවයි.

164 යත්, යම්හෙයකින්; හංසසුලභෙන, හංසයන්කෙරෙහි හෝ නොහොත් හංසයන්විසින් සුලභ වූ; අස්පෘෂ්ටඝනජාතිනා, ස්පර්ශ නොකරනලද මෙඝජාති ඇති; ධර්මෙණ, ගුණයෙන් නොහොත් නූපුරනිනාද සදෘශ රුතයෙන්; සංශයඃ, මේ ශරත් මෙඝයෙක් දෝ හෝ හංසසමූහයෙක් දෝ හෝ යන මේ සන්දෙහය; නිවර්ත්‍යතෙ, වලකනුලැබේද; තත්, එහෙයින්; ඉත්‍යයම්, මෙබඳුවූයේ; සංශයාක්ෂෙපඃ, සංශයාක්ෂෙප නමැයි දතයුතු-සංශයාක්ෂෙපයි.

165 තෙ, තාගේ; වික්‍රමඃ, ශෞර්‍ය්‍යයතෙම; ආක්‍රාන්තවිශ්වොපි, මඩනාලද සියලු ජගත් ඇත්තේද පවා; න තෘප්‍යති, තෘප්ත නොවන්නේය හෙවත් අභිලසිතාවසානයට නොයන්නේය; චිත්‍රම්, අද්භූතයැ; හි, එසේමැයි; උදීර්ණස්‍ය, අතිමාත්‍ර වූ; හවිර්භුජඃ, වහ්නිහුගේ; තෘප්තිඃ, පිනායාම; කදා වා දෘශ්‍යතෙ, කවර දවසෙක දක්නාලැබේද? යම්සේ උදීර්ණානලය අතෘප්තද එසේම තාගේ ශෞර්‍ය්‍යයද අතෘප්තයැ සිසේයි.

166 යෙන, යම්හෙයකින්; ඉහ, මේ ප්‍රයොගයෙහි; ප්‍රක්‍රාන්තඃ, ප්‍රස්තුතවූ; විෂමයඃ, ආශ්චර්‍ය්‍යයතෙම; තත්සධර්මණඃ, ඒ වික්‍රමය හා සදෘශ වූ; අර්ථාන්තරස්‍ය, වහ්නිහුගේ; දර්ශිතාත්, දැක්වීම හෙතුකොටගෙන; වාර්‍ය්‍යතෙ, වලකනුලැබේද; තත්, එහෙයින්; අයම්, මේතෙම; අර්ථාන්තරාක්ෂෙපඃ, අර්ථාන්තරාක්ෂෙපයයි දතයුතු-අර්ථාන්තරාක්ෂෙපයි.

---

* "න ශාම්‍යති"-ක. † "යන්නිවාර්‍ය්‍යතෙ"-ක.

167 න ස්තූයසෙ නරෙන්ද්‍ර! ත්වං දදාසීති කථචන *
ස්වමෙව මත්වා ගෘහ්ණන්ති යතස්ත්වද්ධනමර්ථිනඃ.

168 ඉත්‍යෙවමාදිරාක්ෂෙපො හෙත්වාක්ෂෙප ඉති ස්මෘතඃ
අනයෛව දිශාන්‍යෙ'පි විකල්පාශ්ශක්‍යමූහිතුම්. †

ඉති ආක්ෂෙපචක්‍රම්.

169 ඥෙයඃ සො'ර්ථාන්තරන්‍යාසො වස්තු ප්‍රස්තුත්‍ය කිඤ්චන
තත්සාධනසමර්ථස්‍ය න්‍යාසො යො'න්‍යස්‍ය වස්තුනඃ.

170 විශ්වව්‍යාපී විශෙෂස්ථශ්ශ්ලෙෂාවිද්ධො විරොධවාන්
අයුක්තකාරී යුක්තාත්මා යුක්තායුක්තො විපර්‍ය්‍යයඃ.

171 ඉත්‍යෙවමාදයො භෙදාඃ ප්‍රයොගෙෂ්වස්‍ය ලක්ෂිතාඃ
උදාහරණමාලෛෂාං රූපව්‍යක්තෙනීතිදර්ශ්‍යතෙ. ‡

---

167 නරෙන්ද්‍ර, රජ; යතඃ, යම්හෙයකින්; අර්ථිනඃ, යාචකයෝ; ත්වද්ධනම්, තාගේ වස්තුව; ස්වමෙව මත්වා, තමන්ගේමයයි සිතා; ගෘහ්ණන්ති, ගනිද්ද; (එහෙයින්;) ත්වම්, තෝ; දදාසීති, (අර්ථින්ට) දෙන්නෙහියයි; කථචන, කිසිසේද; න ස්තූයසෙ, ස්තුති නොකරනුලැබෙහි.

168 ඉත්‍යෙවමාදි, මේ ආදිවූ ආක්ෂෙපයතෙම; හෙත්වාක්ෂෙපඃ ඉති, හෙතුපන්‍යාසයෙන් නිෂෙධ කළහෙයින් හෙත්වාක්ෂෙපයයි; ස්මෘතඃ, තජ්ඥයන්විසින් දන්නාලද; අන්‍යෙපි විකල්පාඃ, සෙසු ආක්ෂෙපප්‍රයොගද; අනයෛව දිශා; මේ අනන්තරදර්ශිත වූ ආක්ෂෙපවිකල්පගතියෙන්ම; ඌහිතුම්, ඌහා කරන්නට; ශක්‍යම්, පිළිවන්හුයි.

169 කිඤ්චන වස්තු, කිසි අර්ථරූපයක්; ප්‍රස්තුත්‍ය, කියා; තත්සාධන සමර්ථස්‍ය, ඒ ප්‍රස්තුතාර්ථයාගේ සැධීමට යොග්‍ය වූ; අන්‍යස්‍ය වස්තුනඃ, අනික් වස්තුවක්හුගේ; යො න්‍යාසඃ, යම් ප්‍රයොගයෙක් ඇද්ද: සඃ, ඒ තෙම; අර්ථාන්තරන්‍යාසඃ ඥෙයඃ, අර්ථාන්තරන්‍යාසාලඞ්කාරයයි දතයුතු.

170 විශ්වව්‍යාපී, විශ්වව්‍යාපිය; විශෙෂස්ථඃ, විශෙෂස්ථය; ශ්ලෙෂාවිද්ධඃ, ශ්ලෙෂාවිද්ධය; විරොධවාන්, විරොධවන්තය; අයුක්තකාරී, අයුක්තකාරිය; යුක්තාත්මා, යුක්තාත්මය; යුක්තායුක්තඃ, යුක්තායුක්තය; විපර්‍ය්‍යයඃ. අයුක්තායුක්තයයි.

171 ඉත්‍යෙවමාදයඃ, මේ ආදිවූ; අස්‍ය භෙදාඃ, මේ අර්ථාන්තරන්‍යාසයාගේ ප්‍රකාරයෝ; ප්‍රයොගෙෂු, කාව්‍යයෙහි ලා; ලක්ෂිතාඃ, දන්නාලදහ; එෂාම්, මොවුන්ගේ; රූපව්‍යක්තෙඃ, ස්වරූප ප්‍රකාශ කරනපිණිස; උදාහරණමාලා, ප්‍රයොගපඞ්ක්තිතොමෝ; නිදර්ශ්‍යතෙ, දක්වනුලැබේ.

---

* "කදාචන"–ක. ප.

† "අනයෛව දිශාන්‍යා 'පි විකල්පාඃ ශක්‍ය ඌහිතුම්"–ක.

‡ "ව්‍යක්ත්‍යෛ නිදර්ශ්‍යතෙ"–ක.

172 භගවන්තෞ ජගන්නේත්‍රේ සූර්‍ය්‍යාචන්ද්‍රමසාවපි
පශ්‍ය ගච්ඡත එවාස්තං නියතිඃ කේන ලඞ්ඝ්‍යතේ.

173 පයෝමුචඃ පරීතාපං හරන්ත්‍යේතේ * ශරීරිණාම්
නන්වාත්මලාභෝ මහතාං පරදුඃඛෝපශාන්තයේ.

174 උත්පාදයති ලෝකස්‍ය ප්‍රීතිං මලයමාරුතඃ
නනු දාක්ෂිණ්‍යසම්පන්නඃ සර්වස්‍යාවහති ප්‍රියම්.†

175 ජගදාහ්ලාදයත්‍යේෂ ‡ මලිනෝ'පි නිශාකරඃ
අනුගෘහ්ණාති හි පරාන් සදෝෂෝ'පි ද්විජේශ්වරඃ.

---

172 භගවන්තෞ, (ගුණසමූහයෝගයෙන්) භගවත් වූ; ජගන්නේත්‍රේ, ලෝකයාහට ඇස්දෙකක් වැනිවූ; සූර්‍ය්‍යාචන්ද්‍රමසාවපි, සඳහිරු දෙදෙන පවා; අස්තම්, අස්තපර්වතයට දෝ හෝ නොහොත් විනාශයට; ගච්ඡත එව, යන්නාහුමය; පශ්‍ය, බල; නියතිඃ, නියතිතොමෝ; කේන, කවරක්හුවිසින්; ලඞ්ඝ්‍යතේ, ඉක්මෙනුලැබේද?–සියලු වස්තූන්ගේ ම විනාශය ධර්මයැ එහෙයින් සූර්‍ය්‍ය චන්ද්‍ර දෙදෙනාගේ අස්තප්‍රාප්තිය ආශ්චර්‍ය්‍ය නොවන්නේයයි මෙසේ ප්‍රස්තුත වූ අර්ථයතෙම "නියතිඃ කේන ලඞ්ඝ්‍යතේ" යන මෙයින් සාධනලද. විනාශප්‍රාප්තිය සර්වව්‍යාපිහෙයින් මෙබඳු වූයේ විශ්වව්‍යාපියයි දතයුතු–විශ්වව්‍යාපියි.

173 එතේ පයෝමුචඃ, මේ මෙඝයෝ; ශරීරිණාම්, ස්ථාවරජඞ්ගමසත්ත්වයන්ගේ; පරීතාපම්, සන්තාපය; හරන්ති, දුරුකෙරෙත්; මහතාම්, මහතුන්ගේ; ආත්මලාභඃ, ජීවිතලාභයතෙම; පරදුඃඛෝපශාන්තයේ නනු, අනුන්ගේ දුක් සන්හිඳුවනපිණිස මැ වේද?—මෙඝයෝ සත්ත්වයන්ගේ සන්තාපය දුරුකෙරෙත් යන මේ ප්‍රස්තුත වූ අර්ථයතෙම "නන්වාත්මලාභඃ" යන මේ ආදින් සාධනලදී–මෙහි පරදුඃඛශමනය මහතුන්ගේ ම ස්වභාවය හෙයින් මේතෙම විශෙෂස්ථයයි දතයුතු–විශෙෂස්ථයි.

174 මලයමාරුතඃ, දක්ෂිණමාරුතයතෙම; ලෝකස්‍ය, ලොවැස්සහට; ප්‍රීතිම්, සතුටක්; උත්පාදයති, උපදවා; දාක්ෂිණ්‍ය, පරචිත්තානුකූල වැ පැවැත්මෙන් දෝ හෝ නොහොත් දකුණුදික්හි වූබැවින්; සම්පන්නඃ, යුක්තවූයේ; සර්වස්‍ය, සියල්ලහට; ප්‍රියම්, ප්‍රියයක්ම; ආවහති නනු, එළවන්නේ වේද? මෙහි මලයපවනතෙම ලෝවැස්සන්ට ප්‍රීති එළවන්නේය යන මේ ප්‍රස්තුත වූ අර්ථයතෙම "නනු දාක්ෂිණ්‍යසම්පන්නඃ" යන මේ ආදියෙන් සාධනලදී–මෙහි "දාක්ෂිණ්‍යසම්පන්නඃ" යන මෙබඳුවූ ශ්ලේෂයෙන් අනුවිද්ධහෙයින් ශ්ලේෂානුවිද්ධ නමැයි දතයුතු–ශ්ලේෂානුවිද්ධයි.

175 මලිනෝපි, කලඞ්කයෝගයක් හෙතුකොටගෙන අශුද්ධ වූ; එෂ නිශාකරඃ, මේ චන්ද්‍රතෙම; ජගත්, ලොව; ආහ්ලාදයති, පිනවා; එසේ

* "හරන්ත්‍යව"–ක. † "භවති ප්‍රියඃ"–ක. ‡ "නන්දයත්‍යෙෂ"–ක.

176 මධුපානකලාත් කණ්ඨාන්නිර්ගතො'ප්‍යලිනාං ධ්වනිඃ
කටුර්භවති කර්ණස්‍ය කාමිනාං පාපමීදෘශම්.

177 අයං මම දහත්‍යඞ්ගමම්භොජදලසංස්තරඃ
හුතාශනප්‍රතිනිධිර්දාහාත්මා නනු යුජ්‍යතෙ.

178 ක්ෂිණොතු කාමං ශීතාංශුඃ කිං වසන්තො දුනොති මාම්
මලිනාචරිතං කර්ම සුරභෙර්නන්වසාම්ප්‍රතම්.

---

මැයි; සදොෂොපි, දොෂසහිතද වූ; විජේශ්වරඃ, චන්ද්‍ර දෙ හෝ නොහොත් බ්‍රාහ්මණාධිපතිතෙම; පරාන්, අනුන්; අනුගෘහ්ණාති හි, අනුග්‍රහ කෙරේ මැයි-මේ උක්තක්‍රමයෙන් මලින වූයේද ලොකයාහට ප්‍රීති උපදවන්නේය යන මේ විරොධයාගේ දර්ශනය හෙතු කොට විරොධවත්යයි දතයුතු-විරොධවත්යි.

176 අලිනාම්, භෘඞ්ගයන්ගේ; මධුපාන, කුසුමාසවපානයෙන්; කලාත්, මනොඥවූ; කණ්ඨාත්, කණ්ඨයෙන්; නිර්ගතොපි, නික්මුණාවූද; ධ්වනිඃ, නාදයතෙම; කර්ණස්‍ය, කනට; කටුර්භවති, කර්කශ වන්නේය; කාමිනාම්, රාගීන්ගේ; පාපම්, පාපය; ඊදෘශම්, මෙබඳුයි. මධුරධ්වනි හුගේ කටුත්වයෙන් ප්‍රවෘත්තිය අයුක්තිහෙයින් මේතෙම අයුක්තකාරී නම් වේ-අයුක්තකාරීයි.

177 අයම් අම්භොජදලසංස්තරඃ, මේ පද්මපත්‍රශයනයතෙම; මම අඞ්ගම්, මාගේ ශරීරය; දහති, දවන්නේය; හුතාශනප්‍රතිනිධිඃ, (පාටලත්වය හෙතුකොටගෙන) වහ්නිසදෘශ වූයේහෙමේ; දාහාත්මා, දාහස්වභාව ඇත්තේ; යුජ්‍යතෙ නනු, යොග්‍ය වන්නේ වේද? -පද්මයන්ට අයුක්ත වූයේද දහනගුණය "හුතාශනප්‍රතිනිධිඃ" යනාදියෙන් සාධනලදි-මේතෙම කියනලද ප්‍රකාරයේන් දාහකත්වයොගය හෙතු කොටගෙන යුක්තාත්ම නම් වන්නේයි-යුක්තාත්මයි.

178 ශීතාංශුඃ, චන්ද්‍රතෙම; ක්ෂිණොතු, පෙලාවා; 'කාමම්' යනු අභ්‍යුපගම යෙහියි. වසන්තඃ, වසන්තතෙම; මාම්, මා; කිං දුනොති; කුමකැයි තවාද; මලින, මලිනයාවිසින් හෙවත් චන්ද්‍රයා විසින්; ආචරිතම්, කරනලද; කර්ම, ක්‍රියාව; සුරභෙඃ, වසන්තයහට දෙ හෝ නොහොත් උත්තමයහට; අසාම්ප්‍රතං නනු, අයුක්ත වේද ?-දුෂ්ටයන් විසින් කරනලද ක්‍රියාව නිර්දොෂ තෙම කවරහෙයකින් සෙවුනේද? එහෙයින් චන්ද්‍රතෙම තවාවයි වසන්ත කුමට සන්තාප කරන්නේදැයි පූර්වපක්ෂය සමර්ථනය කරනලදි. චන්ද්‍රයාවිසින් තාපයොගය හෙතු කොටගෙනද වසන්තයාවිසින් තාපයාගේ අයොගය හෙතු කොටගෙනද මේතෙම යුක්තායුක්තයයි දතයුතු-යුක්තායුක්තයි.

179 කුමුදාන්‍යපි දාහාය කිමයං * කමලාකරඃ
න හීන්දුගෘහ්‍යෙෂූග්‍රෙෂු සූර්‍ය්‍යගෘහ්‍යො මෘදුර්භවෙත්.

ඉත්‍යර්ථාන්තරන්‍යාසචක්‍රම්.

180 ශබ්දොපාත්තෙ ප්‍රතීතෙ වා සාදෘශ්‍යෙ වස්තුනොර්ද්වයොඃ
තත්‍ර යද්භෙදකථනං ව්‍යතිරෙකස්ස කථ්‍යතෙ. †

181 ධෛර්‍ය්‍යලාවණ්‍යමාහාත්ම්‍ය ‡ ප්‍රමුඛෛස්ත්වමුදන්වතඃ
ගුණෛස්තුල්‍යො'සි භෙදස්තු වපුෂෛවෙදෘශෙන තෙ.

182 ඉත්‍යෙකව්‍යතිරෙකො'යං ධර්මෙණෛකත්‍රවර්ත්තිනා
ප්‍රතීතිවිෂයප්‍රාප්තෙර්භෙදස්‍යොභයවර්ත්තිනඃ.

---

179 කුමුදාන්‍යපි, කුමුදයෝ පවා; දාහාය, සන්තාප පිණිස (සමර්ථ වන්නාහ); කමලාකරඃ, පද්මාකරයතෙම; කිමයං, කාකථා ද; ඉන්දුගෘහ්‍යෙෂු, චන්ද්‍රයාගේ පක්‍ෂයෙහි වූවවුන්; උග්‍රෙෂු, උග්‍ර කල්හි; සූර්‍ය්‍යගෘහ්‍යඃ, සූර්‍ය්‍යයාගේ පක්‍ෂයෙහි වූ (කමලාකරය) තෙම; නහි මෘදුර්භවෙත්, මොළොක් නොවන්නේයි—මෙහි කුමුදයන්ගේ තාපකාරත්වය අයුක්තයැ පද්මයන්ගේ තාපකාරත්වය යුක්තයයි සාධනලදි. එහෙයින් මේ අයුක්තයුක්තයයි දතයුතු-අයුක්තයුක්තයි.

180 වස්තුනොඃ, අර්ථයන් දෙදෙනක්හුගේ; සාදෘශ්‍යෙ, සදෘශබව; ශබ්දොපාත්තෙ, වාචකශබ්දයෙන් ප්‍රතිපාදිතකල්හිද; ප්‍රතීතෙ වා ශබ්දොපාත්ත වැ (අර්ථබලයෙන් හෝ ප්‍රකරණාදිහෙයින්) දන්නාලදකල්හිද; තත්‍ර, ඒ වස්තූන් දෙන්නා කෙරෙහි; යද්භෙදකථනම්, යම් විශෙෂකථනයෙක් ඇද්ද; සඃ, හෙතෙම; ව්‍යතිරෙකඃ කථ්‍යතෙ, ව්‍යතිරෙකයයි කියනුලැබේ.

181 ධෛර්‍ය්‍ය, නිර්විකාරබවය; ලාවණ්‍ය, සෞන්දර්‍ය්‍යය නොහොත් ලවණරසත්වය; මාහාත්ම්‍යප්‍රමුඛෛඃ, මහත්බවය යන මේ ආදිවූ; ගුණෛඃ, ගුණයෙන්; ත්වම්, තෝ; උදන්වතඃ, සාගරය හා; තුල්‍යො'සි, සමයෙහි; භෙදස්තු, (සාගරය හා තාගේ) භෙදයෙක් නම්; තෙ, තාගේ; ඊදෘශෙන, මෙබඳුවූ; වපුෂෛව, ශරීරයෙන් මැයි.

182 ඉති, මෙසේ; එකත්‍රවර්ත්තිනා, එකපුරුෂයා කෙරෙහි පවත්නාවූ; ධර්මෙණ, ගුණයෙන්; උභයවර්ත්තිනඃ, පුරුෂ සාගර දෙන්නාකෙරෙහි පවත්නාවූ; භෙදස්‍ය, විශෙෂයාගේ; හෙවත් විසදෘශත්වයාගේ; ප්‍රතීතිවිෂයප්‍රාප්තෙඃ, ඥානගොචරයහට පැමිණීම හෙතුකොටගෙන; අයම්, මේතෙම; එකව්‍යතිරෙකඃ, එකව්‍යතිරෙකයයි (දතයුතු)-එකව්‍යතිරෙකයි

---

* "කිමයං"-ක. † "උච්‍යතෙ"-ප. ‡ "ගාම්භීර්‍ය්‍ය"-ක.

183 අභින්නවෙලෞ ගම්භීරාවම්බුරාශිර්භවානපි
අසාවඤ්ජනසඞ්කාශස්ත්වන්තු චාමීකරද්‍යුතිඃ.

184 උභයව්‍යතිරේකො'යමුභයොර්භේදකෞ ගුණෞ
කාර්ෂ්ණ්‍යං පිශඞ්ගතා චොභෞ යත් පෘථග්දර්ශිතාවිහ.

185 ත්වං සමුද්‍රශ්ච දුර්වාරෞ මහාසත්වෞ සතෙජසෞ
ඉයතා * යුවයොර්භේදස්ස ජඩාත්මා පටුර්භවාන්.

186 ස එෂ ශ්ලෙෂරූපත්වාත් සශ්ලෙෂ ඉති ගෘහ්‍යතාම්
සාක්ෂෙපශ්ච සහෙතුශ්ච දර්ශ්‍යතෙ තදපි ද්වයම්.

---

183 අම්බුරාශිඃ, සාගරයද; භවානපි, භවත්ද යන දෙන්න; අභින්න වෙලෞ, නොඉක්මෙනලද මර්‍යාදා ඇත්තාහ; ගම්භීරෞ, අගාධ වූ ස්වභාව ඇත්බැවින් ගම්භීරයෝයි; අසෞ, මේ සාගරයතෙම; අඤ්ජන සඞ්කාශඃ, අඳුන් හා සදෘශයැ හෙවත් කෘෂ්ණයැ; ත්වන්තු. තෝ වනාහි; චාමීකරද්‍යුතිඃ, ස්වර්ණයට බඳුවූ ශොභාඇත්තෙහි.

184 යත්, යම්හෙයකින්; කාර්ෂ්ණ්‍යං පිශඞ්ගතා ච, කළුබවය රන්වන් බවය යන; උභෞ ගුණෞ, ගුණයෝ දෙන්න; උභයොර්භේදකෞ, සාගර පුරුෂ දෙන්නාගේ විසදෘශත්වය කරන්නාහු; ඉහ, මේ ප්‍රයොගයෙහි ලා; පෘථග්දර්ශිතෞ, වෙන වෙන දක්වනලද්දාහුද හෙවත් ශබ්දෝපාත්ත යෝද; තත්, එහෙයින්; අයම්, මේ උක්තප්‍රකාරය; උභයව්‍යතිරේකඃ, උභයව්‍යතිරේකයයි (දතයුතු)-උභයව්‍යතිරේකයි.

185 ත්වම්, තෝද; සමුද්‍රශ්ච, සාගරයද යන දෙන්න; දුර්වාරෞ, අව්‍යග්‍රවූ ප්‍රසර ද්‍යෝ හෝ නොහොත් ක්ෂාරත්වයෙන් දුෂ්ටවූ ජල ඇත් තාහ; මහාසත්වෞ, මකරාදී වූ මහත් වූ සත්වයන් ද්‍යෝ හෝ නොහොත් අවිකම්ප්‍යස්වභාව වූ සත්වය ඇත්තාහ; සතෙජසෞ, අනුභාවසහිත වූ ද්‍යෝ හෝ නොහොත් වඩබානලතෙජස්හි සහිතයෝයි; යුවයොඃ, තොප දෙන්නාගේ; ඉයතා, මෙපමණෙකින්; භෙදඃ, විසදෘශත්වයයි; කෙසේද යත්? සඃ, ඒ සාගරයතෙම; ජඩාත්මා, ජලස්වරූප ද්‍යෝ හෝ නොහොත් අකිඤ්චිත්කර වූ සිත් ඇත්තේයැ; භවාන්, භවත්තෙම; පටුඃ, කුශලයි.

186 එෂඃ, මේ ව්‍යතිරේකයතෙම; ශ්ලෙෂරූපත්වාත්, උක්තප්‍රකාරවූ ශ්ලෙෂස්වභාවය හෙයින්; සශ්ලෙෂ ඉති, ශ්ලෙෂසහිතයයි; ගෘහ්‍යතාම්, ගන්නාලැබේවා; සාක්ෂෙපශ්ච, සාක්ෂෙපව්‍යතිරේකයද; සහෙතුශ්ච, සහෙතුව්‍යතිරේකයද යන; තදපි ද්වයම්, ඒ දෙකද; දර්ශ්‍යතෙ, දක්වනු ලැබේ.

---

* "අයන්තු"-ක.

187 ස්ථිතිමානපි ධීරො'පි රත්නානාමාකරො'පි සන්
තව කක්ෂ්‍යාං න යාත්‍යෙව මලිනො මකරාලයඃ.

188 වහන්නපි මහීං කෘත්ස්නාං සශෛලද්වීපසාගරාම්
භර්තෘභාවාද්භුජඞ්ගානාං ශෙෂස්ත්වත්තො නිකෘෂ්‍යතෙ.

189 ශබ්දොපාදානසාදෘශ්‍යව්‍යතිරෙකො'යමීදෘශඃ
ප්‍රතීයමානසාදෘශ්‍යෙ'ප්‍යස්ති සො'නුවිධීයතෙ. *

190 අභ්‍රූවිලාසමස්පෘෂ්ටමදරාගං මෘගෙක්ෂණම්
ඉදන්තු නයනද්වන්ද්වං තව තද්ගුණභූෂිතම්.

---

187 ස්ථිතිමානපි, මර්‍යාද ඇත්තා ද වූ; අතිධීරොපි, අත්‍යර්ථයෙන් නිර්විකාර ද වූ; රත්නානාම්, මුක්තාප්‍රවාලාදිරත්නයන්ට; ආකරොපි සන්, ස්ථාන ද වූ; මකරාලයඃ, සාගරයතෙම; මලිනඃ, ශුද්ධ නුවූයේ; තව කක්ෂ්‍යාම්, තාගේ පදවියට; හෙවත් තා හා සමබවට; න යාත්‍යෙව, නොයන්නේ මැයි-මෙහි 'න' යන නිෂෙධය හෙතු කොටගෙන මේතෙම සාක්ෂෙප ව්‍යතිරෙකයයි දතයුතු-සාක්ෂෙපව්‍යතිරෙකයි.

188 සශෛලද්වීපසාගරාම්, සමනතකූටාදි පර්වත හා සිංහලාදි ද්වීප හා දක්ෂිණාදි සාගරසහිත වූ; කෘත්ස්නාං මහීම්, මුළු පොළොව; වහන්නපි, උසුලන්නාද වූ; ශෙෂඃ, ශෙෂ නම් නාරජතෙම; භුජඞ්ගානාම්, සර්පයන්ට ප්‍රභු හෝ නොහොත් ධූතීයන්ට; භර්තෘභාවාත්; ස්වාමිබව හෙතු කොටගෙන; ත්වත්තඃ, තාකෙරෙන්; නිකෘෂ්‍යතෙ, හීන කරනුලැබේ.
මෙහි භර්තෘත්වලක්ෂණ වූ හෙතුපන්‍යාසය හෙතුකොටගෙන මේතෙම හෙතුව්‍යතිරෙකයයි දතයුතු-හෙතුව්‍යතිරෙකයි.

189 ශබ්දොපාදානසාදෘශ්‍ය, ශබ්දයෙන් ග්‍රහණ ඇති සාම්‍යයෙන් යුක්ත වූ; අයං ව්‍යතිරෙකඃ, මේ ව්‍යතිරෙකයතෙම; ඊදෘශඃ, මෙබඳුය; ප්‍රතීයමානසාදෘශ්‍යඃ, ශබ්දොපාදානයක් නැතිව අර්ථප්‍රකරණයෙන් ගම්‍යමාන වූ සමබව; අස්ති, ඇති; සොපි, ඒ ව්‍යතිරෙකයද; අනුවිධීයතෙ, දැන් උදාහරණ කරනුලැබේ.

190 ත්වන්මුඛාම්, තීගේ මුඛයද; කමලචෙති, පද්මයද යන; අනයොර් ද්වයොරපි, මේ දෙදෙනාගේම; භිදා, භෙදය (කියනුලැබේ); කමලම්, පද්මයතෙම; ජලසංරොහි, දියෙහි හටගන්නේය; ත්වන්මුඛම්, තීගේ මුඛය; ත්වදුපාශ්‍රයම්, තී මැ ආධාර කොට ඇත්තේයි-මෙසේ කමල මුඛ දෙදෙනාගේ ආශ්‍රයභෙදයෙන් වෙනසක් මුත් සෙසු පරිද්දෙන් සාදෘශ්‍ය මැයැ යනු භාවයි.

---

* "සො'ප්‍යභිධීයතෙ"-ක.

190 ත්වන්මුඛං කමලඤ්චෙති යයොරප්‍යනයොර්භිදා
කමලං ජලසංරොහි ත්වන්මුඛං ත්වදුපාශ්‍රයම්.

191 A

192 පූර්වස්මින් භෙදමාත්‍රොක්තිරස්මින්නාධික්‍යදර්ශනම්
සදෘශව්‍යතිරෙකශ්ච පුනරන්‍යඃ ප්‍රදර්ශ්‍යතෙ. *

193 ත්වන්මුඛං පුණ්ඩරීකඤ්ච ඵුල්ලෙ සුරභිගන්ධිනී
භ්‍රමද්භ්‍රමරමම්භොජං ලොලදෘෂ්ටි † මුඛන්තු තෙ.

194 චන්ද්‍රො'යමම්බරොත්තංසො හංසො'යං තොයභූෂණම්
නභො නක්ෂත්‍රමාලීදමිදමුත්කුමුදං ‡ පයඃ.

195 ප්‍රතීයමානසෞක්ෂ්ම්‍යාදි + සාම්‍යයොශ්චන්ද්‍රහංසයොඃ
කෘතඃ ප්‍රතීතශුද්ධ්‍යාශ්ච භෙදෙ'ස්මින් වියදම්භසොඃ.

---

191 මෘගෙක්ෂණම්, මෘගලොචනතෙම; අභ්‍රූවිලාසම්, භ්‍රෑලීලාවක් නැත්තේය; අස්පෘෂ්ටමදරාගම්, ස්පර්ශ නොකරනලද මදයෙන් වන රත් පැහැ ඇත්තේය; තව, තිගේ; ඉදං නයනවන්වනත්‍ර, මේ ඇස්දෙක වනාහි; තද්ගුණෞ, භ්‍රෑවිලාසය මදරාගය යන ඒ ගුණදෙකින්; භූෂිතම්, හොබවනලදි-මෙහි මෘගෙක්ෂණ හා ලොචනවන්වයාගේ සාදෘශ්‍යය ප්‍රතියමාන වන්නේය.

192 පූර්වස්මින්, පළමුවූ “ත්වන්මුඛං කමලඤ්චෙති” යන මේ ආදියෙහි; භෙදමාත්‍රොක්තිඃ, (අතිශයප්‍රතිවාදනයක් නැතිහෙයින්) විසදෘශත්වමාත්‍රයාගේ කීමයෑ; අස්මින්, මේ “භ්‍රෑවිලාසම්” යනාදියෙහි; ආධික්‍යදර්ශනම්, අතිශයක්හුගේ දැක්වීමයෑ; පුනඃ, නැවත; අන්‍යඃ සදෘශව්‍යතිරෙකශ්ච, අනික් සදෘශව්‍යතිරෙකයෙකුදු; ප්‍රදර්ශ්‍යතෙ, දක්වනුලැබේ.

193 ත්වන්මුඛම්, තිගේ මූඛයද; පුණ්ඩරීකඤ්ච, හෙළපියුමද යන මේ වස්තුහු දෙන්න; ඵුල්ලෙ, ප්‍රබුද්ධයහ; සුරභිගන්ධිනී, ඉෂ්ටවූ ගන්ධ ඇත්තාහ; අම්භොජම්, පද්මයතෙමේ; භ්‍රමද්භ්‍රමරම්, බමන්නාවූ බමරුන් ඇත්තේයෑ; තෙ මුඛන්තු, තිගේ වක්ත්‍රය වනාහි; ලොලදෘෂ්ටි, චටුල වූ නෙත්‍ර ඇත්තේයි.

194 අයං චන්ද්‍රඃ, මේ දෘශ්‍යමානවූ චන්ද්‍ර තෙම; අම්බරොත්තංසඃ, ආකාශයට ශෙඛරයෙක; අයං හංසඃ, මේ ප්‍රත්‍යක්ෂ වූ හංසතෙම; තොයභූෂණම්, ජලය හොබවන්නේය නොහොත් ජලයට ආභරණ වන්නේය; ඉදං නභඃ, මේ ආකාශය; නක්ෂත්‍රමාලි, තාරකාවන් ධරන්නේය නොහොත් තාරකාසමූහ ඇත්තේය; ඉදං පයඃ, මේ අපරොක්ෂ වූ ජලයතෙම; උත් කුමුදම්, උද්ගතවූ කෛරවයන් ඇත්තේයි.

195 අස්මින්, මේ උදාහරණයෙහි; ප්‍රතියමාන, ප්‍රතියමාන වූ; සෞක්ෂ්ම්‍යාදි, අවිශත්වාදි වූ; සාම්‍යයොඃ, සාදෘශ්‍යය ඇති; වියදම්භසොඃ, ගගනො

---

A 72 පිටේ 190 ට වැටීතිබෙන ශ්ලොකය 191 වෙනි කොට මෙතැනට ගතයුතුයි.

* “ප්‍රකාශ්‍යතෙ”-ප. † “ලොලනෙත්‍රං”-ක.

‡ “මාලීදමුත්ඵුල්ලකුමුදං”-ක. + “ශෞක්ල්‍යාදි”-ක.

196 පූර්වත්‍ර ශබ්දවත් සාම්‍යමුභයත්‍රාපි භෙදකම්
භෘඞ්ගනෙත්‍රාදි තුල්‍යං තත් සදෘශව්‍යතිරෙකතා.
197 අරත්නාලොකසංහාය්‍යමවාය්‍යං සූය්‍යරශ්මිභිඃ
දෘෂ්ටිරොධකරං යූනාං යෞවනප්‍රභවං තමඃ.
198 සජාතිව්‍යතිරෙකොයං තමොජාතෙරිදං තමඃ
දෘෂ්ටිරොධිතයා තුල්‍යං භින්නමන්‍යෛරදර්ශි යත්.

ව්‍යතිරෙකචක්‍රම්.

---

දක දෙදෙනාගේද; ප්‍රතීතශුභ්‍රත්වාඃ, න්‍යායලබ්ධ වූ ශුක්ලතාව ඇත්තේ; චන්ද්‍රහංසයොශ්ච, ඉඳු සිතච්ඡද දෙදෙනාගේද; භෙදඃ, විශෙෂය; කෘතඃ, කරනලදී- එහෙයින් මේ ප්‍රතියමාන වූ සාදෘශ්‍යය ඇති ව්‍යතිරෙකය පූර්වොදාහරණයෙන් මෙන් වචනොපාත්තසාදෘශ්‍යය ඇති ව්‍යතිරෙකයෙක් නොවෙයි දතයුතු.

196 පූර්වත්‍ර, "ත්වන්මුඛං පුණ්ඩරීකඤ්ච" යනාදි උදාහරණයෙහි; උභයත්‍රාපි, මුඛ පුණ්ඩරීක දෙක්හිද; සාම්‍යම්, සාදෘශ්‍යයඃ ශබ්දවත්, වාචක ශබ්දයෙන් යුක්තය; භෘඞ්ගනෙත්‍රාදි, භෘඞ්ගනෙත්‍රාදිය හෙවත් භ්‍රමරස ලොචනය යන මොවුන්ගේ ලොලත්වයතෙමේ; තුල්‍යම්, සදෘශ වූයේ; භෙදකම්, (මුඛ පුණ්ඩරීක දෙදෙනාගේ) විශෙෂය කරන්නේය; තත්, එහෙයින්; සදෘශව්‍යතිරෙකතා, පූර්වොදාහරණයෙහි සදෘශව්‍යතිරෙකත්ව යයි; භෘඞ්ගනෙත්‍රාදි වූ සදෘශපදාර්ථයන්විසින් කරනලදහෙයින් විශෙෂ ඇතිබවයැ පීසේසි-මෙහි ශබ්දොපාත්ත සාදෘශ්‍යව්‍යතිරෙක ව්‍යවහාර කරනු කැමැතිහෙයින් ම "ත්වන්මුඛං පුණ්ඩරීකඤ්ච" යනාදිය මැ සාදෘශ්‍ය ව්‍යතිරෙක නම් වෙයි අනන්තරොක්ත වූ "චන්ද්‍රාස" යනාදිය සාදෘශ්‍ය ව්‍යතිරෙක නම් නොවෙයි යනු භාවයි.

197 අරත්නාලොකසංහාය්‍යම්, රත්නප්‍රභායෙන් සංහාර නො කටහැකිවූ; සූය්‍යරශ්මිභිඃ, හිරුරසින්; අවාය්‍යම්, නොවැලකියහැකිවූ; යෞවනප්‍රභවම්, යෞවනයෙන් උපන්; තමඃ, අන්ධකාරයතෙම හෙවත් සදසද්විවෙකප්‍රතිපක්‍ෂබැවින් වූ අඥානයතෙම; යූනාම්, ළදරුවන්ගේ; දෘෂ්ටිරොධකරම්, සදසද්දර්ශනය වැලකීම කරන්නේයි.

198 යත්, යම්හෙයකින්; ඉදං තමඃ, මේ අනන්තරොක්ත වූ අන්ධකාරයතෙම; දෘෂ්ටිරොධිතයා, සදසද්දර්ශනප්‍රතිබන්ධකත්වය හෙතුකොටගෙන; තුල්‍යම්, සෙසු අන්ධකාරයන් හා සම්වූයේ; අන්‍යෛඃ, සෙසු (රත්නාලොකයෙන් සංහාය්‍ය නොවෙයි යනාදි) ගුණයන් කරණකොටගෙන; තමොජාතෙඃ, අන්ධකාරජාතිය හා; භින්නම්, විලක්‍ෂණ වූයේ; අදර්ශි, දක්වනලද්දේ; තත්, එහෙයින්; අයම්, මේ ව්‍යතිරෙකයතෙම; සජාති ව්‍යතිරෙකඃ, සජාතිව්‍යතිරෙක නම්-ප්‍රසිද්ධ වූ ස්වකීය තමොජාතියෙන් උක්තප්‍රකාරවූ තමස්හුගේ සංඛ්‍යාත ගුණයෙන් භින්න වූහෙයින් මේ සජාතිව්‍යතිරෙක නමැයි දතයුතුයැ සීසේසි.

199 ප්‍රසිද්ධහෙතුව්‍යාවෘත්ත්‍යා යත් කිඤ්චිත් කාරණාන්තරම්
යත්‍ර ස්වාභාවිකත්වං වා විභාව්‍යං සා විභාවනා.

200 අපීතක්ෂීබකාදම්බමසම්මෘෂ්ටාමලාම්බරම්.
අප්‍රසාදිතසූක්ෂ්මාම්බු * ජගදාසීන්මනොහරම්.

201 අනඤ්ජිතා'සිතා දෘෂ්ටිර්භ්‍රූරනාවර්ජිතා නතා.
අරඤ්ජිතො'රුණශ්චායමධරස්තව සුන්දරි !

202 යදපීතාදිජන්ම † ස්‍යාත් ක්ෂීබත්වාද්‍යන්‍යහෙතුකම් ‡
අහෙතුකම තස්‍යෙහ විවක්ෂෙත්‍යවිරුද්ධතා.

---

199 යත්‍ර, යම් උක්තියෙක්හි; ප්‍රසිද්ධහෙතුව්‍යාවෘත්ත්‍යා, ලොකප්‍රසිද්ධ කාරණයාගේ දුරුකිරීමෙන්; යත් කිඤ්චිත් කාරණාන්තරම්, ප්‍රසිද්ධහෙතුයෙන් පිටත් යම් කිසි අනික් හෙතුවෙක් හෝ; ස්වාභාවිකත්වං වා, නෛසර්ගිකත්වයෙක් හෝ; විභාව්‍යම්, ප්‍රකාශ කටයුතුද; සා, හෝ තොමෝ; විභාවනා, විභාවනා නම් වන්නීයි.

200 අපීත, මධුපානය නොකොට; ක්ෂීබකාදම්බම්, මත්වූ හංසයන් ඇති; අසම්මෘෂ්ට, පරිශොධිත නොකොට; අමල, නිර්මලවූ; අම්බරම්, ආකාශ ඇති; අප්‍රසාදිත, කතකබීජාදීන් නොපහදවනලදින්; සූක්ෂ්මාම්බු, ප්‍රසන්න දිය ඇති; ජගත්, ලොව; මනොහරම් ආසීත්, සිත්කලු වී-මෙහි හංසාදීන්ගේ ක්ෂීබත්වාදියට ප්‍රසිද්ධහෙතු වූ මධුපානාදීන්ගේ නිරාසයෙන් ශරත්කාලය විභාව්‍යයි එකල්හි මෙ තැම වනහෙයිනි.

201 සුන්දරි, ශොභනවූ තැනැත්තිය; තව, තීගේ; දෘෂ්ටිඃ, දෘෂ්ටි තොමෝ; අනඤ්ජිතා, අඤ්ජිත නොවී හෙවත් අඤ්ජනශලාකාවෙන් සර්‍වනවූ පරිද්දෙන් අස්පෘෂ්ට වී; අසිතා, කළුය; භ්‍රූඃ, භ්‍රූතොමෝ; අනාවර්ජිතා, නොනමනලද්දී; නතා, වක්‍රය; අයමධරශ්ච, මේ ඕෂ්ඨයද; අරඤ්ජිතඃ, (ලාක්ෂාදියෙන්) නොරඳනලද්දේ: අරුණඃ, රතී-මෙහි ලොචනාදීන්ගේ කෘෂ්ණත්වයට ප්‍රසිද්ධ කාරණ වූ අඤ්ජනාදීන්ගේ නිරාසයෙන් කිසි තරුණියකගේ උපාක්ෂීවත් වූ යෞවනවෙශය ප්‍රකාශයි.

202 යත්, යම්හෙයකින්; ක්ෂීබත්වාදි, (පීතාදීන්ගේ කාර්‍ය්‍ය වූ) ක්ෂීබත්ව, මලත්වාදියතෙම; අන්‍යහෙතුකම්, (ශරදාගමයෞවනොදයස්වරූප වූ) කාරණාන්තරයක් ඇත්තේ; ස්‍යාත්, වේද; අතඃ, එහෙයින් ම; අපීතාදි ජන්ම, පීතසම්මෘෂ්ටාදීන්ගේ අනුත්පත්තිය; අහෙතුකම ස්‍යාත්, කාරණයක් නැත්තේද වේ; තස්‍ය, එබඳුවූ ඒ කාර්‍ය්‍යයාගේ; ඉහ, මේ ප්‍රයොගයෙහි; විවක්ෂා, වක්තුමිච්ඡාව හෙවත් ප්‍රතිපාදනය කරන්නට අභිලාෂය; ඉති, මෙහෙයින්; අවිරුද්ධතා, විරොධයක් නැතිබවයි.

---

* "ශුද්ධාම්බු"-ක. † "යදපීත්වාදිජන්‍යඃ"-ඛ. ‡ "හෙතුජම්"-ඛ.

203 වක්ත්‍රං නිසර්ගසුරභි වපුරව්‍යාජසුන්දරම්
අකාරණරිපුශ්චන්ද්‍රො නිර්නිමිත්තාසුහෘත් ස මෙ. *

204 නිසර්ගාදිපදෛරත්‍ර හෙතුස්සාක්ෂාන්නිවර්තිතඃ
උක්තාච සුරභිත්වාදි ඵලං තත් සා විභාවනා.

ඉති විභාවනාචක්‍රම්.

205 වස්තු කිඤ්චිදභිප්‍රෙත්‍ය තත්තුල්‍යස්‍යාන්‍යවස්තුනඃ
උක්තිස්සංක්ෂෙපරූපත්වාත් සා සමාසොක්තිරිෂ්‍යතෙ.

206 පිබන්මධු යථාකාමං භ්‍රමරඃ ඵුල්ලපඞ්කජෙ
අප්‍යසන්නද්ධසෞරභ්‍යං පශ්‍ය චුම්බති කුට්මලම්.

207 ඉති ප්‍රෞඪාඞ්ගනාබද්ධරතිලීලස්‍ය රාගිණඃ
කස්‍යාචිදිහ බාලායාමිච්ඡාවෘත්තිර්විභාව්‍යතෙ.

---

203 වක්ත්‍රම්, මුඛයතෙම; නිසර්ගසුරභි, (මුඛවාසාදියක් නැතිව) ස්වභාවයෙන් ම ශොභනවූ ගන්ධ ඇත්තේය; වපුඃ, ශරීරයතෙම; අව්‍යාජ, ව්‍යාජයක් නැතිව හෙවත් කිසි ප්‍රයත්නයක් නැතිව; සුන්දරම්, ශොභනය; චන්ද්‍රඃ, චන්ද්‍රතෙම; අකාරණරිපුඃ, හෙතුවක් නැතිවම සතුරුය; සඃ, ඒ පුරුෂතෙම; මෙ, මට; නිර්නිමිත්තසුහෘත්, කාරණයක් නැතිව යහළුයි.

204 අත්‍ර, මේ අනන්තරොක්ත ප්‍රයොගයෙහි; නිසර්ගාදිපදෛඃ, නිසර්ගශබ්දයා ආදිවූ ශබ්දයන් හෙතුකොටගෙන; හෙතුඃ, (මුඛවාසාදි වූ සුරභිත්වාදියට) කාරණය; සාක්ෂාත්, ඉදිව හෙවත් සාමර්ථ්‍යයක් නැතිව වාචකව්‍යාපාරයෙන්; නිවර්තිතඃ, වලකනලදී; සුරභිත්වාදි, සුරභිත්වය ආදිකොට ඇති; ඵලච, ඒ මුඛවාසාදීහුගේ ඵලයද; උක්තාම්, කියනලදී; තත්, එහෙයින්; සා, යෝතොමෝ; විභාවනා, ස්වාභාවිකඵලවිභාවනා යයි දතයුතු.

205 කිඤ්චිත් වස්තු, අභිමතවූ කිසි අර්ථයක්; අභිප්‍රෙත්‍ය, සිතා; තත්තුල්‍යස්‍ය, ඒ අභිප්‍රෙත වස්තුහු හා සම වූ; අන්‍යස්‍ය වස්තුනඃ, අනික් වස්තුවක්හුගේ; උක්තිඃ, යම් උක්තියක් ඇද්ද; සා, ඕතොමෝ; සංක්ෂිප්ත රූපත්වාත්, විවක්ෂිතවස්තුපෙක්ෂායෙන් ස්වල්ප වූ ස්වභාවඇතිබැවින්; සමාසොක්තිරිෂ්‍යතෙ, සමාසොක්තියයි කැමැතිවනුලැබේ.

206 භ්‍රමරඃ, භෘඞ්ගතෙම; උත්ඵුල්ලපඞ්කජෙ, ප්‍රබුද්ධ වූ පද්මයෙහි; මධු, මකරන්දය; යථාකාමම්, සිත්සේ; පිබන්, බොන්නේ; අසන්නද්ධ සෞරභ්‍යමපි, අනුපජාත සුගන්ධඇත්තාද වූ; කුට්මලම්, පිපුම්කැකුළ; චුම්බති, සිඹුනේයි; පශ්‍ය, බල.

207 ඉති, මෙසේ කියනලද; ඉහ, මේ වාක්‍යයෙහි; ප්‍රෞඪාඞ්ගනා, විදග්ධස්ත්‍රියක කෙරෙහි; ආබද්ධ, බඳනාලද; රතිලීලස්‍ය, සම්භොගවිලාස

---

* "නිර්නිමිත්තාසුහෘත් සමරඃ"—ක.

208 විශෙෂ්‍යමාත්‍රභින්නාපි තුල්‍යාකාරවිශෙෂණා
අන්‍යාසාවපරාප්‍යස්ති භින්නාභින්නවිශෙෂණා.

209 රූඪමූලඃ ඵලභරෛඃ පුෂ්ණන්නනිශමර්ථිනඃ
සාන්ද්‍රච්ඡායො මහාවෘක්ෂසො'යමාසාදිතො මයා.

210 අනල්පවිටපාභොගඃ ඵලපුෂ්පසමෘද්ධිමාන්
සච්ඡායස් * ස්ථෛර්‍යවාන් දෛවාදෙෂ † ලබ්ධො මහාද්‍රුමඃ.

---

ඇති; රාගිනඃ, කාමීන්හුගේ; කස්‍යාඤ්චිත් බාලායාම්, බාලාවූ කිසි අවිදග්ධ ස්ත්‍රියක කෙරෙහි; ඉච්ඡාවෘත්තිඃ, රාගප්‍රසරයතෙම; විභාව්‍යතෙ, ප්‍රතීයමාන වන්නේයි.

208 විශෙෂ්‍යමාත්‍ර, විශෙෂ්‍යමාත්‍රයෙන්; භින්නා, සදෘශ නොවූ; තුල්‍යාකාර, සදෘශ වූ ආකාරඇති හෙවත් භින්න නොවූ; විශෙෂණා, විශෙෂණ ඇත්තාවූ; අසාවප්‍යස්ති, මෙබඳු වූ සමාසොක්තියකුද ඇත; භින්න, විශෙෂ්‍යය හා භින්න වූද; අභින්න, විශෙෂ්‍යය හා අභින්න වූද; විශෙෂණා, විශෙෂණ ඇති; අපරාප්‍යස්ති, අනික් සමාසොක්තියකුදු ඇති.

209 රූඪමූලඃ, පරිණතවූ මුල්ඇති ද්‍රෙ හෝ නොහොත් මූලාමාත්‍යයන් ඇත්; අර්ථිනඃ, ඵල කැමැත්තවුන්; ඵලභරෛඃ, වෘක්ෂොචිතඵලසමූහයෙන් ද්‍රෙ හෝ නොහොත් සම්පත්තිසමූහයෙන්; අනිශම්, සතතයෙන්; පුෂ්ණන්, පුෂ්ට කරන්නාවූ; සාන්ද්‍රච්ඡායඃ, ඝන වූ සෙවණ ඇත්තාවූ නොහොත් ඝන වූ ශොභාකීර්තිස්වරූප වූ රූප ඇත්තාවූ; සොයං මහාවෘක්ෂඃ, ඒ මේ මහත්වූ ද්‍රැමයතෙම; මයා, මාවිසින්; ආසාදිතඃ, පැමිණෙනලදී-මෙහි විශෙෂ්‍ය වූ වෘක්ෂයා විවක්ෂිත පුරුෂයා කෙරෙන් භින්න හෙයින්ද රූඪමූලත්වාදි විශෙෂණයා අභින්න හෙයින්ද මෝතොමෝ විශෙෂ්‍යමාත්‍රභින්න වූ තුල්‍යාකාරවිශෙෂණා නම් වන්නීයයි දතයුතු.

210 අනල්පවිටපාභොගඃ, නොමඳවූ ශාඛා විස්තාර ඇති; ඵලපුෂ්පසමෘද්ධිමාන්, වෘක්ෂොචිත වූ ඵලයන්ගේ හා පුෂ්පයන්ගේ බොහෝබව ඇත්තාවූ; සච්ඡායඃ, සෙවණ සහිත වූ නොහොත් දෙහප්‍රභාසහිත වූ හෝ කීර්තිලක්ෂණ වූ රූපයෙන් සහිත වූ; ස්ථෛර්‍යවාන්, (වාතාදියෙන් නුඋපුට හැකිබැවින්) ස්ථිර ද්‍රෙ හෝ නොහොත් (විපක්ෂයන්විසින් අනභිභවනීය බැවින්වූ) ස්ථිරත්වය ඇත්තාවූ; එෂ මහාද්‍රුමඃ, මේ මහාවෘක්ෂයතෙම; දෛවාත්, භාග්‍යය හෙතුකොටගෙන; ලබ්ධඃ, පැමිණෙනලදී-මේ විවක්ෂිත පුරුෂයාකෙරෙන් විශෙෂ්‍ය වූ වෘක්ෂයා භින්නහෙයින්ද අනල්ප වූ විටපාභොගත්වය හා ඵලසමෘද්ධිමත්තාව වෘක්ෂයෙහි ම වන හෙයින්ද සච්ඡායත්වය හා ස්ථෛර්‍යවත්බව වෘක්ෂ පුරුෂ දෙන්නා කෙරෙහි ම වනහෙයින්ද මේ සමාසොක්තිතොමෝ විශෙෂ්‍යමාත්‍ර භින්න වූ භින්නාභින්නවිශෙෂණා නම් වන්නීයි.

---

* "සුච්ඡායඃ"-ක. ප. † "දෛවාන්මයා"-ප.

211 උභයත්‍ර පුමාන් කශ්චිද්වෘක්ෂස්ත්වෙවමුපවර්ණිතඃ
සර්වේ සාධාරණා ධර්මාඃ පූර්වත්‍රාන්‍යත්‍ර තු ද්වයම්.

212 නිවෘත්තව්‍යාලසංසර්ගෝ නිසර්ගමධුරාශයඃ
අයමම්භොනිධිඃ කෂ්ටං කාලෙන පරිශොෂ්‍යතෙ.

213 ඉත්‍යපූර්වසමාසොක්තිඃ පූර්වධර්මනිවර්තනාත්
සමුද්‍රෙ තත්සමානස්‍ය * පුංසො ව්‍යාවෘත්තිසූචනෙ. †

ඉති සමාසොක්තිචක්‍රම්.

---

211 උභයත්‍ර, (රුක්මූලාදි වූ ද ‘ අනල්පවිටපාභොගඃ” යනාදි වූ ද) ප්‍රයොගවයෙහි ම; කශ්චිත් පුමාන්, කිසි පුරුෂයෙක්; වෘක්ෂවෙන, වෘක්ෂ බැවින්; උපවර්ණිතඃ, වර්ණනා කරනලද; පූර්වත්‍ර, “රුක්මූලඃ” යන මේ ආදියෙහි; සර්වේ ධර්මාඃ, සියලු (රුක්මූලත්වාදි) ගුණයෝ; සාධාරණාඃ, (වෘක්ෂ පුරුෂ දෙන්නාට) සදෘශයහ: අන්‍යත්‍ර තු, “අනල්පවිටපාභොගඃ” යන මේ ආදියෙහි වනාහි; ද්වයම්, (සොච්ඡ්‍රායබවය ස්ථෛර්‍යවත්බවය යන මේ ගුණ) දෙකතෙම; සාධාරණම්, (වෘක්ෂ පුරුෂ දෙන්නාට) සාධාරණයි.

212 අයමම්භොනිධිඃ, මේ සාගරයතෙම; කාලෙන, සංවත්සරාදියා දිසින් දෙ හෝ නොහොත් මෘත්‍යුහුවිසින්; පරිශොෂ්‍යතෙ, වියළවනු ලැබේ දෙ හෝ නොහොත් පරාසු වූයේ කරනුලැබේ; (කෙසේ වූයේද යත්?) නිවෘත්ත, වැළැක්කාවූ; ව්‍යාල, සර්පයන් හා දෙ හෝ නොහොත් දුෂ්ටයන් හා; සංසර්ගඃ, එක්විම්ඇති; නිසර්ග, ස්වභාවයෙන්; මධුර, සුරස වූ; ආශයඃ, (ජලලක්ෂණ වූ) ආශය ඇත්තාවූ දෙ හෝ නොහොත් චිත්ත ඇත්තාවූ; අයමම්භොනිධිඃ, මේ සාගරයතෙම; කාලෙන, සංවත්සර කාලයාවිසින් දෙ හෝ නොහොත් මරහුවිසින්; පරිශොෂ්‍යතෙ, වියළි වනුලැබේ දෙ හෝ නොහොත් පරාසු වූයේ කරනුලැබේ; කෂ්ටම්, ඛෙදයි–සාගරයා තමා ව්‍යාලසංසෘෂ්ටනොහෙයින්ද ස්වභාවලක්ෂණ වූ ජලාශය ඇතිහෙයින්ද සාගරත්වයෙන් විවක්ෂිත පුරුෂයා වැළැකි ව්‍යාලසංසර්ගත්වය හා ස්වභාවමධුර වූ ආශය ඇතිබැවින්ද මෙතෙම අපූර්ව වූ අම්භොනිධියෙකැයි දතයුතු.

213 තත්සමානස්‍ය, ඒ සාගරය හා සදෘශ වූ; පුංසඃ, පුරුෂයාගේ; ව්‍යාවෘත්තිසූචනෙ, විනාශ ප්‍රකාශකිරීමෙහි ලා; සමුද්‍රෙ, සාගරයෙහි; පූර්වධර්මනිවර්තනාත්, ප්‍රසිද්ධවූ ව්‍යාලසංසර්ගාදි ගුණයන්ගේ නිෂෙධය හෙතුකොටගෙන; ඉති, මෙබඳු වූයේ; අපූර්වසමාසොක්තිඃ, අපූර්වසමාසොක්තියයි (දතයුතු).

---

* “සමුද්‍රෙණ සමානස්‍ය”-ක. † “ව්‍යාපත්තිසූචනෙ”-ක.

214 විවක්ෂා යා * විශෙෂස්‍ය ලොකසීමාතිවර්තිනී
අසාවතිශයොක්තිස්ස්‍යාදලඞ්කාරොත්තමා යථා.

215 මල්ලිකාමාලභාරිණ්‍යස්සර්වාඞ්ගීණාර්ද්‍රචන්දනාඃ
ක්ෂෞමවත්‍යො න ලක්ෂ්‍යන්තෙ ජ්‍යොත්ස්නායාමභිසාරිකාඃ

216 චන්ද්‍රාතපස්‍ය බාහුල්‍යමුක්තමුත්කර්ෂවත්තයා
සංශයාතිශයාදීනාං ව්‍යක්ත්‍යෛ කිඤ්චින්නිදර්ශ්‍යතෙ.

217 ස්තනයොර්ජඝනස්‍යාපි මධ්‍යෙ මධ්‍යං ප්‍රියෙ! තව
අස්ති නාස්තීති සන්දෙහො න මෙ'ද්‍යාපි නිවර්තතෙ.

---

214 විශෙෂස්‍ය, අතිශයක්හුගේ; විවක්ෂයා, කියපිබැවින්; ලොක සීමාතිවර්තිනී, ජගත්සීමාව ඉක්ම පවත්නා සුලුවූ යම් උක්තියක් ඇද්ද: අසෞ, මෝතොමෝ; අලඞ්කාරොත්තමා, සෙසු අලඞ්කාරයන්ට උතුම්වූ; අතිශයොක්තිස්ස්‍යාත්, අතිශයොක්ති නම් වන්නීයි; යථා, හෝ මෙසේයි.

මෙහි “විවක්ෂා යා විශෙෂස්‍ය” යන පාඨයෙකුදු ඇත. එහි–“ලොක සීමාතිවර්තිනී. ලොකසීමාව ඉක්ම පවත්නාසුලුවූ; විශෙෂස්‍ය, අතිශ යක්හුගේ; විවක්ෂා යා, යම් කියපිබවෙක් ඇද්ද; මෝතොමෝ අතිශ යොක්ති නම් වන්නීයයි” අභියොජනා කරනු.

215 මල්ලිකාමාලභාරිණ්‍යඃ, බෙලිද්දමල්දම් උසුලන්නාවූ; සර්වාඞ්ගී ණාර්ද්‍රචන්දනාඃ, සියලු ශරීරයෙහි ආර්ද්‍ර සඳුන් ඇති; ක්ෂෞමවත්‍යඃ, සුදු පිළීඇති; අභිසාරිකාඃ, අභිසාරිකාවෝ හෙවත් සඞ්කෙතස්ථානයට යන ස්ත්‍රීහු; ජ්‍යොත්ස්නායාම්, සඳරැස්හි; න ලක්ෂ්‍යන්තෙ, නොදක්නා ලැබෙත්-ඉතා සුදු වූ සඳරැස්හි සුදු වස්තු නොපෙනෙන්නේය යන මෙබඳු ලොකසීමාතික් නැහීමෙයින් මේ උක්තිතොමෝ අතිශයොක්ති යයි දතයුතු.

216 චන්ද්‍රාතපස්‍ය, සඳරැස්හුගේ; බාහුල්‍යම්, ඝනබව; උත්කර්ෂ වත්තයා, අතිශයවත්බැවින්; උක්තම්, කියනලද; සංශයාතිශයාදීනාම්, සංශයාතිශයාදීන්ගේ; ව්‍යක්ත්‍යෛ, ප්‍රකාශනය පිණිස; කිඤ්චිත්, කිසි වෙක්; නිදර්ශ්‍යතෙ, දක්වනුලැබේ.

217 ප්‍රියෙ, ප්‍රියාව; තව, තීගේ; ස්තනයොඃ, පයොධරවන්වයා ගේද; ජඝනස්‍යාපි, නිතම්බප්‍රදෙශයාගේද; මධ්‍යෙ, මධ්‍යයෙහි ලා; මධ්‍යම්, ශරීරාවයව වූ මධ්‍යයතෙම; අස්ති නාස්තීති, ඇද්දෙ හෝ නැද්දෙ හෝ යන; මෙ, මාගේ; සන්දෙහඃ, සැකයතෙම; අද්‍යාපි, අද දක්වාත්; න නිවර්තතෙ, නොවලක්නේයි–අතිකෘශ වූ මධ්‍යය ස්වභාවයෙන් නොදක්කහැකිබැවින් ලෝවැස්සාට මෙබඳුවූ සංශයෙක් කිසි කලෙක් හිදු නොවන්නේය. එතෙකුදු වුවත් මෙසේ අතිශයවත් වූ කාව්‍යප්‍රයොගය හෙතුකොටගෙන තජ්ඥයෝ අත්‍යාශියෙන් සතුටු වන්නාහයි මෙබඳු වූයේ සංශයාතිශයොක්තියයි දතයුතු

---

* “විවක්ෂා යා”–ක.

218 නිර්ණෙතුං ශක්‍යමස්තීති මධ්‍යං තව නිතම්බිනි!
අන්‍යථානුපපත්ත්‍යෛව * පයොධරභරස්ථිතෙඃ. †

219 අහො විශාලං භූපාල! භුවනත්‍රිතයොදරම්
මාති මාතුමශක්‍යො'පි යශොරාශිර්‍යදත්‍ර තෙ.

220 අලඞ්කාරාන්තරාණාමප්‍යෙකමාහුඃපරායණම්
වාගීශමහිතාමුක්තිමිමාමතිශයාහ්වයාම්.

ඉති අතිශයොක්තිචක්‍රම්.

---

218 නිතම්බිනි, නිතම්බිනිය; තව, තීගේ; මධ්‍යම්, මධ්‍යප්‍රදෙශය තෙම; අස්තීති, ඇතැයි; නිර්ණෙතුම්, නිශ්චය කරන්නට; ශක්‍යම්, පිළිවනි; අන්‍යථා, අනික් ප්‍රකාරයෙකින් හෙවත් මධ්‍යප්‍රදෙශය නැත හොත්; පයොධරභරස්ථිතෙඃ, ස්තනභාරාවස්ථිතියගේ; අනුපපත්ත්‍යෛව, උපපත්තිය නැතිබව හෙතුකොටගෙන ම; (මධ්‍යය ඇතැයි නිශ්චය කරන්නට පිළිවනැයි නිගමනය කරනු). ඉදින් මධ්‍යප්‍රදෙශය නැත්තේ වීනම් මේසා ස්තනභාරය කෙසේ නම් සිටිනේද? එසේහෙයින් මේ ස්තනභාරයාගේ සිටීමෙන් ම මධ්‍යය ඇතැයි නිශ්චය කරන්නට පිළිව නැයි යනු භාවයි. ඉතා කෘශවූ මධ්‍යයෙහිද ලෝවැස්සාට නිශ්චය ප්‍රත්‍යක්ෂයැ. එතෙකුදු වත් මෙපරිද්දෙන් උත්කර්ෂවත් කොට කවිහු විසින් ප්‍රයුක්ත නුයි මේ නිශ්චයාතිශයොක්තියයි දතයුතු.

219 භූපාල, රජ; යත්, යම්හෙයකින්; මාතුම්, පිරිසිඳිනට; අශක්‍යො'පි, නොපිළිවන්වූද; තෙ, තාගේ; යශොරාශිඃ, කීර්තිරාශි තෙම; අත්‍ර, මේ තුන්ලෙව්හි; මාති, සැහෙන්නේය; තත්, එහෙයින්; භුවනත්‍රිතයොදරම්, ත්‍රිලොකකුහරය; විශාලම්, මහතැ; අහො, ආශ්චර්‍ය්‍යයි.

මෙහි අමූර්ත්ත යශස්හුගේද මූර්ත්ත වස්තුවක්හුගේ මෙන් සැඟීම හෙතුකොටගෙන භුවනොදරයාගේ මහත්බව සාධනලද නුයි මෙබඳු වූයේ යශොතිශයොක්තියයි දතයුතු.

220 වාගීශමහිතාම්, කවීන් සම්බන්ධව පූජිත වූ; අතිශයාහ්වයාම්, අතිශය යන නම් ඇත්තාවූ; ඉමාම් උක්තිම්, මේ උක්තප්‍රකාර වූ අතිශයොක්තිය; අලඞ්කාරාන්තරාණාමපි, සෙසු අලඞ්කාරයන්ටද; එකම් පරායණම්, එක අශ්‍රයෙකැයි; ආහුඃ, කියත්.

221 යත්, යම් උක්තියෙක්හි; චෙතනස්‍ය, සජීවයක්හුගේ හෝ; ඉතරස්‍ය වා, නිර්ජීවයක්හුගේ හෝ; අන්‍යථෛව ස්ථිතා, අනික් පරිද් දෙකින් ම සිටියාවූ; වෘත්තිඃ, ප්‍රවෘත්තිතොමෝ; අන්‍යථා, අනික් පරිද්දෙ කින්; උත්ප්‍රෙක්ෂ්‍යතෙ, කල්පනා කරනුලැබේද; තාම්, ඒ උක්තිය; උත්ප්‍රෙක්ෂාම්, උත්ප්‍රෙක්ෂායයි; විදුඃ, දනිත්; යථා, මෙසේයි.

---

* “නොපපද්‍යෙත”–කා. ප.   † “භරස්ථිතිඃ”–කා. ප.

221 අන්‍යථෛව ස්ථිතා වෘත්තිශ්චෙතනස්‍යෙතරස්‍ය වා
අන්‍යථොත්ප්‍රෙක්‍ෂ්‍යතෙ යත්‍ර තාමුත්ප්‍රෙක්‍ෂාං විදුර්‍යථා.

222 මධ්‍යන්දිනාර්කසන්තප්තස්සරසීං ගාහතෙ ගජඃ
මන්‍යෙ මාර්තණ්ඩගෘහ්‍යාණි පද්මාන්‍යුද්ධර්තුමුත්සුකඃ. *

223 ස්නාතුම්පාතුම්බිසාන්‍යත්තුං කරිණො ජලගාහනම්
තද්වෛරනිෂ්ක්‍රයායෙති කවිනොත්ප්‍රෙක්‍ෂ්‍ය වර්ණ්‍යතෙ.

224 කර්ණස්‍ය භූෂණමිදං මමායතිවිරොධිනඃ
ඉති කර්ණොත්පලං ප්‍රායස්තව දෘෂ්ට්‍යා විලඞ්ඝ්‍යතෙ.

225 අපාඞ්ගභාගපාතින්‍යා දෘෂ්ටෙරංශුභිරුත්පලම්
ස්පෘශ්‍යතෙ වා න වෙත්‍යෙවං කවිනොත්ප්‍රෙක්‍ෂ්‍ය කථ්‍යතෙ.†

---

222 මධ්‍යන්දින, මධ්‍යාහ්න වේලෙහි; අර්කසන්තප්තඃ, සූර්‍ය්‍යයාවිසින් තවනලද; ගජඃ, හස්තිතෙම; සරසීම්, විලට; ගාහතෙ, බස්නේයි; මාර්තණ්ඩගෘහ්‍යාණි, (තමා සන්තාපජනක වූ) සූර්‍ය්‍යයාගේ පක්‍ෂයෙහි වූ; පද්මානි, පද්මයන්; උද්ධර්තුම්, උපුරන්නට; උත්සුකඃ, සාභිලාෂයයි; මන්‍යෙ, සිතමි.

223 කරිණඃ, (සූර්‍ය්‍යරශ්මිසන්තප්ත) හස්තිහුගේ; ජලගාහනම්, දියට බැස්ම; ස්නාතුම්, නහන පිණිසද; පාතුම්, පැන් බොන පිණිසද; බිසානි, මෘණාලයන් හෙවත් නෙළුඹුදලි; අත්තුම්, කනපිණිසද (පවත්නේය); තත්, ඒ (ජලගාහනය) තොම; වෛරනිෂ්ක්‍රයායෙති, (සූර්‍ය්‍යපක්‍ෂයෙහි වූ පද්මයන්ගේ උද්ධරණයෙන්) වෛරප්‍රතිකාර කරන පිණිසයයි; කවිනා, කවිහුවිසින්; උත්ප්‍රෙක්‍ෂ්‍ය, කල්පනා කොට; වර්ණ්‍යතෙ, කියනුලැබේ.

224 ඉදම්, මේ කර්ණාවතංසයතෙම; මමායතිවිරොධිනඃ, මාගේ දික්වීම වලකන්නාවූ; කර්ණස්‍ය, ශ්‍රවණයට; භූෂණම්. ආභරණයයි; ඉති, මෙසේ; තව, තීගේ; කර්ණොත්පලම්, ශ්‍රවණොත්පලයතෙම; දෘෂ්ට්‍යා, දෘෂ්ටියවිසින්; විලඞ්ඝ්‍යතෙ ප්‍රායඃ, ඉක්මෙනුලැබෙයි සිතමි.

මෙහි අචෙතන වූ නෙත්‍රාංශුලක්‍ෂණ වූ වස්තුහුගේ අනික් පරිද්දෙකින් සිටි ප්‍රවෘත්තිතොමෝ අනික් පරිද්දෙකින් උත්ප්‍රෙක්‍ෂිතයයි දතයුතු.

225 අපාඞ්ගභාගපාතින්‍යා, නෙත්‍රාන්තයෙහි හෙන්නාවූ හෙවත් සරස බලන; දෘෂ්ටෙඃ, දෘෂ්ටියගේ; අංශුභිඃ, ශොභායෙන්; උත්පලම්, කර්ණාවතංසයතෙම; ස්පෘශ්‍යතෙ වා න වා, ස්පර්ශ කරනුලැබේදෝ හෝ නොලැබේදෝ හොයි; එවම්, මෙසේ; කවිනා, කවිහුවිසින්; උත්ප්‍රෙක්‍ෂ්‍ය, කල්පනා කොට; කථ්‍යතෙ, කියනුලැබේ.

---

* මුද්‍යතඃ–ක. † වර්ණ්‍යතෙ–ක.

226 ලිම්පතීව තමො'ඞ්ගානි වර්ෂතීවාඤ්ජනං නභඃ
ඉතීදමපි භූයිෂ්ඨමුත්ප්‍රේක්ෂාලක්ෂණාන්විතම්.

227 කෙෂාඤ්චිදුපමාභ්‍රාන්තිරිවශ්‍රුත්‍යෙහ ජායතෙ
නොපමානං තිඞන්තෙනෙත්‍යතික්‍රම්‍යාප්තභාෂිතම්.

228 උපමානොපමෙයත්වං තුල්‍යධර්මව්‍යපෙක්ෂයා
ලිම්පතෙස්තමසශ්චාස්‍ය ධර්මඃ කො නු * සමීක්ෂ්‍යතෙ.

229 යදි ලෙපනමෙවෙෂ්ටං ලිම්පතිර්නාම කො'පරඃ
ස එව ධර්මො ධර්මී චෙත්‍යනුන්මත්තො † න භාෂතෙ.

930 කර්තා යද්‍යුපමානං ස්‍යාන්න්‍යග්භූතො'ස්‍ය ක්‍රියාපදෙ
ස්වක්‍රියාසාධනව්‍යග්‍රො නාලමන්‍යව්‍යපෙක්ෂිතුම්. ‡

---

226 තමඃ, අන්ධකාරයතෙම; අඞ්ගානි, ශරීරයන්; ලිම්පතීව, ගල්වන්නක්හු වැන්න; නභඃ, ආකාශයතෙම; අඤ්ජනම්, අඳුන්; වර්ෂතීව, වස්නක්හු වැන්නැයි; ඉති, මෙසේ; ඉදමපි, මෙද; භූයිෂ්ඨම්, අත්‍යර්ථයෙන්; උත්ප්‍රේක්ෂාලක්ෂණාන්විතම්, උත්ප්‍රේක්ෂාලක්ෂණයෙන් යුක්තයි.

227 උපමානම්, සාදෘශ්‍යප්‍රතියොගිය; තිඞන්තෙන, තිඞන්තයා හා; න ඉති, නැතැයි යන; ආප්තභාෂිතම්, යථාර්ථදර්ශීවූ ආප්තයන්ගේ වචනය; අතික්‍රම්‍ය, ඉක්ම; කෙෂාඤ්චිත්, සමහර කෙනෙක්නට; ඉහ, මේ උත්ප්‍රේක්ෂායෙහි ලා; ඉවශ්‍රුත්‍යා, ඉවශබ්දයාගේ ඇසීමෙන්; උපමාභ්‍රාන්තිඃ, උපමා ද්‍යෙහොයි යන විපර්‍ය්‍යාසය; ජායතෙ, උපදනේයි.

228 උපමානොපමෙයත්වම්, (කිසි වස්තුවක්හුගේ) උපමානබවද (කිසි වස්තුවක්හුගේ) උපමෙයබවද; තුල්‍යධර්මව්‍යපෙක්ෂයා, (උපමාන උපමෙය දෙන්නාට) සාධාරණ වූ ක්‍රියාලක්ෂණ වූ ගුණලක්ෂණ වූ හෝ ධර්මයාගේ ආශ්‍රය හෙතුකොටගෙන (වන්නේය); ලිම්පතෙඃ, ලිම්පතිහුගේද; තමසශ්ච, අන්ධකාරයාගේද; අස්‍ය කො ධර්මඃ, (උභයසාධාරණ වූ) මේ කවර ධර්මයෙක්; සමීක්ෂ්‍යතෙ නු, දක්නාලැබේද ?

229 යදි, ඉදින්, ලෙපනමෙව, (ක්‍රියාස්වරූප වූ) ලෙපනය ම; ඉෂ්ටම්, (අපවිසින් උභයසාධාරණ වූ ධර්මයයි) කැමැතිවනලද්දැයි (සිතම්); ලිම්පතිර්නාම අපරඃ කඃ, ලිම්පති නම් අනික් කවරෙක් (අවශිෂ්ටවන්නේද); ස එව, (ලෙපන නම්වූ) හෙ මැ; ධර්මඃ, සාධාරණ වූ ආශ්‍රයයැ; ස එව, ඒ ලෙපනය මැ; ධර්මී චෙති, ආශ්‍රිතයයිද; අනුන්මත්තඃ, ස්වස්ථ වූ සිත් ඇති එකෙක්; න භාෂතෙ, නොකියන්නේයි.

230 කර්තා, (ලෙපනක්‍රියාව සම්බන්ධ වූ) කර්තෘතෙම; යදි, ඉදින්; උපමානං ස්‍යාත්, (තමස්හට) උපමාන වේනම්; අස්‍ය, මේ (කර්තෘ)

---

* කො'නු-ක. † චෙත්‍යනුන්මත්තොපි-ක. ‡ දපෙක්ෂිතුම්-ක.

231 ඉයා ලිම්පත්‍යමුනා තුල්‍යං තම ඉත්‍යපි ශංසතඃ
අඞ්ගානීති න සම්බාධං සො'පි මෘග්‍යඃ සමො ගුණඃ.

232 යථෙන්දුරිව තෙ වක්ත්‍රමිති කාන්තිඃ ප්‍රතීයතෙ
න තථා ලිම්පතෙ ලෙපාදන්‍යදත්‍ර ප්‍රතීයතෙ.

233 තදුපශ්ලෙෂණාර්ථො'යං * ලිම්පතිර්ධ්වාන්තකර්තෘකඃ
අඞ්ගකර්මා ච පුංසෛවමුත්ප්‍රෙක්ෂ්‍යත ඉතීෂ්‍යතෙ. †

234 මන්‍යෙ ශඞ්කෙ ධ්‍රුවම් ප්‍රායො නූනමිත්‍යෙවමාදිභිඃ
උත්ප්‍රෙක්ෂා ව්‍යජ්‍යතෙ ශබ්දෛරිවශබ්දො'පි තාදෘශඃ.

ඉත්‍යුත්ප්‍රෙක්ෂාචක්‍රම්.

---

නෙව; ස්වක්‍රියාසාධනව්‍යග්‍රඃ, ස්වකීයවූ ලෙපනක්‍රියාසිද්ධියෙහි ව්‍යාපෘත වූයේ; ක්‍රියාපදෙ, (ලිම්පතී යන) ක්‍රියාපදයෙහි; න්‍යග්භූතඃ, (ක්‍රියාධීන බැවින්) අප්‍රධාන වන්නේය; අන්‍යත්, (උපමෙයයයි කැමැතිවනලද) තමස්තෙම; ව්‍යපෙක්ෂිතුම්, (උපමා කරනබැවින්) ආශ්‍රය කරන්නට; නාලම්, සමර්ථ නොවන්නේයි.

231 යඃ, යමෙක්තෙම; ලිම්පති, ලෙපනක්‍රියාව කරන්නේද; තමඃ, තමස; අමුනා තුල්‍යමිත්‍යපි, මේ ලෙපන ක්‍රියාව කරන්නහු හා සමයයිද; ශංසතඃ, කියන්නාවූ වාදීහුගේ (මතයෙන්); අඞ්ගානි, ("ලිම්පතිව" යන මෙහි) අඞ්ගානි යන කර්මපදය; න සම්බාධං ස්‍යාත්, අසඞ්ගත වන්නේය; සො'පි සමො ගුණඃ, (යම් ගුණයක් කරණකොටගෙන උපමාව වන්නීද) ඒ සාධාරණ ගුණයද; මෘග්‍යඃ, සෙවියයුතු (වන්නේයි); මෙහි නැතැයි සේයි.

232 තෙ, තීගේ; වක්ත්‍රම්, මුඛය; ඉන්දුරිවෙති, චන්ද්‍රයා වැන්න යන (මෙබඳු වූ ප්‍රයොගයෙහි); කාන්තිඃ, (චන්ද්‍ර මුඛ දෙදෙනාට සාධාරණ වූ) කාන්ති ගුණය; යථා ප්‍රතීයතෙ, යම්සේ දන්නා ලැබේද; තථා, එපරිද්දෙන්; ලිම්පතෙ, ලෙපන ක්‍රියාව කරන්නහු කෙරෙහි; ලෙපාදන්‍යත්, ලෙපනයා කෙරෙන් පිටත් (තමස්හු හා සදෘශ) ධර්මාන්තරයෙක්; අත්‍ර, මෙහි ලා; න ප්‍රතීයතෙ, නොදන්නා ලැබේද.

233 තත්, එහෙයින්; උපශ්ලෙෂණාර්ථඃ, ලෙපනක්‍රියාරූප වූ අර්ථ ඇත්තාවූද; ධ්වාන්තකර්තෘකඃ, තමස්හු කර්තෘ කොට ඇත්තාවූද; අඞ්ගකර්මා ච, අඞ්ගය කර්මකොට ඇත්තාවූද; අයං ලිම්පතිඃ, මේ ලෙපන ක්‍රියාව; පුංසා, කවීහුවිසින්; එවම්, මේ උක්තප්‍රකාරයෙන්; උත්ප්‍රෙක්ෂ්‍යත ඉති, උත්ප්‍රෙක්ෂා කරනුලබන්නේයයි; ඉෂ්‍යතෙ, කැමැතිවනුලැබේ.

234 මන්‍යෙ ශඞ්කෙ ධ්‍රුවම් ප්‍රායො නූනමිති, මන්‍යෙ-ශඞ්කෙ-ධ්‍රුවම්-ප්‍රායඃ-නූනම්-යන; එවමාදිභිඃ ශබ්දෛඃ, මේ ආදි ශබ්දයන්විසින්; උත්ප්‍රෙක්ෂා, උත්ප්‍රෙක්ෂාලංකාරතොමෝ; ව්‍යජ්‍යතෙ, ප්‍රකාශ කරනු ලබන්නීය; ඉවශබ්දොපි, ඉවශබ්දද; තාදෘශඃ, එබඳුයි.

---

* තදුපලෙපනාර්ථොයං–සිං. † ඉත්‍යපෙක්ෂ්‍යතෙ–ක.

235 හෙතුශ්ච සූක්ෂ්මලෙශෞ ච වාචාමුත්තමභූෂණම්
කාරකඥාපකෞ හෙතූ තෞ ච නෛකවිධෞ * යථා.

236 අයමාන්දොලිතා † ප්‍රෞඪචන්දනද්‍රුමපල්ලවඃ
උත්පාදයති සර්වස්‍ය ප්‍රීතිං මලයමාරුතඃ.

237 ප්‍රීත්‍යුත්පාදනයොග්‍යස්‍ය රූපස්‍යාත්‍රොපබෘංහණම්
අලඞ්කාරතයොද්දිෂ්ටං නිවෘත්තාවපි තත්සමම්.

238 චන්දනාරණ්‍යමාධූය ස්පෘෂ්ට්වා මලයනිර්ඣරාන්
පථිකානාමභාවාය පවනො'යමුපස්ථිතඃ.

---

235 හෙතුශ්ච, හෙතුවද; සූක්ෂ්මලෙශෞ ච, සූක්ෂ්ම ලෙශ දෙන්නද (යන මොහු තුන්දෙන); වාචාම්, කාව්‍යයන්ට; උත්තමභූෂණම්, ප්‍රධානවූ අලඞ්කාරයෙක; (මොවුන් කෙරෙහි ලා) කාරකඥාපකෞ, (භාවාභාව රූප වූ කාර්‍ය්‍යයා සම්බන්ධව ජනක වූ) කාරකද (විද්‍යමානවූ කිසිවක්හුගේ යම්කිසි සම්බන්ධයෙකින් ප්‍රතිපාදනය කරන්නාවූ) ඥාපකද යන මොහු දෙන්න; හෙතූ, හෙතු නම් වන්නාහ; තෞ ච, ඒ (කාරක ඥාපක) දෙන්නාද; නෛකවිධෞ, (ජන්‍ය ඥාප්‍ය දෙන්නාගේ විචිත්‍රබව හෙතුකොට) නානාප්‍රකාරයෝයි; යථා, (හේ) මෙසේයි.

236 ආන්දොලිත, කම්පා කරනලද; ප්‍රෞඪ, අපරිණත වූ හෙවත් ඝුමුහු කලාවූ; චන්දනද්‍රුමපල්ලවඃ, චන්දනවෘක්ෂයන්ගේ පලුපත් ඇති; අයං මලයමාරුතඃ, මේ දක්ෂිණපවනතෙම; සර්වස්‍ය, සියලු ලොකයහට; ප්‍රීතිම්, සන්තොෂයක්; උත්පාදයති, උපදවා-මේතෙම ප්‍රීතිසන්ධානය හෙතුකොටගෙන භාවයා මැ කාර්‍ය්‍යකොට ඇති කාරකහෙතු නම් වන්නේයි.

237 ප්‍රීත්‍යුත්පාදනයොග්‍යස්‍ය, සන්තොෂ ඉපදවීමට යොග්‍යවූ; රූපස්‍ය, ("අයමාන්දොලිත" යන මේ ආදියෙන් ප්‍රකාශ කරනලද සුරභිත්වාදි) ස්වභාවයාගේ; උපබෘංහණම්, ප්‍රතිසංස්කරණයතෙම; අත්‍ර, මේ ප්‍රයොගයෙහි; අලඞ්කාරතයා, කාව්‍යභූෂණබැවින්; උද්දිෂ්ටම්, විවක්ෂිතය; තත්, ඒ (දර්ශිත ස්වරූපවූ භාවකාර්‍ය්‍යය) තෙම; නිවෘත්තාවපි, (කාර්‍ය්‍යයාගේ) අභාවයෙහිදු; සමම්, (ඔහුවිසින් කිසි අභාවයක්හුගේ කිරීම හෙතුකොටගෙන) සදෘශයි.

238 චන්දනාරණ්‍යම්, චන්දනවනය; ආධූය, කම්පා කොට; මලයනිර්ඣරාන්, මලයමාරුතයෙහි ගඟල්හැලි; ස්පෘෂ්ට්වා, ස්පර්ශ කොට; අයම් පවනඃ, මේ දක්ෂිණානිලයතෙම; පථිකානාම්, මඟීන්ගේ හෙවත් විරහීන්ගේ; අභාවාය, විනාශය පිණිස; උපස්ථිතඃ, පැමිණියේය-මේතෙම පථිකයන්ගේ අභාවකාරණය හෙතු කොටගෙන අභාවයා ම කාර්‍ය්‍ය කොට ඇති කාරකහෙතුයයි දතයුතු.

---

* තෞ චානෙකවිධෞ-පා. † අයමාන්දොලිත-පා.

239 අභාවසාධනායාලමෙවම්භූතො හි මාරුතඃ
විරහජ්වරසම්භූතමනොඥාරොචකෙ * ජනෙ.

240 නිර්ව්වර්ත්‍යෙ ච විකාර්‍ය්‍යෙ ච හෙතුත්වං තදපෙක්ෂයා
ප්‍රාප්‍යෙ තු කර්ම්මණි ප්‍රායඃ ක්‍රියාපෙක්ෂෛව හෙතුතා.

241 හෙතුර්නිර්ව්වර්ත්තනීයස්‍ය දර්ශිතශ්ශෙෂයොර්ද්වයොඃ
දත්තොදාහරණද්වන්ද්වං ඥාපකො වර්ණයිෂ්‍යතෙ.

242 උත්ප්‍රවාලාන්‍යරණ්‍යානි වාප්‍යඃ සම්ඵුල්ලපඞ්කජාඃ
චන්ද්‍රඃ පූර්ණ්ණශ්ච කාමෙන පාන්ථදෘෂ්ටෙර්විෂං කෘතම්.

243 පානයොග්‍යාං † කරොමීති ප්‍රියස්ථානෙ කෘතාං ‡ සඛීම්
බාලා භ්‍රූභඞ්ගජිහ්මාක්ෂී පශ්‍යති ස්ඵුරිතාධරා.

---

239 එවම්භූතඃ, මෙබඳුවූ; මාරුතඃ, දක්ෂිණානිලයතෙම; විරහජ්වර සම්භූත, විරහ නමැති හුණින් උපන්නාවූ; මනොඥාරොචකෙ, රම්‍ය වස්තුයෙහි වෙෂ ඇති; ජනෙ, ජනයා විෂයෙහි ලා හෙවත් ජනයාගේ; අභාවසාධනාය, අභාවසිද්ධියට; අලම්, සමර්ථයි-හිශබ්දො වාචොපුසොත්‍ර ප්‍රසිද්ධෙ වා.

240 නිර්ව්වර්ත්‍යෙ ච, නිර්ව්වර්ත්‍ය වූ කර්ම්මයෙහිද; විකාර්‍ය්‍යෙ ච, විකාර්‍ය්‍ය වූ කර්ම්මයෙහිද; හෙතුත්වම්, කාරකබව; තදපෙක්ෂයා, ඒ (නිර්ව්වර්ත්‍ය විකාර්‍ය්‍ය දෙන්නාගේ) ආශ්‍රයෙන් වන්නේය; ප්‍රාප්‍යෙ තු කර්ම්මණි, ප්‍රාප්‍යකර්ම්මයෙහි ලා; හෙතුතා, කාරකත්වය; ප්‍රායඃ, බොහෝසේ; ක්‍රියාපෙක්ෂෛව, ක්‍රියාව මැ ආශ්‍රය කරන්නේයි.

241 නිර්ව්වර්ත්තනීයස්‍ය, (භාවරූප වූද අභාවරූප වූද) නිර්ව්වර්ත්‍යකර්ම්මයාගේ; හෙතුඃ, කාරකයතෙම; දර්ශිතඃ, (උදාහරණමුඛයෙන්) දක්වන ලද; ශෙෂයොඃ, අවශිෂ්ටවූ හෙවත් අනුක්ත වූ; ද්වයොඃ, (විකාර්‍ය්‍ය ප්‍රාප්‍ය) දෙදෙනහට; උදාහරණද්වන්ද්වම්, උදාහරණ යුගලය; දත්තා, දී හෙවත් දක්වා; ඥාපකඃ, ඥාපකහෙතුතෙම; වර්ණයිෂ්‍යතෙ, මතු උදාහරණ කරනුලැබේ.

252 උත්ප්‍රවාලානි, උද්ගත වූ පලුපත් ඇති; අරණ්‍යානි, වනයෝද; සම්ඵුල්ලපඞ්කජාඃ, ප්‍රබුද්ධ වූ පද්ම ඇති; වාප්‍යඃ, වාපිහුද; පූර්ණ්ණඃ, පිරුණාවූ; චන්ද්‍රශ්ච, චන්ද්‍රද (යන මේ සියල්ල); කාමෙන, අනඞ්ගයාවිසින්; පාන්ථදෘෂ්ටෙඃ, පථිකයන්ගේ ඇසට; විෂං කෘතම්, විෂ කරනලදී-මෙහි විද්‍යමාන වූ උක්තප්‍රකාර වූ අරණ්‍යාදීන් කාමයාවිසින් පථිකයන් ඇසට විෂරූපයෙන් විකෘතහෙයින් මේ විකාරයට හෙතු වූයේ කර්ම්මයයි දතයුතු.

243 පානයොග්‍යාම්, පානයට පොහොසත්වීම: කරොමීති, කෙරෙමියි; ප්‍රියස්ථානෙ, වල්ලභයාගේ ස්ථානයෙහි; කෘතාම්, කරනලද හෙවත්

* මදනාග්න්‍යාතුරෙ–ක. † මානයොග්‍යාං–ක. ‡ ප්‍රියස්ථානස්ථිතාං–ක.

244 ගතො'ස්තමර්කො භාතීන්දුර්යාන්ති වාසාය පක්ෂිණඃ
ඉතීදමපි සාධ්වෙව කාලාවස්ථා නිවෙදනෙ.

245 අවධ්‍යෛරින්දුපාදනාමසාධ්‍යෛශ්චන්දනාම්භසාම්
දෙහොෂ්මභිස්සුබොධං තෙ සඛි! කාමාතුරං මනඃ.

246 ඉති ලක්ෂ්‍යාඃ ප්‍රයොගෙෂු රම්‍යා ඥාපකහෙතවඃ
අභාවහෙතවඃ කෙචිද්ව්‍යාහ්‍රියන්තෙ මනොහරාඃ.

247 අනභ්‍යාසෙන විද්‍යානාමසංසර්ගෙණ ධීමතාම්
අනිග්‍රහෙණ චාක්ෂාණාං ව්‍යසනං ජායතෙ * ඍණම්.

---

තමාගේ වල්ලභයෙකියයි ප්‍රියයාගේ රූපයෙන් පරිකල්පිත වූ; සඛිම්, යෙහෙළිය; භ්‍රූභඞ්ග, බැම බිඳීමෙන්; ජිහ්මාක්ෂී, කුටිලවූ ඇස් ඇති; බාලා, බාලාතොමෝ; ස්ඵුරිතාධරම්, (කෘතඝ්නරොෂයෙන්) ලොල වූ අධර ඇතිකොට; පශ්‍යති, බලා-මෙහි නිර්ව්‍යාජනාකාර ව්‍යතිරෙකයෙන් බාලස්ත්‍රියවිසින් සඛිවිෂය වූ දර්ශනමාත්‍රය සිද්ධ කරනහෙයින් මේ ප්‍රාප්‍ය කාර්‍ය්‍ය වූ කාරකහෙතුයයි දතයුතු.

244 අර්කඃ, සූර්‍ය්‍යතෙම; අස්තම්, අස්තයට; ගතඃ, ගියේ; ඉන්දුඃ, චන්ද්‍ර තෙම; භාති, බබළන්නේය; පක්ෂිණඃ, පක්ෂීහු, වාසාය, වාසයට; යාන්ති, යන්නාහයි; ඉති, මෙබඳු වූ; ඉදමපි, මෙද; කාලාවස්ථානිවෙදනෙ, කාලයාගේ ප්‍රදොෂලක්ෂණයෙහි වූ අවස්ථා ඥාපනයෙහි ලා; සාධු එව, සම්චීන මැයි-මෙහි රජනීමුඛය විනා නොපවත්නාවූ සූර්‍ය්‍යාස්තමයාදියෙන් රජනීමුඛය කියනලදහෙයින් මේතෙම ඥාපකහෙතුයයි දතයුතු.

245 සඛි, යෙහෙළිය: ඉන්දුපාදනාම්, චන්ද්‍රරශ්මීන් සම්බන්ධ වැ; අවධ්‍යෛඃ, නොනැසිය හැක්කාවූ හෙවත් දුරු නොකටහැකිවූ; චන්දනාම්භසාම්, චන්දනජලයන් සම්බන්ධ වැ; අසාධ්‍යෛඃ, අසාධ්‍ය වූ; දෙහොෂ්මභිඃ, ශරීරසන්තාප කරණකොටගෙන; තෙ, ඔබගේ; මනඃ, සිත; කාමාතුරම්, මන්මථාතුර වූයේ; සුබොධම්, ව්‍යක්තකොට මැ දන්නා ලැබේ.

246 ඉති, මෙසේ; රම්‍යාඃ, මනොහර වූ; ඥාපකහෙතවඃ, ඥාපක හෙතූහු; ප්‍රයොගෙෂු, ප්‍රයොගයෙහි ලා; ලක්ෂ්‍යාඃ, දක්නයුත්තාහ; මනොහරාඃ, සිත්කලුවූ; කෙචිත් අභාවහෙතවඃ, කිසි අභාවහෙතු කෙනෙක්; ව්‍යාහ්‍රියන්තෙ, උදාහරණ කරනුලැබෙත්.

247 විද්‍යානාම්, (ත්‍රයී ආදී චතුර්විධ) ශාස්ත්‍රයන්ගේ; අනභ්‍යාසෙන, (ශ්‍රැති චින්තා භාවනා ලක්ෂණ වූ) අභියොගයක් නැතිහෙයින්ද; ධීමතාම්, (ඒ ඒ ශාස්ත්‍ර දන්නා) නුවණැත්තන්ගේ; අසංසර්ගෙණ, අසඞ්ගමයෙන් ද; අක්ෂාණාම්, චක්ෂුරාදි ඉන්ද්‍රියයන්ගේ; අනිග්‍රහෙණ, (ආපායික වූ

---

* ජායතෙ ව්‍යසනං-ක.

248 ගතඃ කාමකථොන්මාදෝ ගලිතො යෞවනජ්වරඃ
ක්ෂතො * මොහශ්ච්‍යුතා තෘෂ්ණා කෘතං පුණ්‍යාශ්‍රමෙ මනඃ.

249 වනාන්‍යමූනි න ගෘහාණ්‍යෙතා නද්‍යො න යොෂිතඃ
මෘගා ඉමෙ න දායාදාස්තන්මෙ නන්දති මානසම්.

250 අත්‍යන්තමසදාර්‍ය්‍යාණාමනාලොචිතචෙෂ්ටිතම්
අතස්තෙෂාං විවර්ධන්තෙ සතතං සර්වසම්පදඃ.

---

විෂයප්‍රවෘත්තිනිරොධස්වරූප වූ) නිග්‍රහයක් නැත්හෙයින්ද; නෘණාම්, මනුෂ්‍යයන්ට; ව්‍යසනම්, විපත්තිය; ජායතෙ, වන්නේයි-මෙහි විද්‍යාභ්‍යාසාදීන්ගේ අනුත්පත්තිය හෙතුකොටගෙන භාවරූප වූ ව්‍යසනකාර්‍ය්‍ය උද්භූත වේනුයි මෙතෙම භාවය මැ කාර්‍ය්‍ය කොට ඇති ප්‍රාගභාවමය වූ කාරකහෙතුයයි දතයුතු.

248 කාමකථොන්මාදඃ; විෂයසම්භොගකථා නමැති වියරුව; ගතඃ, ගියේ; යෞවනජ්වරඃ, තාරුණ්‍ය නමැති ජ්වරයතෙම; ගලිතඃ, ගිලිහියේ; මොහඃ, දුඃඛාත්මක වූ සංසාරයෙහි සුඛය යන විපර්‍ය්‍යාසය; ක්ෂතඃ, ක්ෂීණ වැ ගියේය; තෘෂ්ණා, (තදනුගාමිනී වූ) තෘෂ්ණාතොමෝ; ච්‍යුතා, ගිලිහුණා; (එහෙයින් මා); මනඃ, සිත; පුණ්‍යාශ්‍රමෙ, ධර්ම්මවිෂයෙහි; කෘතම්, පිහිටුවනලදි-මෙහි උත්පන්න වූ කාමොන්මාදාදීන්ගේ විනාශය හෙතුකොට ගෙන ධර්ම්මමාර්ගයෙහි බුද්ධිතොමෝ වූනුයි මෙතෙම භාවයාම කාර්‍ය්‍ය කොට ඇති ප්‍රධ්වංසාභාවලක්ෂණ වූ කාරකහෙතුයයි දතයුතු.

249 අමූනි, මොහු; වනානි, අරණ්‍යයහ; න ගෘහාණි, ගෘහයෝ නොවෙති; එතාඃ, මොහු; නද්‍යඃ, නදීහුය; න යොෂිතඃ, ස්ත්‍රීහු නොවෙති; ඉමෙ, මොහු; මෘගාඃ, මෘගයෝය; න දායාදාඃ, දරුවෝ නොවෙති; තත්, එහෙයින් හෙවත් මෙසේ සකලකල්‍යාණප්‍රාප්තිය හෙතු කොටගෙන; මෙ, මාගේ; මානසම්, සිත; නන්දති, සතුටු වන්නේයි-මෙහි වනගෘහාදීන්ගේ ඔවුනොවුන්කෙරෙහි උක්තප්‍රකාරයෙන් අභාවය හෙතු කොට ගෙන මනොනන්දනය උත්පන්නහෙයින් මෙතෙම භාවයම කාර්‍ය්‍ය කොට ඇති ඔවුනොවුන්ගේ අභාවලක්ෂණ වූ කාරකහෙතුයයි දතයුතු.

250 ආර්‍ය්‍යාණාම්, ආර්‍ය්‍යයන්ගේ; අනාලොචිතචෙෂ්ටිතම්, (සාධුය අසාධුයයි) නොබලනලද දෘෂරූප වූ චරිතය තෙම; අත්‍යන්තම්, එකාන්තයෙන්; අසත්, නැත්තේය; අතඃ, එහෙයින්; තෙෂාම්, ඒ ආර්‍ය්‍යයන්ගේ; සම්පදඃ, සම්පත්තීහු; සදා, සතතයෙන්; සර්ව්‍ය, හැමතැන්හි මැ; විවර්ධන්තෙ, වඩනාහුයි-මෙහි ලා සර්ව්වප්‍රකාරයෙන් අනාලොචිතචෙෂ්ටිතයක් නැතිහෙයින් සියලු සම්පද්වෘද්ධිඵලය වේනුයි මෙතෙම භාවයා මැ කාර්‍ය්‍ය කොට ඇති අත්‍යන්තයෙන් අභාවලක්ෂණ වූ කාරකහෙතුයයි දතයුතු.

---

* ගතො-ක.

251 උද්‍යානසහකාරාණාමනුද්භින්නා න මඤ්ජරී
දෙයඃ පථිකනාරීණාං සතිලස්සලිලාඤ්ජලිඃ.

252 ප්‍රාගභාවාදිරූපස්‍ය හෙතුත්වමිහ වස්තුනඃ
භාවාභාවස්වරූපස්‍ය කාර්‍ය්‍යස්‍යොත්පාදනම්ප්‍රති.

253 දූරකාර්‍ය්‍යස්තත්සහජඃ කාර්‍ය්‍යානන්තරජස්තථා
අයුක්තයුක්තකාර්‍ය්‍යෞ චෙත්‍යසංඛ්‍යාශ්චිත්‍රහෙතවඃ.

254 තෙ'මී ප්‍රයොගමාර්ගෙෂු ගෞණවෘත්තිව්‍යපාශ්‍රයාඃ
අත්‍යන්තසුන්දරා දෘෂ්ටාස්තදුදාහෘතයො යථා.

255 ත්වදපාඞ්ගාහ්වයං ජෛත්‍රමනඞ්ගාස්ත්‍රං යදඞ්ගනෙ !
මුක්තං තදන්‍යතස්තෙන සො'ප්‍යහං මනසි ක්‍ෂතඃ.

---

251 උද්‍යාන, ප්‍රමදවනයෙහි ලා; සහකාරාණම්, චූතද්‍රැමයන්ගේ; මඤ්ජරී, කලිකාතොමෝ; අනුද්භින්නා න, පහළ නොවූවා නොවෙයි හෙවත් උද්භූතයැ; (එහෙයින්); පථිකනාරීණම්, විරහි ස්ත්‍රීන්ට; සතිලඃ, තලසහිත වූ; සලිලාඤ්ජලිඃ, ජලාඤ්ජලිය; දෙයඃ, දියයුතුයි-මෙහි චූතමඤ්ජරීන් සම්බන්ධි වූ අනුද්භෙදයාගේ උද්භෙදරූප ප්‍රාගභාවාභාවයතෙම * පථිකස්ත්‍රීන්ට විනාශජනක නුයි මෙතෙම අභාවය මැ කාර්‍ය්‍ය කොට ඇති ප්‍රාගභාවලක්‍ෂණ වූ කාරකහෙතුයයි දතයුතු.

252 ඉහ, මෙහි; භාව, විධිස්වරූපවූද; අභාවස්වරූපස්‍ය, ප්‍රතිෂෙධ ස්වරූපවූද; කාර්‍ය්‍යස්‍ය, ඵලයාගේ; උත්පාදනම්ප්‍රති, ක්‍රියාපිණිස; ප්‍රාගභාවාදිරූපස්‍ය, ප්‍රාගභාවාදිය මැ ස්වභාව කොට ඇති; වස්තුනඃ, පදාර්ථයාගේ; හෙතුත්වම්, කාරණත්වයයි.

253 දූරකාර්‍ය්‍යඃ, දූරකාර්‍ය්‍යය; තත්සහජඃ, ඒ කාර්‍ය්‍යසහජය; කාර්‍ය්‍යානන්තරජඃ, කාර්‍ය්‍යානන්තරජය; තථා, එසේම; අයුක්තයුක්තකාරී වෙති, අයුක්තකාර්‍ය්‍ය යුක්තකාරියයි කියාද මෙසේ; චිත්‍රහෙතවඃ, ආශ්චර්‍ය්‍ය වූ හෙතූහු; අසංඛ්‍යාඃ, ගණන් නැත්තාහුයි.

254 ගෞණවෘත්තිව්‍යපාශ්‍රයාඃ, අමුඛ්‍ය වූ භාවාභාවස්වභාව වූ වස්තු ස්ථාන අධිෂ්ඨාන කොට ඇත්තාවූ; අත්‍යන්තසුන්දරාඃ, අත්‍යර්ථයෙන් මනොහර වූ; තෙ'මී, ඒ මේ (අනන්තරොක්තප්‍රකාර වූ දූරකාර්‍ය්‍යාදි වූ) චිත්‍රහෙතූහු; ප්‍රයොගමාර්ගෙෂු, (සම්බන්ධාදිලක්‍ෂණ) කාව්‍යමාර්ගයෙහි ලා; දෘෂ්ටාඃ. දක්නාලදහ; තදුදාහෘතයඃ, ඒ චිත්‍රහෙතූන්ට උදාහරණයෝ; යථා, මෙසේයි.

255 අඞ්ගනෙ, කාන්තාව; ත්වදපාඞ්ගාහ්වයම්, තීගේ නෙත්‍රාන්තයයි යන නම් ඇත්තාවූ; ජෛත්‍රම්, ලොකවිජය මැ ස්වභාව කොට ඇති; යත් අනඞ්ගාස්ත්‍රම්. යම් කාමයාගේ ආයුධයෙක් ඇද්ද; තත්, ඒ ආයුධය තෙම: අන්‍යතො මුක්තම්, අනික් පුරුෂයකු කෙරෙහි හරනාලද; තෙන, ඒ ශරයෙන්; සො'ප්‍යහම්, ඒ මමද; මනසි, සිත්හි ලා; ක්‍ෂතඃ, පහර නාලදිම්

---

* ප්‍රාගභාවයතෙම

256 ආවිර්භවති නාරීණාං වයඃ පර්‍ය්‍යස්තශෛශවම්
සහෛව විවිධෛඃ පුංසාමඞ්ගජොන්මාදවිභ්‍රමෛඃ.

257 පශ්චාත්පර්‍ය්‍යස්‍ය කිරණානුදීර්ණං චන්ද්‍රමණ්ඩලම්
ප්‍රාගෙව හරිණාක්ෂීණාමුදීර්ණො රාගසාගරඃ.

258 රාඥාං හස්තාරවින්දානි කුඩ්මලීකුරුතෙ කුතඃ
දෙව! ත්වච්චරණද්වන්ද්වරාග * බාලාතපඃ ස්පෘශන්.

259 පාණිපද්මානි භූපානාං සඞ්කොචයිතුමීශතෙ
ත්වත්පාදනඛචන්ද්‍රාණාමර්චිෂඃ කුන්දනිර්මලාඃ.

---

ආයුධයතෙම යම්තැනෙක හෙළනලද්දේ වී නම් ඒ විෂය මැ ඡේදන කරන්නේයයි ප්‍රසිද්ධයැ. මේ ස්වව්‍යවහාරයට ගොචර නොවූ වස්තුවද පහරන්නේනුයි මෙබඳු වූයේ දූර වූ කාර්‍ය්‍යී ඇති චිත්‍රහෙතුයයි දතයුතු.

256 නාරීණාම්, අඟනාවන්ගේ; පර්‍ය්‍යස්තශෛශවම්, දුරුකරනලද බාල්‍යය ඇති; වයඃ, වයසතෙම; පුංසාම්, පුරුෂයන්ගේ; විවිධෛඃ, නානාප්‍රකාර වූ; අඞ්ගජොන්මාදවිභ්‍රමෛස්සහෛව, කාමොන්මාදයාගේ අවස්ථාවිශෙෂ හා එක් ව මැ; ආවිර්භවති, පහළවන්නේයි–මෙතෙම කාර්‍ය්‍ය හා එක් වැ උපන්හෙයින් කාර්‍ය්‍යසහජ වූ චිත්‍රහෙතුයයි දතයුතු.

257 හරිණාක්ෂීණාම්, මියුලැසියන්ගේ; රාගසාගරඃ, පුරුෂාභිලාෂ නමැති සමුද්‍රයතෙම; ප්‍රාගෙව, (චන්ද්‍රොදයට) පළමුව මැ; උදීර්ණඃ, වෘද්ධියට පැමිණියේ; චන්ද්‍රමණ්ඩලම්, ශශාඞ්කබිම්බයතෙම; කිරණාන්, රශ්මීන්; පර්‍ය්‍යස්‍ය, විසුරුවා; පශ්චාත්, පසුව හෙවත් රාගසාගරෝදයට අනන්තර වැ; උදීර්ණම්, නැංගේ.

මෙහි ස්වකාර්‍ය්‍යයට පළමු කොට චන්ද්‍රමණ්ඩලොදය හෙතු කොට ගෙන මෙතෙම කාර්‍ය්‍යානන්තරජ වූ චිත්‍රහෙතුයයි දතයුතු.

258 දෙව, දෙවය; ත්වච්චරණද්වන්ද්ව, තාගේ පාදයුග්මයාගේ; රාග බාලාතපඃ, රත්පැහැ නමැති ළහිරුරැස්තෙම; රාඥාම්, රජදරුවන්ගේ; හස්තාරවින්දානි, හස්ත නමැති පද්මයන්; ස්පෘශන්, ස්පර්ශ කරන්නේ; කුතඃ, කවරහෙයකින්; කුඩ්මලීකුරුතෙ, මුහුළු කෙරේද හෙවත් හකුළුවාද?

පද්මොන්මීලනයට කාරණ වූ බාලාතපය මෙහි පද්මසම්මීලනය කරනහෙයින් මෙතෙම අයුක්තකාරි වූ චිත්‍රහෙතුයයි දතයුතු.

259 ත්වත්පාද, තාගේ චරණයෙහි; නඛචන්ද්‍රාණාම්, නඛ නමැති චන්ද්‍රයන්ගේ; කුන්දනිර්මලාඃ, කුන්දපුෂ්ප සේ නිෂ්කලඞ්ක වූ; අර්චිෂඃ, ශොභාවෝ; භූපානාම්, රජදරුවන්ගේ; පාණිපද්මානි, හස්ත නමැති පද්මයන්; සඞ්කොචයිතුම්, හකුළුවන්නට; ඊශතෙ, පොහොසත් වේ.

---

* මන්මරචි–ක.

260 ඉති හේතුවිකල්පස්‍ය * දර්ශිතා ගතිරීදෘශී-(ඉති හේතුචක්‍රම්.)
ඉඞ්ගිතාකාරලක්‍ෂ්‍යෝ'ර්ථස්සෞක්ෂ්ම්‍යාත් සූක්ෂ්ම ඉති ස්මෘතඃ.

261 කදා නෞ සඞ්ගමෝ භාවීත්‍යාකීර්ණේ වක්තුමක්‍ෂමම්
අවෙත්‍ය † කාන්තමබලා ලීලාපද්මං න්‍යමීලයත්.

262 පද්මසම්මීලනාදත්‍ර සූචිතෝ නිශි සඞ්ගමඃ
ආශ්වාසයිතුමිච්ඡන්ත්‍යා ප්‍රියමඞ්ගජපීඩිතම්.

263 ත්වදර්පිත ‡ දෘශස්තස්‍යා ගීතගෝෂ්ඨ්‍යාමවර්ධත
උද්දාමරාගතරලාච්ඡායා කාපි මුඛාම්බුජේ.

---

චන්ද්‍රමරීචියෙන් පද්මසඞ්කොචය උචිතහෙයින් මෙතෙම ප්‍රකෘත කාරි චිත්‍රහෙතුයයි දතයුතු.

260 ඉති, මෙසේ අනන්තරොක්ත ක්‍රමයෙන්; හෙතුවිකල්පස්‍ය, හෙතු භෙදයාගේ; ඊදෘශී, මෙබඳුවූ; ගතිඃ, ස්වරූපය; දර්ශිතා, දක්වනලද්දී; ඉඞ්ගිතාකාර, ඉඞ්ගිතය ආකාරය යන දෙකින්; ලක්‍ෂ්‍යාර්ථඃ, දතයුතුවූ අර්ථයතෙම; සෞක්ෂ්ම්‍යාත්, සූක්ෂ්මත්වය හෙතු කොට; සූක්ෂ්ම ඉති, සූක්ෂ්මයයි; ස්මෘතඃ, දන්නාලදී,

261 නෞ, අප දෙදෙනාගේ; සඞ්ගමඃ, සංයොගය; කදා භාවීති, කවර වේලෙහි වේද්ද හොයි; ආකීර්ණෙ, ජනසම්බාධස්ථානයෙහි; වක්තුම්, කියන්නට; අක්‍ෂමම්, නොපොහොසත්වූ; කාන්තම්, වල්ලභයා; අවෙත්‍ය, ආකාරයෙන් දැන; අබලා, ස්ත්‍රීතොමෝ; ලීලාපද්මම්, ලීලා පිණිස ගත් පද්මය; න්‍යමීලයත්, හැකුළුවූ.

262 අත්‍ර, මේ ප්‍රයොගයෙහි ලා; අඞ්ගජපීඩිතම්, කාමයාවිසින් පෙළනලද; ප්‍රියම්, වල්ලභයා; ආශ්වාසයිතුම්, අස්වසන්නට; ඉච්ඡන්ත්‍යා, කැමැති විදග්ධ ස්ත්‍රියකවිසින්; පද්මසම්මීලනාත්, (ඉඞ්ගිතවිශෙෂ) පද්මසඞ්කොචය හෙතු කොටගෙන; නිශි, රාත්‍රියෙහි ලා; සඞ්ගමඃ, (සඞ්කල්පස්වරූපයෙන් සිටි) සඞ්ගමයතෙම; සූචිතඃ, හඟවනලදී-කරන ලද පද්මමීලනය කායක්‍රියාවගේ ඉඞ්ගිතස්වභාවබැවින් මෙතෙම ඉඞ්ගිත සූක්‍ෂ්මයයි දතයුතු.

263 ගීතගොෂ්ඨ්‍යාම්, ගීතවිනොදයෙහි ලා; ත්වදර්පිතදෘශඃ, තා කෙරෙහි පිහිටුවනලද ඇස් ඇති; තස්‍යාඃ, ඇයගේ; මුඛාම්බුජෙ, මුඛ පද්මයෙහි; උද්දාමරාගතරලා, අධික වූ රත්‍යභිප්‍රායයෙන් උජ්ජ්වල වූ; කාපිච්ඡායා, කවර ද්දෙ හෝ ම ශොභාවක්; අවර්ධත, වැඩුණි.

මෙයින් චිත්තාන්තර්ගත වූ සුරතසන්තොෂොත්සවය ප්‍රකාශ කරන ලදී. මෙයි මුඛගත වූ එබඳු වූ ශොභා තමාම එබඳු ශොභාඅභිප්‍රායයෙන් වෘද්ධිපුරස්සර වැ පහළවූහෙයින් මෙතෙම ආකාරසූක්ෂ්මයයි දක්වනලදී.

---

* විකල්පානාං-ක. † අවෙක්‍ෂ්‍ය-ක. ‡ මදර්පිත-ක.

264 ඉත්‍යනුද්භින්නරූපත්වාද්‍රත්‍යුත්සවමනොරථඃ
අනුල්ලඞ්ඝ්‍යෛව සූක්ෂ්මත්වමභූදත්‍රාප්‍යවස්ථිතඃ *.

ඉති සූක්ෂ්මම්.

265 ලේශො ලේශෙන † නිර්භින්නවස්තුරූපනිගූහනම්
උදාහරණ එවාස්‍ය රූපමාවිර්භවිෂ්‍යති.

266 රාජකන්‍යානුරක්තං මාං රොමොද්භෙදෙන රක්ෂකාඃ
අවගච්ඡෙයුරාඥාතමහො ශීතානිලං වනම්.

267 ආනන්දාශ්‍රු ප්‍රවෘත්තං මෙ කථං දෘෂ්ට්වෛව කන්‍යකාම්
අක්ෂි මෙ පුෂ්පරජසා වාතොද්ධූතෙන දූෂිතම්.

---

264 ඉති, මේ උක්තප්‍රකාරයෙන්; රත්‍යුත්සවමනොරථඃ, සුරතොත්සවාභිලාෂයතෙම; අනුද්භින්නරූපත්වාත්, ශබ්දප්‍රකාශිත වූ ස්වභාවයක් නැතිබැවින්; සූක්ෂ්මත්වම්, දුරුපලක්ෂ්‍යබව; අනුල්ලඞ්ඝ්‍යෛව, නොඉක්ම මැ; අත්‍රාපි, මේ සූක්ෂ්මප්‍රයොගයෙහිදු; අවස්ථිතඃ අභූත්, පිහිටියේයි.

අපිශබ්දයෙන් මෙහි මතු නොවෙයි ඉඞ්ගිතසූක්ෂ්මයෙහිද සූක්ෂ්මත්වය සිටියේයයි හඟවනලදී.

265 ලේශෙන, කිසි හෙතුවකින්; නිර්භින්න, ප්‍රකට වූ; වස්තුරූප නිගූහනම්, කිසි අනුරාගාදි වස්තුරූපයක්හුගේ සැඟවීම; ලේශඃ; ලේශ නම් වන්නේය; අස්‍ය රූපම්, මේ ලේශයාගේ ස්වභාවය; උදාහරණ එව, උදාහරණයෙහි මැ; ආවිර්භවිෂ්‍යති, පහළ වන්නේයි.

266 මාම්, මා; රාජකන්‍යානුරක්තම්, රාජකන්‍යාව කෙරෙහි ඇලුම් ඇත්තහු; රක්ෂකාඃ, ඇයගේ රක්ෂායෙහි අධිකෘත වූ වර්ෂවරාදීහු; රොමොද්භෙදෙන, රොමහර්ෂණය කරණ කොටගෙන; අවගච්ඡෙයුඃ, දනිත්; ආ ඥාතම් ‡, දන්නාලදී; අහො, අතිශයෙක; වනම්, වනයතෙම; ශීතානිලම්, ශීතපවන් ඇත්තේයි.

මෙහි රොමහර්ෂයෙන් ප්‍රකට වූ අනුරාගස්වරූපයෙන් වූ වස්තුරූපය තෙම ශීතානිලස්පර්ශලක්ෂණ වූ කාරණාන්තරොපන්‍යාසයෙන් සඟවනලදී.

267 කන්‍යකාම්, කන්‍යකාව; දෘෂ්ට්වෛව, දැක මැ හෙවත් දර්ශනයට අනන්තරව මැ; මෙ, මට; ආනන්දාශ්‍රු, සන්තොෂබාෂ්පය තෙම; කථම් ප්‍රවෘත්තම්, කෙසේ පැවැත්තේද; මෙ, මාගේ: අක්ෂි, ඇස; වාතොද්ධූතෙන, පවනින් නඟනලද; පුෂ්පරජසා, කුසුමපරාගයෙන්; දූෂිතම්, උපද්‍රුතයි–මෙහි සන්තොෂබාෂ්පප්‍රකාශිත වූ අනුරාගලක්ෂණ වූ වස්තුරූපය තෙම පුෂ්පරජඃපාතස්වරූප වූ කාරණාන්තරයාගේ ප්‍රතිපාදනයෙන් සඟවනලදී.

---

* දත්‍රාව්‍යවස්ථිතඃ–ක. † ලවො ලේශෙන–ප.

‡ "ආ ඉති ස්මරණෙ"–මාලින්‍යප්‍රොක්ෂ්ණි.

268 ඉත්‍යෙවමාදෞ * ස්ථානෙ'යමලඞ්කාරො'තිශොභතෙ
ලෙශමෙකෙ විදුර්නින්දාං ස්තුතිං වා ලෙශතඃ කෘතාම්.

269 යුවෛව † ගුණවාන්‍රාජා යොග්‍යස්තෙ පතිරූර්ජිතඃ
රණොත්සවෙ මනස්සක්තං යස්‍ය කාමොත්සවාදපි.

270 වීර්‍ය්‍යොත්කර්ෂස්තුතිර්නින්දෛවාස්මින් භාවනිවෘත්තයෙ
කන්‍යායාඃ කල්පතෙ භොගාන්නිර්විවික්ෂොර්නිරන්තරාන්. ‡

271 චපලො නිර්දයශ්චාසෞ ජනඃ කිං තෙන මෙ සඛි!
ආගඃප්‍රමාර්ජනායෛව චාටවො යෙන ශික්ෂිතාඃ.

272 දොෂාභාසො ගුණඃ කො'පි දර්ශිතශ්චාටුකාරිතා
මානං සඛීජනොද්දිෂ්ටං කර්තුං රාගාදශක්තයා.

ඉති ලෙශචක්‍රම්.

---

268 ඉත්‍යෙවමාදෞ, අනන්තරොක්ත වූ රාජකන්‍යාදර්ශිතය රාග සංවරණය යන මේ ආදිවූ; ස්ථානෙ, ප්‍රස්තාවයෙහි; අයමලඞ්කාරඃ, මේ ලෙශාලඞ්කාරයතෙම; අතිශොභතෙ, අත්‍යර්ථයෙන් හොබනේය; එකෙ, සමහර කෙනෙක්; ලෙශතඃ, ව්‍යාජයෙන්; කෘතාම්, කරනලද; නින්දාම්, දෝෂොක්තිය හෝ නොහොත්; ස්තුතිං වා, ගුණවිෂ්ක්‍රියාව හෝ; ලෙශම්, ලෙශයයි; විදුඃ, දනිත්.

269 යස්‍ය, යමක්හුගේ; මනඃ, සිත; කාමොත්සවාදපි, කාමසුඛයට ද වඩා; රණොත්සවෙ, යුද්ධොත්සවයෙහි; සක්තම්, ඇලුණේද; යුවෛව, ළදරු වූයේ මැ; ගුණවාන්, ගුණ ඇත්තාවූ; ඌර්ජිතඃ, තෙජස්වි වූ; ස රාජා, ඒ රජතෙම; තෙ, තිට; යොග්‍යඃ පතිඃ, උචිත ස්වාමියෙකි.

270 අස්මින්, මේ අනන්තරවර්ණිත වූ පුරුෂයාකෙරෙහි; නිරන්තරාන්, විච්ඡෙදයක් නැති; භොගාන්, සුරතසුඛයන්; නිර්විවික්ෂොඃ, අනුභව කටපිවූ; කන්‍යායාඃ, කන්‍යාවගේ; භාවනිවෘත්තයෙ, අභිප්‍රාය නිවෘත්තිය පිණිස; කල්පතෙ, (යම්හෙයකින්) සමර්ථ වන්නේද (එහෙයින්); වීර්‍ය්‍යොත්කර්ෂස්තුතිඃ, වික්‍රමාතිශයාගේ වර්ණනාව; නින්දෛව, දෝෂොක්ති මැ (වන්නියි).

271 සඛි, යෙහෙළිය; අසෞ ජනඃ, මේ ජනතෙම; චපලඃ, දුර්විනීතය; නිර්දයඃ, දයාවක් නැත්තේය; තෙන, ඔහුවිසින්; මෙ, මට; කිම්, කුමක්ද; යෙන, යමක්හුවිසින්; ආගඃප්‍රමාර්ජනායෛව, තමාගේ අපරාධය දුරලිමපිණිස මැ; චාටවඃ, ලාලනප්‍රකාරයෝ; ශික්ෂිතාඃ, අභ්‍යස්තයෝද; (ඔහුවිසින් කිම්දැයි නිගමනය කටයුතු).

272 සඛීජනොද්දිෂ්ටම්, යෙහෙළිජනයන් විසින් උපදෙශ කරනලද; මානම්, මන්; රාගාත්, අනුරාගය හෙතු කොටගෙන; කර්තුම්, කරන්නට; අශක්තයා, නොපොහොසත්වූ කිසි ස්ත්‍රියකවිසින්; දොෂාභාසඃ,

---

* ඉත්‍යෙවමාදි-ක. † යූවෛෂ-ක. ‡ නිරන්තරම්-ක.

273 උද්දිෂ්ටානාමපදාර්ථානාමනුද්දෙශො යථාක්‍රමම්
යථාසඞ්ඛ්‍යමිති ප්‍රොක්තං සඞ්ඛ්‍යානං ක්‍රම ඉත්‍යපි.

274 ධ්‍රැවනෙන චොරිතා තන්වි! ස්මිතෙක්ෂණමුඛද්‍යුතිඃ
ස්නාතුමම්භඃප්‍රවිෂ්ටායාඃ කුමුදොත්පලපඞ්කජෛඃ.

ඉති ක්‍රමඃ.

275 ප්‍රෙයඃ ප්‍රියතරාඛ්‍යානං, රසවද්‍රසපෙශලම්
ඌර්ජස්වි රූඪාහඞ්කාරං, යුක්තොත්කර්ෂඤ්ච තත්ත්‍රයම්.

276 අද්‍ය යා මම ගොවින්ද ජාතා ත්වයි ගෘහාගතෙ
කාලෙනෛෂා භවෙත් ප්‍රීතිස්තවෛවාගමනාත් පුනඃ.

---

ශ්ලෙෂයක් සේ වැටහෙන්නාවූ; චාටුකාරිතා, චාටුකාරිත්‍ව නම්වූ; කොපි ගුණඃ, (නාගර ජනයන්ට උචිත වූ) කිසි ගුණයෙක්; දර්ශිතඃ, දක්වන ලදි-එහෙයින් මේ ලෙශයෙන් ස්තුතියයි දතයුතු.

273 උද්දිෂ්ටානාම්, පළමුකොට උද්දෙශ කරනලද්දාවූ; පදාර්ථානාම්, වස්තූන්ගේ; යථාක්‍රමම්, ක්‍රම නොඉක්ම; අනුද්දෙශඃ, ප්‍රත්‍යාම්නායතෙම; යථාසඞ්ඛ්‍යම්, යථාශඞ්ඛ්‍යයයිද; සඞ්ඛ්‍යානම්, සඞ්ඛ්‍යානයයිද; ක්‍රම ඉත්‍යපි, ක්‍රමයයිද; ප්‍රොක්තම්, කියනලදි-මෙහි ප්‍රොක්තශබ්දයා ඒ ඒ ශබ්දයට උචිත කොට ලිඞ්ගවිපරිණාමයෙන් අපි කියයුතු.

274 තන්වි, කෘශ වූ ගාත්‍ර ඇත්තිය; ස්නාතුම්, සනහන්නට; අම්භඃ ප්‍රවිෂ්ටායාඃ, දියට වන්නාවූ; තෙ, තිගේ; ස්මිත, සිනාය; ඊක්ෂණ, නෙත්‍රය; මුඛ, වදනය යන මොවුන්ගේ; ද්‍යුතිඃ, ශොභාතොමෝ; කුමුද, කුමුදය; උත්පල, උත්පලය; පඞ්කජෛඃ, පද්මය යන මොවුන්විසින්; චොරිතා ධ්‍රැවම්, පැහැර ගන්නාලද්දැයි සිතම්-මෙහි උද්දිෂ්ට කුමුදාදීන්ට ක්‍රමයෙන් අනුද්දෙශ කළහෙයින් ක්‍රමයයි දතයුතු.

275 ප්‍රියතරාඛ්‍යානම්, අත්‍යර්ථයෙන් ප්‍රිය වූ කිසි අර්ථයක්හුගේ කීම; ප්‍රෙයඃ, ප්‍රෙයස් නම් වන්නේය; රසපෙශලම්, (ශෘඞ්ගාරාදි) රසයෙන් මනොඥ වූයේ; රසවත්, රසවත් නම් වන්නේය; රූඪාහඞ්කාරම්, දිපත වූ ශෞර්‍ය්‍ය ඇත්තේ; ඌර්ජස්වි, ඌර්ජස්වි නම් වන්නේය; තත් ත්‍රයන්තු, ඒ ප්‍රෙයස් ආදි වූ අලඞ්කාර තුනද; යුක්තොත්කර්ෂම්, සඞ්ගත වූ අධිමාත්‍ර බව ඇත්තේයි.

276 ගොවින්ද, ගරුඩධ්වජය; ත්වයි, තා; ගෘහාගතෙ, (අපගේ) ගෙට එළඹිකල්හී; අද්‍ය, අද; යා, යම් ප්‍රීතියක්; මම, මට; ජාතා, වූද; එෂා ප්‍රීතිඃ, මේ ප්‍රීතිතොමෝ; කාලෙන, (මෙබඳුවූ) ශුභකාලයෙන්; පුනඃ, නැවත; තවෛව, තාගේ මැ; ආගමනාත්, (ගෙට) එළඹීමෙන්; භවෙත්, වන්නීයි.

277 යුක්තමේවාහ * විදුරෝ නාන්‍යතස්තාදෘශී ධෘතිඃ
භක්තිමාත්‍රසමාරාධ්‍යස්සුප්‍රීතශ්ච තතෝ හරිඃ.

278 සෝමස්සූර්‍ය්‍යෝ මරුද්භූමිර්ව්‍යෝම හෝතානලෝ ජලම්
ඉති රූපාණ්‍යතික්‍රම්‍ය ත්වාං ද්‍රෂ්ටුං දෙව කෙ වයම්.

279 ඉති සාක්ෂාත්කෘතෙ දෙවෙ රාඥෙ යද්‍රාජවර්මණඃ †.
ප්‍රීතිප්‍රකාශනං තච්ච ප්‍රෙය ඉත්‍යනුගම්‍යතාම්. ‡

280 මෘතෙති ප්‍රෙත්‍ය සඞ්ගන්තුං යයා මෙ මරණං මතම්
සෛවාවන්තී + මයා ලබ්ධා කථමත්‍රෛව ජන්මනි.

281 ප්‍රාක් ප්‍රීතිර්දර්ශිතා, සෙයං රතිඃ ශෘඞ්ගාරතාං ගතා
රූපබාහුල්‍යයොගෙන තදිදං රසවද්වචඃ.

---

277 අන්‍යතඃ, (ගොවින්දයාගේ ගමනයෙන් පිටත්) අනික් තැනකින්; තාදෘශී ධෘත්නී, එබඳුවූ ප්‍රීතියක් (සම්භෙගයකින්) නැද්ද (එහෙයින්); විදුරඃ, විදුරනම් රජතෙම; යුක්තමෙවාහ, යුත්තක් ම කී; භක්තිමාත්‍ර සමාරාධ්‍යඃ, ආදරමාත්‍රයෙකින් පිදියහැකිවූ; හරිශ්ච, විෂ්ණුද; තතඃ, ඒ භක්තියෙන්; සුප්‍රීතඃ, අත්‍යර්ථයෙන් සතුටු වී.

278 දෙව, මහෙශ්වරය!; සොමඃ, චන්ද්‍රය; සූර්‍ය්‍යඃ, සූර්‍ය්‍යය; මරුත්, පවනය; භූමිඃ, භූමිය; ව්‍යොම, ආකාශය; හොතා, යජමානය; අනල, අග්නිය; ජලම්, දියයි; ඉති රූපාණි, මෙබඳුවූ අෂ්ටරූපයන්; අතික්‍රම්‍ය, ඉක්ම; ත්වාම්, තා; ද්‍රෂ්ටුම්, දක්නට; වයං කෙ, අපි කවුරුමෝද?

279 දෙවෙ, ශඞ්කරයා; සාක්ෂාත්කෘතෙ, ප්‍රත්‍යක්ෂ වූකල්හි; රාජවර්මණඃ රාඥඃ, රාජවර්ම නම් රජහුගේ: ඉති, මේ අනන්තරොක්ත ක්‍රමයෙන්; යත් ප්‍රීතිප්‍රකාශනම්, යම් සන්තොෂප්‍රකාශනයෙක් ඇද්ද; තච්ච, එද; ප්‍රෙය ඉති, ප්‍රෙයස්සයි; අනුගම්‍යතාම්, දන්නාලැබේවා.

280 මෘතා, (මාගේ ප්‍රෙයසීතොමෝ) මළායි; ඉති, මේ හෙතුකොට ගෙන; ප්‍රෙත්‍ය, කිසි ලොකාන්තරයෙක්හි; යයා සඞ්ගන්තුම්, යමක හා එක්වන්නට; මෙ, මට; මරණම්, මරණය; මතම්, ඉෂ්ට වීද;. සෛවා වන්ති, එබ අවන්ති රාජපුත්‍රීතොමෝ; මයා, මාවිසින්; අත්‍රෛව ජන්මනි, මේ ජන්මයෙහි මැ; කථං ලබ්ධා, කෙසේ ලබනලද්ද?

එක් කලෙක්හි උදයන නම් වත්සරාජයා වාසවදත්තා නම් අවන්ති රාජපුත්‍රිය කෙරෙහි ඇලිගෙන රාජ්‍යධුරයෙහි විමුඛ වූහෙයින් අමාත්‍ය යෝ ඒ වාසවදත්තාවන් සඟවාපියා මළහයි ඔහට කීහ. හෙද ඒ අසා මරණෙහි ව්‍යවසාය කෙළේ. එ දුක අමාත්‍යයෝ නැවත ඇය ඔහට පාවා දුන්හ යනු කථායි.

281 ප්‍රාක්, පූර්වොක්ත වූ ප්‍රෙයස්‍යලඞ්කාරයෙහි; ප්‍රීතිර්දර්ශිතා, (පුරුෂවිෂය වූ) ප්‍රීතිතොමෝ දක්වනලද; සෙයම්, ඒ මේ අනන්ත

* ඉත්‍යාහ යුක්තං–ක. † යද්‍රාතවර්මණඃ–සිං. ‡ ඉත්‍යවගම්‍යතාම්–ක.
+ සෛෂා තන්වී–ක.

282 නිගෘහ්‍ය කෙශෙෂ්වාකෘෂ්ටා කෘෂ්ණා යෙනාග්‍රතො මම
සො'යං දුශ්ශාසනඃ පාපො ලබ්ධඃ කිං ජීවති ක්‍ෂණම්.

283 ඉත්‍යාරුහ්‍ය පරාං කොටිං ක්‍රොධො රෞද්‍රාත්මතාං ගතඃ
භීමස්‍ය පශ්‍යතශ්ශත්‍රුමිත්‍යෙතද්‍රසවද්වචඃ.

284 අජිත්වා සාර්ණවාමුර්වීමනිෂ්ට්වා විවිධෛර්මඛෛඃ
අදත්වා චාර්ථමර්ථිභ්‍යො භවෙයං පාර්ථිවඃ කථම්.

285 ඉත්‍යුත්සාහඃ ප්‍රකෘෂ්ටාත්මා තිෂ්ඨන් වීරරසාත්මතා
රසවත්ත්වං ගිරාමාසාං සමර්ථයිතුමීශ්වරඃ.

---

රොක්ත වී; රූපබාහුල්‍යයොගෙන, තමාගේ ස්වභාවවෘද්ධියොගයෙන්; ශෘඞ්ගාරතාං ගතා, ශෘඞ්ගාරරසබවට පැමිණියා වූ; රතිඃ, ස්ත්‍රීවිෂය වූ රති නම් භාවවිශෙෂයැ; තත්, එහෙයින්; ඉදං වචඃ, මේ කාව්‍යයතෙම; රසවත්, (ශෘඞ්ගාරරසයොගය හෙතු කොටගෙන) රසවත් නම් වන්නේයි.

282 යෙන, යමක්හුවිසින්; කෘෂ්ණා, ද්‍රෞපදීතොමෝ; මමාග්‍රතඃ, මාගේ අභිමුඛයෙහි ලා; කෙශෙෂු නිගෘහ්‍ය, කෙශයෙහි ගෙන; ආකෘෂ්ටා, අදනාලද්ද; පාපඃ, දුරාත්මවූ; සො'යං දුශ්ශාසනඃ, ඒ මේ දුශ්ශාසන තෙම; ලබ්ධඃ, * (හිනිඹු මාවිසින්) පැමිණෙනලද; ක්‍ෂණම්, ඇසිල්ල කින්; ජීවති කිම්, ජීවත් වේද ?

283 ශත්‍රුම්; (තමාගේ) ශත්‍රුවූ (දුශ්ශාසනයා); පශ්‍යතඃ, බලන්නාවූ; භීමස්‍ය, භීමයාගේ; ක්‍රොධඃ, ක්‍රොධයතෙම; ඉති, මේ අනන්තරොක්තප්‍රකාරයෙන්; පරාං කොටිම්, උත්කෘෂ්ට වූ නිෂ්ඨාවට; ආරුහ්‍ය, නැඟී; රෞද්‍රාත්මතාං ගතඃ, රෞද්‍රරසබවට ගියේ; ඉති, මෙබඳුවූ; එතද්වචඃ, මේ කාව්‍යයතෙම; රසවත්, (රෞද්‍රරසයාගේ යොගය හෙතු කොටගෙන) රසවත් නම් වන්නේයි.

284 සාර්ණවාම්, චතුස්සාගරසහිත වූ; උර්වීම්, පෘථිවිය; අජිත්වා, නොදිනා; විවිධෛඃ, නානාප්‍රකාර වූ; මඛෛඃ, යාගයෙන්; අනිෂ්ට්වා, යාග නොකොට; අර්ථිභ්‍යඃ, යාචකයන්ට; අර්ථම්, වස්තුව; අදත්වා ච, නොදීද; කථම්පාර්ථිවො භවෙයම්, කෙසේ රජ වෙම්ද ?

285 ඉති, මේ අනන්තරොක්ත ක්‍රමයෙන්; ප්‍රකෘෂ්ටාත්මා, උත්කෘෂ්ට වූ ස්වභාව ඇති; උත්සාහඃ, උත්සාහ නම් භාවයතෙම; වීරරසාත්මතා, වීරරසස්වරූපයෙන්; තිෂ්ඨන්, සිටිනේ; තාසාං ගිරාම්, ඒ කාව්‍යරූප වූ වචනුන්ගේ; රසවත්ත්වම්, රසවත්බව; සමර්ථයිතුම්, කරන්නට; ඊශ්වරඃ, සමර්ථයි.

286 යස්‍යාඃ කුසුමශය්‍යාපි කොමලාඞ්ග්‍යා රුජාකරී.
සාධිශෙතෙ කථං දෙවි * හුතාසනවතීං චිතාම්.

287 ඉති කාරුණ්‍යමුද්‍රික්තමලඞ්කාරතයා සමෘතම්
තථාපරෙ'පි බීභත්සහාස්‍යාද්භුතභයානකාඃ.

288 පාශම්පායං තවාරීණං ශොණිතං පාණිසම්පුටෛඃ
කෞණපාඃසහ නෘත්‍යන්ති කබන්ධෛරන්ත්‍රභූෂණාඃ.

289 ඉදමම්ලානමාලායා † ලග්නං ස්තනතටෙ තව
ඡාද්‍යතාමුත්තරීයෙණ නවං නඛපදං සඛි !.

---

286 කොමලාඞ්ග්‍යාඃ, සුකුමාරශරීර ඇති; යස්‍යාඃ, යමකට; කුසුම ශය්‍යාපි, පුෂ්පමය සහනද; රුජාකරී, පීඩාකරද; සා දෙවි, ඒ දෙවී තොමෝ; හුතාශනවතිම්; ගිනි ඇත්තාවූ; චිතාම්, දරසෑයෙහි; කථමධි ශෙතෙ, කෙසේ හෝනිද?

287 ඉති, මෙසේ; උද්‍රික්තම්, අතිව්‍යක්ත වූ; කාරුණ්‍යම්, කරුණ රසයතෙම; අලඞ්කාරතයා, අලඞ්කාරබැවින්; සමෘතම්, දන්නාලදී; බීභත්ස, ජුගුප්සාරූප වූ බීභත්සය; හාස්‍ය, හාසස්වභාව වූ හාස්‍යය; අද්භූත, විස්මයාත්මක වූ අද්භූතය; භයානකාඃ, භයලක්ෂණ වූ භයානකය යන; අපරෙපි, සෙසු රසයෝද; තථා, ශෘඞ්ගාරාදී රස මෙන් දැක්විය යුත්තාහුයි.

288 තව, තාගේ; අරීණම්, සතුරන්ගේ; ශොණිතම්, රුධිරය; පාණිසම්පුටෛඃ, දෙඅතින්; පායම්පායම්, බිබී; අන්ත්‍රභූෂණාඃ, බඩ වැල් මැ ආභරණ කොට ඇති; කෞණපාඃ, රාක්ෂසයෝ; කබන්ධෛඃසහ, ඉස්නැති ඊප්‍රශරීර හා එක්ව; නෘත්‍යන්ති, නටත්.

මෙහි ජුගුප්සා නම් භාවයතෙම එබඳු විභාවයෙන් උපදනලද්දේ තද්‍රූප අනුභාවයෙන්ද අභියුක්ත වූයේ විකෘතස්වභාව වූ බීභත්සරසස්වය අනුභව කරන්නේ අලඞ්කාරබැවින් කැමැතිවනලද්දැයි දතයුතු.

289 සඛි, යෙහෙළිය; අම්ලානමාලායාඃ, නොමිරිකුණාවූ මල්දම් ඇති; තව, තිගේ; ස්තනතටෙ, පයොධරතටයෙහි; ලග්නම්, පිහිටියාවූ; නවම්, අලුත්වූ; ඉදං නඛපදම්, මේ නඛක්ෂතය; උත්තරීයෙණ, උතුරු සළුයෙන්; ඡාද්‍යතාම්, වසනුලැබේවා.

මෙහි නඛක්ෂතදශීනය මැ විභාව කොට ඇති ගන්නාලද හාස නම් භාවයතෙම සංසිද්ධස්වරූප වැ හාස්‍යරසබවට ගියේ කාව්‍යශොභාකරයයි දතයුතු.

---

* තන්වී–ක. † මානායා–ක.

290 අංශුකානි ප්‍රවාලානි පුෂ්පං හාරාදිභූෂණම්
ශාඛාශ්ච මන්දිරාණ්‍යෙෂාං චිත්‍රං නන්දනශාඛිනාම්.

291 ඉදං මඝොනඃ කුලිශං ධාරාසන්නිහිතානලම්
ස්මරණං යස්‍ය දෛත්‍යස්ත්‍රීගර්භපාතාය කල්පතෙ.

292 වාච්‍යස්‍යා * ග්‍රාම්‍යතායොනිර්මාධුර්‍ය්‍යෙ දර්ශිතො රසඃ
ඉහ ත්වෂ්ටරසායත්තා රසවත්තා ස්මෘතා ගිරාම්.

රසවච්චක්‍රම්.

---

293 අපකර්තාහමස්මීති හෘදි තෙ මා ස්ම භූද්භයම්
විමුඛෙෂු න මෙ ඛඩ්ගඃ ප්‍රහර්තුං ජාතු වාඤ්ඡති.

---

290 එෂාං නන්දනශාඛිනාම්, මේ නන්දනොද්‍යානගතවෘක්ෂයන්ගේ; ප්‍රවාලානි, පල්ලවයෝ; අංශුකානි, වස්ත්‍රයහ; පුෂ්පම්, මල්; හාරාදි භූෂණම්, මුක්තාහාරකෙයූරාදි ආභරණය; ශාඛාශ්ච, ශාඛාවෝද; මන්දිරාණි, ගෘහයහ; චිත්‍රම්, ආශ්චර්‍ය්‍යයි.

මෙහි විස්මය නම් ස්ථායිභාවයතෙම පරිණත වැ අද්භූතරසභාවයට පැමිණියේ කාව්‍යශොභාකරයයි දතයුතු.

291 යස්‍ය, යම් වජ්‍රයක්හුගේ; ස්මරණම්, සිහිකිරීම; දෛත්‍යස්ත්‍රී, අසුරස්ත්‍රීන්ගේ; ගර්භපාතාය, ගර්භවිනාශයට; කල්පතෙ, සමර්ථ වන්නේද; ධාරාසන්නිහිතානලම්, ධාරායෙහි පිහිටි වහ්නි ඇති; ඉදම්, මේ; මඝොනඃ, ශක්‍රයාගේ; කුලිශම්, වජ්‍රයයි.

මෙහි භය නම් ස්ථායිභාවයතෙම මිහිකිරීමෙන් භයානක රසභාවයට පැමිණ කාව්‍යභූෂණභාවයට සමර්ථවියයි දතයුතු.

292 වාච්‍යස්‍ය, අභිධෙය වූ වස්තුහුගේ; අග්‍රාම්‍යතායොනිඃ, අග්‍රාම්‍යත්වය මැ උත්පත්ති කොට ඇති; රසඃ, රසයතෙම; මාධුර්‍ය්‍යෙ, මාධුර්‍ය්‍යයෙහි; දර්ශිතඃ, (පළමුකොට "කාමං සර්වොප්‍යලඞ්කාරඃ" යන මේ ආදියෙන්) දක්වනලද; ඉහ තු, මෙහි වනාහි; ගිරාම්, කාව්‍යයන් සම්බන්ධ වූ; අෂ්ටරසායත්තා, යථොක්ත වූ අෂ්ටරසයෙහි ප්‍රතිබද්ධ වූ; රසවත්තා, රසයොගිතාතොමෝ; ස්මෘතා, දත්නාලදු.

293 අහම්, මම; අපකර්තාස්මීති, අපකාර කෙළෙමි වේදැයි; තෙ හෘදි, තාගේ සිත්හි; භයම්, භයෙක්; මා ස්ම භූත්, නහම් වේවා; මෙ ඛඩ්ගඃ, මාගේ ඛඩ්ගයතෙම; විමුඛෙෂු, (යුද්ධයෙහි ආස්ථා නැති වැ) පරාඞ්මුඛයන්කෙරෙහි; ප්‍රහර්තුම්, පහරනට; ජාතු, කිසිකලෙක්හි; න වාඤ්ඡති, කැමැති නොවන්නේයි.

---

* වාක්‍යස්‍යා-ක.

294 ඉති මුක්තඃ * පරෝ යුද්ධෙ නිරුද්ධො දර්පශාලිනා
පුංසා කෙනාපි තජ්ඥෙයමූර්ජස්වීත්‍යෙවමාදිකම්.

ඌර්ජස්වි.

---

295 අර්ථමිෂ්ටමනාඛ්‍යාය සාක්ෂාත්තස්‍යෛව සිද්ධයෙ
යත් ප්‍රකාරාන්තරාඛ්‍යානං පර්‍ය්‍යායොක්තං තදිෂ්‍යතෙ.

296 දශත්‍යසෞ පරභෘතස්සහකාරස්‍ය මඤ්ජරීම්
තමහං වාරයිෂ්‍යාමි යුවාභ්‍යාං ස්වෛරමාස්‍යතාම්.

297 සඞ්ගමය්‍ය සඛීං යූනා සඞ්කෙතෙ තද්‍රතොත්සවම්
නිර්වර්තයිතුමිච්ඡන්ත්‍යා කයාප්‍යපසෘතං තථා. †

ඉති පර්‍ය්‍යායොක්තම්.

---

294 ඉති, මේ අනන්තරෝක්ත ක්‍රමයෙන්; දර්පශාලිනා, ශෞර්‍ය්‍යයෙන් යුක්ත වූ; කෙනාපි පුංසා, කිසි පුරුෂයකුවිසින්; යුද්ධෙ, යුද්ධයෙහි ලා; නිරුද්ධඃ, සැඟවුණාවූ; පරඃ, සතුරෙක්; මුක්තඃ, (ප්‍රහාරදානය නොකොට) හරනාලද; තත්, එහෙයින්; එවමාදිකම්, මේ ආදි වූ කාව්‍යය; ඌර්ජස්වි ඉති, ඌර්ජස්වි නම් වන්නේයයි; ඥෙයම්, දතයුත්තේයි.

295 ඉෂ්ටම් අර්ථම්, අභිමතාර්ථය; සාක්ෂාත්, ඉදිවුරා හෙවත් වාචක ව්‍යාපාරයෙන්; අනාඛ්‍යාය, නොකියා; තස්‍යෛව සිද්ධයෙ, ඒ ඉෂ්ටාර්ථයා ගේ මැ සිද්ධිය පිණිස; යත් ප්‍රකාරාන්තරාඛ්‍යානම්, යම් අන්‍යප්‍රකාරයක් හුඟග් කීමෙක් ඇද්ද; තත්, ඒ; පර්‍ය්‍යායොක්තමිෂ්‍යතෙ, පර්‍ය්‍යායොක්ත යයි කැමැතිවනුලැබේ.

296 අසෞ පරභෘතඃ, මේ කොකිලතෙම; සහකාරස්‍ය මඤ්ජරීම්, චූතපුෂ්පස්තබකය; දශති, කන්නේය; අහම්, මම; තම්, ඔහු; වාරයිෂ්‍යාමි, වලකම්; යුවාභ්‍යාම්, තොප දෙදෙනාවිසින්; ස්වෛරම්, සිත් සේ; ආස්‍යතාම්, හිඳිනාලැබේවා. ‡

297 සඛිම්, යෙහෙළිය; යූනා, ළදරුවක්හු හා; සඞ්කෙතෙ, සඞ්කෙත කරනලද කිසි ස්ථානයෙක්හි; සඞ්ගමය්‍ය, එක්කොට; තද්‍රතොත්සවම්, ඒ දෙදෙනාගේ සුරතොත්සවය; නිර්වර්තයිතුම්, කරන්නට; ඉච්ඡන්ත්‍යා, කැමැතිවූ; කයාපි, කිසි සඛියකවිසින්; තථා, එසේ (පරභෘතනිවාරණ ව්‍යපදෙශයෙන්): අපසෘතම්, පහවීමයි.

---

* එවමුක්ත්වා-ක. † තතඃ-ක.

‡ "භිඳිම වේවා" යි කිව මනා නැති.

298 කිඤ්චිදාරභමාණස්‍ය කාර්‍ය්‍යං දෛවබලාත් * පුනඃ
තත්සාධනසමාපත්තිර්‍යා තදාහුස්සමාහිතම්.

299 මානමස්‍යා නිරාකර්තුම්පාදයොර්මෙ නමස්‍යතඃ †
උපකාරාය දිෂ්ට්‍යෛතදුදීර්ණං ඝනගර්ජ්ජිතම්.

සමාහිතම්.

---

300 ආශයස්‍ය විභූතෙර්‍වා යන්මහත්ත්වමනුත්තරම් ‡
උදාත්තං නාම තම්ප්‍රාහුරලඞ්කාරං මනීෂිණඃ.

301 ගුරොශ්ශාසනමත්‍යෙතුං න ශශාක ස රාඝවඃ
යො රාවණශිරශ්ඡෙදකාර්‍ය්‍යභාරෙ'ප්‍යවික්ලවඃ.

---

298 කිඤ්චිත් කාර්‍ය්‍යම්, කිසි (ප්‍රසාදාදි) කාර්‍ය්‍යයක්; ආරභමාණස්‍ය, සාධන්නට පටන්ගන්නාවූ පුරුෂයාගේ; දෛවබලාත්, දෛවශක්තියෙන්; යා, යම්; තත්සාධනසමාපත්තිඃ, ඒ සාධනුකැමැති කාර්‍ය්‍යයට සාධනප්‍රාප්තියෙක් ඇද්ද; තත්, ඒ; සමාහිතම් ආහුඃ, සමාහිතයයි කියත්.

299 අස්‍යාඃ, මැයගේ; මානම්, මන්සිත; නිරාකර්තුම්, දුරුකරන පිණිස; පාදයොඃ, පාදවයෙහි; නමස්‍යතඃ, වඳනාවූ; මෙ, මට; උපකාරාය, අනුග්‍රහ පිණිස; එතත් ඝනගර්ජ්ජිතම්, මේ මෙඝධ්වනිය; උදීර්ණම්, පහළ වී; දිෂ්ට්‍යා, යෙහෙකි.

මෙහි මානනිරාකරණරූප වූ කාර්‍ය්‍යතෙම ප්‍රාරබ්ධයැ එහි දෛවබලයෙන් අන්‍යසාධන වූ ඝනගර්ජ්ජිතය ප්‍රාප්තයි.

300 ආශයස්‍ය, අභිප්‍රායයාගේ හෝ; විභූතෙර්‍වා, සම්පත්තියගේ හෝ; අනුත්තරම්, අධිකයක් නැත්තාවූ; යන්මහත්ත්වම්, යම් මහත්බවෙක් ඇද්ද; තම් අලඞ්කාරම්, ඒ අලඞ්කාරය; මනීෂිණඃ, කවීහු; උදාත්තං නාම, උදාත්ත නමැයි; ප්‍රාහුඃ, කියත්.

301 යඃ, යමෙක්තෙම; රාවණ, රාවණයාගේ; ශිරශ්ඡෙද, හිස් කැපීම මැ; කාර්‍ය්‍යභාරෙපි, කටයුතු බරෙහි පොවා; අවික්ලවඃ, පොණහා සත්විද; ස රාඝවඃ, ඒ රාමතෙම; ගුරොඃ, දශරථයාගේ; ශාසනම්, ("රාජ්‍යය භරතයහට දින්මි හෝ වලට යා" යි යන මේ) ආඥාව; අත්‍යෙතුම්, ඉක්මවන්නට; න ශශාක, නොපොහොසත් වී.

මෙහි රාමයාගේ විනයාතිශය රාජ්‍යලොභාභාවය යන මෙබඳු ආශයමාහාත්ම්‍යයෙක් දක්නාලැබේ.

---

* දෛවවශාත්-ක. † පතිෂ්‍යතඃ-ක. ‡ මනුත්තමම්-ක.

302 රත්නභිත්තිෂු සඞ්ක්‍රාන්ත * ප්‍රතිබිම්බශතෛර්වෘතඃ
ඥාතො ලඞ්කෙශ්වරඃ කෘච්ඡ්‍රාදාඤ්ජනෙයෙන තත්ත්වතඃ.

303 පූර්වත්‍රාශයමාහාත්ම්‍යමත්‍රාභ්‍යුදයගෞරවම්
සුව්‍යඤ්ජිතමිති ව්‍යක්ත † මුදාත්තද්වයමප්‍යදඃ.

උදාත්තම්.

---

304 අපහ්නුතිරපහ්නුත්‍ය කිඤ්චිදන්‍යාර්ථදර්ශනම්
න පඤ්චෙෂුඃ ස්මරස්තස්‍ය සහස්‍රම්පත්‍රිණාමිති.

305 චන්දනං චන්ද්‍රිකා මන්දො ගන්ධවාහශ්ච දක්ෂිණඃ
සෙයමග්නිමයී සෘෂ්ටිශ්ශීතා කිල ‡ පරාන් ප්‍රති.

---

302 රත්නභිත්තිෂු, රුවන්භිත්තිහි; සඞ්ක්‍රාන්ත, පහලවූ; ප්‍රතිබිම්බ ශතෛඃ, පිළිබිඹුසමූහයෙන්; වෘතඃ, පිරිවරනලද්දවූ; ලඞ්කෙශ්වරඃ, රාවණතෙම; ආඤ්ජනෙයෙන, හනුමත්හුවිසින්; කෘච්ඡ්‍රාත්, දුකින්; තත්ත්වතඃ, වූ පරිද්දෙන්; ඥාතඃ, දන්නාලදී.

මෙහි ගෘහභිත්තීහු රත්නමයහයි යන්නෙන් විභූතිමාහාත්ම්‍යය දක්වනලදී.

303 පූර්වත්‍ර, ("ගුරොශ්ශාසනම්" යන මේ) ආදියෙහි; ආශය මාහාත්ම්‍යම්, අභිප්‍රායයාගේ මාහාත්ම්‍යය (කියනලද); අත්‍ර, ("රත්නභිත්තිෂු" යන) මේ ආදියෙහි; අභ්‍යුදයගෞරවම්, විභූතිමාහාත්ම්‍යය (කියනලද); ඉති, මෙසෙයින්; අදඃ උදාත්තද්වයමපි, මේ උදාත්තද්වයද; ව්‍යක්තම්, ස්ඵුට කොට; සුව්‍යඤ්ජිතම්, විභාග කරනලදී.

304 කිඤ්චිත්, කිසි වස්තුවක්; අපහ්නුත්‍ය, සඟවා; අන්‍යාර්ථදර්ශනම්, (ධර්මාන්තරාරූප වූ) අනික් වස්තුවක්හුගේ දැක්වීම; අපහ්නුතිඃ, අපහ්නුති නම් වන්නේයි; (හේ මෙසේයි.) ස්මරඃ, අනඞ්ගයෙම; පඤ්චෙෂුඃ න, පස් ශරයක් ඇත්තේ නොවෙයි; තස්‍ය, ඔහුගේ; පත්‍රිණාම්, ශරයන්ගේ; සහස්‍රම්යි, දහසකැයි යනුයි.

මෙහි ශරයන්ගේ පඤ්චත්වලක්ෂණ වූ ධර්මය දුරුකොට සහස්‍ර සංඛ්‍යාත්වලක්ෂණ වූ ධර්මය දක්වනලදහෙයින් මෝ ධර්මාපහ්නුතියි නම්වේයි දතයුතු.

305 චන්දනම්, සඳුන; චන්ද්‍රිකා; සඳරැස; මන්දඃ, මෘදු වූ; දක්ෂිණඃ ගන්ධවාහශ්ච, දක්ෂිණ පවනද යන; සෙයම්, ඒ මේ; අග්නිමයී, වහ්නිමය වූ; සෘෂ්ටිඃ, (බ්‍රහ්මයාගේ) සෘෂ්ටිතොමෝ; පරාන් ප්‍රති, සෙස්සවුන් කෙරෙහි; ශීතා කිල, ශීත වූ—මෙහි කිලශබ්ද ශ්‍රවණගම්‍යභාව හඟවා.

---

* සඞ්ක්‍රාන්තෛඃ-ක. † ප්‍රොක්ත-ක. ‡ සෘෂ්ටිර්මයි ශීතා-ක.

306 ශෛශිර්‍ය්‍යමභ්‍යුපෙත්‍යෛව පරෙෂ්වාත්මනි කාමිනා
ඖෂ්ණ්‍යප්‍රදර්ශනාත්තෙෂාං * සෛෂා † විෂයනිහ්නුතිඃ.

307 අමෘතස්‍යන්දිකිරණශ්චන්ද්‍රමා නාම නො ‡ මතඃ
අන්‍ය එවායමර්ථාත්මා විෂනිෂ්‍යන්දිදීධිතිඃ.

308 ඉති චන්ද්‍රත්වමෙවෙන්දොර්නිවර්ත්‍යාර්ථාන්තරාත්මතා
උක්තා ස්මරාතුරෙණෛෂා ස්වරූපාපහ්නුතිර්මතා.

309 උපමාපහ්නුතිඃ පූර්වමුපමාස්වෙව දර්ශිතා
ඉත්‍යපහ්නුතිභෙදානාං ලක්‍ෂ්‍යො ලක්‍ෂ්‍යෙෂු විස්තරඃ.

අපහ්නුතිචක්‍රම්.

---

306 කාමිනා, කාමිහු විසින්; පරෙෂු, අනුන් විෂයෙහි; ශෛශිර්‍ය්‍යම්, ශීතත්වය; අභ්‍යුපෙත්‍යෛව, ස්වීකාර කොට මැ; ආත්මනි, තමා විෂයෙහි; තෙෂාම්, ඒ චන්දනාදීන්ගේ; ඖෂ්ණ්‍යප්‍රදර්ශනාත්, උෂ්ණත්වයාගේ දක්වීම හෙතු කොටගෙන; සෛෂා, ඒ මේ අනන්තරොක්තප්‍රකාරයෙන් වූවා; විෂයනිහ්නුතිඃ, විෂයාපහ්නුති නම් වන්නීයි- වස්තුස්වරූපයාගේ අපහ්නවය හැමතැන්හි නොකොට කිසි විෂයෙක්හි කළහෙයින් මේ විෂයාපහ්නව නම් වන්නේය සීසේයි.

307 විෂනිෂ්‍යන්දි, විෂ වහන්නාවූ; දීධිතිඃ, මරීචි ඇති; අන්‍ය එව අය මර්ථාත්මා, අනික්මැ මේ පදාර්ථයෙක්; අමෘතස්‍යන්දි, අමාවහන; කිරණඃ, රශ්මි ඇති; චන්ද්‍රමා නාම, චන්ද්‍රමස් නම්; නඃ, අපට, මතඃ, ප්‍රසිද්ධයි.

308 ඉති, මෙසේ; ඉන්දොඃ, චන්ද්‍රයාකෙරෙහි; චන්ද්‍රත්වම්, (අමෘතමයත්ව ස්වරූප වූ) චන්ද්‍රත්වය; නිවර්ත්‍යෛව, වලකා මැ; අර්ථාන්තරාත්මතා, විෂ රූප වූ අන්‍යවස්තුස්වරූපභාවයතෙම; ස්මරාතුරෙණ, කාමාතුර වූ විරහියක්හු විසින්; උක්තා, කියනලද නුයි; එෂා, මේතොමෝ; ස්වරූපාපහ්නුතිඃ, ස්වරූපාපහ්නුයි නම් වන්නියයි; මතා, දන්නාලදු.

309 උපමාපහ්නුතිඃ, ස්වරූප උපමාපහ්නුතිතොමෝ; පූර්වම්, පළමු කොට; උපමාස්වෙව, උපමායෙහි මැ; දර්ශිතා, ("න ජාතු ශක්තිරින්දොස්තෙ" යන මේ ආදියෙන්) දක්වනලද; ඉති, මෙසේ (උක්තමාර්ගානුසාරයෙන්); අපහ්නුතිභෙදනාම්, අපහ්නුතිප්‍රකාරයන්ගේ; විස්තරඃ, ප්‍රපඤ්චය තෙම; ලක්‍ෂ්‍යෙෂු, (සංගීබද්ධාදි) ප්‍රයොගයෙහි ලා; ලක්‍ෂ්‍යඃ, දක්කනුත් තේයි.

---

* ප්‍රකාශනාදානස්‍ය—ක. † සෙයං—ඛ.
‡ නාමතො—ඛ.

310 ශ්ලිෂ්ටමිෂ්ටමනෙකාර්ථමෙකරූපාන්විතං වචඃ
තදභින්නපදං භින්නපදප්‍රායමිති ද්විධා.

311 අසාවුදයමාරූඪඃ කාන්තිමාන් රක්තමණ්ඩලඃ
රාජා හරති ලොකස්‍ය හෘදයං මෘදුභිඃ කරෛඃ.

312 දොෂාකරෙණ සම්බධ්නන්නක්ෂත්‍රපථවර්තිනා
රාඥා ප්‍රදොෂො මාමිත්ථමප්‍රියං කිං න බාධතෙ.

313 උපමාරූපකාක්ෂෙපව්‍යතිරෙකාදිගොචරාඃ
ප්‍රාගෙව දර්ශිතාශ්ශ්ලෙෂා දෘශ්‍යන්තෙ කෙචනාපරෙ.

---

310 අනෙකාර්ථම්, නොයෙක් අර්ථ ඇත්තාවූ; එකරූපාන්විතම්, එක ශබ්දස්වභාව වූ (සමානරූපයෙන් යුක්තවූ); වචඃ, වචනය; ශ්ලිෂ්ටමිෂ්ටම්, ශ්ලිෂ්ටයයි කැමැතිවනලද; තත්, ඒ ශ්ලිෂ්ටයතෙම; අභින්නපදමභින්නපදප්‍රායමිති, අභින්නපදය භින්නපදප්‍රායයයිද; ද්විධා, ද්විප්‍රකාර වන්නේයි.

311 උදයම්, උදයපර්වතයට ද්‍රෙ හෝ නොහොත් රාජ්‍යරූපයෙන් වූ අභ්‍යුදයට; ආරූඪඃ, නැංගාවූ; කාන්තිමාන්, සෞම්‍ය වූ ද්‍යෙ හෝ නොහොත් අභිරූප වූ; රක්තමණ්ඩලඃ, රත්වූ බිම්බ ඇත්තාවූ නොහොත් අනුරක්ත වූ අමාත්‍යමණ්ඩලයා ඇත්තාවූ; මෘදුභිඃ, මොළොක්වූ; කරෛඃ, රශ්මියෙන් ද්‍රෙ හෝ නොහොත්; මෘදුභිඃ, අනුමෙර වූ හෙවත් මධ්‍ය වූ; කරෛඃ, සුක්වතීන්; අසෞ රාජා, මේ චන්ද්‍ර ද්‍රෙ හෝ නොහොත් රජ තෙම; ලොකස්‍ය, සියලු ලොකයාගේ; හෘදයම්, සිත; හරති, ගන්නේයි.

මෙහි පදභඞ්ගයක් නැතිවැ තුබුතුබූ පරිද්දෙන් මැ චන්ද්‍රනෘපති දෙන්නහට පදයොජනය හෙතු කොට ගෙන මේතෙම අභින්නපදශ්ලෙෂයයි දතයුතු.

312 දෝෂාකරෙණ, රාත්‍රියට ආශ්‍රය වූ ද්‍රෙ හෝ නොහොත් ක්‍රෞර්‍ය්‍යාදි දොෂයට ආකර වූ; නක්ෂත්‍රපථවර්තිනා, ආකාශයෙහි පවත්නාවූ ද්‍රෙ හෝ නොහොත් දුෂ්ටනිග්‍රහශිෂ්ටපරිපාලනලක්ෂණ වූ රාජමාර්ගයෙහි නොපවත්නාවූ; රාඥා, චන්ද්‍රයා හා ද්‍රෙ හෝ නොහොත් රජ හා; සම්බධ්නන්, එක්වන්නාවූ; ප්‍රදොෂඃ, රාත්‍රිමුඛය ද්‍රෙ හෝ නොහොත් ප්‍රකෘෂ්ටදෝෂ ඇති තැනැත්තේ; ඉත්ථම්, මෙසේ; අප්‍රියම්, ප්‍රියා රහිතවූ ද්‍රෙ හෝ නොහොත් අප්‍රියවූ; මාම්, මා; කිං න බාධතෙ, කුමැයි නො පෙළන්නේද?

මෙහි උක්තප්‍රකාරයෙන් "ප්‍රදොෂඃ" යන මේ ආදීන්ගේ භඞ්ගය හෙතු කොට ගෙනද "රාඥා" යන මේ පදයාගේ අභෙදය හෙතු කොට ගෙනද මෙයැන්හි භින්නපදප්‍රාය වූ ශ්ලෙෂයයි දතයුතු.

313 උපමාරූපකාක්ෂෙපව්‍යතිරෙකාදිගොචරාඃ, උපමාය රූපකය ආක්ෂෙපය ව්‍යතිරෙකය යන මේ ආදීන් විෂය කොට ඇති; ශ්ලෙෂාඃ,

314 අස්ත්‍යභින්නක්‍රියඃ කශ්චිදවිරුද්ධක්‍රියො'පරඃ
විරුද්ධකර්මා චාස්ත්‍යන්‍යශ්ශ්ලෙෂො නියමවානපි.

315 නියමාක්ෂෙපරූපොක්තිරවිරොධී විරොධ්‍යපි
තෙෂාං නිදර්ශනෙෂ්වෙව රූපව්‍යක්තිර්භවිෂ්‍යති. *

316 ස්වභාවමධුරාස්ස්නිග්ධාශ් † ශංසන්ත්‍යො රාගමුල්බණම්
දෘශො දූත්‍යශ්ච කර්ෂන්ති කාන්තාභිඃ ප්‍රෙෂිතාඃ ප්‍රියාන්.

317 මධුරා රාගවර්ධින්‍යඃ කොමලාඃ කොකිලාගිරඃ
ආකර්ණ්‍යන්තෙ මදකලාශ්ශ්ලිෂ්‍යන්තෙ චාසිතෙක්ෂණාඃ.

---

ශ්ලෙෂයෝ; ප්‍රාගෙව, පළමුකොට මැ; දර්ශිතාඃ, දක්වනලදහ; අපරෙ කෙචන ශ්ලෙෂාඃ, සෙසු කිසි ශ්ලෙෂකෙනෙක්; දර්ශ්‍යන්තෙ, දක්වනු ලැබෙත්.

314 කශ්චිත් අභින්නක්‍රියඃ, කිසි අභින්නක්‍රියය යන ශ්ලෙෂයෙක්; අස්ති, ඇති; අපරඃ අවිරුද්ධක්‍රියඃ, අනික් අවිරුද්ධක්‍රියය යන ශ්ලෙෂයෙකුදු ඇති; විරුද්ධකර්මා ච, විරුද්ධකර්ම නම්වූද; අන්‍යඃ ශ්ලෙෂො'ස්ති, අනික් ශ්ලෙෂයෙක් ඇති; නියමවානපි, නියමවත්වූද ශ්ලෙෂයෙක් ඇති.

315 නියමාක්ෂෙපරූපොක්තිඃ, නියමාක්ෂෙපරූපොක්ති නම් ශ්ලෙෂයෙකුදු ඇත; අවිරොධී, අවිරොධී නම් ශ්ලෙෂයෙකුදු ඇත; විරොධ්‍යපි, විරොධිනම් ශ්ලෙෂයෙකුදු ඇත; තෙෂාම්, ඒ අභින්නක්‍රියාදි ශ්ලෙෂයන්ගේ; රූපව්‍යක්තිඃ, රූපව්‍යක්තිතොමෝ; නිදර්ශනෙෂ්වෙව, නිදර්ශනාලඞ්කාරයෙහි මැ; භවිෂ්‍යති, පහළ වන්නීයි.

316 ස්වභාවමධුරාඃ, ස්වභාවයෙන් සුභග වූ; ස්නිග්ධාඃ ප්‍රෙමරස භාවිතබැවින් සිනිඳුවූ; උල්බණම්, උදීර්ණ වූ; රාගම්, අනුරාගය; ශංසන්ත්‍යඃ, ප්‍රකාශ කරන්නාවූ; දෘශඃ, දෘෂ්ටිහුද; දූත්‍යශ්ච, දූතීහුද; කාන්තාභිඃ, කාන්තාවන්විසින්; ප්‍රෙෂිතාඃ, මෙහෙයනලද්දාහු; ප්‍රියාන්, වල්ලභයන්; කර්ෂන්ති, අදිත් (වශග කෙරෙත්).

මෙහි කර්ෂණලක්ෂණ වූ දෘෂ්ටීන්ගේද දූතීන්ගේද සම්බන්ධය හෙතු කොටගෙන මේතෙම අභින්නක්‍රියශ්ලෙෂ නම් වන්නේයයි දතයුතු.

317 මධුරාඃ, සුභග වූ; රාගවර්ධින්‍යඃ, රතිභාවය වඩන්නාවූ; කොමලාඃ, ශ්‍රවණසුභග බැවින් ද්‍රව හෝ නොහොත් සුඛස්පර්ශ බැවින් සුකුමාර වූ; මදකලාඃ, කාලකෘත වූ ගර්භයෙන් ද්‍රව හෝ නොහොත් මධුපාන ජනිත මදයෙන් මනොඥ වූ නොහොත් විහ්වල වූ; කොකිලාගිරඃ, කොකිලාවන්ගේ ශබ්දයෝ; ආකර්ණ්‍යන්තෙ, අසනු ලැබෙති; අසිතෙක්ෂණාශ්ච, අසිතලොචනාවෝද; ශ්ලිෂ්‍යන්තෙ, වැලඳනු ලැබෙත්.

මෙහි ආකර්ණනාලිඞ්ගන දෙන්නාගේ සහභාවය හෙතුකොට ගෙන මේතෙම අවිරුද්ධක්‍රියශ්ලෙෂයයි දතයුතු.

---

* මාවිර්භවිෂ්‍යති–ක.  † වක්‍රාඃ ස්වභාවමධුරාඃ–ක.

318 රාගමාදර්ශයත්‍යෙෂ වාරුණීයොගවර්ධිතම්
පරාභවති * ඝර්මාංශුරඞ්ගජස්තු විජෘම්භතෙ.

319 නිස්ත්‍රිංශත්වමසාවෙව ධනුෂ්‍යෙවාස්‍ය වක්‍රතා
ශරෙෂ්වෙව නරෙන්ද්‍රස්‍ය මාර්ගණත්වඤ්ච වර්ත්තතෙ.

320 පද්මානාමෙව දණ්ඩෙෂු කණ්ටකස්ත්වයි රක්ෂති
අථවා දෘශ්‍යතෙ රාගිමිථුනාලිඞ්ගනෙෂ්වපි.

---

318 වාරුණීයොග, වාරුණී නම් දිශාවගේ සඞ්ගමයෙන් දෙ හෝ නොහොත් සුරාවන්ගේ පානලක්ෂණවූ යොගයෙන්: වර්ධිතම්, වඩන ලද; රාගම්, රත්පැහැය දෙ හෝ නොහොත් රතිභාවය; ආදර්ශයන්, දක්වන්නාවූ; එෂ ඝර්මාංශුඃ, මේ සූර්‍ය්‍යතෙම; පරාභවති, අස්තයට යන්නේය; අඞ්ගජස්තු, අනඞ්ග වනාහි; විජෘම්භතෙ, පැලඹෙන්නේයි.

මෙහි සූර්‍ය්‍ය කාම දෙන්නාගේ අස්තඞ්ගමඋදයස්වරූප වූ පරාභව විජෘම්භණයන්ගේ පරස්පරවිරොධය හෙතුකොටගෙන මේතෙම විරුද්ධ කර්මශ්ලෙෂයයි දතයුතු.

319 අස්‍ය නරෙන්ද්‍රස්‍ය, මේ රජහුගේ; නිස්ත්‍රිංශත්වම්, ඛඩ්ගත්වය දෙ හෝ නොහොත් ක්‍රෑරත්වය; අසාවෙව, ඛඩ්ගයෙහි මැ; වර්ත්තතෙ, පවත්නේය; වක්‍රතා, වක්බව දෙ හෝ නොහොත් ශඨත්වය; ධනුෂ්‍යෙව, දුන්නෙහි මැ; වර්ත්තතෙ, පවත්නේය; මාර්ගණත්වඤ්ච, ශරබව දෙ හෝ නොහොත් යාචකබව; ශරෙෂ්වෙව, ශරයෙහි මැ; වර්ත්තතෙ, පවත්නේයි.

මෙහි "ඛඩ්ගයෙහි මය; චාපයෙහි මය; ශරයෙහි මයැ" යි මෙසේ අවධාරණප්‍රයොගය හෙතුකොටගෙන මේතෙම නියමවත් ශ්ලෙෂයයි දතයුතු.

320 ත්වයි රක්ෂති, තා භුවනය රක්ෂා කරනකල්හි; කණ්ටකඃ, කටු දෙ හෝ නොහොත් විපක්ෂතෙම; පද්මානාම්, පද්මයන්ගේ; දණ්ඩෙෂ්වෙව, දණ්ඩයෙහි මැයි; අථවා, එසේ නුමුත්; රාගි, රාගීන් සම්බන්ධි වූ; මිථුන, ස්ත්‍රීපුරුෂදෙන්නාගේ; ආලිඞ්ගනෙෂ්වපි, ආලිඞ්ගනයෙහිදු (පුලකිත ස්වරූප වූ කණ්ටකයතෙම); දෘශ්‍යතෙ, දක්නාලැබේ.

මෙහි "පද්මානාමෙව" යන මේ නියමය "මිථුනාලිඞ්ගනෙෂ්වපි දෘශ්‍යතෙ" යන්නෙන් නිෂිද්ධහෙයින් මේ නියමාක්ෂෙපරූපොපාත්තයයි දතයුතු.

---

* තිරොභවති-පා.

321 මහීභෘද්භූරිකටකස්තේජස්වී නියතෝදයඃ
දක්ෂඃ ප්‍රජාපතිඃ ස්වාමී ශක්තිධරශ්ච සඃ.

322 අච්‍යුතෝ'ප්‍යවෘෂච්ඡේදී රාජා'ප්‍යවිදිතක්ෂයඃ
දේවො'ප්‍යවිබුධො ජඥේ ශඞ්කරෝ'ප්‍යභුජඞ්ගවාන්.

ශ්ලේෂවක්‍රම්.

---

321 සඃ, හෙතෙම; මහීභෘත්, රජ වූයේ දෙ හෝ නොහොත් පර්වත වූයේ; භූරි, මහත්වූ; කටකඃ, සෙනාඞ්ගාවාර දෙ හෝ නොහොත්; (භූරි, විස්තීර්ණවූ; කටකඃ, නිතම්බ ඇත්තේය; තේජස්වී, ප්‍රතාප ඇත්තේ දෙ හෝ නොහොත් රශ්මි ඇත්තේය; නියත, අවසානගත වූ; උදයඃ, සම්පත්ති ඇත්තේ දෙ හෝ නොහොත්;) * නියත, නියතවූ; උදයඃ, උද්ගම ඇත්තේය; දක්ෂඃ, ශූර වූයේ; ප්‍රජාපතිඃ, ලෝවැස්සන්ට අධිපති වූයේ දෙ හෝ නොහොත්; දක්ෂඃ, දක්ෂනම්වූ; ප්‍රජාපතිඃ, බ්‍රහ්මයැ; ස්වාමී, ප්‍රභූ වූයේ දෙ හෝ නොහොත් ස්කන්ධ වූයේ; ශක්තිධරශ්ච, ආත්මප්‍රභාවාදි වූ ශක්ති ධරන්නේ දෙ හෝ නොහොත්; ශක්තිධරඃ, ශක්ති නම් ආයුධ විශේෂය ධරන්නේද; අසිත්, වි.

මෙහි මහීභෘත්ත්වය භූරිකටකත්වය යන මේ ආදින්නේ උභයපක්ෂයෙහි මැ අවගතිය හෙතුකොටගෙන මේතෙම අවිරොධිශ්ලේෂයයි දතයුතු.

322 අච්‍යුතොපි, විෂ්ණු වූයේද නොහොත් ස්ථිරබැවින් ස්ථානභ්‍රෂ්ට නූවූයේද; අවෘෂච්ඡේදී, වෘෂ නම් අසුරයාගේ † දෙ හෝ නොහොත්, ධර්මයාගේ ඡේදය නොකෙළේ; ජඥේ, දන්නාලද; රාජාපි, චන්ද්‍ර වූයේ දෙ හෝ නොහොත් නෘපති වූයේ; අවිදිතක්ෂයඃ, නොදන්නාලද (දක්ෂශාපය හෙතුකොටගෙන කෘෂ්ණපක්ෂයෙහි වන) ක්ෂයමාණත්වය ඇත්තේ දෙ හෝ නොහොත් (රාජ්‍යාපචයක් නැතිබැවින්) කිසි විනාශයක් නැත්තේ; ජඥේ, දන්නාලද; දේවොපි, දෙවතාවූයේ දෙ හෝ නොහොත් රජ වූයේද; අවිබුධඃ, සුරයන් නැත්තේ දෙ හෝ නොහොත් විගතවූ පණ්ඩිතවරුන් නැත්තේ නෙවත් පණ්ඩිතප්‍රධාන වූයේ; ජඥේ, දන්නාලද; ශඞ්කරොපි, ඊශ්වර වූයේ දෙ හෝ නොහොත් ශාන්තිකර වූයේද; අභුජඞ්ගවාන්, සර්පයන් නැත්තේ දෙ හෝ නොහොත් ධූර්තයන් නැත්තේ; ජඥේ, දන්නාලදී.

මෙහි අච්‍යුතත්වාදීන්ට අවෘෂච්ඡේදිත්වාදිය විරුද්ධහෙයින් මේතෙම විරොධිශ්ලේෂයයි දතයුතු.

---

* රේඛාවසානතර ව්‍යාඛ්‍යානය සන්නපොත්හි නූවයි.

† "විඝටනම් වෘෂභයාගේ" සන්න,

323 ගුණජාතික්‍රියාදීනං යත්‍ර වෛකල්‍යදර්ශනම්
විශේෂදර්ශනායෛව සා විශේෂෝක්තිරිෂ්‍යතේ.

324 න කඨෝරං න වා තීක්ෂ්ණමායුධං පුෂ්පධන්වනඃ
තථාපි ජිතමේවාසීදමුනා භුවනත්‍රයම්.

325 න දේවකන්‍යකා නාපි ගන්ධර්වකුලසම්භවා
තථාප්‍යේෂා තපෝභඞ්ගං විධාතුං වේධසෝ'ප්‍යලම්.

326 න බද්ධා භ්‍රුකුටිර්නාපි ස්ඵුරිතෝ දශනච්ඡදඃ
න ච රක්තාභවද්දෘෂ්ටිර්ජිතඤ්ච * ද්විෂතාං කුලම්.†

---

323 විශෙෂදර්ශනායෛව, අතිශයක් දක්නාපිණිස මැ; ගුණජාති ක්‍රියාදීනාම්, ගුණය ජාතිය ක්‍රියාය ද්‍රව්‍යය යන මොවුන්ගේ; යත්‍රවෛකල්‍යදර්ශනම්, යම් ඒ අභාවදර්ශනයෙක් ඇද්ද; සා, හෝ තොම; විශෙෂොක්තිරිෂ්‍යතෙ, විශෙෂොක්තියයි කැමැතිවනුලැබේ.

324 පුෂ්පධන්වනඃ, අනඞ්ගයාගේ; ආයුධම්, ආයුධයතෙම; න කඨොරම්, කඨින නොවන්නේය; න වා තීක්ෂ්ණම්, තීක්ෂ්ණද නොවන්නේය; තථාපි, එතෙකුදු වත්; අමුනා, මේ අනඞ්ගයාවිසින් නොහොත් මේ ආයුධයෙන්; භුවනත්‍රයම්, තුන්ලොව; ජිතමෙවාසීත්, දිනනලද්දේ මැ වී.

මෙහි අනඞ්ගයා සම්බන්ධි වූ ආයුධයාගේ කඨිනත්‍වාදි වූ ගුණයාගේ නිෂෙධයෙන් ඔහුගේ ලොකවිජයකාර්‍ය්‍යවිෂය වූ කිසි විශෙෂයෙක් දක්වනලදනුයි මෝ ගුණවිශෙෂොක්ති නමැයි දතයුතු.

325 එෂා, මේ ස්ත්‍රීතොමෝ; න දෙවකන්‍යකා, දිව්‍යස්ත්‍රියකුත් නොවෙයි; නාපි ගන්ධර්වකුලසම්භවා, ගන්ධර්වවංශයෙහි උපන් එකකුදු නොවෙයි; තථාපි, එතෙකුදු වුව; වෙධසොපි, බ්‍රහ්මයාගේද; තපොභඞ්ගම්, තපස්බිඳීම්; විධාතුම්, කරන්නට; අලම්, සමර්ථයි.

මෙහි අතිශයවත් වූ රූපඇති ස්ත්‍රියකගේ දෙවතාදිජාතියෙන් නිවෘත්තිය හෙතුකොටගෙන මෝතොමෝ මනුෂ්‍යවිද බ්‍රහ්මයා පවා පරවශ කරන්නීයයි මෙබඳු අතිශයෙක් දක්වනලදනුයි ජාතිවිශෙෂොක්ති නමු.

326 භ්‍රුකුටිඃ, කොපයෙන් භ්‍රූභෙදය; න බද්ධා, නොකරනලද; දශනච්ඡදඃ, අධරෞෂ්ඨතෙම; නාපි ස්ඵුරිතඃ, කොපයෙන් කම්පිත නොවිය; දෘෂ්ටිඃ, දෘෂ්ටියද; න ච රක්තා අභවත්, කොපයෙන් රත් විද නොවෙයි; ද්විෂතාං කුලම්, ශත්‍රුකුලයද; ජිතම්, දිනනලදී.

මෙහි භ්‍රූභඞ්ගාදි ක්‍රියාවන්ගේ අභාවය හෙතුකොටගෙන විකාරයක් නැති වැ ශත්‍රුවිජයරූප වූ විශෙෂයෙක් දක්වනලදනුයි ක්‍රියාවිශෙෂොක්ති නමු.

---

* ජිතමෙව-පා. † බලම්-පා.

327 න රථා න ච මාතඞ්ගා න හයා න ච පත්තයඃ
ස්ත්‍රීණාමපාඞ්ගදෘෂ්ට්‍යෛව ජීයතෙ ජගතාං ත්‍රයම්.

328 ඒකචක්‍රො රථො යන්තා විකලො විෂමා හයාඃ
ආක්‍රාමත්‍යෙව තෙජස්වී තථාප්‍යර්කො ජගත්ත්‍රයම්.*

329 සෛෂා හෙතුවිශෙෂොක්තිස්තෙජස්වීති විශෙෂණාත්
අයමෙව ක්‍රමො'න්‍යෙෂාම්භෙදානාමපි කල්ප්‍යතෙ.

විශෙෂොක්තිචක්‍රම්.

330 විවක්ෂිතගුණොත්කෘෂ්ටෛර්යත් සංසෘජ්‍ය කස්‍යචිත්
කීර්තනං ස්තුතිනින්දාර්ථං සා ස්මෘතා † තුල්‍යයොගිතා.

---

327 න රථාඃ, රථයෙකෙනෙකුත් නැති; න ච මාතඞ්ගාඃ, ගජයෙකෙනෙක් නැති; න හයාඃ, අශ්වයෙකෙනෙක් නැති; න ච පත්තයඃ, පදාති කෙනෙකුදු නැති; (එතෙකුදු වුවත්) ස්ත්‍රීණාම්, ස්ත්‍රීන්ගේ; අපාඞ්ගදෘෂ්ට්‍යෛව, නෙත්‍රාන්තවිලොකනයෙන් මැ හෙවත් කටාක්ෂමාත්‍රයෙන් මැ ජගතාං ත්‍රයම්, තුන්ලොව; ජීයතෙ, දිනනුලැබෙ.

මෙහි රථාදි ද්‍රව්‍යයන්ගේ අභාවය හෙතුකොටගෙන ස්ත්‍රීකටාක්ෂයාගේ ජගත්ත්‍රයජය ලක්ෂණ කොට ඇති විශෙෂයෙක් දක්වනලද නුයි ද්‍රව්‍යවිශෙෂොක්ති නමු.

328 රථඃ, රථයතෙම; ඒකචක්‍රඃ, එක්සකක් ඇත්තේය; යන්තා, රථාචාර්‍ය්‍යතෙම; විකලඃ, (කලවා නැතිහෙයින්) අකර්මණ්‍යය; හයාඃ, අශ්වයෝ; විෂමාඃ, (සත්දෙනකු හෙයින්) සම නොවන්නාහ; තථාපි, එතෙකුදු වුවත්; තෙජස්වී, තෙජස්වි වූ; අර්කඃ, සූර්‍ය්‍යතෙම; ජගත්ත්‍රයම්, තුන්ලොව; ආක්‍රාමත්‍යෙව, මඩනේ මැයි.

329 තෙජස්වීති, තෙජස්වීය යන; විශෙෂණාත්, මේ විශෙෂණය හෙතු කොටගෙන; සෛෂා, ඒ මේ උක්තිතොමෝ; හෙතුවිශෙෂොක්තිඃ, හෙතුවිශෙෂොක්තියයි (දතයුත්තීය); අන්‍යෙෂාම් භෙදානාමපි, සෙසු විශෙෂොක්ති ප්‍රකාරයන්ගේද; කල්ප්‍යතෙ, ප්‍රයොගයෙහි ලා; අයමෙව ක්‍රමඃ, මෙ මැ යුක්තියයි.

330 විවක්ෂිතගුණෛඃ, කියන්නට කැමැතිවනලද (සාධු වූ හෝ අසාධු වූ හෝ) ගුණයෙන්; උත්කෘෂ්ටෛඃ, අධික වූ සිය කෙනකුන් හා; සංසෘජ්‍ය, සදෘශ කොට; ස්තුතිනින්දාර්ථම්, ස්තුති පිණිස හෝ නින්දා පිණිස හෝ; කස්‍යචිත්, කිසිවකුගේ; යත් කීර්තනම්, යම් කීමෙක් ඇද්ද; සා, හෝතොම; තුල්‍යයොගිතා, තුල්‍යයොගිතායයි; ස්මෘතා, දත්තාලදු.

---

* නභස්තලම්-ක. † මතා-ක.

331 යමඃ කුවෙරො වරුණස්සහස්‍රාක්‍ෂො භවානපි
බිභ්‍රත්‍යනන්‍යවිෂයාං ලොකපාලා * ඉති ශ්‍රැතිම්.

332 සඞ්ගතානි මෘගාක්‍ෂීණාං තඩිද්විලසිතානි ච
ක්‍ෂණද්වයං න තිෂ්ඨන්ති ඝනාරබ්ධාන්‍යපි ස්වයම්.

333 විරුද්ධානාං පදාර්ථානාං යත්‍ර සංසර්ගදර්ශනම්
විරොධසාධනායෛව † ස විරොධස් ස්මෘතො යථා.

334 කූජිතං රාජහංසානාං වර්ධතෙ මදමඤ්ජුලම්
ක්‍ෂීයතෙ ච මයූරාණාං රුතමුත්ක්‍රාන්තසෞෂ්ඨවම්.

---

331 යමඃ, දකුණුදිගට අධිපති වූ යමය; කුවෙරඃ, උතුරුදිගට අධිපති වූ කුවෙරය; වරුණඃ, පැළදිගට අධිපති වූ වරුණය; සහස්‍රාක්‍ෂඃ, පූර්වදිගට අධිපති වූ ශක්‍රය; භවානපි, භවත්ය යන මොහු; අනන්‍යවිෂයාම්, අනිකකුහට අගොචර වූ; ලොකපාලා ඉති, ලොකපාලයහ යන; ශ්‍රැතිම්, ශබ්දය; බිභ්‍රති, උසුලන්නාහුයි.

මෙහි ලොකපාලත්වයෙන් විවක්‍ෂිතවූ ගුණයෙන් උත්කෘෂ්ට වූ යමාදීන් හා සදෘශ කොට කිසි රජකුහුගේ කිවි සතුති පිණිසයයි දතයුතු.

332 මෘගාක්‍ෂීණාම්, මිනුලැසියන්ගේ; සඞ්ගතානි, ප්‍රෙමයෝද; තඩිද්විලසිතානි ච, විද්‍යුද්විලසිතයෝද; ඝන, මෙඝයන්විසින් දු හෝ නොහොත් නිරන්තරයෙන්; ආරබ්ධාන්‍යපි, ආරබ්ධ වූවාහුද; ස්වයම්, තුමූ; ක්‍ෂණද්වයම්, ක්‍ෂණද්වයකුදු; න තිෂ්ඨන්ති, නොසිටිත්; බොහෝ කලක් කියන්නේ ම කිම්ද? යනු භාවයි.

මෙහි විවක්‍ෂිතවූ ක්‍ෂණමාත්‍රස්ථායිත්වලක්‍ෂණයෙන් ප්‍රතීත වූ තඩිද්විලසිත හා එක්කොට අතිචපලත්වය හෙතුකොටගෙන ස්ත්‍රීප්‍රෙමයාගේ කිවි නින්දා පිණිසයයි දතයුතු.

333 යත්‍ර, යම් උක්තිප්‍රකාරයෙක්හි ලා; විරොධසාධනායෛව, විරොධයාගේ සාධනය පිණිස මැ; විරුද්ධානාං පදාර්ථානාම්, පරස්පර විරුද්ධවූ වස්තූන්ගේ; සංසර්ගදර්ශනම්, සංසර්ගදර්ශනයෙක් ඇද්ද; සඃ, හෙතෙම; විරොධඃ ස්මෘතඃ, විරොධයයි දන්නාලදී; යථා, හේ මෙසේයි.

334 රාජහංසානාම්, රාජහංසයන්ගේ; මදමඤ්ජුලම්, මදයෙන් මනොඥ වූ; කූජිතම්, නාදයතෙම්; වර්ධතෙ, වඩනේය; මයූරාණාංච, මොනරුන්ගේද; උත්ක්‍රාන්තසෞෂ්ඨවම්, අපගත වූ ශොභනත්වය ඇති; රුතම්, නාදය තෙම්; ක්‍ෂීයතෙ, ක්‍ෂය වන්නේයි.

මෙහි වෘද්ධික්‍ෂයලක්‍ෂණ වූ අන්‍යොන්‍යවිරුද්ධ වූ ක්‍රියාපදාර්ථයන් දෙදෙනාගේ සංසර්ගය හෙතු කොට ගෙන මේතෙම ක්‍රියාවිරුද්ධ නම් වන්නේයයි දතයුතු.

---

* ලොකපාල–ක. ප. † විශෙෂදර්ශනායෛව–ක.

335 ප්‍රාවෘෂේණ්‍යෛර්ජලධරෛරම්බරං දුර්දිනායතෙ.
රාගෙණ පුනරාක්‍රාන්තං ජායතෙ ජගතාං මනඃ.

336 තනුමධ්‍යං පෘථුශ්‍රොණි රක්තොෂ්ඨමසිතෙක්ෂණම්
නතනාභි වපුඃ ස්ත්‍රීණං කං න හන්ත්‍යුන්නතස්තනම්.

337 මෘණාලබාහුරම්භොරු පද්මොත්පලමුඛෙක්ෂණම්
අපි තෙ රූප මස්මාකං තන්වි තාපාය කල්පතෙ.

---

335 අම්බරම්, ආකාශයතෙම; ප්‍රාවෘෂෙණ්‍යෛඃ, ප්‍රාවෘට්කාලයෙහි වූ; ජලධරෛඃ, මෙඝයන් කරණකොට ගෙන; දුර්දිනායතෙ, දුර්දින වන්නේය හෙවත් ඝනතරාග වන්නේය; ජගතාං මනස්තු, ලෝවැස්සන්ගේ චිත්තය වනාහි; රාගෙණ, රතිභාවයෙන්; ආක්‍රාන්තං ජායතෙ, මඩනාලද්දේ වන්නේයි.

මෙහි විරාගරාගරූප වූ දුර්දිනත්වරක්තත්වලක්ෂණ වූ ගුණයන් දෙන්නාගේ විප්‍රතිපත්තිය හෙතුකොට ගෙන මේතෙම ගුණවිරොධයයි දතයුතු.

336 තනුමධ්‍යම්, කෘශ වූ මධ්‍යප්‍රදෙශ ඇත්තා වූ; පෘථුශ්‍රොණි, පළල්වූ නිතම්බචක්‍ර ඇත්තාවූ; රක්තොෂ්ඨම්, රත්වූ අධර ඇත්තාවූ; අසිතෙක්ෂණම්, කළුවූ ඇස් ඇත්තාවූ; නතනාභි, ගම්භීරනාභි ඇත්තාවූ; උන්නතස්තනම්, උත්තුඞ්ග වූ පයොධර ඇත්තාවූ; ස්ත්‍රීණං වපුඃ, තරුණීන්ගේ ශරීරයතෙම; කං න හන්ති, කවරක්හු නොපහරනේද හෙවත් කවරක්හු වශග නොකරන්නේද ?

මෙහි පරස්පරවිරොධිවූ තනුමධ්‍යපෘථුශ්‍රොණීආදිවූ ශරීරාවයවයන්ගේ සංසර්ගදර්ශනය හෙතුකොටගෙන මේතෙම ද්‍රව්‍යවිරොධයයි දතයුතු.

337 තන්වි, කෘශාඞ්ගිය; මෘණාලබාහු, නෙළුම්දළියට බඳු අත් ඇත්තාවූ; රම්භොරු, කදලියට බඳුවූ ඌරු ඇත්තාවූ; පද්මොත්පල, පද්ම හා ඉන්දීවරපත්‍ර වැනි වූ; මුඛෙක්ෂණම්, මුව හා ඇස් ඇත්තාවූ; තෙ රූපමපි, තීගේ රූපය පවා; අස්මාකම්, අපට; තාපාය කල්පතෙ, තාපපිණිස සමර්ථ වන්නේයි.

මෙහි ශීතගුණයාගේ හෝ තවත්වූ බාහුප්‍රභෘති ද්‍රව්‍යයන්ගේ හෝ අවයවවූ ශරීරද්‍රව්‍යයාගේ හෝ උෂ්ණකාර්‍ය්‍යවූ තාපය හා විරොධය දක්වන ලදනුයි මේතෙම ගුණවිරොධය හෝ ද්‍රව්‍යවිරොධය නම් වන්නේයයි දතයුතු.

338 උද්ධූතමාරුතොද්ධූතාශ්චූතචම්පකරෙණවඃ
උදශ්‍රයන්ති පාන්ථානාමස්පෘශන්තො'පි ලොචනෙ.

339 කෘෂ්ණාර්ජුනානුරක්තාපි දෘෂ්ටිඃ කර්ණාවලම්බිනී
යාති විශ්වසනීයත්වං කස්‍ය තෙ කලභාෂිණි-

340 ඉත්‍යනෙකප්‍රකාරො'යමලඞ්කාරඃ ප්‍රතීයතෙ
විරොධවක්‍රම්.

අප්‍රස්තුතප්‍රශංසා ස්‍යාදප්‍රක්‍රාන්තෙෂු * යා ස්තුතිඃ.

---

338 උද්ධූත, උපන්හි; මාරුත, පවනින්; උද්ධූත, නඟනලද; චූත චම්පක, සහකාරවෘක්ෂයන්ගේ හා චම්පකද්‍රැමයන්ගේ; රෙණවඃ, කුසුමපරාගයෝ; පාන්ථානාම්, පථිකයන්ගේ; ලොචනෙ, නෙත්‍රවයන්; අස්පෘශන්තොපි, ස්පර්ශ නොකරන්නාහුද; උදශ්‍රයන්ති, උද්ගතවූ බාෂ්ප ඇත්තවුන් කෙරෙත්.

මෙහි ස්පර්ශනිෂෙධඋදශ්‍රයනලක්ෂණ වූ ක්‍රියා දෙන්නාගේ විරොධය හෙතු කොටගෙන ක්‍රියාවිරොධයයි දතයුතු.

(339 කලභාෂිණි, මනොඥ වූ වචන ඇත්තිය; තෙ, තීගේ; දෘෂ්ටිඃ, දෘෂ්ටිතොමෝ; අර්ජුනානුරක්තා, ධනඤ්ජයයා කෙරෙහි ඇලුම්ඇති; කෘෂ්ණාඅපි, ද්‍රෞපදීස්වරූප වුවද; කර්ණාවලම්බිනී, රාධෙයයා ඇසුරු කරන්නි; කස්‍ය, කවරක්හට; විශ්වසනීයත්වම්, විශ්වාස කටයුතුබවට; යාති, පැමිණෙන්නිද; (නොහොත්)-කලභාෂිණි, මනොඥවූ වචන ඇත්තිය; තෙ, තිගේ; දෘෂ්ටිඃ, දෘෂ්ටිතොමෝ කෘෂ්ණා, කළුය; අර්ජුනා, ධවලය; අනු, පශ්චාද් භාගයෙහි හෙවත් කෙළවරෙහි; රක්තා අපි, රත් පැහැද වුවා; කර්ණාවලම්බිනී, ශ්‍රවණපර්‍ය්‍යන්තයට යන සුළුද වූවා; කස්‍ය, කවරක්හට; විශ්වසනීයත්වම්, විශ්වාස කටයුතුබවට; යාති, පැමිණෙන්නිද ?.

මෙහි අර්ජුනානුරක්ත ද්‍රෞපදීරූප ද්‍රව්‍යයාගේ රාධෙයාවලම්බන ක්‍රියාව හා විරොධය වේ. එතකුදු වුවත් කෘෂ්ණ ධවල රක්ත වර්ණතා හා ශ්‍රවණපර්‍ය්‍යන්තගාමිත්වය යන අවිරුඬවූ ශ්ලෙෂයෙන් අනුවිඬබව හෙතුකොටගෙන මේතෙම ශ්ලෙෂානුවිඬ විරොධයයි දතයුතු.) †

340 අයමලඞ්කාරඃ, මේ විරොධාලඞ්කාරය තෙම; ඉති, මෙසේ උක්තක්‍රමයෙන්; අනෙකප්‍රකාරඃ, නානාවිධ වූයේ; ප්‍රතීයතෙ, දන්නා ලැබෙයි; අප්‍රක්‍රාන්තෙෂු තු, අප්‍රස්තුතයා කෙරෙහි; යා ස්තුතිඃ, යම් ප්‍රශංසාවෙක් ඇද්ද; සා, හෝ තොම; අප්‍රස්තුතප්‍රශංසා ස්‍යාත්, අප්‍රස්තුතප්‍රශංසා නම් වන්නීයි.

---

* දප්‍රක්‍රාන්තෙෂු-ක.

† මේ ශ්ලොකවිවරණය සන්නයෙහි භ්‍රෂ්ටයි.

341 සුඛං ජීවන්ති හරිණා වනෙෂ්වපරසෙවිනඃ
අර්ථෛ * රයත්නසුලභෛර්ජලදර්භාඞ්කුරාදිභිඃ.

342 සෙයමප්‍රස්තුතෛවාත්‍ර මෘගවෘත්තිඃ ප්‍රශස්‍යතෙ
රාජානුවර්ත්තනක්ලෙශනිර්විණ්ණෙන මනස්විනා.

අප්‍රස්තුතප්‍රශංසා.

343 යදි නින්දන්නිව ස්තෞති ව්‍යාජස්තුතිරසෞ ස්මෘතා
දොෂාභාසා ගුණා එව ලභන්තෙ හ්‍යත්‍ර සන්නිධිම්.

---

මෙහි "අප්‍රක්‍රාන්තෙප්සිතස්තුතිඃ" යන මේ පාඨයෙහි මෙසේ විග්‍රහ කටයුතු.

අප්‍රක්‍රාන්ත, ප්‍රස්තුත නුවූ; ඊප්සිත, ඉෂ්ට වූ කිසි වස්තුවක්හුගේ; ස්තුතිඃ, ස්තුති තොමෝ; අප්‍රස්තුතප්‍රශංසා නම් වන්නීය; තොහොත්–අප්‍රක්‍රාන්ත, අප්‍රස්තුත වූ; ඊප්සිතස්තුතිඃ, ඉෂ්ටවූ කිසි වස්තුවක්හුගේ ප්‍රශංසා තොම අප්‍රස්තුතප්‍රශංසානම් වන්නියි.

341 අපරසෙවිනඃ, අන්‍යසෙවාවක් නොකරන්නාවූ හෙවත් පර චිත්තාරාධනයෙහි දුක් නොදන්නාවූ; හරිණාඃ, මෘගයෝ; වනෙෂු, වන යෙහි ලා; අයත්නසුලභෛඃ, කිසි යත්නයක් නැතිවම සුවසේ ලැබෙන්නාවූ; ජල, දිය; දර්භාඞ්කුරාදිභිඃ, ඉලුද්දළුය යන මේ ආදිවූ; අර්ථෛඃ, උපකරණ ගැනු කොට ගෙන; සුඛං ජීවන්ති, සුවසේ ජීවත් වෙත්.

342 අත්‍ර, මේ ප්‍රයොගයෙහි ලා; සෙයම්, ඒ මේ; මෘගවෘත්තිඃ, ජලදර්භාඞ්කුරාදිස්වරූප වූ මෘගයන්ගේ ජීවිකාතොමෝ; අප්‍රස්තුතෛව, අප්‍රක්‍රාන්ත වී ම; රාජානුවර්ත්තනක්ලෙශ, රාජසෙවාපීඩායෙන්; නිර්විණ්ණෙන, උකටලීවූ; මනස්විනා, සිත ඇත්තාවූ; කෙනෙකු විසින්, කිසි වක්හු විසින්; ප්‍රශස්‍යතෙ, ප්‍රශංසා කරනුලැබේ.

343 යදි, ඉදින්; නින්දන්නිව, දොෂ කියන්නක්හු මෙන්; ස්තෞති, ස්තුති කෙරේද; අසෞ, මෝතොමෝ; ව්‍යාජස්තුතිඃ ස්මෘතා, ව්‍යාජස්තුති යයි දන්නාලද්; අත්‍ර, මේ ව්‍යාජස්තුතියෙහි ලා; දොෂාභාසාඃ, දොෂ යන්ගේ ආභාසමාත්‍රයෝමය හෙවත් නැත්තාවූද දොෂයෝ ඇත්තාහුන් මෙන් වැටහෙති; ගුණා එව, ගුණයෝ මැ; සන්නිධිම්, අවස්ථානය; ලභන්තෙහි, ලැබෙත්මැයි.

---

* අශෙෂෛ-කා.

344 තාපසෙනාපි රාමෙණ ජිතෙයං භූතධාරිණී
ත්වයා රාඥාපි සෛවෙයං ජිතා මාභූන්මදස්තව.

345 පුංසඃ පුරාණාදාච්ඡිද්‍ය ශ්‍රීස්ත්වයා පරිභුජ්‍යතෙ
රාජන්නික්ෂ්වාකුවංශස්‍ය කිමිදං තව යුජ්‍යතෙ.

346 භුජඞ්ගභොගසංසක්තා කලත්‍රං තව මෙදිනී
අහඞ්කාරඃ පරං කොටිමාරොහති කුතස්තව.

---

344 ඉයම් භූතධාරිණී, මේ පෘථිවිතොමෝ; තාපසෙනාපි, තපස්වි වූද; රාමෙණ, දශරථපුත්‍රයාවිසින් නොහොත් භාර්ගවයාවිසින්; ජිතා, දිනනලද; රාඥාපි, රජවූ ද; ත්වයා, තාවිසින්; සෛවෙයම්, ඒ මේ පෘථිවිය මැ; ජිතා, දිනනලද; (එහෙයින්) තව, තට; මදඃ, (පෘථිවිය දිනිමි යන) අහඞ්කාරය තෙම; මාභූත්, නහමක් වේවා,

මෙහි උක්තප්‍රකාරයෙන් නින්‍දාවක් සේ වැටහෙනබව මුත් පරමාර්ථයෙන් වනාහි මහත් ප්‍රභාව ඇති මුළුපොළොව දිනූ සියලු නරාධිපයන්ට චූඩාමාණික්‍යයක් බඳු රාමයා හා සමකොට කිසි රජක්හට කරන ලද ස්තුතිය හෙතු කොට ගෙන මෙහි ගුණ මැ අවස්ථිතයයි දතයුතු.

345 රාජන්, රජ; පුරාණාත් පුංසඃ, ජීර්ණපුරුෂයා කෙරෙන් ද හෝ නොහොත් විෂ්ණුහු කෙරෙන්: ශ්‍රීඃ, රාජ්‍යාභ්‍යුදයලක්ෂණවූ සම්පත් ද හෝ නොහොත් ශ්‍රීදෙවතා තොමෝ; ආච්ඡිද්‍ය, පැහැර ගෙන; ත්වයා, තාවිසින්; පරිභුජ්‍යතෙ, අනුභව කරනු ලබන්නිය; ඉදම්, මේ; ඉක්ෂ්වාකුවංශස්‍ය, ඔක්කාවස්කුලෙහි වූ; තව, තට; යුජ්‍යතෙ කිම්, යෙදේද?

මෙහි අකිඤ්චිත්කරවූ පුරාණපුරුෂයාකෙරෙන් ශ්‍රීතොම පැහැරගෙන අනුභව කරනුලබන්නීයයි නින්‍දාව ආභාසමාන වන්නීය. පරමාර්ථවශයෙන් වනාහි විෂ්ණුහු කෙරෙන් පවා ශ්‍රීදෙවතා තොමෝ තාවිසින් පැහැර ගෙන අනුභව කරනුලබන්නීයයි කිසි රජක්හුගේ විශේෂාත් සෂීාවිෂ්කරණයෙන් ස්තුතිය හෙතු කොට ගෙන ගුණ මැ අවස්ථිතීය ලබන්නේයි.

346 තව, තාගේ; කලත්‍රම්, අඹුවූ; මෙදිනී, පෘථිවිතොමෝ; භුජඞ්ගභොගසංසක්තා, අනන්තනම් නාගරාජයාගේ දරණයෙහි අවස්ථිත වී ද හෝ නොහොත් ධූර්තයන්ගේ ශරීරසම්භොගයෙහි ඇලුම් ඇත්තීය; තව, තාගේ; අහඞ්කාරඃ, අභිමානයතෙම; පරාං කොටිම්, උත්කෘෂ්ට වූ කෙළවරට; කුතඃ ආරොහති, කවර හෙයකින් නැඟෙන්නේද?

මේ නින්‍දාවක් සේ වැටහෙත් මුත් සකලමහීතලාධිරාජ්‍යලක්ෂණ වූ ස්තුති මැ කියනලදනුයි ව්‍යාජස්තුතිනම් වන්නේයයි දතයුතු.

347 ඉති ශ්ලෙෂානුවිද්ධානාමන්‍යෙෂාඤ්චොපලක්‍ෂ්‍යතාම්
ව්‍යාජස්තුතිප්‍රකාරාණාමපර්‍ය්‍යන්තස්තු විස්තරඃ.

ව්‍යාජස්තුතිඃ.

348 අර්‍ථාන්තරප්‍රවෘත්තෙන කිඤ්චිත්තත්සදෘශං ඵලම්
සදසද්වා ප්‍රදර්‍ශ්‍යෙත යදි තත්ස්‍යාන්නිදර්‍ශනම්.

349 උදයන්නෙව සවිතා පද්මෙෂ්වර්‍පයති ශ්‍රියම්
විභාවයිතුමෘද්ධීනාං ඵලං සුහෘදනුග්‍රහම්.

350 යාති චන්ද්‍රාංශුභිඃ ස්පෘෂ්ටා ධ්වාන්තරාජී පරාභවම්
සද්‍යො රාජවිරුද්ධානාං සූචයන්තී දුරන්තතාම්.

නිදර්‍ශනම්.

---

347 ඉති, මෙ කියනලද මාර්‍ගයෙන්; ශ්ලෙෂානුවිද්ධානාම්, ශ්ලෙෂයෙන් යුක්තවූ; අන්‍යෙෂාම්, සෙසු; ව්‍යාජස්තුතිප්‍රකාරාණාම්, ව්‍යාජස්තුති විකල්පයන්ගේද; අපර්‍ය්‍යන්තඃ, කෙළවරක් නැත්තාවූ; විස්තරඃ, ප්‍රපඤ්චය තෙම; උපලක්‍ෂ්‍යතාම්, (සශ්‍රීබන්ධාදි ප්‍රයොගයෙහි ලා) දක්නු ලැබේවා.

348 යදි, ඉදින්, අර්‍ථාන්තරප්‍රවෘත්තෙන, නිදර්‍ශනීයාපෙක්‍ෂායෙන් අනික් කිසි උචිතකාර්‍ය්‍යයෙක්හි ප්‍රවෘත්තයක්හු විසින්; තත්සදෘශම්, ඒ අර්‍ථාන්තරය හා සමවූ; සදසද්වා, ඉෂ්ටවූ හෝ අනිෂ්ටවූ හෝ; කිඤ්චිත් ඵලම්, කිසි ඵලයක්; ප්‍රදර්‍ශ්‍යෙත, දක්වනු ලබන්නේ වීනම්; තත්, ඒ; නිදර්‍ශනං ස්‍යාත්, නිදර්‍ශන නම් වන්නේයි.

349 සවිතා, සූර්‍ය්‍යතෙම; උදයන්නෙව, නැඟෙන්නේ ම; ඍද්ධීනාං ඵලම්, සම්පත්තීන්ගේ කාර්‍ය්‍යය; සුහෘදනුග්‍රහම්, ආශ්‍රිතයන්ට උපකාරවූවා; විභාවයිතුම්, ප්‍රකාශ කරන්නට; පද්මෙෂු, පද්මයෙහි ලා; ශ්‍රියම්, විකාශ ස්වරූප වූ ලක්‍ෂ්මිය; අර්‍පයති, පිහිටුවන්නේයි.

මෙහි උචිතවූ පද්මවිකාශලක්‍ෂණවූ කාර්‍ය්‍යයෙහි ප්‍රවෘත්තවූ හිරු විසින් ඒ පද්මවිකාශනය හා සදෘශවූ සුහෘදනුග්‍රහලක්‍ෂණවූ කාර්‍ය්‍ය මැ දක්වනලදහෙයින් මෙබඳුවූයේ නිදර්‍ශන නම් වන්නේයයි දතයුතු.

මෙහි සුහෘදනුග්‍රහ ඉෂ්ටහෙයින් මෙද සත්ඵලනිදර්‍ශනයි.

350 චන්ද්‍රාංශුභිඃ, චන්ද්‍රමරීචියෙන්; ස්පෘෂ්ටා, ස්පර්‍ශ කරනලද්දාවූ; ධ්වාන්තරාජී, අන්ධකාරශ්‍රෙණීතොමෝ; රාජ, චන්ද්‍රයාහට ද්‍රෝහී තොහොත් නරෙශ්වරයන්ට; විරුද්ධානාම්, ප්‍රතිපක්‍ෂවූවන්ගේ; දුරන්තතාම්, දුෂ්ටවූ විපත්තිරූපවූ කෙළවරක් ඇතිබව; සූචයන්තී, ප්‍රකාශකරන්නී; සද්‍යඃ, එකෙණෙහි; පරාභවං යාති, විනාශයට පැමිණෙන්නීයි,

මෙහි පරාභවය අනිෂ්ට හෙයින් රාජවිරොධකාරණ වූ අසත්ඵලය දක්වන ලද; තවද මෙහි විනාශලක්‍ෂණවූ කාර්‍ය්‍යයට පැමිණෙන ධ්වා

351 සහොක්තිස්සහභාවස්‍ය * කථනං ගුණකර්මණාම්
අර්ථානාං යො විනිමයඃ පරිවෘත්තිස්තු සා යථා. †

352 සහ දීර්ඝා මම ශ්වාසෛරිමාඃසම්ප්‍රති රාත්‍රයඃ
පාණ්ඩුරාශ්ච මමෛවාඞ්ගෛස්සහ තාශ්චන්ද්‍ර භූෂණාඃ.

353 වර්ධතෙ සහ පාන්ථානාං මූර්ච්ඡයා චූතමඤ්ජරී
පතන්ති ච සමං තෙෂාමසුභිර්මලයානිලාඃ.

---

නතරාජීතොමෝ රාජවිරොධයෙන් වන අනිෂ්ටඵල දක්වන්නීහුයි මෙහි උක්තිතොමෝ අසත්ඵලනිදර්ශන නම් වේ.

351 ගුණකර්මණාම්, ගුණයන් හා ක්‍රියාවන්ගේ; සහභාවස්‍ය, යුගපත්සත්තාවගේ; කථනම්, කීම; සහොක්තිඃ, සහොක්ති නම් වන්නීය; අර්ථානාම්, ගුණක්‍රියාදී පදාර්ථයන්ගේ; යො විනිමයඃ, යම් ව්‍යත්‍යයෙක් ඇද්ද; සා තු, තෝ වනාහි; පරිවෘත්තිඃ, පරිවෘත්ති නම් වන්නීය; යථා, ඒ මෙසේයි.

352 සම්ප්‍රති, දැන්; ඉමා රාත්‍රයඃ, මේ රාත්‍රීහු; මම, (විරහාක්‍රාන්ත) මාගේ; උච්ඡ්වාසෛස්සහ, නිඃශ්වාස හා එක්වම; දීර්ඝාඃ, දික්හ; චන්ද්‍රභූෂණාඃ, ශශාඞ්කයාම ආභරණකොට ඇති; තාඃ, ඒ රාත්‍රීහු; මමෛවාඞ්ගෛස්සහ, මාගේ ශරීරය හා එක්වම; පාණ්ඩුරාශ්ච, පඬුවන්වූ ශොභාද ඇත්තාහුයි.

මෙහි නිඃශ්වාසයෝද රාත්‍රීහුද දීර්ඝයහ් අඞ්ගයෝද රාත්‍රීහුද පාණ්ඩුර යහයි උභයසම්බන්ධිවූ දෛර්ඝ්‍ය පාණ්ඩුරත්ව දෙදෙනාගේ යුගපද්භාව කථනයෙන් මේතොමෝ සහොක්ති නම් වන්නීයි.

353 චූතමඤ්ජරී, සහකාරකලිකාතොමෝ; පාන්ථානාම්, පථිකයන්ගේ; මූර්ච්ඡයා සහ, මොහය හා එක්වම; වර්ධතෙ, වඩනීය; මලයානිලාඃ, දක්ෂිණමාරුතයෝ; තෙෂාම්, ඒ පථිකයන්ගේ; අසුභිස්සම්, ප්‍රාණය හා එක්වම; පතන්ති, ගිලිහෙත්.

මෙහි මූර්ච්ඡා මඤ්ජරී දෙන්නා හා ද ප්‍රාණ මාරුත දෙන්නා හා ද සාධාරණ වූ වර්ධනක්‍රියාවන් දෙන්නාගේද පතනක්‍රියාවන් දෙන්නාගේද සහභාවය කීනලදහෙයින් මෝද සහොක්ති නමු.

මේ සහොක්ති තොමෝ සහජම්ත්‍ර වූ හෙතු ගර්භකොට ඇත්තීයයි දතයුතු.

---

* සහභාවෙන—ක. † සාසම්‍යා—ක.

354 කොකිලාලාපසුභගාස්සුගන්ධිවනවායවඃ
යාන්ති සාර්ධං ජනානන්දෛර්වෘද්ධිං සුරභිවාසරාඃ.

355 ඉත්‍යුදාහෘතයො දත්තාස්සහොක්තෙරත්‍ර කාශ්චන
සහොක්තිඃ
ක්‍රියතෙ පරිවෘත්තෙශ්ච කිඤ්චිද්‍රූපනිරූපණම්. *

356 ශස්ත්‍රප්‍රහාරං දදතා භුජෙන තව භූභුජාම්
චිරාර්ජිතං හෘතං තෙෂාං යශඃ කුමුදපාණ්ඩුරම්.

පරිවෘත්තිඃ.

357 ආශීර්නාමාභිලෂිතෙ වස්තුන්‍යාශංසනං යථා
පාතු වඃ පරමං ජ්‍යොතිරවාඞ්මනසගොචරම්.

ආශීඃ.

---

354 කොකිලාලාප, කොකිලස්වරයෙන්; සුභගාඃ, මනොහරවූ; සුගන්ධි, ශොභනවූ ගන්ධ ඇති; වනවායවඃ, වනපවන ඇත්තාවූ; සුරභිවාසරාඃ, වසන්තකාලයාගේ දිවසයෝ; ජනානන්දෛඃසාර්ධම්, ජනයන්ගේ සන්තොෂය හා එක්වම; වෘද්ධිම්, වැඩීමට; යාන්ති, යන්නාහුයි.

මෙහි වාසර ජනානන්දාධාරවූ වර්ධනක්‍රියාවන් දෙන්නාගේ සහභාවය කියනලදහෙයින් මේද සහොක්ති නමු.

මෙකී උක්ති තොමෝ අභිධානක්‍රියායෑ ප්‍රමවීකාත භිනනක්‍රියාදි මෙසේ මේ උදාහරණයන් දෙන්නාගේ භෙදය දතයුතු.

355 අත්‍ර, මේ ප්‍රයොගයෙහි ලා; ඉති, උක්තප්‍රකාරයෙන්; සහොක්තෙඃ, සහොක්තියට; කාශ්චන උදාහෘතයඃ, කිසි උදාහරණ කෙනෙක්; දත්තාඃ, දෙනලදහ; මෙවත් දක්වනලදහ; පරිවෘත්තෙශ්ච, පරිවෘත්තියගේද; කිඤ්චිත් රූපනිරූපණම්, කිසි ස්වරූපදර්ශනයෙක්; ක්‍රියතෙ, කරනු ලැබේ.

356 භූභුජාම්, රජදරුවන්ට; ශස්ත්‍රප්‍රහාරම්, ආයුධප්‍රහාරය; දදතා, දෙන්නාවූ; තව, තාගේ; භුජෙන, හස්තයවිසින්; තෙෂාම්, ඒ රජදරුවන්ගේ; චිරාර්ජිතම්, බොහෝකලක් රැස්කරනලද්දාවූ; කුමුදපාණ්ඩුරම්, කුමුදු සේ සුදුවූ; යශඃ, යසසතෙම; හෘතම්, ගන්නාලදී.

මෙහි ප්‍රහාරක්‍රියායෙන් යශස්හුගේ විනිමය කරනලද, එහෙයින් මෙබඳුවී පරිවෘත්තියයි දතයුතු.

357 අභිලෂිතෙ වස්තුනි, කැමැතිවනලද කිසි අර්ථයෙක් හි; ආශංසනම්, ප්‍රාර්ථනයතෙම; ආශීර්නාම, ආශිස් නම් වන්නේය; යථා, සේ වෙ

---

* නිදර්ශනම්—ක.

358 අනන්වයසසන්දෙහාවුපමාස්වෙව දර්ශිතෞ
උපමාරූපකඤ්චාපි රූපකෙෂ්වෙව කීර්තිතම් *

359 උත්ප්‍රෙක්ෂාභෙද එවාසාවුත්ප්‍රෙක්ෂාවයවො'පි ච
නානාලඞ්කාරසංසෘෂ්ටා සංසෘෂ්ටිස්තු † නිගද්‍යතෙ

360 අඞ්ගාඞ්ගිභාවාවස්ථානං සර්වෙෂාං සමකක්ෂතා
ඉත්‍යලඞ්කාරසංසෘෂ්ටෙඃ ‡ ලක්ෂණීයා ද්වයී ගතිඃ

361 ආක්ෂිපන්ත්‍යරවින්දානි මුග්ධෙ තව මුඛශ්‍රියම්
කොශදණ්ඩසමග්‍රාණාං කිමෙෂාමස්ති දුෂ්කරම්.

---

සෙයි; අවාඞ්මනසගොචරම්, වාඞ්මනස් දෙකට විෂය නොවූ; පරමං ජ්‍යොතිඃ, පරමවූ ජ්‍යොතිෂය හෙවත් ඥානයතෙම; වඃ, තොපට; පාතු, රක්ෂාකෙරේවා.

මෙහි අභිලෂිතවූ රක්ෂණය ආශංසා කරනලදී.

358 අනන්වයසසන්දෙහෞ, අනන්වය සසන්දෙහය යන අලඞ්කාර යෝ දෙදෙන; උපමාස්වෙව, උපමායෙහි ම; දර්ශිතෞ, ("චන්ද්‍රාරවින්දයොඃ කක්ෂ්‍යාම්" යන මේ ආදියෙන්ද "කිම්පද්මමන්තර්භ්‍රාන්තාලි" යන මේ ආදියෙන්ද ) දක්වන ලදහ; උපමාරූපකඤ්චාපි, උපමාරූපකයද; රූපකෙෂ්වෙව, රූපකයෙහිම; කීර්තිතම්, ("අයමාලොහිතච්ඡායඃ" යන මේ ආදියෙන්) කියනලදී.

359 උත්ප්‍රෙක්ෂාවයවඃ, උත්ප්‍රෙක්ෂාවයව නම්වූ; අසාවපිච, මේ අලඞ්කාරයද; උත්ප්‍රෙක්ෂාභෙද එව, උත්ප්‍රෙක්ෂාලඞ්කාරයාගේ විශෙෂයක්මය; (එහෙයින් භෙද නොකියම්හ යනු භාවයි); නානාලඞ්කාරසංසෘෂ්ටා, නොයෙක් අලඞ්කාරයන් එක්කරනලද; සංසෘෂ්ටිස්තු, සංසෘෂ්ටිය වනාහි; නිගද්‍යතෙ, කියනුලැබේ,

360 අලඞ්කාරසංසෘෂ්ටෙඃ, අලඞ්කාරසංසෘෂ්ටියෙහි ලා; සර්වෙෂාම්, සියලු අලඞ්කාරයන්ගේ; අඞ්ගාඞ්ගිභාවාවස්ථානම්, උපකාරොපකාර්‍ය්‍ය බැවින් හෙවත් සාධ්‍ය සාධන වශයෙන් සිටීමද; සමකක්ෂතා, ස්වප්‍රධාන බැවින් හෙවත් අඞ්ගාඞ්ගිභාවයක් නැතිව ස්වතන්ත්‍රයෙන් අවස්ථානයද යන; ද්වයී ගතිඃ, ද්විප්‍රකාර වූ ගතිතොමෝ; ලක්ෂණීයා, දක්ක යුත්තීයි.

361 මුග්ධෙ, බොළඳ තැනැත්තිය; අරවින්දානි, පද්මයෝ; තව මුඛශ්‍රියම්, තීගේ මුඛශොභාව; ආක්ෂිපන්ති, ගනිත්; (තීගේ මුඛය හා සදෘශ යෝයී සෙයි); එසේමැයි; කොශදණ්ඩ, පද්මගර්භයෙන් හා නාලයෙන් ලෙදනෝ නොහොත් ධනයෙන් හා චතුරඞ්ගසෙනායෙන්, සමග්‍රාණාම්, සම්ප

---

* දර්ශිතම් — ක. † සංසෘෂ්ටිඃ සඞ්කීර්ණතා — ක.
‡ සංසෘෂ්ටෙර් — ක.

(362 ලිම්පතීව තමො'ඞ්ගානි වර්ෂතීවාඤ්ජනං නභඃ
අසත්පුරුෂසෙවෙව දෘෂ්ටිර්විඵලතාං ගතා.)

සඞ්කීර්ණම්.

363 ශ්ලෙෂඃ සර්වාසු පුෂ්ණාති ප්‍රායො වක්‍රොක්තිෂු ශ්‍රියම්
භින්නං ද්විධා ස්වභාවොක්තිර්වක්‍රොක්තිශ්චෙති වාඞ්මයම්.

364 භාවිකත්ව * මිතිප්‍රාහුඃ ප්‍රබන්ධවිෂයං ගුණම්
භාවඃ කවෙරභිප්‍රායඃ කාව්‍යෙෂ්වාසිද්ධි සංස්ථිතඃ.

---

නතවූ; එෂාම්, මේ අරවින්දයන්ට; කිං දුෂ්කරමස්ති, කවර දුෂ්කරයෙක් ඇද්ද,

මෙහි සාධ්‍යවූ උපමාවගේ අඞ්ගිත්වයෙන්ද සාධනවූ කොෂදණ්ඩ යන මේ ආදී ශ්ලෙෂානුවිද්ධවූ අර්ථාන්තරන්‍යාසයාගේ අඞ්ගත්වයෙන්ද අවස්ථානය හෙතුකොට ගෙන අඞ්ගාඞ්ගිවූ මේ උපමාද්‍යලඞ්කාරත්‍රය සංසෘෂ්ට යයි දතයුතු.

(362 තමඃ, අන්ධකාරය තෙම; අඞ්ගානි, ශරීරාවයවයන්; ලිම්පතීව, ගල්වන්නක්හු වැන්න; නභඃ, ආකාශයතෙම; අඤ්ජනම්, අඳුන්; වර්ෂතීව, වස්නක්හු වැන්න; දෘෂ්ටිඃ, දෘෂ්ටීතොමෝ; අසත්පුරුෂසෙවෙව, අසත්පුරුෂයක්හුගේ සෙවාව මෙන්; විඵලතාම්, නිෂ්ඵලබවට; ගතා, පැමිණියා.

මෙහි පූර්වාර්ධයෙහි උත්ප්‍රෙක්ෂාවද උත්තරාර්ධයෙහි උපමාවද පරස්පරනිරපෙක්ෂව ප්‍රාධාන්‍යයෙන් අවස්ථිතයි. එහෙයින් මේ සඞ්කීර්ණ නම්.) †

363 ශ්ලෙෂඃ, උක්ත ලක්ෂණවූ ශ්ලෙෂයතෙම; සර්වාසු වක්‍රොක්තිෂු, සියලු උපමාදිවූ වක්‍රොක්තියෙහි මැ; ප්‍රායඃ, බොහෝසේ; ශ්‍රියම්, ශොභාව; පුෂ්ණාති, පුෂ්ට කරන්නේයි; වාඞ්මයම්, සියලු මේ අලඞ්කාරසමූහයතෙම; ස්වභාවොක්තිඃ, නිර්දිෂ්ටලක්ෂණ වූ ස්වභාවොක්තියැ; වක්‍රොක්තිශ්චෙති, වක්‍රොක්තියයිද; ද්විධා භින්නම්, දෙපරිද්දෙකින් භෙදයට යන්නේයි.

364 ප්‍රබන්ධවිෂයම්, ගද්‍ය පද්‍ය මිශ්‍රාත්මක වූ කාව්‍යසමුදය ගොචර කොට ඇති; ගුණම්, ගුණය; භාවිකත්වමිති, භාවිකත්වයයි; ප්‍රාහුඃ, කියත්; එහි ලා; යඃ, යමෙක් තෙම; කාව්‍යෙෂු, ප්‍රබන්ධයෙහි ලා; ආ සිද්ධි, ආදියෙහි පටන් බන්ධවිෂයවූ සමාප්තිය අවධිකොට; සංස්ථිතඃ, සිටියේද; ස කවෙරභිප්‍රායඃ, ඒ ප්‍රබන්ධප්‍රයොගකර්තෘහුගේ අභිප්‍රාය තෙම; භාවඃ, භාවනම් වන්නේයි.

---

* තද්භාවික—ක.

† මේ ශ්ලොකය හා සන්නයසිංහල පොත්හි නොපැනේ.

365 පරස්පරොපකාරිත්‍වං සර්‍වෙෂාං වස්තුපර්‍වණාම්
විශෙෂණානාං ව්‍යර්‍ථානාමක්‍රියා ස්‍ථානවර්‍ණනා.

366 ව්‍යක්තිරුක්තික්‍රමබලාද්ගම්භීරස්‍යාපි වස්තුනඃ
භාවායත්තමිදං සර්‍වමිති තද්භාවිකං විදුඃ.

367 යච්ච සන්‍ධ්‍යඞ්ගවෘත්ත්‍යඞ්ගලක්‍ෂණාද්‍යාගමාන්තරෙ
ව්‍යාවර්‍ණිතමිදං චෙෂ්ටමලඞ්කාරතයෛව නඃ.

## භා වි ක ම්.

368 පන්‍ථාස්ස එෂ විවෘතඃ පරිමාණවෘත්ත්‍යා
සංහෘත්‍ය විස්තරමනන්තමලඞ්ක්‍රියාණාම්
වාචාමතීත්‍ය විෂයං පරිවර්‍තමානා-
නභ්‍යාස එව විවරීතුමලං විශෙෂාන්.

ඉත්‍යාචාර්‍යදණ්ඩිනඃ කෘතෞ කාව්‍යාදර්‍ශේ’ර්‍ථාලඞ්කාර
විභාගො නාම ද්විතීයඃ පරිච්ඡෙදඃ.

---

365 සර්‍වෙෂාම්, සියලු; වස්තුපර්‍වණාම්, ප්‍රබන්‍ධාර්‍ථයාගේ අවයවවූ නගරවර්‍ණනාදීන්ගේ; පරස්පරොප කාරිත්‍වම්, ඔවුනොවුන්ට උපකාරිබව ය; ව්‍යර්‍ථානාම්, නිරර්‍ථකවූ; විශෙෂණානාම්, විශෙෂණයන්ගේ; අක්‍රියා, නොකිරීමය; ස්‍ථානවර්‍ණනා, ස්‍ථානයෙහි ස්ත්‍රීආදීන්ගේ වර්‍ණනාය.

366 උක්තික්‍රමබලාත්, උක්තිප්‍රකාශශක්තියෙන්; ගම්භීරස්‍යාපි, නොදතහැක්කාවූද; වස්තුනඃ, අර්‍ථයාගේ; ව්‍යක්තිඃ, සුවසේ දතහැකි නියාව කිරීමය යන; ඉදම් සර්‍වම්, මේ සියල්ල; භාවායත්තමිති, භාවප්‍රතිබද්ධයයි; තත්, ඒ අනන්තරොක්තවූ සියල්ල; භාවිකං විදුඃ, භාවිකයයි දනිත්.

367 ආගමාන්තරෙ, අන්‍යශාස්ත්‍රයෙහි ලා හෙවත් භරතාදීයෙහි ලා; ව්‍යාවර්‍ණිතම්, වර්‍ණනා කරනලද; යච්ච සන්‍ධ්‍යඞ්ගවෘත්ත්‍යඞ්ගලක්‍ෂණාදි, යම් සන්‍ධ්‍යඞ්ග වෘත්ත්‍යඞ්ග යන මොවුන්ගේ ලක්‍ෂණාදියෙක් ඇද්ද; ඉදංච, මෙද; නඃ, අපට; අලඞ්කාරතයෛව; අලඞ්කාරබැවින්ම; ඉෂ්ටම්, අභිමතයි.

368 අලඞ්ක්‍රියාණාම්, අලඞ්කාරයන් සම්බන්‍ධිවූ; අනන්තම්, අවසානයක් නැති; විස්තරම්, ප්‍රපඤ්චය; සංක්‍ෂිප්‍ය, හකුළුවා; පරිමාණවෘත්ත්‍යා, ප්‍රමාණවෘත්තියෙන් හෙවත් පන්තිස් අලඞ්කාරයෙකින් යුක්තකොට; ස එෂ පන්‍ථාඃ, ඒ මේ ලක්‍ෂ්‍ය ලක්‍ෂණ විකල්පස්වරූපවූ මාර්‍ගය තෙම; විවෘතඃ, ප්‍රකාශ කරනලදැ; වාචාම්, වචනයන්ගේ; විෂයම්, ගොචරය; අතී

1 අව්‍යපේතව්‍යපේතාත්මා ව්‍යාවෘත්තිර්වර්ණසංහතේඃ
යමකං තච්ච පාදානාමාදිමධ්‍යාන්තගෝචරම්.

2 එකද්විත්‍රිචතුෂ්පාදයමකානාං විකල්පනාඃ
ආදිමධ්‍යාන්තමධ්‍යාන්තමධ්‍යාද්‍යාද්‍යන්තසර්වතඃ.

3 අත්‍යන්තබහවස්තේෂාං භේදාස්සම්භේදයෝනයඃ
සුකරා දුෂ්කරාශ්චෛව දර්ශ්‍යන්තේ තත්‍ර කේචන.

---

ත්‍ය, ඉක්ම; පරිවර්තීමානාන්, පවත්නාවූ; විශේෂාන්, අනුක්තවූ අලඞ්කාරවිශේෂයන්; විවරීතුම්, ප්‍රයෝගද්වාරයෙන් ප්‍රකාශකරන්නට; අභ්‍යාස එව, උක්තලක්ෂණවූ අලඞ්කාරයන් අනුව පවත්නාවූ කාව්‍යාභියෝගය මැ; අලම්, සමර්ථයි.

1 වර්ණසංහතේඃ, ස්වරව්‍යඤ්ජනවර්ණසමුදායයාගේ; අව්‍යපේතව්‍යපේතාත්මා, අන්‍යවර්ණයෙකින් අව්‍යවහිතස්වරූපවූද ව්‍යවහිතස්වරූපවූද; ව්‍යාවෘත්තිඃ, පුනරුච්චාරණය; යමකම්, යමකනම් වන්නේය; (වර්ණාන්තරයෙකින් අව්‍යවහිතවූ වර්ණසමුදායාවෘත්තිතොමෝ අව්‍යපේතයමකනම් වෙයි. වර්ණාන්තරයෙකින් ව්‍යවහිතවූ වර්ණාවෘත්ති තොමෝ ව්‍යපේත යමක නම් වන්නේයයිද යමක ද්විප්‍රකාරවෙයි යනු අර්ථයි) තච්ච, ඒ ද්විප්‍රකාරවූ යමකද; පාදානාම්, ශ්ලෝකාවයවවූ සතරපාදයන්ගේ; ආදිමධ්‍යාන්තගෝචරම්, ආදිය මධ්‍යය අන්තය යන මෙතෙක්තැන් විෂය කොටඇත්තේයි.

2 ආදිමධ්‍යාන්ත, පාදයන්ගේ ආදිය මධ්‍යය අන්තය යන මෙහිද; මධ්‍යාන්ත, ආදිය හැර මධ්‍යය හා අන්තයෙහිද; මධ්‍යාදි, අන්තය හැර මධ්‍යය හා ආදියෙහිද; ආද්‍යන්ත, මධ්‍යය හැර අන්තය හා ආදියෙහිද; සර්වතඃ, ආදි මධ්‍ය අන්ත යන සියල්ලෙහිදැයි මෙසේ; එකද්විත්‍රිචතුෂ්පාදයමකානාම්, එක්පාදයමකය ද්විපාදයමකය ත්‍රිපාදයමකය චතුෂ්පාදයමකයයි යන මොවුන්ගේ; විකල්පනාඃ, භේදයෝ වන්නාහුයි.

3 තේෂාම්, ඒ යමකවිකල්පයන්ගේ; සම්භේදයෝනයඃ, මිශ්‍රත්වය උත්පත්තිකොට ඇති; සුකරාඃ, සුවසේ කටහැකිවූද; දුෂ්කරාශ්චෛව, සුවසේ නොකට හැකිවූද; භේදාඃ, ප්‍රකාරයෝ; අත්‍යන්තබහවඃ, ඉතා බහුලයහ; තත්‍ර, ඒ සුකරදුෂ්කරයන්කෙරෙහි ලා; කේචන, කීසි භේදකෙනෙක්; දර්ශ්‍යන්තේ, දක්වනුලැබෙත්.

4 **මානෙන මානෙන** සඛි ප්‍රණයෝ'භූත් ප්‍රියෙ ජනෙ
වඤ්චිතා * කණ්ඨමාශ්ලිෂ්‍ය තමෙව කුරු සත්‍රපම්.

5 මේඝනාදෙන හංසානාං **මදනෝ මදනෝදිනා**
නුන්නමානං මනඃ ස්ත්‍රීණං සහ රත්‍යා විගාහතෙ,

6 රාජන්වත්‍යඃ ප්‍රජා ජාතා භවන්තම්ප්‍රාප්‍ය සම්ප්‍රති †
**චතුරං චතුර**ම්භෝධිරශනෝර්වීකරග්‍රහෙ.

7 අරණ්‍යං කෛශ්චිදාක්‍රාන්තමන්‍යෛස්සද්ම ‡ දිවෞකසාම්
පදාතිරථනාගාශ්වර**හිතෛරහිතෛ**ස්තව.

---

4 සඛි, යෙහෙළිය; ප්‍රියෙ ජනෙ, ප්‍රියවූ ජනයා කෙරෙහි; අනෙන මානෙන, මේ මානය හා එක්ව; ප්‍රණයඃ, පර්චය තෙම; මා'භූත්, නොනමින් වේවා; මානය නොවේවයි සේයි; වඤ්චිතා, වඤ්චිතවූවා; කණ්ඨම්, කණ්ඨය; ආශ්ලිෂ්‍ය, වැළඳ; තමෙව, ඔහුම; සත්‍රපම් කුරු, ලජ්ජාසහිතවූවහු කර.

මේ ප්‍රථමපාදාදි යමක නම්.

5 මදනඃ, අනඞ්ගතෙම; හංසානාම්, හංසයන්ගේ; මදනොදිනා, මද දුරුකරන්නාවූ; මෙඝනාදෙන, මෙඝධ්වනියෙන්; නුන්න, දුරුකරනලද; මානම්, මන් ඇති; ස්ත්‍රීණාං මනඃ, ස්ත්‍රීන්ගේ සිතට; රත්‍යා සහ, තමාගේ ප්‍රියාව හා එක්ව; විගාහතෙ, බස්නේයි.

මේ ද්විතීයපාදාදි යමක නම්.

6 චතුරම්භොධිරසනා, සතර සාගරයම මෙඛලා කොට ඇති; උර්වී, පෘථිවියගේ; කරග්‍රහෙ, පාණිග්‍රහයෙහි දෙ හෝ නොහොත් කරවූවර ගැන්මෙහි; චතුරම්, භව්‍යවූ; භවන්තම්ප්‍රාප්‍ය, තොප කරා පැමිණ; ප්‍රජාඃ, සත්වයෝ; සම්ප්‍රති, දැන්; රාජන්වත්‍යො ජාතාඃ, සෞරාජ්‍යය ගෙනතුකොට ගෙන; රාජන්වති වූහු.

මේ තෘතීයපාදාදි යමක නම්.

7 පදාතිරථනාගාශ්වරහිතෛඃ, පදාති සඟ රථයන හස්තියන අශ්වයන යන මොවුන් විසින් වර්ජිතවූ; තව, තාගේ; කෛශ්චිත් අහිතෛඃ, කිසි සතුරුකෙනකුන්විසින්; අරණ්‍යම් ආක්‍රාන්තම්, වල් වඩනාලද; අන්‍යෛඃ, සෙසු ශත්‍රුන්විසින්; දිවෞකසාම් සද්ම, දිව්‍යලොකශතකම; ආක්‍රාන්තම්, නැඟෙනලදී.

මේ චතුර්ථපාදාදි යමක නම්.

---

* ඛණ්ඩිතා—ක. † සත්පතිම්—ක. ‡ කෛශ්චිත් සද්ම—ක.

8 මධුරං මධුරම්භොජවදනෙ වද නෙත්‍රයොඃ
විභ්‍රමං භ්‍රමරභ්‍රාන්ත්‍යා විඩම්බයති කිං නු තෙ.

9 වාරණො වා රණොද්දාමො හයො වා ස්මර දුර්ධරඃ *
න යතො නයතො'නයං නස්තදහො වික්‍රමස්තව.

10 රාජිතෛරාජි ශෞටීර්‍ය්‍යෙණ † ජීයතෙ ත්වාදෘශෛශ්වරෛඃ
නීයතෙ ච පුනස්තෘප්තිං වසුධා වසුධාරයා.

11 කරොති සහකාරස්‍ය කලිකොත්කලිකොත්තරම්
මන්මනො මන්මනො'ප්‍යෙෂ මත්තකොකිලනිස්වනඃ.

---

8 අම්භොජවදනෙ, පද්මයට බඳුවූ මුඛඇති තැනැත්තිය; මධුඃ, වස න්තයතෙම; තෙ, තීගේ; මධුරම්, මධුරවූ; නෙත්‍රයොර්විභ්‍රමම්, ලොචනවයා ගේ විභ්‍රමය; භ්‍රමරභ්‍රාන්ත්‍යා, භෘඞ්ගයන්ගේ බැම්මෙන්; විඩම්බයති, වෙ ලපන්නේය; කිංනු, මේ කිම්ද; වද, කීය.

මේ ප්‍රථමද්විතීයපාදාදි යමක නාම්.

9 ස්මර, අනඞ්ගය; යතඃ, යම් හෙයකින්; නඃ, අප; අනයම්, විනාශ යට; නයතඃ, පමුණුවන්නාවූ; තව, තාගේ; රණොද්දාමඃ, යුධයෙහි උම්ම ත්තවූ; වාරණො වා, හස්තියෙක් හෝ; දුර්ධරඃ, නොවැලැක්විය හැකි; හයො වා, අශ්වයෙක් හෝ; න, නැත්ද; තත්, එහෙයින්; තවවික්‍රමඃ, තාගේ වික්‍රමය; අහො, ආශ්චර්ය්‍යයි.

මේ ප්‍රථමතෘතීයපාදාදි යමක නාම්.

10 ආජි, යුධයෙහි; ශෞටීර්‍ය්‍යෙණ, ශෞර්ය්‍යයෙන්; රාජිතෛඃ, දිලි යෙන්නාවූ; ත්වාදෘශෙශ්වරෛඃ, තබඳු රජදරුවන්විසින්; වසුධා, පෘථිවි තොමෝ; ජීයතෙ, දිනනු ලබන්නීය; පුනඃ, නැවත; වසුධාරයා, ධනප්‍ර බන්ධය හෙතුකොට ගෙන; තෘප්තිං නීයතෙ, තෘප්තියට පමුණුවනු ලැබේ.

මේ ප්‍රථමචතුර්ථපාදාදි යමක නාම්.

11 සහකාරස්‍ය, චූතවෘක්ෂයාගේ; කලිකා, මඤ්ජරිද; මන්මනඃ, මධුරවූ; එෂ මත්තකොකිලනිස්වනොපි, මේ මත්තකොකිලයාගේ ස්වරයද; මත් මනඃ, මාගේ සිත; උත්කලිකොත්තරම්, උත්කණ්ඨාව අධිකකොට ඇත් තා; කරොති, කෙරේ.

මේ ද්විතීයතෘතීයපාදාදි යමක නාම්.

---

* දුර්ධීරඃ-ක. † ශෞණ්ඩීර්‍ය්‍යෙණ-ක.

12 කථං ත්වදුපලම්භාශා විහතාවිහ තාදෘශී
අවස්ථා නාලමාරොඪුමඞ්ගනාමඞ්ගනාශිනී.

13 නිගෘහ්‍ය නෙත්‍රෙ කර්ෂන්ති බාලපල්ලවශොභිනා
තරුණා තරුණාන් කෘෂ්ටානලිනො නලිනොන්මුඛාඃ

14 විශද විශදමත්ත සාරසෙ සාරසෙ ජලෙ
කුරුතෙ කුරුතෙනෙයං හංසී මාමන්තකාමිෂම්.

15 විෂමං විෂමන්වෙති මදනං මදනාදනඃ
සහෙන්දුකලයාපොඪමලයා මලයානිලඃ

---

12 ඉහ, මේ ජගත්හි ලා; ත්වදුපලම්භාශාවිහතෙ, තාගේ සමාගමා ශාවිනාශයෙහි ලා; අඞ්ගනාශිනී, ශරීරවිනාශය කරන්නාවූ; තාදෘශී අවස්ථා, එබඳුවූ අවස්ථාතොමෝ; අඞ්ගනාම්, ස්ත්‍රිය කරා; ආරොඪුම්, නැඟෙන්නට හෙවත් පැමිණෙන්නට; කථම් නාලම්, කෙසේ සමර්ථ නොවන්නීද.

තාදෘශීම් යන පාඨයෙකුදු ඇත. එහි ලා "තාදෘශීම්"යනු "අඞ්ගනාම්" යනු බලා විශෙෂණ කොට කියනු.

මේ විතීයචතුර්පාදාදී යමක නම්.

13 බාලපල්ලවශොභිනා, ළපලුපතින් හොබනාවූ; තරුණ, වෘක්ෂයා විසින්: නෙත්‍රෙ, ලොචනයන්; නිගෘහ්‍ය, ගෙන; කෘෂ්ටාන්, අදනාලද; තරුණන්, ළදරුවන්; නලිනොන්මුඛාඃ, පද්මයෙහි යොමුවූ හෙවත් ප්‍රවෘත්තවූ: අලිනඃ, භෘඞ්ගයෝ; නෙත්‍රෙ නිගෘහ්‍ය, නෙත්‍රමයෙන් ගෙන; කර්ෂන්ති, අදිත්. තරුණියෝ උභයදෘෂ්ටියෙන් ව්‍යාකුලයෝයයි යේයි.

මේ තෘතීයචතුර්පාදාදී යමක නම්.

14 විශද, ධවලවූ; ඉයං හංසී, මේ හංසීතොමෝ; විශත්, වදනාවූ; අමත්ත, මත්වූ; සාරසෙ, විල්ලිහිණියන් ඇති; සාරසෙ ජලෙ, සරස්හි ප්‍රතිබද්ධවූ ජලයෙහි ලා; කුරුතෙන, කුත්සිතවූ නාදයෙන්; මාම්, මා; අන්තකාමිෂම්, යමයාට ආහාර වූවකු; කුරුතෙ, කෙරේ.

මෙහි හංසනාදය මධුර වුවද "කුරුතෙන"යනු විරහිජනාපෙක්ෂායෙනැයි දතයුතු

මේ ප්‍රථමද්විතීයතෘතීයපාදාදි යමක නම්.

15 මදනාදනඃ, මට සනෙතාෂයක් නොකරන්නාවූ; මලයානිලඃ, දක්ෂිණ මාරුතයතෙම; අපොඪමලයා, දුරුකරනලද කලඞ්ක ඇති හෙවත් නිර්මලවූ; ඉන්දුකලයා සහ, චන්ද්‍රලෙඛාව හා එක්ව; විෂමං විෂම්, (අශුභසකබැවින්) විෂම විෂවූ; මදනම්, අනඞ්ගයා; අන්වෙති, අනුවන්නේයි.

මේ ප්‍රථමවිතීයචතුර්පාදාදී යමක නම්.

16 මානිනි මා නිනීෂුස්තෙ නිශ්ශඞ්කශ්චිත්තමනඞ්ග මෙ
හාරිණී හාරිණී ශර්ම තනුතාං තනුතාං යතඃ.

17 ජයතා ත්වන්මුඛෙනාස්මානකථං න කථං ජිතම්
කමලං කමලං කුර්වද්දලිමද්දලි මත්ප්‍රියෙ.

18 රමණී රමණීයා මෙ පාටලා පාටලාංශුකා
වාරුණීවාරුණීභූතසෞරභා සෞරභාස්පදම්.

19 ඉති පාදාදියමකමව්‍යපෙතං විකල්පිතම්
ව්‍යපෙතස්‍යාපි වර්ණ්‍යන්තෙ විකල්පාස්තස්‍ය කෙචන.

---

16 අනඞ්ග, මන්මථය; මා, මා: තෙ නිශ්ශඞ්කස්වම්, තට නිසැවුරු බවට; නිනීෂුඃ, පැමිණීයපිවූ; හාරිණී, මුක්තාහාර ඇත්තාවූ; හාරිණී, මනොහර වූ; මානිනි, මන්ඇති ස්ත්‍රීතොමෝ; තනුතාම්, කෘශබවට; යතඃ, යන්නාවූ; මෙ, මට; ශර්ම, ශාන්තියක් හෙවත් සමාගමසුඛයක්; තනුතාම්, කෙරේවා.

අනඞ්ගස්වාමිය පැහැද තෝම මට නියොග කොට වශත කරන්නට සමර්ථයෙහි යනු භාවයි.

මේ ප්‍රථමතෘතීයචතුර්ථපාදාදි යමක නම්.

17 මත්ප්‍රියෙ, මාගේ ප්‍රියාව; අස්මාන්, (බුබර වූ) අප; ජයතා, දිනන්නාවූ හෙවත් වශග කරන්නාවූ; ත්වන්මුඛෙන, තීගේ මුඛයවිසින්; කම්, ජලය; අලංකුර්වන්, හොබවන්නාවූ; අලිමත්, භෘඞ්ගයන් ඇත්තාවූ; දලි, ප්‍රශස්තවූ පත්‍ර ඇති හෙවත් ප්‍රබුද්ධ වූ; කමලම්, පද්මයතෙම; අකථම්, වචනයක් නැත්තේම; කථං න ජිතම්, කෙසේ නොදිනනලද්ද; දිනනලදමැයි සේයි—මෙහි කමලයෙන් මුඛය උපමිතයි.

මේ ද්විතීයතෘතීයචතුර්ථපාදාදි යමක නම්.

18 පාටලා, පලොල් මල්සේ; පාටල, සුදුරත්වූ; අංශුකා, වස්ත්‍ර ඇත්තාවූ; සෞරභාස්පදම්, සුගන්ධයට පිහිටවූ; මෙ, මාගේ; රමණී, ප්‍රියාතොමෝ; අරුණීභූත, රත්වගිය; සෞරභා, සූර්‍ය්‍යරශ්මි ඇති; වාරුණීව, පශ්චිම දිග මෙන්; රමණීයා, මනොඥයි.

මේ පාදචතුෂ්ටයාදි යමක නම්.

19 ඉති, මේ උක්තප්‍රකාරයෙන්; අව්‍යපෙතම්, අව්‍යවහිත වූ; පාදාදි යමකම්, පාදාදියමකතෙම; විකල්පිතම්, නොයෙක් ප්‍රකාරයෙන් විස්තර කරනලද; තස්‍ය ව්‍යපෙතස්‍යාපි, ඒ ව්‍යපෙතයමකයාගේද; කෙචන විකල්පාඃ, කිසි භෙදකෙනෙක්; වර්ණ්‍යන්තෙ, කියනුලැබෙත්.

20 **මධුරෙණදෘශාං** මානං **මධුරෙණ** සුගන්ධිනා
**සහකාරො**ද්ගමෙනෛව ශබ්දශෙෂං කරිෂ්‍යති.

21 **කරො'ති**තාම්‍රො රාමාණාං තන්ත්‍රීතාඩනවිභ්‍රමම්
**කරොති සෙර්ෂ්‍යං** කාන්තෙ ච ශ්‍රවණොත්පලතාඩනම්.

22 සකලාපොල්ලසනයා කලාපින්‍යානු නෘත්‍යතෙ
මෙඝාලී නර්තිතා වාතෛස්සකලාපො විමුඤ්චති.

23 ස්වයමෙව ගලන්මානකලි **කාමිනි** තෙ මනඃ
**කලිකාම**ථ * නීපස්‍ය දෘෂ්ට්වා කාං නු † ස්පෘශෙද්දශාම්.

---

20 මධුඃ, වසන්තතෙම; එණදෘශාම්, මුවලැසියන්ගේ; මානම්, මන් නොහොත් ප්‍රියජනයාකෙරෙහි විමුඛත්වය; මධුරෙණ සුගන්ධිනා, මනොහර වූ සෞරභ්‍යයෙන් උපලක්ෂිත වූ; සහකාරොද්ගමෙනෛව, චූතාඞ්කුරයක් කරණකොට ගෙන ම; ශබ්දශෙෂම්, කථාවශෙෂ වූවා හෙවත් නැත්තා; කරිෂ්‍යති, කරන්නේයි.

මේතෙම ප්‍රථමද්විතීයපාදාදිවර්ත්ති වූ ව්‍යපෙත යමක නමි.

21 රාමාණාම්, අඟනන්ගේ; අතිතාම්‍රඃ, ඉතා රත්වූ; කරඃ, හස්තය තෙම; තන්ත්‍රීතාඩනවිභ්‍රමම්; වීණාරජ්ජුවාදනලීලාව හෝ; සෙර්ෂ්‍යම්, අසූයාසහිත වැ; කාන්තෙත, වල්ලභයාකෙරෙහි; ශ්‍රවණොත්පලතාඩනං වා, කර්ණාවතංශයෙන් ප්‍රහාරය හෝ; කරොති, කරන්නේයි.

ස්ත්‍රීන්ගේ පාණියට මේ ක්‍රියාදෙක මුත් උචිතක්‍රියාවක් නැතැයි යනු භාවයි.

මෙතෙම ප්‍රථමතෘතීයපාදාදිවිෂය වූ ව්‍යපෙත යමක නමි.

22 වාතෛඃ, පවනින්; නර්තිතා, නටනලද; මෙඝාලී, මෙඝමාලා තොමෝ; සකලාපඃ, සියලු ජලයන්; විමුඤ්චති, හරනීය; සකලාපොල්ලසනයා, බර්හිභාරයාගේ නැඟීම් සහිත වූ; කලාපින්‍යා, මයූරස්ත්‍රියවිසින්; අනු නෘත්‍යතෙ, වෘෂ්ට්‍යනන්තර වැ නැටීමයි.

මේ ප්‍රථමචතුර්ථපාදාදිවිෂය වූ ව්‍යපෙත යමක නමි.]

23 කාමිනි, කාමිනිය; තෙ මනඃ, තීගේ සිත; ස්වයමෙව, තෙමේම; ගලන්මානකලි, ගිළිහෙන්නාවූ මානවිග්‍රහ ඇත්තේය; අථ, නැවත; නීපස්‍ය, නීප වෘක්ෂයාගේ; කලිකාම්, මජරිය; දෘෂ්ට්වා, දැක; කාං දශාම්, කවර අවස්ථාවක්; ස්පෘශෙන්නු, ස්පර්ශ කෙරේ දෝ හෝ– නීපනම් බක්මයි.

මේ ද්විතීයතෘතීයපාදාදිවිෂය වූ ව්‍යපෙත යමක නමි.

---

* කලිකාමිහ-ඝ. † කාං න-ඝ.

24 ආරුහ්‍යාක්‍රීඩශෛලස්‍ය **චන්ද්‍රකාන්ත**ස්ථලීමිමාම්
නෘත්‍යත්‍යේෂ ලසච්චාරු**චන්ද්‍රකාන්**තශිඛාවලඃ.

25 උද්ධෘතා * රාජකාද්‍යාපි ශ්‍රියතේ'ද්‍ය භුජේන තෙ
**වරාහෙ**ණොද්ධෘතා යාසෞ **වරාහෙ**රුපරි ස්ථිතා.

26 **කරෙණ** තෙ රණෙෂ්වන්ත**කරෙණ** ද්විෂතාං හතාඃ
කරෙණවඃ ක්ෂරද්‍රක්තා භාන්ති සන්ධ්‍යාඝනා ඉව.

27 **පරාගත**රුරාජීව වාතෛර්ධ්වස්තා භටෛශ්චමූඃ
**පරාගත**මිව ක්වාපි **පරාගත**මම්බරම්.

28 පාතු වො භගවාන් විෂ්ණුස්**සදා නවඝ**නද්‍යුතිඃ
**ස දා**නවකුලධ්වංසී **සදානව**රදන්තිහා.

---

24 ලසච්චාරුචන්ද්‍රකාන්තඃ, බබළන්නා වූ මනොඥ වූ සඳැස්පිල් කෙළවර ඇති; එෂ ශිඛාවලඃ, මේ මයූරතෙම; ආක්‍රීඩශෛලස්‍ය, ක්‍රීඩා පර්වතය සම්බන්ධවූ; ඉමාං චන්ද්‍රකාන්තස්ථලීම්, මේ සඳකැන්මිණිගොඩට; ආරුහ්‍ය, නැගී; නෘත්‍යති, නටන්නේයි.

මේ ද්විතීයචතුර්ථපාදද්වි ව්‍යපෙත යමක නාම්.

25 යා, යම් පෘථිවියක් තොමෝ; වරාහෙණ, ශූකරවෙෂධාරී වූ විෂ්ණුහු විසින්; උද්ධෘතා, උපුරනලද්ද; වරාහෙඃ, උත්තමසර්පයාගේ හෙවත් අනන්ත නම් නාගරාජයාගේ; උපරි, මත්තෙහි; ස්ථිතා, සිටියාද; අසෞ උර්වී, මේ පෘථිවිතොමෝ; අද්‍ය, දැන්; තෙ භුජේන, තාගේ හස්තය විසින්; රාජකාත්, රාජසමූහයා කෙරෙන්; උද්ධෘතා, උපුරනලද්දී; ශ්‍රියතෙ, උසුලනු ලැබේ; හෙවත් නීත්‍යනුකූල කොට රක්ෂාකරනුලැබේ,

මේ තෘතීයචතුර්ථපාදද්වි ව්‍යපෙත යමක නාම්.

26 රණෙෂු, යුද්ධයෙහි ලා; ද්විෂතාම්, සතුරන්ට; අන්තකරෙණ, විනාශ කරන්නාවූ; තෙ කරෙණ, තාගේ හස්තයෙන්: හතාඃ, පහරන ලද්දාවූ; ක්ෂරද්‍රක්තාඃ, වැහෙන ලෙහෙ ඇත්තාවූ; කරෙණවඃ, හස්තිහු; සන්ධ්‍යාඝනා ඉව, සන්ධ්‍යානුරඤ්ජිතවූ මෙඝයන් මෙන්; භාන්ති, හොබිත්.

මෙ ප්‍රථමද්විතීයතෘතීයපාදද්වි ව්‍යපෙත යමක නාම්.

27 පරා චමූඃ, ශත්‍රුසෙනාතොමෝ; භටෛඃ, ශූරයන්විසින්; වාතෛඃ, පවනින්; අගතරුරාජීව, පර්වතයෙහි වෘක්ෂපඞ්ක්තියක් මෙන්; ධ්වස්තා, නසනලද; පරාග, (සම්රසංඝෂ්ටනයෙන් උපන්) ධූලියෙන්; තතම්, පතළ; අම්බරම්, ආකාශයතොම; ක්වාපි, කොහි දෙ යෝ; පරාගතමිව, පලාගියාක් මෙන් හෙවත් සැඟවුණාක් මෙන් වී.

මේ ප්‍රථමතෘතීයචතුර්ථපාදද්වි ව්‍යපෙත යමක නාම්.

28 නවඝනද්‍යුතිඃ, අළුත් මෙඝයකට බඳුවූ ශොභාඇති; හෙවත් ශ්‍යාමවර්ණ වූ: දානවකුලධ්වංසී, දානවකුලය නසන්නාවූ; සදානා, මද

---

* උද්ධෘතං-ක.

29 **කමලෙ**සසමකෙශෙනනු **කමලෙ**ර්ෂ්‍යාකරං මුඛම්
**කමලෙ**ඛ්‍යං කරොෂි ත්වං **කමලෙ**වොන්මදිෂ්ණුම්.

30 **මුද** රමණමන්විත**මුදරම**ණීභූෂණාඃ
**මද**භ්‍රමදෘශඃ කර්තුං **මද**භ්‍රජඝනාඃ ක්ෂමාඃ.

31 **උදිතෛර**න්‍යපුෂ්ටානා**මාරුතෛ**ර්මේ හතං මනඃ
**උදිතෛර**පි තෙ දූති! **මාරුතෛ**රපි දක්ෂිණෛඃ.

32 **සුරාජිත**හ්‍රියො යූනාං **තනුමධ්‍යා**සතො ස්ත්‍රියඃ
**තනුමධ්‍යාඃ** ක්ෂරත්ස්වෙද**සුරාජිත**මුඛෙන්දවඃ.

---

සහිත වූ; වරදනතිශා, උදාම් දසනින් නසන්නාවූ; ස භගවාන් විෂ්ණුඃ, ඒ භගවත්වූ විෂ්ණුතෙමෙ; වඃ, තොප; සදා, හැමකල්හි; පාතු, රක්ෂා කෙරේවා.

මේ විතීයතෘතීයචතුර්ථපාදාදි ව්‍යපෙත යමක නම්.

29 තෙ, තිගේ; කම්, සිරස; අලෙසසමකෙශම්, භෘඞ්ගයන් හා සදෘශවූ හෙවත් නිල්වූ ඉසකෙහෙ ඇත්තේය; මුඛම්, මුඛයතෙම; කමලෙර්ෂ්‍යාකරම්, පද්මයට ඊර්ෂ්‍යා කරන්නේය; හෙවත් පද්මසදෘශය; කමලෙව, ලක්ෂ්මියට බඳුවූ; ත්වම්, මෙබඳුවූ තෝ; කම්, කවරක්; උන්මදිෂ්ණුම්, උන්මත්ත වන්නවුන් අතුරෙහි; අලෙඛ්‍යං කරොෂි, අගණිතය වූවහු කෙරෙහිද; හි දුටු දුටු යමක්හුම උන්මත්ත කරන්නෙහියයි සේයි.

මේ පාදචතුෂ්ටයාදි ව්‍යපෙත එකජාතීය යමක නම්.

30 උදරමණීභූෂණාඃ, මහඇඟිවූ රත්නාභරණ ඇති; මදභ්‍රමදෘශඃ, (යෞවනාදියෙන්වූ) මදයෙන් බමන ඇස් ඇති; අදභ්‍රජඝනාඃ, මහත්වූ ජඝන ඇති ස්ත්‍රීහු; රමණම්, වල්ලභයා; මුදා, සන්තොෂයෙන්; අන්විතම්, යුක්තවූවහු; කර්තුම්, කරන්නට: ක්ෂමාඃ, පොහොසත් වූ–අත්‍යර්ථයෙන් වල්ලභයන් සතුටු කරන්නාහුයයි සේයි.

මේ පාදචතුෂ්ටයාදි ව්‍යපෙත අනෙකජාතීය වූ යමක නම්.

31 දූති, දූතිය; මෙ මනඃ, මාගේ සිත; අන්‍යපුෂ්ටානාම්, කෝකිල යන්ගේ; උදිතෛඃ, සම්පන්නවූ; ආරුතෛරපි, ස්වරයෙන්ද; තෙ, තිගේ; උදිතෛරපි, වචනයෙන්ද; දක්ෂිණෛර්මාරුතෛරපි, මලය පව නින්ද; හෘතම්, ගන්නාලදි.

මේතෙම ප්‍රථමතෘතීය පාදදෙක්හිද විතීය චතුර්ථපාදදෙක්හිද
ආදියෙහි ව්‍යපෙත යමක නම්.

32 සුරාජිතහ්‍රියඃ, සුරායෙන් දිනනලද ලජ්ජාඇති (අනාත්මවත් වූ); තනුමධ්‍යාඃ, කෘශ වූ මධ්‍යප්‍රදෙශ ඇති; ක්ෂරත්, වැහෙන්නාවූ; ස්වෙද, ශ්‍රමජලයෙන්; සුරාජිත, අත්‍යර්ථයෙන් හොබවනලද; මුඛෙන්දවඃ, මුඛ

33 ඉති ව්‍යපෙතයමකප්‍රභෙදෙ'ප්‍යෙෂ දර්ශිතඃ
අව්‍යපෙතව්‍යපෙතාත්මා ඒකලෙපා'ප්‍යසති තද්‍යථා.

34 **සාලං සාල**ම්බකලිකා**සාලං සාලං** න වීක්ෂිතුම්
**නාලීනාලී**නවකුලා**නාලී නාලී**කිනීරපි.

35 **කාලං කාල**මනාලක්ෂ්‍ය**තාරතාර**කමීක්ෂිතුම්
**තාරතාර**ම්‍යරසිතං **කාලං කාල**මහාඝනම්.

36 **යාම යාම**ත්‍රයාධීනා**යාමයා** මරණං නිශා
**යාමයාම**ධියාස්වාත්මා**යා** ලූයා මපිනෛව සා.

---

චතුයන් ඇති; ස්ත්‍රියඃ, ස්ත්‍රීහු; ශූන මී, ළදරුවන්ගේ; තනූ, ශරීරය; අධ්‍යාසඟත, ගම්භීරාධිකයොගයෙන් පිහිටත්.

මේ ප්‍රථමචතුර්ථියෙහිද ද්විතීයතෘතීයයෙහිද ආදිව්‍යපෙත යමක නමි.

33 ඉති, මේ උක්තප්‍රකාරයෙන්; එෂ ව්‍යපෙතයමකප්‍රභෙදෙපි, ව්‍යපෙත යමකයන්ගේ මේ විකල්පයද; දර්ශිතඃ, දක්වනලද; අව්‍යපෙත ව්‍යපෙතාත්මා, අව්‍යපෙතව්‍යපෙතස්වභාව වූ; ඒකලෙපා'ප්‍යසති, යමක ප්‍රකාරයෙකුදු ඇත; තද්‍යථා, ඒ මෙසේයි.

34 සා අලී, ඒ සෙහෙළිතොමෝ; සාලම්බ, අලම්බසහිත වූ හෙවත් හාත්පසින් ගටගන්නාවූ; කලිකාසාලම්, මජරි ම ප්‍රාකාර කොටඇති; සාලම්, සාලද්‍රැමය; වීක්ෂිතුම්, බලන්නට; නාලම්, සමර්ථ නොවන්නීය; අලිනවකුලාන්, වලඳනාලද මුහුළු මල්ගස්ඇති; අලීන්, භෘඞ්ගයන්ද; වීක්ෂිතුම්, බලන්නට; නාලම්, සමර්ථ නොවන්නීය; අලිකිනීරපි, පද්මිනීන්ද; වීක්ෂිතුම්, බලන්නට; නාලම්, සමර්ථ නොවන්නීයි-කිසි ස්ත්‍රියක් විරහිණී වූ තමාගේ සෙහෙළිය පිණිස මෙසේ කියා.

මෙහි ප්‍රථමද්විතීයයෙහි යමකය අව්‍යවහිතහෙයින් තෘතීය චතුර්ථියෙහි යමක ව්‍යවහිත හෙයින් මෙතෙම අව්‍යපෙතව්‍යපෙත යමක නමි.

35 අනාලක්ෂ්‍ය, නොදක්කහැක්කාවූ; තාර, උජ්වල වූ; තාරකම්, තරුඇති; තාරතා, උච්චෛස්තරත්වයෙන් [illegible] ගම්භීරත්වයෙන්; රම්‍යරසිතම්, මනොහරවූ මෙඝධ්වනිඇති; කාලම්හාඝනම්, කළුවූ මෙඝ ඇති; කාලම්, (විරහිණීජනයා කෙරෙහි) යමයාබඳුවූ; කාලම්, සමය හෙවත් ප්‍රාවෘට්කාලය; ඊක්ෂිතුම්, බලන්නට; කාලම්, කවර ස්ත්‍රියක් සමර්ථද?.

මෙහි ප්‍රථමචතුර්ථියෙහිද ද්විතීයතෘතීයයෙහිද අනෙකජාතිය වූ අව්‍යපෙතව්‍යපෙත යමක නමි.

36 යාමත්‍රයාධීන, තුන්යම පිළිබඳවූ; ආයාමයා, දෛර්ඝ්‍යය ඇති; නිශා, (වර්ෂප්‍රමාණ වූ) රාත්‍රිය කරණකොටගෙන; මරණං යාම, අපි

37 ඉත්‍යාදිපාද * යමකවිකල්පස්‍යෙදෘශී ගතිඃ
එවමෙව විකල්ප්‍යානි යමකානීතරාණ්‍යපි.

38 න ප්‍රපඤ්චභයාද්භෙදාඃ කාර්ත්ස්න්‍යෙනාඛ්‍යාතුමීප්සිතාඃ †
දුෂ්කරාභිමතාඑව දර්ශ්‍යන්තෙ ‡ තත්‍ර කෙචන.

39 ස්ථිරායතෙ! යතෙන්ද්‍රියො න හීයතෙ යතෙර්භවාන්
අමායතෙයතෙ'ප්‍යභූත් සුඛාය තෙ'යතෙ ක්‍ෂයම්.

---

මරණට යම්හ; අපට තාපයෙක් නැත යනු ශෙෂයි. එසෙක්වතු; යාම් අයාම්, යමක කරා පැමිණියෙම්ද; හෙවත් යමක හා සඝනම කෙළෙම්ද; අඝවනීයා, ප්‍රාණයන්ගේ පිවාවට ගියාවූ; සා, ඝෝනොමෝ; අපයා මයා, නුවණ්නැත්තාවූ මාවිසින්; මපිගෙතෙව, නසනලදවැයි-ප්‍රියාවකෙරෙන් විප්‍රයුක්ත වූ කිසි කාමියෙක් ප්‍රියාවට මෙම්සේ කියා ශොක කෙරේ.

මේතෙම පාදචතුෂ්ටයෙහිම එකරූප වූ අව්‍යපෙතව්‍යපෙත වූ ආදි යමක නමි.

37 ඉති, මෙසේ; ආදිපාදයමකවිකල්පස්‍ය, ආදිපාදයමකප්‍රභෙද යාගේ; ඊදෘශී, මෙබඳුවූ; ගතිඃ, ස්වරූපය (දක්වනලද); එවමෙව, මේ ආදිපාද යමකභෙදන්‍යායයෙන් ම; ඉතරාණ්‍යපි යමකානි, මධ්‍යපාද අන්ත පාදවර්ති වූ සෙසු යමකයෝද; විකල්ප්‍යානි, කල්පනා කටයුත්තාහුයි.

38 භෙදාඃ, (සුකර වූ පාදමධ්‍යාන්තභාවි වූ ඒ සියලු යමක) විකල්පයෝ; ප්‍රපඤ්චභයාත්, ග්‍රන්ථවිස්තරබැවින්; කාර්ත්ස්න්‍යෙන, සාකල්‍යයෙන්; ආඛ්‍යාතුම්, කියන්නට; නෙප්සිතාඃ, නොකැමතිවනලදහ; තත්‍ර, ඒ යමකයෙහි ලා; දුෂ්කරාභිමතා එව, දුෂ්කරත්වයෙන් ඉෂ්ටවූ ම; කෙචන, සමහර යමක කෙනෙක්; දර්ශ්‍යන්තෙ, දක්වනු ලැබෙත්.

39 ස්ථිරායතෙ, (අනපායිබැවින්) ස්ථිරවූ උභයලොකාභ්‍යුදයස්වරූප වූ එෂ්‍යත්ඵල ඇත්තව; යතෙන්ද්‍රියඃ, අභ්‍යාසයෙන් වලකනලද චක්ෂුරාදී ඉන්ද්‍රියයන් ඇති; භවාන්, භවත්තෙම; යතෙඃ, තපස්වියකු කෙරෙන්; න හීයතෙ, හීන නොවන්නේය; හෙවත් තපස්වියකු හා සදෘශය; අමායතාපි, වංචාවක් නැත්බැවිද; හෙවත් පරොපකාරීබවද; තෙ, තට; ක්‍ෂයම් අයතෙ, විනාශයකට නොයන්නාවූ; ඉයතෙ, මෙපමණවූ; හෙවත් මහත්වූ; සුඛාය, සුඛපිණිස, අභූත්, වී-භවත්තෙම ගැමිතන් ඝි මැ සම්පන්නයැ කිසිතැනෙකින්ද නොනැවූයේය යනු අදියි.

මේ පාදචතුෂ්ටයමධ්‍යවර්ති වූ එකරූප වූ අව්‍යපෙත යමක නමි. එහෙයින් මැ දුෂ්කරයි.

---

* ඉති පාදාදි-ක. ප, † මීප්සිතාඃ-ක. ‡ වර්ණ්‍යන්තෙ-ක. ප,

40 සභාසු රාජන්නසුරාහතෛර්මුඛෛ-
ර්මහීසුරාණං වසුරාජිතෛස්තුතාඃ
න භාසුරා යාන්ති සුරාන්න තේ ගුණාඃ
ප්‍රජාසු රාගාත්මසු රාශිතාං ගතාඃ.

41 තව ප්‍රියා'සච්චරිතාප්‍රමත්ත! * යා
විභූෂණං ධාර්‍ය්‍යමිහාංශුමත්තයා
රතෝත්සවාමෝදවිශේෂමත්තයා
න මෙ ඵලං කිඤ්චන † කාන්තිමත්තයා.

---

40 රාජන්, රජ; සභාසු, සභායෙහි ලා; මහීසුරාණාම්, බ්‍රාහ්මණ සන්ගේ; නසුරාහතෛඃ, සුරායෙන් දුෂ්ටනොවූ; හෙවත් පවිත්‍රවූ; වසුරාජිතෛඃ, (කැමතිසේ දෙනලද) ධන හෙතුකොටගෙන විකසිතවූ; මුඛෛඃ, මුඛයෙන්; ස්තුතාඃ, වර්ණනාකරන ලද්දාවූ; භාසුරාඃ, බබලන්නාවූ; රාගාත්මසු, අනුරාගස්වභාවවූ හෙවත් අත්‍යන්තරක්තවූ; ප්‍රජාසු, ලෝවැස්සන් කෙරෙහි; රාශිතාම්, රැස්බවට; ගතාඃ, ගියාවූ; තෙ ගුණාඃ, තාගේ (ශෞර්‍ය්‍යාදි) ගුණයෝ; සුරාන්, දෙවතාවන්කරා; න න යාන්ති, නොයන්නෝ නොවෙත්.

තාගේ ගුණයෝ මෙහි සියලු ලොව පැතිර දිව්‍යලොකයෙහිද ප්‍රසිද්ධවූහ යනු භාවයි.

මේ එකරූපවූ ව්‍යපෙතවූ චතුෂ්පාදමධ්‍ය යමක නමි.

41 සච්චරිතාප්‍රමත්ත, සච්චරිතයෙහි නොපමා තැනැත්තව; තව, තාගේ; යා ප්‍රියා, යම් ප්‍රියාවක් ඇද්ද; රතොත්සවාමොද විශෙෂ, සුරතොත්සවයෙන් වන ප්‍රීතිවිශෙෂයෙන්; මත්තයා, මත්වූ; හෙවත් සඤ්ජාතවූ ගර්වඇති; තයා, (තාගේ) ඒ ප්‍රියාවවිසින්; අංශුමත්, ශොභා සම්පන්නවූ; විභූෂණම්, ආභරණය; ධාර්‍ය්‍යම්, ඉසිලිය යුත්තේය; ඉහ, මේ ප්‍රස්තාවයෙහි ලා; මෙ, මාගේ; කාන්තිමත්තයා, ශොභාවත්බව හෙතු කොටගෙන; කිඤ්චන ඵලං න, කිසි ප්‍රයොජනයෙක් නැති.

කිසි ස්ත්‍රියක් සාපරාධවූ වල්ලභයා තමා ප්‍රසාධන විධියෙහි යොදන් නහුට කුපිතව මෙසේ කීව.

මේ එකරූපවූ ව්‍යපෙතවූ පාදචතුෂ්ටයාන්ත යමක නමි.

---

* සච්චරිතප්‍රමත්ත-ක. † ප්‍රයොජනං නාස්ති ශි-ක.

42 භවාදෘශා නාථ! න ජානතෙ නතෙ
රසං විරුද්ධෙ ඛලු සන්නතෙනතෙ
ය එව දීනාශ් ශිරසා නතෙන තෙ
චරන්ත්‍යලං දෛන්‍යරසෙන තෙන තෙ.

43 ලීලාස්මිතෙන ශුචිනා මෘදුනොදිතෙන
ව්‍යාලොකිතෙන ලඝුනා ගුරුණා ගතෙන
ව්‍යාජෘම්භිතෙන ජඝනෙන ච දර්ශිතෙන
සා හන්ති තෙන ගලිතං මම ජීවිතෙන.

44 ශ්‍රීමානමානමරවර්ත්මසමානමාන
මාත්මානමානතජගත්ප්‍රථමානමානම්
භූමානමානත * යස්ස්ථිතිමානමාන
නාමානමානම තමප්‍රතිමානමානම්.

---

42 නාථ, ස්වාමිය; සන්නතෙනතෙ, සන්නතා ඉනතා දෙන්න (දුඃඛිතභාවය ස්වාමිභාවය යන දෙන්න); විරුද්ධෙඛලු, සම්භෙයකින් පරස්පර ව්‍යාහතයෝද එහෙයින්; භවාදෘශාඃ, තොපවැන්නෝ; නතෙ රසම්, ප්‍රණාමයෙහි රසය; න ජානතෙ, නොදනිත්; (පරප්‍රණාම නොකරන්නා හයි සේයි.) යෙ, යම්කිසිකෙනෙක්; දීනාඃ, දුඃඛිතයෝද; ත එව, ඔව්හු ම; තෙ, (ස්වාමිවූ) තට; නතෙන, නැමුණු; ශිරසා, හිසින්; තෙනදෛන්‍ය රසෙන, ඒ ප්‍රභෝතාවූ කාර්පණ්‍යරසයෙන් (උපලක්ෂිතවූවාහු); අලම්, අත්‍යර්ථයෙන්; චරන්ති, ඇවිදිත්.

ඉසුරු තැනැත්තේ තෙමේ කිසි තැනෙක්හි ප්‍රණාම නොකරන්නේය; දරිද්‍රයා හැමතන්හි ප්‍රණාමය කරන්නේය යනු පිණ්ඩාර්ථයි.

මේ එකරූපවූ අව්‍යපෙතාත්මවූ චතුෂ්පාදාන්ත යමක නම්.

43 සා, ඒ ස්ත්‍රීතොමෝ; ශුචිනා, විශදවූ; ලීලාස්මිතෙන, විලාසහාස යෙන්ද; මෘදුනා, මොළොක්වූ; උදිතෙන, වචනයෙන්ද; ලඝුනා, ලඝුවූ; ව්‍යාලොකිතෙන, බැල්මෙන්ද; ගුරුණා, මන්ථරවූ; ගතෙන, ගමනින්ද; ව්‍යාජෘම්භිතෙන, විසතිණිණවූ; දර්ශිතෙන, දක්වනලද; ජඝනෙනච, නිතම්බයෙන්ද; හන්ති, පහරනීය; තෙන, ඒ ප්‍රහාරය හෙතුකොට ගෙන; මම ජීවිතෙන, මාගේ ප්‍රාණයාවිසින්; ගලිතම්, හීමයි–සා හන්ති, හන්ත යන පාඨයෙහි හන්ත යනු විශාදයෙහියි.

මේ එකරූපවූ ව්‍යපෙතවූ චතුෂ්පාදමධ්‍යාන්ත යමක නම්.

44 ශ්‍රීමාන්, ශ්‍රීමත්වූ; අමාන්, සර්වයබැවින් එකතැනකද නොහැසි රෙන්නාවූ; ස්ථිතිමාන්, නිත්‍යහෙයින් ස්ථිතිමත්වූ; යඃ, යමෙක්තෙම; ආත්මානම්, ස්වභාවය; භූමානම්, විශ්වරූපබැවින් බොහෝබවට; ආන

---

* මාතමත-ක.

**45 සාරයන්තාමුරසා රමයන්තී සාරභූතමුරුසාරධරා තම**
**සාරසානුකෘතසාරසකාඤ්චි සා රසායනමසාරමවෛති.**

**46 නයානයාලොචනයා'නයා'නයා**
**නයානයාන්ධාන් විනයානයායතෙ**
**න යානයාසීජ්ජින * යානයානයා**
**න යානයාසන්තාන් ජනයානයාශ්‍රිතාන්.**

---

යත, පැමිණෙවිද; අමරවත්මසමාන, ආකාශය හා සදෘශවූ; මානම්, ප්‍රමාණඇති හෙවත් ආකාශය සේ අනන්තවූ; ආනතජගත්, භක්තිමත්වූ ලොකයා කෙරෙහි; ප්‍රථමානමානම්, පැලඹෙන්නාවූ පූජාඇති හෙවත් ජගත්පූජ්‍යවූ; නොහොත් අවනත ජගත්හු කෙරෙහි පහලවන අනුග්‍රහ ඇති; අමානනාමානම්, සර්වඥබැවින් අපරිමිතවූ නම්ඇති; අප්‍රතිමානමානම්, අසදෘශවූ අභ්‍යුන්නතයි ඇති; තම්, ඒ ජිනේශ්වරයානු; ආනම, වඳු.

මේ ඒකරූපවූ අව්‍යපෙත ව්‍යපෙතාත්මකවූ
චතුෂ්පාද මධ්‍යාන්ත යමක නම්.

45 උරුසාරධරා, ආභරණකරනලද ස්වර්ණම ධරන්නාවූ; සාරස, කිල්ලිහිණියන් විසින්; අනුකෘත, අනුකරනලද; සාරස, හඬ සහිතවූ; කාඤ්චි, මෙවුල්දම් ඇත්තාවූ; සා, ඒ ස්ත්‍රීතොමෝ; සාරයන්තම්, රස සිත් පමුණුවන්නාවූ; සාරභූතං, සාරවූ; හෙවත් මේතෙමේම ලොක යෙහි සාරයයි ගන්නුලබන්නාවූ; තම්, ඔහු; උරසා, වක්ෂසින් හෙවත් පයොධර භාරයෙන්; (ආලිඞ්ගනය කෙරෙමින්); රමයන්ති, ඇලවන්නී; රසායනම්, අජනාදි සුඛයෝගය පවා; අසාරම්, සාරනොවූවා; අවෛති, දනී. †

මේ ඒකස්වරූපවූ ව්‍යවහිතවූ චතුෂ්පාදදී මධ්‍යසමක නම්.

46 හෙඅනයායතෙ, ස්ථිරවූ අභ්‍යුදය ඇත්තව; අනයාන්, ත්‍රිවර්ගානු බන්ධිවූ නීති නැති පුරුෂයන් එහෙයින්ම; අයානයාන්ධාන්, ප්‍රාප්තවූ උපායාන හිඳබැවින් අභිමත ඵලානයනයෙහි අශක්තවූවන්; අනයා නයානයාලොචනයා, මේ අපරොක්ෂවූ නයානය විචාරණයෙන්; විනය, හික්මව හෙවත් අභිමතවූ ඵලයෙහි සමර්ථවූවන් කර; යාන්, යම් කෙනෙකුන් කරා; නඅයාසීඃ, නොපැමිණියෙහිද; තානයාන්, ඒ හිංසොප ද්‍රෙශයන්; ජිනයානයාඃ, තථාගතාගම අනුවූයෙහි; අයානයාඃ, යාත්‍රාපරි ක්ලෙශයට නොයන්නෙහි හෙවත් කිසි මාර්ගාන්තරයකට නොගොසින් ව්‍යවස්ථිතවූයෙහි; අනයාශ්‍රිතාන්, ප්‍රාප්තිදුක්ඛ නොවූවවුන්; ජනය, කර.

න විද්‍යතෙ නයො නීතිඃ ත්‍රිවර්ගානුබන්ධී විහිරෙෂාමිත්‍යනයාඃ තාං; අයස්‍යාභිමතස්‍ය ඵලස්‍ය ආනයඃ ප්‍රාප්තිඃ අයානයඃ තස්මින් අන්ධාඃ තාන් අයානයාන්ධාන්; න විද්‍යතෙ අයො විගමො යස්‍යා ඉත්‍යනයා අන පායා ස්ථිරා ආයතිරභ්‍යුදයොයස්‍යෙත්‍යනයායතිඃ හෙ අනයායතෙ; යාන්හි ප්‍රාප්ණුවන්‍යනෙන හිතමිති යානමාගමඃ; ජිනස්‍යයානම් ජිනයා නම් එනද්යාතියථාවත් වෙත්තීති ජිනයානයාඃ; නඛවිද්‍යාකම්යාතීය්‍ය යානයාඃ; නනයඃ අනයඃ, තමාශ්‍රිතාඃ, තාංඅනයාශ්‍රිතාන්.

තථාගත සමය අනුවතෙනහි සියලු නීතින් කරා පැමිණෙහියනු අපියි.

---

* සීජ්ජන-ක.    † මේ පද්‍යයේ සන්නය ග්‍රන්ථානුගතව තුබූ යෙන් ටීකානුසාරයෙන් සකස්කෙළෙමු.

47 රවෙණ භෞමො ධ්වජවර්තිවීරවෙ-
රවෙජී සංයත්‍යතුලාස්ත්‍රගෞරවෙ
රවෙරිවොග්‍රස්‍ය පුරො'හරෙරවෙ-
රවෙත තුල්‍යං රිපුමස්‍ය භෛරවෙ.

48 මයාමයාලම්බ්‍යකලාමයාමයා
මයාමයාතව්‍යවිරාමයාමයා
මයාමයාර්තිං නිශයාමයාමයා
මයාමයාමූං කරුණාමයාමයා.

49 මතාමධුනානාරමතාමකාමතා
මතාපලබ්ධාග්‍රිමතානුලොමතා
මතාවසත්‍යුත්තමතා විලොමතා
මතාම්‍යතසෙත සමතා න වාමතා.

---

මෙහි ප්‍රථමතෘතීයයෙහි පාදානයා යනු එකරූපවූ අව්‍යවහිතවූ ආද්‍යන්ත යමක නම්විය මෙහි චිතීය චතුර්ථයෙහි උක්තාක්ෂරරූපවූ ආද්‍ය මධ්‍ය යමක නම් වී.

47 අතුලාස්ත්‍රගෞරවෙ, අසදෘසවූ ආයුධභාරඇති එහෙයින්; භෛරවෙ, භයඞ්කරවූ; සංයති, යුධයෙහිලා; ධ්වජවර්ති, (යමක්හුගේ) ධ්වජයෙහි පවත්නාවූ; වීරවෙඃ, වීරවූ පක්ෂීහුගේ ගෙවත් ගරුඩයාගේ; රවෙණ, නාදයෙන්; භෞමඃ, නරකනම් අසුරතෙම; අවෙජි, යුහුවනු ලදද; රවෙරිව, හිරුසේ; උග්‍රස්‍ය, තෙජස්විවූ; අස්‍යහරෙඃ, මේ විෂ්ණු හුගේ; පුරඃ, අභිමුඛයෙහි; රිපුම්, කිසි සතුරක්හු; අවෙස්තුල්‍යම්, (අකිම්ත් ස්රබැවින්) එළුවකුහා සමවූවහු; අවෙත, දන්නු.

මෙහි රවෙයනු එකරූපවූ ව්‍යපෙතවූ චතුෂ්පාදන්ත යමක නමි.

48 හෙකරුණාමය, සානුක්‍රොසවූ මති ඇත්තව; අමය, (සියළු අවස්ථාවන්හිම මට) අනුව පවත්නා තැනැත්තව; අයාම්, (රූපසම්ප ත්තිය හෙතුකොටගෙන) දෛවසම්පත්තිය ඇත්තාවූ; අමූම්, මේ ස්ත්‍රිය; අයාතව්‍යවිරාමයාමයා, අප්‍රාප්‍ය කෙළවරඇතිහෙයින්; අපරිමිත යාම ඇති; අමයා, අපරිමිතහෙයින් අතිදීඝීවූ; අමයා, නිශ්‍රිකවූ; නිශයා, රාත්‍රිය හෙතුකොටගෙන; මයාමයාර්තිම්, විරහව්‍යාධිපීඩිත තැනැත්තිය (එහෙයින්ම;) මයාමය, (දක්ෂශාපයෙන් කරනලද) ක්ෂයාක්ෂය විකාර යෙන්; ආලම්බ්‍ය, අලම්භනීයවූ; කලාමය, චන්ද්‍රයාම; ආමයාම්, ව්‍යාධි කොට ඇත්තිය; ආමයා, විරහදුඃඛයෙන් පීඩිතවූ; මයා, මා හා; ආමය, එක්කර.

මයාමයඃ ක්ෂයාක්ෂයවිකාරො දක්ෂශාපකෘතඃ තෙන මයාමයෙන අලම්බ්‍යඃ ගෘහීතව්‍යඃ කලාමයඃ චන්ද්‍රඑවආමයො ගද්‍යෙ,ස්‍යස්‍යාස්‍යා තථො ක්තා තාම්; අයඃ ශුභඵලම් සොස්‍යා අසතීති අයා තාම්; අශ්‍රාදිත්‍වාදච්; අයාතව්‍යොවිරාමඃ යස්‍ය ඉත්‍යයාතව්‍යවිරාමා තයා; මාශ්‍රිනීච්ඡෙතෙ'ස්‍යා ඉත්‍යමා තයා; මයනං මයඃ ප්‍රක්ෂෙපඃ පරිත්‍යාගඃ ස එව ආමයඃ විකාරඃ කඵගස්‍යව ආතීතිඃවැඩිඃ, මයාමයස්‍යවා ආතීතිඃ යස්‍යාස්‍යා තථොක්තා තාම්; බහිරාදිත්‍වාදිච්-මා නච්ඡ්‍යතෙ යෙෂාමිත්‍යමාඃ; අතඃ අපරිමිතා යාමාඃ ප්‍රහරා අස්‍යා ඉත්‍යමා තයා; ආමං විරහවිකාරං යාතීත්‍යාමයාඃ, තෙන ආමයා.

මේතෙම එකාක්ෂරරූපවූ අව්‍යපෙතවූ චතුෂ්පාදද්‍යන්ත යමක නමී.

49 අතාමත්‍යඃ, (දුශ්චරිතයක් නැතිබවහේතුකොටගෙන) ප්‍රතිභාන ප්‍රඥකෞශල්‍යය හෙතුකොටගෙන ශ්‍රමයකට නොපැමිණෙන්නාවූ;

50 **කාල! කාලගලකාලකාලමුඛකාලකාල**
**කාලකාලපනකාලකාලඝන * කාල කාල**
**කාලකාලසි තකාලකාලලතිකාලකාල**
**කාලකාලගතු කාලකාලකලිකාලකාල.**

---

ජන, තාගේ; මන්‍යෙ, බුද්ධියෙහි; ආරමතාම්, භාවනාරතවූ යෝගීන්විසින් මතාම්, සම්මතවූ; අකාමතාම්, නිරභිලාසභවයපවා; ධූනාතා, නිර්ධූත නය කරන්නාවූ; අතාප, අකෘච්ඡ්‍රයෙන්; ලබ්ධ, ප්‍රාප්තවූ; අග්‍රිමතානු ලෝමතාම්, අග්‍රිමතාවගේ අනුගුණ්‍යය ඇත්තාවූ; තවද උත්තමතාවිලෝ මතාම්, ප්‍රාධාන්‍යයාගේ ප්‍රාතිකූල්‍යයට හෙවත් අධිමාත්‍රාවට; අයතී, නොයන්නාවූ; සමතා, රාගද්වේෂාදි වෛෂම්‍යාභාවයෙන්වූ; එකාකාරතා තොමෝ පවත්නිය; නවාමතා, දුෂ්ටතාවක් නොවන්නියි.

මේ එකරූපවූ ව්‍යපෙතවූ චතුෂ්පාදාදි මධ්‍යාන්ත යමක නමී.

50 කාල, ඊශ්වරයාගේ; ගල, ග්‍රීවය; කාල, යමය; කාලමුඛ, වානරය යන මොවුන්ගේ; කාලක, කෘෂ්ණභාවය; අල, ගන්නාවූ; කාලකාල පනක, මයූරයන්ගේ කෙකා රාවිඇති; අලකාලඝන, බමර පතරසේ කළුවූ මෙඝයන්ඇති; කාල, වර්‍ෂාකාලයසේ; කාල, කළුවූ; කාල, විෂ්ණුව; කාල, වර්‍ෂාදි කාලයන් සම්බන්ධිවූ; කාලකලිකා, කාලකලිකාවන්ට හෙවත් පක්‍ෂමාසාදීන්ට; ආලක, ප්‍රභූවූ අනන්තකයහට; අල, අග්‍රාහ්‍ය වූව හෙවත් අගොචර වූව; කාලකාලසී, සමුද්‍රයෙහි; තකා, තාගේ විරහ යෙන් කෘච්ඡ්‍රයෙන් ජීවත්වන්නාවූ; ලකා, ලොලවූ; ලලනිකා, ස්ත්‍රී තොමෝ හෙවත් ශ්‍රී දෙවතා තොමෝ; අලකාල, කෙශපාසයෙන්; කාල, කළුවූ; කා, හිස් ඇත්තී; අලගතු, සඞ්ගමය කෙරේවා.

මෙසෙ මාධවතෙමේ රාධාවවිසින් ප්‍රබොධ කරනු ලැබෙයි දතයුතු. කාලගලශ්ච කාලශ්ච කාලමුඛශ්ච තෙෂාම් කාලකම් කෘෂ්ණත්වම් අලාති ගෘහ්ණාතීති කාලගලකාලකාලමුඛකාලකාලඃ; කායන්ති ශබ්ද යන්ත ඉති කාලකාඃ මයූරාඃ, තෙෂාමාලපනං යස්මින් ස කාලකාල පනකඃ; අලීනාං සමූහඃ ආලඃ, ආලවත් කාලාඃ කෘෂ්ණ ඝනා මෙඝා යස්මින් ස ආලකාලඝනඃ; කාලකාලපනකශ්චාසෞ ආලකාලඝනශ්චෙති තථොක්තඃ සචාසෞ කාලශ්චෙති කාලකාලපන කාලකාලඝන කාලඃ කාලගල කාලකාලමුඛ කාලකාලශ්චාසෞ කාලකාලපන කාලකාල ඝන කාලශ්චෙති තථොක්තඃ, තද්වත්කාල හෙ විෂ්ණෝ; කමුදක මාලාන්ත්‍යා දදත ඉති කාලාඃ; කාලා එව කාලකාඃ, කාලකෙමේඝෙඃ අලසති භාතීති කාලකාලඃ; ක්විබන්තඃ, තස්මින් කාලකාලසි සමුද්‍රෙ; තකාවිරහා කෘච්ඡ්‍රජීවිකා; ලකා ලොලා ලලනිකා ස්ත්‍රී ලක්‍ෂ්මීරිත්‍ය යාවත්; අලකානා මලඃ පඞ්ක්තිරෙව අලකාලඃ; කෙශපාශඃ, තෙන

---

* කාලකාලඝනකාලකාලපන-ක.

51 සන්දෂ්ටයමකස්ථාන මන්තාදී පාදයොර්ද්වයොඃ
උක්තාන්තර්ගතමප්‍යේතත් ස්වාතන්ත්‍ර්‍යෙණ * කීර්ත්‍යතෙ.

52 උපොඪරාගාප්‍යබලා මදෙන සා
මදෙනසා මන්‍යුරසෙන යොජිතා
න යොජිතාත්මානමනඞ්ගතාපිතා-
ඞ්ගතාපි තාපාය මමාස නෙයතෙ.

53 අභ්‍යාසස්සමුද්ගස්‍යාදස්‍ය භෙදස්ත්‍රයො මතාඃ
පාදාභ්‍යාසො'ප්‍යනෙකාත්මා ව්‍යජ්‍යතෙ ස නිදර්ශනෛඃ.

---

කාලං කෘෂ්ණම් කම් ශිරො යස්‍යාස්සා තරේ‍යාක්තා: කාලොම්තොතාදිඃ, තස්‍ය කාලකලිකා කාලප්‍රභෙදඃ ජඝාදිඃ; තස්‍ය, ආලකඃ ප්‍රහරනකඃ; තස්‍ය, අල අග්‍රාහ්‍ය හෙ විශ්ණෝ; නවීද්‍යතෙ ලං ආදාන මස්‍යෙත්‍යල ඉති විග්‍රහඃ.

මේ එකරූපවූ ව්‍යපෙතවූ චතුෂ්පාදාදි මධ්‍යාන්ත යමක නම්.

51 පාදයොර්ද්වයොඃ, ප්‍රථම ද්විතීය පාදදෙදෙනාගේද ද්විතීය තෘතීය පාදදෙදෙනාගේද තෘතීය චතුර්ථ පාදදෙදෙනාගේද; අන්තාදී, අන්තආදී ස්ථානයෝ දෙන්න සන්දෂ්ටයමකස්ථානම්, සන්දෂ්ටයමකයහට ස්ථානයයි දතයුතු; එතත්, මේ සන්දෂ්ටයමකයතෙම; උක්තාන්තර්ගතමපි, කියනලද කාලකාල යනමේ ආදියෙහි ඇතුළත්වූයේද; ස්වාතන්ත්‍ර්‍යෙණ, වෙනම සිඩබැවින්; අද්‍ය, දූන්; කීර්ත්‍යතෙ, කියනු ලැබේ.

52 සා අබලා, ඒ ස්ත්‍රීතොමෝ; මදෙන, යෞවන විකාරය හෝ මද්‍යෝපයොගය හේතුකොටගෙන; උපොඪරාගාපි, මා කෙරෙහි අධික අනුරාග ඇත්තීද; මදෙනසා, මාගේ අපරාධයවිසින්; මන්‍යුරසෙන, ක්‍රොධ වේගය හා; යොජිතා, යොදනලද්දී; යොජිතාත්මානම්, එහෙයින්ම අභිනිවේසිතවූ සිත්ඇති; අනඞ්ගතාපිතාම්, මාගේ විරහයෙන් කාමාග්නිබවට; ගතාපි, පැමිණීද; ඉයතෙ, මෙපමණවූ; තාපාය, සන්තාපය පිණිස; මමනආසන, මට නොවූවානොවේ වූවාමය; යීසේයි.

විරහකාලයටද වඩා ප්‍රාප්තසුඛවිප්‍රලම්භය හේතුකොටගෙන මෙසේ යොද දුක්විම අත්‍යන්ත සන්තාපජනකය යනු අභිප්‍රායයි,

මෙහි මදෙනසා යනු ප්‍රථම පාදාන්තය ද්විතීයපාදාදිය; **නයොජිතා** යනු ද්විතීය පාදාන්තය තෘතීය පාදාදිය; **ඞ්ගතාපිතා** යනු තෘතීය පාදාන්තය චතුර්ථ පාදාදියයි; එහෙයින් ම පාදවයන්ගේ අන්තාදි වය විෂය කොට ඇති සන්දෂ්ට යමක නම්වේ,

53 අභ්‍යාසඃ, අභියන් දෙදෙනක්හුගේ ආවෘත්තිය; සමුද්ගස්‍යාත්, සමුද්ගයමකනම් වන්නේය; අස්‍ය, මේ සමුද්ගයමකයාගේ; භෙදඃ,

---

* ණාඩු-ක.

54 නාශෙඨ! ශස්සඛ්‍යා වර්ජ්‍යඃ පරමායතමානයා
නා ශෙඨශස්සඛ්‍යාවර්ජ්‍යඃ පරමායතමානයා.

55 නරා ජිතා මානනයා සමෙත්‍ය
නරාජිතා මානනයාසමෙත්‍ය
විනාශිතා වෛභවතා'පනෙන *
විනා'ශිතා වෛ භවතාපනෙන. *

---

ප්‍රකාරයෝ; ත්‍රයොමතාඃ, තුන්දෙනෙකැයි දන්නාලදහ; පාදභ්‍යාසොපි, පාදභ්‍යාස යමකයද; අනෙකාත්මා, අනෙකප්‍රකාරවත්තේය; සඃ, ඒ සමුද්ගයද; පාදභ්‍යාසයද; නිදර්ශනෛඃ, උදාහරණයෙන්; ව්‍යජ්‍යතෙ, ස්ඵුට කරනුලැබේ.

54 හෙ නාශෙඨ, ශඨනැත්තිය; පරමායතමානයා-පරම; අධිකවූ; ආයත, දීර්ඝකාලප්‍රවෘත්තවූ; මානයා, කෝපඇති; ඛ්‍යා, ඛ්‍යාතිවිසින්; සඃ, යම් පුරුෂයෙක්තෙම; අවර්ජ්‍යඃ, නොහලයුතුද; ස නා, ඒ පුරුෂතෙම; පරම්, අත්‍යර්ථයෙන්; ආයතමානයා, යත්නකරන්නිය විසින්; ශෙඨශස්සඛ්‍යා, ස්ථිරවූ අවිකාරඛ්‍යය ඇත්තියවිසින්; ආවර්ජ්‍යඃ, ස්මරණීය කට යුත්තේයි;-හෙවත් සිහිකටයුත්තේයි.

න-විද්‍යතෙ ශඨා අස්‍යාඉති නාශඨා; හෙ-නාශෙඨ—මෙතැන්හි න ශබ්ද නොවෙයි; ප්‍රතිෂෙධවාචි නකාර මැයි.

මෙහි පූර්වාර්ධයාගේ ආවෘත්තිය ද්විතීයාර්ධයෙහිද වූහෙයින් මේතෙම සමුද්ග යමක නම්.

55 වෛභව, විභූතිය; තාපනෙන, තවන්නාවූ; භවතාවෛ, තා විසින් වනාහි; ආපනෙන, සුඛයෙහි ප්‍රාප්තිය හෙතුකොටගෙන; ජිතාඃ, පරදවනලද; නරාඃ, නරයො; මානනය, සම්මානය; නය යන දෙන්නාගේ; ආසම්එත්‍ය, සඞගයට පැමිණ; මානනයා, (තට) ප්‍රණාම ක්‍රියාව හා සමෙත්‍ය, එක්ව; නරාජිතාඃ නොහෙබියො; (කෙචිත්, සමහරකෙනෙක්) විනාශිතාඃ, නසනලදහු; වෛ, ඒකාන්තයෙන්; විනා, පක්ෂිජාතයා විසින්; අශිතාඃ, කනලදහු; අසමානයන් හා කරන විවාදයෙහිඵල තුඹුම ලදහ සීසේසි.

විභොර්භාවඃ වෛභවම්, තත්තාපයතීති වෛභවතාපනඃ; තෙන— මෙහි ප්‍රථම පාදයාගේ ආවෘත්තිය දෙවන්නෙහිවිය තෘතීයපාදයාගේ ආවෘත්තිය චතුර්ථයෙහිවිය; එහෙයින් මේ සමුද්ගයමක නම් වි.

---

* තෘශතෙත-ක.

56 කලාපිනාං චාරුතයොපයාන්ති
බෘන්දානි ලාපොඪඝනාගමානාම්
බෘන්දානිලාපොඪඝනාගමානාම්
කලාපිනාං චාරුතයොපයාන්ති.

57 න මන්දයාවර්ජ්ජිතමානසාත්මයා
නමන්දයාවර්ජ්ජිතමානසාත්මයා
උරස්‍යුපාසඞ්ගිණීණපයොධරද්වයං
මයා සමාලිඞ්ගිත ජීවිතෙශ්වරඃ.

58 සභා සුරාණාමබලා විභූෂිතා
ගුණෛස්තවාරොහි මෘණාලනිර්මලෛඃ
ස භාසුරාණාමබලා විභූෂිතා
විහාරයන්නිර්විශ සම්පදඃ පුරාම්.

---

56 ලාප, කෙකාරාවින්; ඌඪ, අභිනන්දිතවූ; ඝනාගමානාම්, මේඝ කාලයන් ඇති; කලාපිනාම් බෘන්දානි, මයූර සමූහයෝ; චාරුතයා, මනොඥත්වය හා; උපයාන්ති, යෙදෙති; බෘන්දානිල, වාත්‍යායෙන් හෙවත් පවන් සමූහයෙන්; අපොඪ, දුරුකරනලද; ඝන, බඳවූ; ආගමානාම්, ප්‍රසර ඇති; කලාපිනාම්, දියෙහිලපන ශීලවූ හංසයන්ගේ; ආරුතයශව, ශබ්දයෝද; අපයාන්ති, පහවෙත්.

මෙහි ප්‍රථමපාදයාගේ ආවෘත්තිය චතුර්ථපාදයෙහි විය ද්විතීය පාදයාගේ ආවෘත්තිය තෘතීයයෙහි විය එහෙයින් මෙද සමුද්ග යමක නම්.

සමුද්ග යමකභෙද මෙකී තුන්ප්‍රකාරයි.

57 දයාවර්ජ්ජිත, කරුණාරහිතවූ; මානස, සිත් ඇති; ආත්මීයා, ආත්මී ද්‍රකාතවූ; ආවර්ජිත, ස්වීකෘතවූ; මානසාත්මයා, ගර්වයම ස්වභාව කොට් ඇති; මන්දයා, චණ්ඩවූ; මයා, මාවිසින්; ජීවිතෙශ්වරඃ, වල්ලභතෙම; නමත්, වඳනේ; උරසි, උභුඋරස්හි ලා; උපාසඞ්ගිණීණ, පිහිටුවනලද; පයොධරද්වයම්, ස්තනයුග්ම ඇතිව; නසමාලිඞ්ගිත, ආලිඞ්ගනය නොකරනලදී.

මෙහි ප්‍රථමපාදයාගේ ආවෘත්තිය ද්විතීයයෙහි විය එහෙයින් මේ පාදභ්‍යාස නම්.

58 තව, තාගේ; මෘණාලනිර්මලෛඃ, නෙළුම්දූලිසේ ධවලවූ; ගුණෛඃ, ගුණයන් විසින්; අබලා, ශක්‍රයාවිසින් නෂ්ටවූහෙයින් බලනම් අසුරයා නැත්තාවූ; විභූ, ශක්‍රයාවිසින්; උසිතා, අධ්‍යුෂිතවූ හෙවත් පිහිටුවන ලද්දාවූ; සුරානාංසභා, දෙවසභාතොමෝ; ආරොහි, නැඟෙනලද; සඃ, සේ තෝ; විභූෂිතාඃ, නානාලඞ්කාරයෙන් හොබවනලද; අබලාඃ

59 කලඞ්කමුක්තං තනුමධ්‍යනාමිකා
ස්තනද්වයී ච ත්වදෘතෙ න හන්ත්‍යකං
න යාති භූතං ගණනෙ භවන්මුඛෙ
කලඞ්කමුක්තං තනුමධ්‍යනාමිකා.

60 යශශ්ච තෙ දික්ෂු රජශ්ච සෛනිකා
විතන්වතෙජෝපමදං ශිතායුධා
විතන්වතෙජෝපමදං ශිතායුධා
විශාංච කුර්වන්ති කුලං තරස්විනඃ.

---

පුරස්ත්‍රීන්; විහාරයන්, ඇල්වන්නෙහි; භාසුරාණාම්, හොබවන්නාවූ; පුරාම්, නගරයන්ගේ; සම්පදඃ, සම්පත්තීන්; නිර්විශ, අනුභව කර.

මෙහි ප්‍රථමපාද තෘතීයයෙහි ආවෘත්ත විය. එහෙයින් මේ පාදාභ්‍යාස නම්.

59 කලම්, මධුරවූ; උක්තම්, (ස්ත්‍රීන්ගේ) තෙපුල ද; තනුමධ්‍ය නාමිකා, කෘශවූ මධ්‍යය නමන්නාවූ නොහොත් දෙහමිටය නමන්නාවූ; ස්තනද්වයී ච, පයොධර-(භාර-)ද්වය ද; ත්වදෘතෙ, (ජිතෙන්ද්‍රියවූ) තා විනා; කං න හන්ති, කවරක්හු නොනසා ද (හෙවත් අභිලාෂාදික්‍රමයෙන් දශම් අවස්ථාවට කා නම් නො පමුණුවත් ද); අතඃ, මේ කාරණයෙන්; භවන්මුඛෙ, තොප ප්‍රධාන කොට ඇති; ගණනෙ, (සත්පුරුෂ-)සංඛ්‍යාව කරන කල්හි; කලඞ්කමුක්තම්, දෝෂරහිතවූ; තනුමත්, (පරමාත්මව්‍යතිරික්තවූ)* ශරීර ඇති භූතම්, පුරුෂයක්හු කා; අනාමිකා, කනිෂ්ඨාංගුලියට දෙවනුවූ ඇඟිලි තොමෝ; න යාති හි, නො වැයන්නීයි—සත්පුරුෂයන් ගණන්නා තැන තං අධිකගුණැතියෙයින් තා විනා කණිෂ්ඨාංගුලියෙන් ගෙනැ දෙවන අනාමිකායෙන් සම කොට ගිණිය හැකි පුරුෂයෙක් නැතැයි සේයි. †

මෙහි ප්‍රථමපාදය චතුර්ථයෙහි ආවෘත්ත වී.

60 අජෝපම, ‡ විෂ්ණුසදෘශය; ශිතායුධාඃ, තීක්ෂ්ණවූ ආයුධ ඇති; දංශිතාඃ, කවචිපු හෙවත් සන්නාහසන්නද්ධවූ; තරස්විනඃ, § ශූරවූ; තෙ සෛනිකාඃ, තාගේ සේනාචරයෝ; යශශ්ච, (තාගේ) යශස් ද; රජශ්ච, ධූලිත්‍රු ද; දික්ෂු, දික්හි; විතන්වතෙ, පතුරුවති; විශාං කුලං ච, ශත්‍රුකුලය ද; යුධා, යුද්ධයෙන්; අපමදම්, මද රහිත වූවා ද; අතෙජඃ, තෙජස් නැත් වූවා ද; විතනු, (ප්‍රහාරසඤ්ජාතජර්ජරිතාවයවින්) විගතවූ ශරීර ඇත්තා ද; කුර්වන්ති, කෙරෙත්. **

මෙහි ද්විතීයපාදය තෘතීයයෙහි ආවෘත්ත වී.

---

* පරමාත්මව්‍යතිරික්තවූ. † කස්‍යචිත් සංයමිනඃ සත්‍යහිරඥම්-ප්‍රෝ.
‡ අජෝ රඝුරාජපුත්‍රඃ, තත්සදෘශ!-ප්‍රෝ. § වෛගවන්තඃ-ප්‍රෝ.
** වජ්ජිත්‍රුතඃපසන ප්‍රශංස නාම්දම්-ප්‍රෝ.

61 බිභර්ති භූමේර්වලයම්භුජේන තෙ
භුජඞ්ගමො'මා සමරතො මදඤ්චිතාම්
ශෘණුෂ්වතාමෙකං ස්වමිවෛත්‍ය භූධරං
භුජඞ්ගමො මා සමරතො මදඤ්චිතාම්.

62 සමරානලොමානවිවර්ධිතො ය
සස නිර්වෘතිතෙන කිමපාකරොති
සමන්තතස්තාමරසෙක්ෂණෙ! න
සමංගතාතතාසතාමරසෙ! ක්ෂණෙන.

---

61 තෙ, තාගේ; භුජෙන, බාහුව හා; අමා, එක් වැ; භුජඞ්ගමඃ, (අනන්ත්) නාරජ තෙමෙ; භූමේර්වලයම්, භූවක්‍රය; බිභර්ති, උසුලයි (එහෙයින්); ස්වම් භුජම්, ස්වකීය බාහුව; භූධරම්, පෘථිවිය ධරන්නාහු; අවෙත්‍ය, දැනැ; චිතාම්, වැඩියාවූ; මදම්, අහඞ්කාරයට; රතඃ,* අභිනිවිෂ්ට වූයෙහි; මා සම ගමඃ, නාහමක් යා යි යන මේ; එකම්, ප්‍රධානවූ; අඤ්චිතාම්, පූජිතවූ; † උක්තම්, වචනය; ස්මරතඃ, දත්නාවූ හෙවත් ප්‍රාජ්ඥවූ; මත්, මා කෙරෙන්; ශෘණු, අස;—මෙසේ උදාරවූ තො ඉදින් ආත්මලාඝවයක් නො කෙරෙහි නම් විනයෙහි; විනයෙන් හොබවනලදගුණඇතිබැවින් අත්‍යර්පියෙන් හොබනෙ ඔියැ යන සියලුගුණයට ආභරණයක් වූ මාගේ මේ වචනය ගත යුත්තෙයැ යනු මෙහි භාවයි.‡

මෙහි ද්විතීයපාදය චතුර්ථයෙහි ආවෘත්ත වී.

62 තාමරසෙක්ෂණේ, පද්මයට බඳුවූ ඇස්ඇතිතැනැත්තිය; අරසෙ, රස නැති තැනැත්තිය ⸸ හෙවත් කාමාස්වාදයෙහි අනාදරතැනැත්තිය; යඃ ස්මරානලඃ, යම් කාමාග්නියෙක්; මානවිවර්ධිතඃ, (ප්‍රියසඞ්ගමසුඛයට විරුද්ධවූ) ගර්වයෙන් වඩනාලදද; සඃ ඒ (මේ) (ස්මරානලය තෙමෙ); ක්ෂණෙන සමම්, ක්ෂණයක් හා සමඟ හෙවත් නොබෝකලෙකින් මැ; තතඃ, විස්තෘතවූයේ; තෙ, තීගේ; තාම් නිර්වෘතිම්, (සම්ප්‍රයොගප්‍රභවවූ) ඒ සුඛය; සමන්තතඃ, සර්ව ප්‍රකාරයෙන්; කිම් න අපාකරොති, කුමක් පිණිස දුරු නො කෙරේද? (දුරුකරන්නේ මැ යි, එහෙයින් මේ දග්ධමානයෙන් ප්‍රයොජන නැති, ඒ මානය දුරු කර ලී සේ යි. **

මෙහි තෘතීයපාදය චතුර්ථයෙහි ආවෘත්ත වී.

---

* ප්‍රීතඃ සත්: ප්‍රෝං. † හිතවූ–පොත්.
‡ රාඝදඃ සතුතිරියම්-ප්‍රෝං. ⸸ අවිදග්ධෙ! ප්‍රෝං.
** මානිත්ම්ප්‍රතිසඞ්ඛ්‍යා උත්තිරියම්-ප්‍රෝං.

63 ප්‍රභාවතො නාමිත වාසවස්‍ය
ප්‍රභාවතො නාම නවාසවස්‍ය
ප්‍රභ වතොනාමත! වා සවස්‍ය
විච්ඡිත්තිරාසීත් ත්වයි විෂ්ටපස්‍ය.

64 පරම්පරායා බලවා රණානාං
පරම්පරායා බලවාරණානාම්,
ධූලීස්ථලීර්ව්‍යොම විධාය රුන්ධන්
පරම්පරායා'බලවාරණානාම්.

---

63 ප්‍රභාවතඃ, දීප්තිමත් වූ; වාසවස්‍ය, ශක්‍රයා සම්බන්ධි වූ; ප්‍රභාවතඃ, ශක්තිවිශෙෂයෙන්; නාමිත, නමු කරන්නව! හෙවත් ශක්‍රසදෘශය; අනාම,* ප්‍රණිපාතය නොවන්නවුන්ට යම්හෙයකින් නො මැ අධිකගුණයෙහිද; අතඃ, එහෙයින්; විෂ්ටපස්‍ය, ලොකය හට; ත්වයි, තා; ප්‍රභෞ(සති), ස්වාමි වූ කල්හි; නවාසවස්‍ය.† සොමපානයට ද; සවස්‍ය වා, යාගයටද; විච්ඡිත්ති නාම, විඝාතයෙක් නම්; න ආසීත්, නො වී—තා ත්‍රිවිෂ්ටපනාථවූතැන් පටන් කොට යම් වැ ක්‍රියාවෙක් වේද ඕතොමො අවිච්ඡින්න වැ පවත්නීයයි‡ කිසිරජෙක් ස්තුතිකරනලදී.

මෙහි ප්‍රථමයමැ ද්විතීය ව ද තෘතීය ව ද ආවෘත්ත වී.

64 පරාය, උත්කෘෂ්ටවූ ශුභවිධි ඇත්තව! (තො); බලවාඃ, පරයන්ගේ සාමර්ථ්‍යය වළක්වන්නෙහි; (තවද:) අබලවාරණානාම්, දුර්වලයන් වළක්වන්නාවූ; බලවාරණානාම්, සෙනාගජයන් ඇති; රණානාම්, යුද්ධයන් සම්බන්ධිවූ, පරම්පරායාඃ ඝටාවගෙ; ස්ථලීඃ, ස්ථලීන්; ධූලිවිධාය, පාංශුමය කොට; ව්‍යොම, ආකාශය; රුන්ධන්, මුවහ කරන්නෙහි; පරම්, උත්කෘෂ්ටවූ; පරම්, ශත්‍රැහු; පරායාඃ, නැසීහි. §

බලං සාමර්ථ්‍යං වාරයතීති බලවාඃ- ක්විබන්තයි- ප්‍රථමායි— බලං ස්ථූණාං තගති ගච්ඡතීති බලවාඃ- ආතොපාදෞ ක-යි- කවූ කල්හි සිද්ධයි—බලවඃ ආරණ්‍යශ්ශබ්දෙ යෙෂාමිති බලවාරණඃ, තෙෂාං බලවාරණානාම්.

මෙහි ප්‍රථමපාද ද්විතීයවද චතුර්ථවද ආවෘත්ත වී.

---

* අනාම! නාස්ති ආමො රොගො යස්‍ය යස්මාවා තත්සම්බොධ [නම්—ප්‍රෝං.
† සොමපානය ඇති-පොත්.
‡ ශ්‍රීකෘෂ්ණස්‍ය ස්තුතිරියම්-ප්‍රෝං. § රසයුද්ධයෙන් නැසීහි

65 න ශුද්ධෙ වාචමලජ්ජ! මිථ්‍යා
භවවිධානාමසමාභිතානාම්
භවවිධානාමසමාභිතානාං
භවවිධානාමසමාභිතානාම්.

66. සනාභිතෝමානම්‍රරාජසේන!
සනාභිතෝ'මානම!රාජසේන
සනාභිතෝ මානම!රාජසේන
සනාභිතෝ'මානම්‍රරාජසේන.

---

65 අලජ්ජ, ලජ්ජා නැත්තව; භවවිධානාම්, භවයෙහි විප්‍රකාරවූ අහඞ්කාර මමඞ්කාර ඇති නොහොත් රාග ද්වේෂ ඇති (එහෙයින්); අසම, සම්ප්‍රවෘත්තියක් නැති; අභිතානාම්, ශ්‍රෙයොලක්ෂණ හිතය කුදු නැති; අභිතානාම්, විඥප්තාවූ; භවවිධානාම්, තොපබඳුවත්ගේ; මිථ්‍යා භවත්, බොරුවත් නාවූ; විධානාම්, අනුෂ්ඨාන ඇති හෙවත් එකක් කියා එකක් කිරීම් ඇති (එහෙයින් මැ); අසම, කුටිලවූ; අභිසජියක්හට බඳුවූ; තානාම්, ගයි ඇති; වාචම්, තෙප්ල; න ශුද්ධෙ, නොහදහම්—මෙසේ කිසිවෙක් කිසිවකුවිසින් රැහැණී වැ නිඥ, කරනු ලැබේ.*

මෙහි විතීයපාදය මැ තෘතීයයෙහි ද චතුර්ථයෙහි ද ආවෘත්තා වී.

66 සනාභ, නට්ටුවාවූ; අභිතෝම, සතුරන්ගේ ශොභා ඇත්තව; ආනම්‍රරාජසේන, නැමුවූ රාජසේනා ඇත්තව; ඉන, ස්වාමිය; අභිත, (සංග්‍රාමයෙහි) පිහිටුවනලද; උමානමරාජ, උමාව හා වෘෂයා ඇතියහු විසින් හෙවත් ශංකරයා විසින්; සෙන, සනාථවූව; අනම, පරප්‍රාණීපාතයක් නොකරන්නව; සන්, සත්පුරුෂවූ තෝ; මානම් අභිනස්සත්, මාන්‍යයට පැමිණියෙයි වූයෙහි; සනාභිතඃ, කාව්‍යිතවූයෙහි; මා න රාජසෙ, නොහොබනෙයි නොවෙහි-හොබනෙහිමැයි—අභිනානාමුමා ශොභා, අභිතෝමා,- සනාභිතෝමා යස්‍ය † ඉති- හෙ සනාභිතෝම!- ආනම්‍රතීතානම්‍රාඃ ආනම්‍රා රාජසේනා යස්මින්නිති- හෙ ආනම්‍රරාජසේන!- රාජ්ඤො විකාරඃ රාජසඃ, න රාජසඃ අරාජසඃ; හෙ අරාජස!- න විද්‍යතෙ මා ශ්‍රීරස්‍යෙත්‍යමීඃ, න අමඃ අනමඃ සශ්‍රීකඃ; රාජා වෘෂඃ ශෙඛරභූතො යස්‍යෙති අනමරාජඃ; ආභිතො මා වාසෙව අනමරාජශ්චෙති ආභිතොමානමරාජඃ ශංකරඃ, තෙන සෙන! සනාථ!

---

* ශබ්දානකං ප්‍රති නාසිකායා උපාන්තියම්-ප්‍රෙ. † ශෙ.

67 සකෘද්විස්ත්‍රිශ්ච යෝ'භ්‍යාසඃ පාදස්‍යෛවම්ප්‍රදර්ශිතඃ
ශ්ලෝකද්වයන්තු යුක්තාර්ථං ශ්ලෝකාභ්‍යාසඃ ස්මෘතෝ යථා-

68 **විනායකේන භවතා වෘත්තෝපචිතබාහුනා**
**ස්වමිත්‍රෝද්ධාරිණාභීතා පෘථ්වී යමතුලාශ්‍රිතා.**

69 **විනායකේන භවතා වෘත්තෝපචිතබාහුනා**
**ස්වමිත්‍රෝද්ධා'රිණා'භීතා පෘථ්වී යමතුලාශ්‍රිතා.**

---

67 සකෘත්, එකවරක ද; ද්විඃ, දෙවරක ද; ත්‍රිශ්ච, තුන්වරක ද; පාදස්‍යෛව, පාදයාගේ මැ; යෝ'භ්‍යාසඃ. යම් ආවෘත්තියෙක් ඇත් ද; සඃ, හෙ තෙමේ; ප්‍රදර්ශිතඃ, දක්වනලද;— යුක්තාර්ථම්, යුක්තාවූ අර්ථ ඇති; ශ්ලෝකද්වයං තු, ශ්ලෝකද්විතය වනාහි; ශ්ලෝකාභ්‍යාසඃ ස්මෘතඃ, ශ්ලෝකාභ්‍යාසයැ යි දන්නාලද;—යථා, (ඒ ශ්ලෝකාභ්‍යාසය) මෙසේ යි;—

68 විනායකේන, ජගත් විනයනය කරන්නාවූ හෙවත් සන්මාර්ගයෙහි පිහිටුවන්නාවූ; වෘත්ත, වටවූ; උපචිත, පිරුණාවූ; බාහුනා, අත් ඇති; ස්වමිත්‍රෝද්ධාරිණා, මිත්‍රා කොට ශත්‍රූන් උපුරන සුලුවූ; භවතා, තා විසින්; ඉයං පෘථ්වී, මේ මිහි තොමෝ; අභීතා, (ස්වචක්‍රපරචක්‍රයෙන් කිසිඋපද්‍රවයක් නැතිවනබැවින්) භයක් නැත්තී; අතුලා, පරෝපක්‍රමයක් නැති වී; අධිෂ්ඨිතා, අධිෂ්ඨිතයි. හෙවත් පිහිටුවනලදු.

පුනරුභෘති:—

69 විනායකේන භවතා, විගතවූ නායකයන් ඇත්තාවූ හෙවත් නායකයන් නැත්තාවූ තා විසින්; වෘත්ත, පරේතවූ-නිර්ජීවවූ; උපචිත, චිතාසමීපයෙහි; බාහුනා, අත් ඇති (එහෙයින් මැ); ස්වමිත්‍රෝද්ධ. ස්වමිත්‍රයන් හරණවූ; අරිණා, (තාගේ) සතුරා විසින්; අභීතා, අභිමුඛගතවූ; පෘථ්වී, මිහත්වූ; යම්තුලා, යම්තුලා තොමෝ; ශ්‍රිතා, පැමිණෙනලදු—චිතායාස්සමීපම්ප්‍රාප්තම්—ස්වාමිත්‍රාණි උජ්ජහාතීති ස්වමිත්‍රෝද්ධා- ස්විබනනයහට තෘතීයෛක වචනයි- තෙන ස්වමිත්‍රෝද්ධා.

මෙහි ප්‍රථමශ්ලෝකයෙන් එක්රජකුහුගෙ අභ්‍යුදය කියා එ මැ සොලොව ආවෘත්ත කොට එ මැ රජහු ශත්‍රැහුගෙ විපත්තිය වශයාව දක්වූහු-එහෙයින් මේ ශ්ලෝකාභ්‍යාස නම්.

70 ඒකාකාරචතුෂ්පාදං තන්මහායමකාහ්වයම්
තත්‍රාපි දෘශ්‍යතේ'භ්‍යාසස්සා පරා යමකක්‍රියා.

71 **සමානයාස! මානයා සමානයාසමානයා**
**සමානයා සමානයා සමාන! යා සමානයා.**

72 **ධරාධරාකාරධරා ධරාභුජාං**
**භුජා මහීං පාතුමහීනවික්‍රමාඃ.**
ක්‍රමාත් සහන්තේ සහසා හතාරයෝ
රයෝද්ධුරා මානධුරාවලම්බිනඃ.

---

70 ඒකාකාර, සමානරූපවූ; චතුෂ්පාදම්, සතරපාදය ඇති; යත්, යමෙක් තෙමේ; මහායමකාහ්වයම්, මහායමකයැ යන නම් ඇත්තේද; තත්‍රාපි, ඒ මහායමකයෙහි දු; අභ්‍යාසඃ, ත්‍රිපාද වෘත්ති තොමෝ; දෘශ්‍යතෙ, දක්නාලබන්නීයැ (එහෙයින් මැ); සා යමකක්‍රියා, ඒ යමකක්‍රියා තොමෝ; පරා, (සියලු යමකයනට ප්‍රධාන බැවින්) උත්කෘෂ්ටයි.— මහායමකයෙහි දු ත්‍රිපාදවෘත්තිය ඇති කල්හි ත්‍රිපාදභ්‍යාසවිශෙෂයක් හා මෙහි භෙද කිම් දැ යත්: එහි හුදෙක් පාදමාත්‍රයෙක් මැ තුන්වටක් ආවෘත්ත වෙයි, මහායමක යෙහි වනාහි සතරපාදයෙහි මැ යමකසහිත වැ ආවෘත්ත වෙයි- එහෙයින් මේ මහායමකය පාදභ්‍යාසයෙන් භින්න මැ යි.

71 යා, යම් ප්‍රියතමාවක් තොමෝ; සමා, කාන්තායුක්ත වී; ආනයාස, අකාර්‍ය්‍යනිෂෙධය සම්බන්ධිවූ; මානයා, ප්‍රමාණයට යන්නීද හෙවත් අකාර්‍ය්‍යපරිහාර දන්නීද; මාන, තුල්‍යවූ හෙවත් ඒකකාලවර්ත්තිවූ; යා සමානයා, ප්‍රියාසමාන දෙක ඇති හෙවත් බෙදමාන * දෙක ඇති; සමානයා, මාන්‍යවූ ජනය! ඒ මෙ ප්‍රියතමාව හා; (හෙ) අසමාන! නිරුපමවූව; සනිම්, හෙ තො; සමානය, සමභකර.— කිසිකාමියෙක් තෙමෙ එක්තරාමිත්‍රයකුට මෙසේ යාච්ඤා කෙරෙ.

72 ධරාධර, ශෙෂ නම් නාගරාජයාගෙ; ආකාරධරාඃ, සාදෘශ්‍යය උසුලන්නාවූ; ධරාභුජාම්, රජදරුවන්ගෙ; භුජාඃ, හස්තයෝ; අහීන, පර්‍ය්‍යාප්තවූ; වික්‍රමාඃ, ශෞර්‍ය්‍ය ඇත්තාහු; සහසා, වහා මැ; හත, නසනලද; අරයඃ, සතුරන් ඇත්තාවූ; රයොද්ධුරාඃ, පුඩවෙග යෙන් නො වැළැකියැ හැක්කාවූ: මානධුරාවලම්බිනඃ, මාන කෘත්‍යය මැ එල්බෙන්නාහු; මහීම්, පෘථිවිය; ක්‍රමාත්, ශාස්ත්‍රොක්ත ක්‍රමයෙන්; පාතුම්, රක්ෂාකරන්නට; සහන්තෙ, පොහොසත් වෙත්.

---

* බෙද හා මාන ඇති.

73 ආවෘත්තිඃ ප්‍රාතිලෝම්‍යේන පාදශ්ලෝකගෝචරා
යමකං ප්‍රතිලෝමත්වාත් ප්‍රතිලෝමමිතිස්මෘතම්.

74 යා මතාශ! කෘතායාසා සායාතා කෘශතා මයා
රමණාරකතා තේ'ස්තු ස්තුතේතාකරණාමර!.

75 නාදිනෝ මදනාධිස්වා නමෙ කාචනකාමිතා
තාමිකා න ච කාමේන ස්වාධීනා දමනොදිනා.

---

මෙ තෙමෙ සන්දෂ්ටයමකයැ, ප්‍රථමපාදයෙහි ආදිමධ්‍යාන්‍ය ව්‍යපෙතයමකයැ, අනික් පාදත්‍රයෙහි අව්‍යපෙතඅන්තාදියමකයි.

73 පාදශ්ලෝකගෝචරා, ශ්ලෝකපාදයක් ද ශ්ලෝකාර්ධයක් ද ශ්ලෝකයක් මුළුල්ල ද විෂය කොට ඇති; ප්‍රාතිලෝම්‍යේන ප්‍රතිලෝමයෙන්; ආවෘත්තිඃ, අභ්‍යාසය තෙමෙ; ප්‍රතිලෝමත්වාත්, (ඒ ආවෘත්තියගේ) ප්‍රතිලෝමබව හෙතු කොට ගෙනැ; ප්‍රතිලෝමමිති, ප්‍රතිලෝමයමකයැ යි; ස්මෘතම්, දන්නාලදී.

74 (හෙ) අමතාශ, ප්‍රතිකූලවූ සුරතමනොරථඇත්තව! හෙවත්: වෙශ්‍යාසංගමය ක්‍ෂමාකරන්නව; රමණ, වල්ලභය; අකරණාමර, අකරණත්වයෙන් අමරය! හෙවත් දෙවියා; ස්තුතෙත. ස්තුතියට ප්‍රාප්තය; කෘතායාසා, කරනලද ආයාසඇති; යා කෘශතා, යම් (විරහයෙන්වූ) කෘශතාවෙක් ඇත් ද; සා, ඒ කෘශතා තොමෝ; මයා, මා විසින්; යාතා, පැමිණෙනලදු; තෙ, තාගේ; ආරකතා, ගමනමැ; අස්තු, වේවා—සමය ඉක්මැ ආ වල්ලභයෙක් සරොෂවූ ප්‍රියාව විසින් මෙසේ අධික්‍ෂෙපකරනලදී—අමතාප්‍රතිකූලා ආශා අස්‍යාත් සුරතමනොරථො යස්‍යා සඃවමමතාශඃ, හෙ අමතාශ—ඉයනති ගච්ඡතීත්‍යාරකස්තස්‍ය භාව ආරකතා—ස්තුතමිතඃ ස්තුතෙතඃ, හෙ ස්තුතෙත—අකරණත්වෙන අකෘත්‍යත්වෙන අමරඃ, අකරණාමරඃ, හෙ අකරණාමර.

මෙහි ප්‍රථමපාදය ප්‍රතිලෝමයෙන් කියවා දෙවනපාදය නැගෙයි, තුන්වනපාදය ප්‍රතිලෝමයෙන් කියවා සතරවනපාද නැගෙයි—එයින් මේ පාද ප්‍රතිලෝම නම්.

75 නාදිනඃ, (සෛවසමය ප්‍රසිද්ධවූ) නාද නම් තත්වවිශෙෂයක් ඇති; මෙ, මාගේ; ස්වා, ස්වකීයවූ; ධී, බුද්ධි තොමෝ; අමදනා, කාමියා රහිතවී (එහෙයින්) ස්වාධීනා, මා මැ අයත්වෙයි; (එසේහෙයින්මැ;) මෙ, මට; කාචනකාමිතා, කිසි විෂයාභිලාෂයෙක් නැත; දමනොදිනා. දමය දුරුකරන්නාවූ හෙවත් ප්‍රගම්ප්‍රත්‍යනීකවූ; කාමේන,

76 යානමානය මාරාවි කශොනානජනාසනා
යාමුදාරශතාධීනා මායාමායමනාදිසා

---

මනමවථයා හෙතුකොටගෙන; න ච තාමිකා, සන්තාපයතුඳු නැති— නාදෙ නාම ශෛවසමය ප්‍රසිඩසතත්ත්වවිශෙෂඃ; සර්වඥ තො'සෞති නාදි. තස්‍ය නාදිනඃ.

මෙහි පූර්වාර්ධයේ කෙළවරවූ අකුර පටන්ගෙන ප්‍රතිලොමයෙන් කියවූකල උත්තරාර්ධය නැගෙයි. එසේම උත්තරාර්ධය මුඛ්‍යයෙන් කියවූකල පූර්වාර්ධය නැගෙයි. එහෙයින් මේ අර්ධප්‍රතිලොම නම්.

76 යා, යම්ස්ත්‍රියක් තොමෝ; මානය, තුන්ලෝවිජය හෙතු කොටගෙන අභිමානයට යන; මාර, අනඞ්ගයා; ආවි, තත්සාධනය හෙතු කොටගෙන රක්ෂාකරනසුලුවූ; කශා, පතොදයක්බඳු වියකට; ඌනා, අඩුවී; න, නොවද; හෙවත් සදෘශවිද; අනජන, ඉන්ද්‍රියවිජයයෙහි සමර්ථවූ ජනයන්ගේ; අසනා, ක්ෂෙපයම හෙවත් අභිභවයම ඇත්තිද; හෙවත් තපස්වීන්ට රාගජනනද; උදාරශතාධීනාම්, ප්‍රභුසමූහයා අයත්වූ; හෙවත් වැඩිසිටියවුන් විසින්ම අනුභවනීයවූ; යාම්, යමක හා; ආයාම්, සඞ්ගමය කෙළෙම්ද; සා, ඒ උක්තස්වරූපවූ ස්ත්‍රීතොමෝ; ආයාමී, ආගමනය; අනාදි, බණනලද්ද; හෙවත් එයි කියා සැඳවනලද්ද. *

කිසිපුරුෂයෙක් මෙසේ තමාගේ විදග්ධාංගනයක් කීයයි ගත යුතු. මානමවලෙපඃතිහී මානඃ,- මානයශ්චාසෞ මාරශ්චෙති මානයමාරඃ,- තමවිතුං රක්ෂිතුං ශීලං යස්‍යාති මානයමාරාවිඃ;- මානයමාරාවි චාසෞ කශාචෙති තථොක්තා-තස්‍යඃ; ඌනා මාරාවිකශොනා- අනක්ති න ඊශත ඉත්‍යනාඃ-අනාශ්ච තෙ ජනාශ්චෙතාන නාජනාඃ- තෙෂාමසනඃ ක්ෂෙපොභිභවො යසෙති අනජනාසනා;-

---

* (හෙ සඛෙ, මිත්‍රවත් යහළුව; ත්වං, යුෂ්මත්තෙම;) යානම්, අශ්වාදි එක්තරා වාහනයක්; ආනය, ගෙනඑව; (කුමටයත? අහම්, මම) උදාරශතාධීනාම්, සියගණන් මහාධනවතුන්ට අයත්වූ; යාම්, යම් වෙශ්‍යාවක් කරා; ආයාමි, ගියෙම්ද; මාරාවිකශා, කාම නමැති එළකයාහට කවුසැමිටියක් බඳුවූ; ඌනානාජනාසනා, නැඹීනයන් බැහැරකරන්නාවූ; සා, ඒ ගණිකා තොමෝ; ආයාමි, ගමන; අනාදි, මා විසින් කියනලදු- යනු කාලිකාතා පිකාගත අර්ථවිස්සි.

77 සා දිනාමයමායාමා නාධීතා ශරදම්බයා
නාසනාජනනා ශොක විරාමාය න මානයා.

(යමිකාවක්‍රම්)

78 වර්ණානාමෙකරූපත්වං යද්‍යෙකාන්තරම්ඞ්ඞයොඃ †
ගොමූත්‍රිකෙති තත් ප්‍රාහුර් දුෂ්කරං තද්විදො යථා.

---

මෙම සොලොව පුතිලොමයෙන් කියවූ කල්හි අනික් සොලො වෙක් වෙයි, හේ ඔබ්බෙන් දක්විත්.

77 සා, ඒ ස්ත්‍රීතොමෝ; දිනාමයම්, (රූක්‍ෂබව හෙතුකොට ගෙන) දිවස නමැති ව්‍යාධියට; අධීතා, ප්‍රාප්තවී; න (ගභවති), නොවන්නී නොව; හෙවත් පැමිණීමැයි; (එහෙයින්) අම්බයා ශරද, මේ ශරද කරණකොටගෙන; ආයා, ආගතවූ; අාමා, පිඩා ඇත්තී; (එහෙයින්ම) අසනාජනනා, සුවසේ හිඳීමක් නැත්තී: ශොකවිරාමාය, (තීගේ ශොකයෙන්වූ! ශොකයාගේ විනොදය පිණිස; මානයා න, මානයට යන්නී නොවී*—දිනමෙව ආමයඃ දිනාමයඃ, තං ආයඃ ආගතඃ ආමඃ පීඩා යයෙති ආයාමා;—නාධීතා යන තැනැ නකාරයාද තෘතිය පාදයෙහි ආදිවූ නකාරයාද එක් කොට "න න භවති" යොදනු—න ජනනම් අජනනම්; ආසනස්‍ය විස්ථානස්‍ය අජනනම් යස්‍යාඃ ඉති ආසනාජනනා—සුඛනාමලභ මානෙනාපීඃ —

78 අඞ්ඞයොඃ, උත්තරාධරඛ්‍යෙන් ලියනලද ශ්ලොකාඞ්ඞයන් දෙන්නක්හු සම්බන්ධවූ; වර්ණානාම්, අක්ෂරයන්ගේ; එකාන්තරම්, එකෙකී අක්ෂරයන් ව්‍යවධානකොට ඇති; එකරූපත්වම්, සාදෘශ්‍යය; යදි (භවති), ඉදින් වේ නම්; දුෂ්කරම්, දුඃඛනිෂ්පාද්‍යවූ; තත්, එබ ඳුවූ බන්ධය; ගොමූත්‍රිකෙති, ගොමූත්‍රිකායයි; තද්විදඃ, ඒ (ගොමූත්‍රිකා බන්ධය) දන්නාහු; ප්‍රාහුඃ, කියත්; යථා, හේ මෙසේයි:—

---

* සා, ඒ වෙශ්‍යාතොමෝ; අම්බයා ශරද, මේ එළඹසිටි ශරත් කාලය හෙතුකොටගෙන; ආධීතා, චිත්තපීඩාවට පැමිණියා; ශොකවිරාමා, (එහෙයින්ම) ශොකයාගේ අවසන්වීම් ඇත්තියක්; න, නොවන්නීය; (එසේම) දිනාමයමායාමා, දහවල්හි රොගයට පැමිණියා; නාසනාජනනා, අසුන්හි උපවෙශනක්‍රියා නැත්තී; ආයනමානයා, මාගේ ගමන්දනීමට පැමිණියාය—
සඛායම් ප්‍රති අනුරාගිණ්‍යාං වෙශ්‍යායාමාශකාසොක්තිරියම්-කා-

† යත්‍රෙකාන්තරමඞ්ඞයොඃ-කා.

79 මදනො මදිරාක්ෂීණාමපාඞ්ගාස්ත්‍රො ජයෙදයම්
මමෛනො යදි තත්ක්ෂීණමනඞ්ගායාඤ්ජලිං දදෙ.

80 ආහුරර්ධභ්‍රමං* නාම ශ්ලොකාර්ධභ්‍රමණං යදි
තදිෂ්ටං සර්වතොභද්‍රං භ්‍රමණං යදි සර්වතඃ.

---

පළමුකොට පූර්වාර්ධය ලියාලා අපරාර්ධය එයට යටකොට ලියා උත්තරාර්ධයෙහි ආදි අකුර හා පූර්වාර්ධයෙහි දෙවැනි අකුර හා නැවත උත්තරාර්ධයෙහි තුන්වන අකුර හා නැවත පූර්වාර්ධයෙහි සතරවන අකුර හා මෙකී ක්‍රමයෙන් වර්ණයක් හැර වර්ණයක් බැවින් කියවා පූර්වාර්ධය හා මුළුලුකොට පූර්වාර්ධයේ ආදි අකුර ගෙන නැවැත කියවූපරිද්දෙන්ම අකුරක් හැර අකුරක් කියවා උත්තරාර්ධය මුළුලු කොට ශ්ලොකය මුළුලු වේ නම් ගෝමූත්‍රිකා නම් වන්නේයයි දතයුතු.

79 මදිරාක්ෂීණාම්, ස්ත්‍රීන්ගේ; අපාඞ්ගාස්ත්‍රඃ, කටාක්ෂයමැ ආයුධ කොට ඇති; අයම් මදනඃ, මේ අනඞ්ගතෙම; යදි, ඉදින්;† ජයෙත්, මා පෙළන්නේද; ‡ තත් (තස්මාත්), § එහෙයින් හෙවත් ඉෂ්ටවිෂය ප්‍රාපණය හෙතුකොටගෙන; මමෛනඃ, මාගේ පාපය; තත්ප්‍රාප්තියට විඝ්නවූයේ; ක්ෂීණම්, නෂ්ටද එහෙයින් පූර්ණ මනොරථවූ මම්; අනඞ්ගාය, අනඞ්ගයහට; අඤ්ජලිං දදෙ, ප්‍රණාමය කෙරෙම්.

එක්තරා කාමුකයෙක් මෙසේ කීයැයි ගතයුතු.

80 ශ්ලොකාර්ධභ්‍රමණම්, ශ්ලොකයා සම්බන්ධිවූ අර්ධයක්හුගේ භ්‍රමණය; යදි භවෙත්, ඉදින් වේ නම්; (එබඳුවූවා); අර්ධභ්‍රමං නාම, අර්ධභ්‍රම නමැයි; ආහුඃ, කියති;- සර්වතඃ, අනුලොම ප්‍රතිලොමයෙන්; යදි භ්‍රමණම්, ඉදින් භ්‍රමණය වේ නම්; තත්, ඒ; සර්වතොභද්‍රම් නාම, සර්වතොභද්‍ර නමැයි; ඉෂ්ටම්, අභිමතයි—

ප්‍රථමපාදය ලියා අනික් තුන්පාදය ඒ යට ලියා ප්‍රථමපාදයෙහි පළමු අකුරු ගෙනැ යට ලී තුන්පාදයෙහිද පළමු පළමු අකුරු යට බලා ක්‍රමයෙන් කියවා සතරවන පාදයෙහි කෙළවර අකුර හිම්කොට ප්‍රථමපාදයෙහි කෙළවර අකුර දක්වා උඩුබලා

---

* ප්‍රාහුරර්ධභ්‍රමං–ක.   † යත්, යම්හෙයකින්;- පොත්.

‡ ජයෙත්, ජනවශීකරණය කරන්නේද- පොත්.

§ ඉති, මෙහෙයින්;- පොත්.

81 මනොභව තවානීකං නොදයාය න මානිනී
භයාදමෙයාමාමාවා වයමෙනොමයා නත.

අර්ධභ්‍රමිඃ.

82 සාමා සාමා මායා මාසා මාරානායායානාරාමා
යානාවාරාරාවානායා මායාරාමා මාරායාමා

සර්වතොභද්‍රම්.

---

කියවූ කල්හි පෙළ හෙළා ලී ප්‍රථමපාදය නැඟෙයි; නැවත ප්‍රථම පාදයෙහි දෙවන අකුර හිම්කොට යට බලා කියවා අන්‍යපාදයෙහි අන්‍යඅකුරට දෙවන අකුර දෙණ උඩ බලා ක්‍රමයෙන් කියවූ කල පෙළ හෙළා ලී දෙවන පාදය නැඟෙයි; නැවත ප්‍රථමපාදයෙහි තුන්වන අකුර ගෙනැ යට බලා කියවා අන්‍යපාදයෙහි අන්‍යපාදය හට තුන්වන අකුර ගෙනැ ක්‍රමයෙන් උඩ බලා කියවූ කල තුන් වන පාදය මුළුල වෙයි. නැවත ප්‍රථමපාදයෙහි සතරවන අකුර ගෙනැ යට බලා කියවා අන්‍යපාදයෙහි අන්‍යවර්ණයහට සතර වන අකුර ගෙනැ උඩු බලා ක්‍රමයෙන් කියවූකල සතරවනපාදය මුළුලු වෙයි; මෙසේ ශ්ලොකනිෂ්පත්තිය වෙයි—මේ අර්ධභ්‍රම නම්.

අර්ධභ්‍රමක්‍රමය මැ අනුලොම ප්‍රතිලොම හෙයින් සිඛවී නම් ඒ සර්වතොභද්‍ර නම්.

81 මනොභව, අනඟය; නත, (හැමදෙනාගේම චිත්තාධිෂ්ඨාන හෙයින්) උපනතවූවව! හෙවත් අපරොක්ෂය; යා මානිනී, යම් මාන්නියක් තොමෝ; භයාත්. භය හෙතුකොටගෙනැ; අමෙය, අපරිමිතවූ; අමා, පීඩා ඇත්තී; මා වා භවති, නහමක් වේද; නො හොත් නොවේද; සා මානිනී, ඒ මනස්විනීතොමෝ; අනීකම්, ජග විජය ප්‍රයුක්තඹය හෙතුකොටගෙනැ සෙනා වී; තව, තට; උද යාය, ජගවිජයලක්ෂණවූ උදය පිණිස; න න භවති, නොවන්නී නොවා හෙවත් වේමැයි; (කෙවලම්, හුදෙක්;) වයම්, ඇපිමෙ; එනොමයාඃ, පාපස්වභාව ඇත්තමෝයි—

තාගේ ප්‍රසාදයෙක් ඇත්නම් ඉන් මැ රක්ෂාවම්හ, එහෙයින් තාගේ අනීකවූ මානිනීතොමෝ ප්‍රසන්නවේවා යනු වාචොක්තියි—
අමෙයඃ අප්‍රමාණඃ ආමඃ පීඩා යෙෂාං තෙ අමමියාමාඃ.

මේ අර්ධභ්‍රමයට උදාහරණයි.

82 යා, යම් ස්ත්‍රියක්තොමෝ; අමායාමා, පීඩාවගේ දීර්ඝතාවක් ඇත්නී; මා (භවත), නොවේද? අපගේ දුඃඛයෙන් නොතැවේද?

83 යඃ ස්වරස්ථානවර්ණානාං නියමො දුෂ්කරෙෂ්වසෞ
ඉෂ්ටශ්චතුඃ ප්‍රභෘත්‍යෙෂ දර්ශිතො සුකරඃ පරඃ,

84 ආම්නායානාමාහාන්ත්‍යා වාග්ගීතිරීතිඃ ප්‍රීතිර්භීතිඃ
භොගො රොගො මොදො මොහො ධ්‍යෙයො වෙද්‍යෙ
දෙශෙ ක්ෂෙමෙ.

---

යනු භාවයි; මාර, අනඞ්ගයාගේ; ආත්‍රාය, ජාලයෙහි; අයාතා, පතනයක් නැත්තීද; (භො මැ); යානාචාරා, ලොකාන්තර ගමන චලකන්නාවූ; ආරාවා, මධුරවචන ඇත්තීද (එහෙයින්); ආනායා, ප්‍රාණිය රක්ෂාකරන්නීද; මායා, පරව්‍යාමොහනොපායමැ; ආරාමා, ක්‍රීඩාභූමි කොට ඇත්තීද; සා රාමා, ඒ ස්ත්‍රීතොමෝ; මාසා, චන්ද්‍රයා හා; අමා, එක්වැ; මාරාය, අප විනාශය පිණිස පැමිණියා; 'අසමාංක මුපස්ථිතා' යනු ශෙෂයි— අමසා පීඩායා ආයාමො දීර්ඝතා යස්‍යා ඉත්‍යමායාමා; පීඩයතීත්‍යර්ථඃ.

83 ස්වර, (අකාරාදිවූ) ස්වරයන්ගේද; ස්ථාන, (කණ්ඨතාල්වාදිවූ) ස්ථානයන්ගේද; වර්ණානාම්, (ස්ථානවිවක්ෂා නැතිවැ පරස්පර විලක්ෂණවූ කකාරාදී) වර්ණයන්ගේද; යො නියමඃ, යම් ව්‍යවස්ථා යෙක් ඇත්ද; හෙවත් සංඛ්‍යා නියමයෙක් ඇත්ද; අසෞ (නියමඃ) මේ (නියමතෙමෙ); දුෂ්කරෙෂු. දුෂ්කරබන්ධයන් අතුරෙහි: ඉෂ්ටඃ, අභිමතයි;— එද දුෂ්කරයැයි සේයි; එෂනියමඃ, මේ ස්වරස්ථානාදීන්ගේ නියමය; චතුඃ ප්‍රභෘති, වෙන වෙන ස්වරස්ථානවර්ණයන් සතරදෙනක්හු පටන්කොට එකස්වර එකවර්ණයක්හු දක්වා; දර්ශිතො, දක්වනලැබේ;—පරඃ, මෙයින් අන්‍යවූ පඤ්චප්‍රභෘතිවූ මේ නියමයතෙමෙ; සුකරඃ, සුවසේ කටහැකිහෙයින් ඒ දුෂ්කර නම් නොවෙයි—එහෙයින් මෙහි නොදක්වනලැබේ.

84 ආම්නායානාම්, වෙදයන්ගේ; අන්ත්‍යාවාක්, උපනිෂද්නොමො; ගීතිඃ, සුඛාභිමතවූ ගානයනට; ඊතිඃ, මෘගයනට සෙයින් දුඃඛානුබන්ධනහෙයින් උපද්‍රවවූවධූන්ද; ප්‍රීතිඃ, චිත්තාහ්ලාදන; භීතිඃ, අනානුබන්ධිවිය හෙතුකොටගෙනැ ත්‍රාසයයිද; ආහ, කියයි; භොග (ශව), රූපාදි විෂයානුභවයද; රොගඃ, (සංසාරයෙහි වධබන්ධනාදි දුඃඛයට පමුණුවනහෙයින්) ව්‍යාධියකැයිද; මොදඃ, (රොගසදෘශවූ විෂයොපභොගයෙන්) හර්ෂයද; මොහඃ, (දුඃඛයෙහි සුඛවිපර්‍යාසය හෙතුකොටගෙනැ) අඥානයකැයිද; ආහ, කියා; (යම්හෙයකින් සංසාර චක්‍රය මෙසේ සොපද්‍රවද එහෙයින් මැ:) ක්ෂෙමෙ, (සියලු) උපද්‍රව නැත්තාවූ; දෙශෙ, ස්ථානයෙහි හෙවත් නිර්වාණයෙහි; ධ්‍යෙවේද්‍ය-

85 ඤිති විජිති සම්ති මිහිති ව්‍රතරතයඃ පරගතයඃ
උරු රුරුධුර්ගුරු දුධුවුර්යුධි කුරවඃ ස්වමරිකුලම්.

86 ශ්‍රී දීප්තී හ්‍රී කීර්තයි ධීනීතී ගීඃ ප්‍රීතී
එධෙතෙ වෙවෙතෙ යෙනෙමෙ දෙවෙශෙ.

---

චින්තාධාන ඉච්ඡා දෙක්නා; ධෙ‍්‍යයෙ, විධාතව්‍යයෝයි හෙවත් මොක්ෂයතෙමෙ සිතින් ධැරියැ යුත්තේයැ—එහි මැ ඡන්දය කට යුත්තේයි.

මෙහි ආකාර ඊකාර ඖකාර සතරදෙනාගේ ප්‍රයොගය හෙයින් මේ ශ්ලොකයතෙමෙ චතුඃස්වර නම් වේ.

ධාතං ධාහි දෘදි දශිතයෙන් අවුද නිමිත්තයාගේ දශීනයැයි සේයි. ධා ඉච්ඡා ඡන්දස්‍ය ධෙවෙ.

85 ඤිතිවිජිති, පෘථිවිවිජය; සම්තිමිහිති, වර්ණාශ්‍රමපරිපාක ලක්ෂණවූ ක්ෂෙමයාගේ කිරීමයැ යන මොවුන්ගේ; ව්‍රතරතයඃ, නියමයෙහි ඇලුම් ඇත්තාවූ; පර, උත්කෘෂ්ටවූ; ගතයඃ, ප්‍රඥා ඇති; කුරවඃ, කුරුරාජයෝ; යුධි, යුධයෙහි; ස්වම් අරිකුලම්, තමන්ගේ ශත්‍රුකුලය; උරු, අත්‍යර්ථයෙන්; රුරුධුඃ, වැළැක්කූහ; ගුරු, බල වත්කොට; දුධුවුඃ, කම්පා කොළෝ– නැසූහයි සේයි—ගුරු යනු අරිකුලම් යන්නට විශෙෂණ හෝ කටයුතු.

මෙහි ඉකාර අකාර උකාර තුන්දෙනාගේ ප්‍රයොගයෙන් මේ ත්‍රිස්වර නම් වේ.

86 යෙ වෙවෙ, යම් පදාර්ථයෝ දෙදෙනෙක් දෙදෙනෙක්; දෙවෙශෙ, සුරපතිහු කෙරෙහි; තසත්‍ය, නැත්තාහුද; තෙ ඉමෙ වෙ වෙ, ඒ මේ දෙදෙපදාර්ථයෝ; තෙ, තට; එධෙතෙ, වඩිත්;(ඔහු කවුරුද යත:) ශ්‍රී දීප්ති, සම්පත්තිය හා ශරීරදීප්තිය යන දෙන්නයැ; හ්‍රී කීර්ති, (අකාර්‍ය්‍යසංකොචලක්ෂණවූ) ලජ්ජා හා (හැමතන්හිමැ ගුණඛ්‍යාත ලක්ෂණවූ) කීර්තියැ යන දෙන්නයැ; ධීනීති, (හෙයොපාදෙය ලක්ෂණවූ) බුඩිය හා (ත්‍රිවර්ගානුබන්ධිවූ සම්‍යක්ප්‍රයොගාඛ්‍යවූ) නීතිය යන දෙන්නයැ; ගීඃ ප්‍රීති, (මධුරවූ) වාක් හා (තදනුගුණවූ) ප්‍රීතිය යන දෙන්නයයි මෙසේ දෙදෙපදාර්ථයෝ; එධෙතෙ, වඩිත්.

මෙහි ඊකාර එකාර දෙන්නාගේ මැ ප්‍රයොගය හෙයින් මේ ද්විස්වර නම්.

87 සාමායාමා මායා මාසා මාරානායා යානාරාමා
යානාවාරා රාවානායා මායාරාමා මාරායාමා.

ස්වරනියමඃ.

88 නයනානන්දජනනෙ නක්ෂත්‍රගණශාලිනි
අඝනෙ ගගනෙ දෘෂ්ටිරඞ්ගනෙ දීයතාං සකෘත්.

89 අලිනීලාලකලතං කං න හන්ති ඝනස්තනි
ආනනං නලිනච්ඡායනයනං ශශිකාන්ති තෙ.

90 අනඞ්ගලඞ්ඝනාලග්න නානාතඞ්කා සදඞ්ගනා
සදානඝ සදානන්ද! නතාඞ්ගා සඞ්ග සඞ්ගත!. *

87 මේ එකස්වරොදාහරණය පළමුකොට සර්වතොභද්‍රයට කී උදාහරණමය. එහෙයින් එයට කී පරිද්දෙන් අර්ථ දතයුතු.

මෙසේ චතුර්විධ ස්වරනියම දතයුතු—

88 අඞ්ගනෙ!, කාන්තාව; නක්ෂත්‍රගණශාලිනි, තාරකාසමූහයෙන් යුක්තවූ; අඝනෙ, මේඝයක් නැත්තාවූ; (එහෙයින්ම) නයනානන්දජනනෙ, ලොචනයට සන්තොෂ උපදවන්නාවූ: ගගනෙ, ආකාශයෙහි; දෘෂ්ටිඃ. දෘෂ්ටිතොමො; සකෘත්, එක්වරෙකැ; දීයතාම්, දෙනුලැබේවා;—

මේ කණ්ඨ තාලව්‍ය සිරස් දන්තයන්ගේම ප්‍රයෝගහෙයින් මේ චතුස්ථානික නම්.

89 ඝනස්තනි, ඝනවූ ස්තන ඇත්තිය!; අලි, භෘඞ්ගයන්ගේ; නීල, නිල්වූ; අලකලතං, කියඹුලතා ඇති; නලිනච්ඡාය නයනම්, පද්මයට බඳු ශොභා ඇති නෙත්‍ර ඇති; ශශිකාන්ති, චන්ද්‍රයාට බඳු කාන්ති ඇති; තෙ ආනනං, තීගේ මුඛය; කං න හන්ති, කවරක්හු නොපහරණේද; හෙවත් කවරක්හු නම් දසවන අවස්ථාවට නො පමුණුවන්නේද?.

මෙහි කණ්ඨ තාලව්‍ය දන්තයන්ගේම ප්‍රයොගහෙයින් මේ ත්‍රිස්ථාන නම්.

90 හෙ සදානඝ, හැමකල්හිම පාපයක් නැත්තව්;: එහෙයින්ම සදානන්ද නතාඞ්ග, ශොභනවූ සන්තොෂ හා අවනතාඞ්ග ඇති තැ නැත්තව; අසඞ්ගසඞ්ගත, අන්‍යස්ත්‍රීසමෙභාගයෙහි ඇළුනව; සදඞ්ගනා, තාගේ ස්ත්‍රීවූ හෙවත් අව්‍යභිචාරිණීවූ අඞ්ගනාතොමෝ; අනඞ්ගලඞ්ඝනා, කාමාභිභවයෙන්; අලග්න, ආසක්තවූවා හෙවත් උත්පන්නවූවා; නානාතඞ්කා, අනෙකප්‍රකාරවූ පීඩා ඇත්තීයි—

* සඞ්ගතඃ-කා.

91 අගා ගාඞ්ගාඞ්ගකාකාක ගාහකාඝකකාකහා
අහාහාඞ්ග ඛගාඞකාගකඞකාගඛගකාකක.

ස්ථානනියමඃ.

92 රෙ රෙ රොරූ රුරූ රොරු ගාගොගෝ ගාඞ්ගගෝගඞ්ඝඃ
ඛං කෙකාකාකුකඃ කාකො මාමා මාමම මාමම.

---

මෙසේ කිසි කාන්තාවක් අන්‍යවිෂයාතුරකත වල්ලභයක්හු තමාගේ යෙහෙළිය කරා එළවනු කැමැතිව කීවා ගතයුතු.

මෙහි කණ්ඨ්‍යවර්ණයන්ගේම ප්‍රයෝගහෙයින් මේ විස්ථාන නම්.

91 හෙ අහාහාඞ්ග, මා මා යන ආවේග සහිතවූ ප්‍රතිෂේධවචන යට නොයන්නව; ඛග, ආදිත්‍යයා; අඞක, විශ්නිතකොට ඇති; අග, පර්ව්තයෙහි හෙවත් සුමේරුයෙහි; කඞක, කීර්තිවාරයෙන් ඇවිදින්නට; අග, කුටිලවූ; ඛ, ඉන්ද්‍රියයන් කරා; ගක, යන්නාවූ; (කුත්සිතයන් කෙරෙහි හෙවත් අදාන්තේන්ද්‍රියවූ බාලයන්කෙරෙහි) අකක, අලුබ්ධය (හෙවත් සතතසංසර්ගයෙහි වෛෂිට්‍යයෙන්) නො ඇළුනව; ගාඞගක, ගඞ්ගාප්‍රතිබද්ධවූ ජලයට; අක, කුටිලගත්ව; ආක, හාත්පසින් ශබ්දකරන්නහු කරා; ගාහක, අවගාහකරන්නව; එහෙයින්ම අඝක, කුත්සිතවූ පාප නමැති; කාකහා, කාක යන් නසන්නාවූ තො; ගාං, ස්වර්ගයට; අගාඃ, ප්‍රාප්තයෙහිසි—

අකති කුටිලං ගච්ඡතීත්‍යකඃ—අක-කුටිලායාං ගතෞ යන ධාතුහු කෙරෙන් කර්තෘකාරකයෙහි අවයි. ආ සමන්තා දකායන් ශබ්දයතීත්‍යාකාකම්;-කං ච තත් ආකාකං චෙති කාකාකම්;-ගඞ්ගායා ඉදම් ගාඞගම්;-ගාඞගඤ්ච තත් කාකාකං චෙති ගාඞගකාකාකම්;-තත්‍යත්‍යස්‍ය වා ගාහකඃ ප්‍රවෙෂ්ටා ගාඞගකාකාකගාහකඃ;- හෙ ගාඞගකාකාකගාහක! ඛෙ ආකාශෙ ගච්ඡන්ති ඛගඃ;- ඛගඃ අඞ්කම් චිහ්නමස්‍යෙති ඛගාඞකඃ;- සශවාසා අගස්චෙති ඛගාඞකාගඃ;- සුමෙරුරිතියාවත්- තං කඞකාති කීර්ත්තිවාරෙන ගච්ඡතීති ඛගාඞකාග කඞකඃ;- හෙ ඛගාඞකාගකඞක;- අගන්ති කුටිලං ගච්ඡන්තීත්‍යගානි;- අගානි ච තානි ඛානීන්ද්‍රියානි චෙති අගඛානි;- තානි ගච්ඡන්තීති අගඛගාඃ;- අදාන්තේන්ද්‍රියාඃ ඉති භාවඃ;- තදෙව අගඛගකාඃ;- තෙසු අකකඃ අලොලඃ; හෙ අගඛගකාකක.

මෙහි කණ්ඨ්‍යවර්ණයන්ගේ ප්‍රයොගහෙයින් මේ එකස්ථාන නාම්. මෙසේ චතුර්විධවූ ස්ථානනියමයද දතයුතු.

92 රෙ රේ, කොල කොල; රොරූ රුරූ, අත්‍යර්ථයෙන්ම හඬන්නාවූ රුරු මෘගයාගේ; උරඃ, වක්ෂස්හුගේ; රුග්, පැළීම් නැමති; ආගො

93 දෙවානාං නන්දනො දෙවො නොදනො වේදනින්දිනඃ
දිවං දුදාව නාදෙන දානෙ දානවනන්දිනඃ,

94 සූරිඃ සුරා සුරා සාරි සාරඃ සාරස සාරසාඃ
සසාර සරසීඃ සීරී සසූරුඃ ස සුරාරසී.

---

ගඃ, පාපයට ගියෙහි; අගාඞගඃ, පර්‍වතෛකදෙශයෙහි වසන්නෙහි; අගගුඃ, වෘක්‍ෂමූලයෙහි ව්‍යවස්ථිත ගෙරි ඇත්තෙහි; අමම, නිෂ්පරිග්‍රහවූ; මාම්, මා කරා; මාමා(ගච්ඡ), නො එ—

තරුමූලගත ගොමානීතාඃපීඃ.

පර්‍වතෛකදෙශවාසීවූ ගොපාලයක්හු මෘගවධය කොට සමීපයට ආවහු තපස්වියෙකු හට මෙසේ වැලැකූහයි දතයුතු. * මෘගවධයෙහි පාප නම් වේවයි මාගෙ දණ්ඩනය වළකන්නේ කුමක් පිණිස ද යන ගෝපාලයාගේ වචනයට නැවතද කියත්.

අමම, පරිග්‍රහක්ලේශොපහතය; කෙකාකාකුකඃ, කෙකාධ්වනියෙන් ශබ්දකරන; කාකඃ, කවුඩුයෙක්; (සම්භවති) කිම්, සම්භවන්නේද (නොවන්නේමැයි). එසේම අපබඳුවූවන් හා තා සෙ වූ බාලයන්ගේ සම්පර්කය නොවන්නේය කීවා වෙත්.

භෘශමභික්‍ෂණං රෞතීති රොරූඃ; රූරොරුරඃ- රුගාගොගඃ- අගස්‍ය පර්‍වතස්‍යාඞගමෙකදෙශඃ-තං ගතඃ අගාඞගඃ-අගෙෂු තරුෂු ව්‍යවස්ථිත ගාවොයස්‍යසඃ අගගුඃ- කෙකා මයූරධ්වනිඃ- තස්‍යාඃ කාකුඃ- තයා කායති ශබ්දයති ඉති කෙකාකාකුකඃ.

93 දෙවානාං නන්දනඃ, දේවතාවන් සම්බන්ධව සතුටුකරන්නාවූ; වෙද නින්දිනඃ, ධර්මාධික්‍ෂෙපයකරන්නාවූ ලොකයාගේ; නොදනඃ, නිෂෙධය කරන්නාවූ; දෙවඃ, විෂ්ණුතෙම; දානවනන්දිනඃ, අසුරෙශ්වරවූ හිරණ්‍යකසිපු කෛටභාදීහුගේ; දානෙ, ඛණ්ඩනයෙහි ලා; නාදෙන, හඬින්; දිවං, ස්වර්ගලොකය; දුදාව, සාසංකා කෙළේ.

මෙහි දකාර වකාර නකාරයන්ගේම ප්‍රයොගහෙයින් ත්‍රිවර්ණී නම්

94 සසිරි, ඒ බලභද්‍රතෙම; සූරිඃ, සර්වකොවිදවූයේ; සුරාසුරාසාරි, සුරයන් කරා හා අසුරයන් කරා පැමිණෙනසුලුවූ; සාරඃ, සම්පීඇත්තේ; හෙවත් නයවික්‍රමසම්පන්නවූයේ; සසූරුඃ, ශොභනවූ ඌරු සහිතවූයේ; සුරාරසී, මදිරාස්වාදය කරන්නේ; සාරසසාරසාඃ, මුඛරවූ පක්‍ෂිශ්‍රෙණියක් ඇති; සරසීඃ, ගෘහදීර්ඝිකාවන්; සසාර, වාපිවිභාගයොගයෙන් අනුභව කෙළේ.

මෙහි සකාර රෙඵ දෙන්නාගේ ප්‍රයොගහෙයින් ද්විවර්ණී නම්.

---

* බද්ධපණ්‍යායාඃ කාසහාශ්වමාරාඞගණායාඃ ස්වම්භිලක්‍ෂණත්‍යා කඤ්චිත් පුලින්දං ප්‍රති මෙවමෙතාතිරියම-ප්‍රෙ ।०.

95 නූනන්නුන්නානි නානෙන නානනෙනානනානි නඃ
නානෙනානනුන්නානූනෙ නෙනෙනානානිනො නිනීඃ,

වර්ණනියමඃ.

96 ඉති දුෂ්කරමාර්ගෝපි * කිඤ්චිදාදර්ශිතඃ ක්‍රමඃ
ප්‍රහෙලිකාප්‍රකාරාණාං පුනරුද්දිශ්‍යතෙ ගතිඃ,

97 ක්‍රීඩාගොෂ්ඨී විනොදෙෂු තජ්ඥෛරාකීර්ණමන්ත්‍රණෙ
පරව්‍යාමොහනෙ චාපි සොපයොගාඃ ප්‍රහෙලිකාඃ.

---

95. නූනං, ඒකාන්තයෙන්; නඃ, අපගේ; ආනනානි, මුඛයෝ; අනෙන, සමක්ෂු හා යුඬකටයුතුද ඒ මේ පුරුෂයා විසින්; ආනනෙන, හිරුමඬලසේ තෙජස්විවූ තමාගේ මුඛයෙන්; නනුන්නානි, අනභිභූතයෝ නොවෙත්, හෙවත් අභිභූතයෝමැයි; එනෙන, පූජොකතවූ; අනූනෙ, අධිකවූ හෙවත් අතිබලීයවූ පුරුෂයා හා යුඬකරන්නව! අනාන්, ජීව්වූ ප්‍රාණීන්; නිනීඃ, මේහෙයනු කැමතිවූ; ඉනඃ, අපට ස්වාමිවූ; නා, පුරුෂතෙම; නනු, ඒකාන්තයෙන්; න අනෙනාඃ, නිෂ්පාප නොවෙ හෙයින්, පාපසංහතමැයි.

එනං පාපං විද්‍යතෙස්‍යත්‍යනෙනාඃ- නෙතුවනති යො කර්තු ලිච්ඡතීති සනනනාඃ- නයතිහි කෙරෙන් ක්විප් කළ කල්හි රූපයයි.

මෙහි හුදෙක් නකාරම ප්‍රයුක්තහෙයින් මේ එකාක්ෂර නම්.

96. ඉති, මෙසේ උක්තප්‍රකාරයෙන්; දුෂ්කරමාර්ගෝපි, දුෂ්කරවූ කාව්‍යප්‍රයොගයද; කිඤ්චිත්, සංක්ෂෙපයෙන්; ආදර්ශිතඃ ක්‍රමඃ, දක්වනලද ස්වභාවඇත්තේය; පුනඃ, නැවත; ප්‍රහෙලිකාප්‍රකාරාණාං, ප්‍රහෙලිකා විකල්පයන්ගේ; ගතිඃ, ස්වරූපය; උද්දිශ්‍යතෙ, ප්‍රතිපාදනය කරනුලැබේ.

97 ක්‍රීඩා, රසවත්වූ; ගොෂ්ඨී, කාව්‍යාලාපරූපවූ; විනොදෙෂු, සුවසේ කාලප්‍රෙහාරණලක්ෂණ විනොදයෙහිද; තජ්ඥෛඃ, ඒ ප්‍රහෙලිකා දන්නවුන් විසින් හා; ආකීර්ණමන්ත්‍රණෙ, ජනසම්බාධස්ථානයෙහි ගුප්තභාෂණ ඇතිකල්හිද; පරව්‍යාමොහනෙ චාපි, ප්‍රහෙලිකා ලක්ෂණ නොදන්නාවූ අන්‍යයන්ගේ ආකුලිකරණයෙහිද; ප්‍රහෙලිකාඃ, ප්‍රහෙලිකාවෝ; සොපයොගාඃ, ප්‍රයෝජනසහිතයෝයි. †

---

* දුෂ්කරමාර්ගෙපි-ක.

† සොප්‍රයොගාඃ, ප්‍රයොගසහිතයෝය-ඇතැම්.

98 ආහුස්සමාගතානාම ගූඪාර්ථං පදසන්ධිනා
වඤ්චිතාන්‍යත්‍ර රූඪේන යත්‍ර ශබ්දේන වඤ්චනා.

99 ව්‍යුත්ක්‍රාන්තාතිව්‍යවහිතප්‍රයෝගාන්මෝහකාරිණී
සා ස්‍යාත් ප්‍රමුෂිතා යස්‍යා* දුර්බෝධාර්ථා පදාවලී.

100 සමානරූපා ගෞණාර්ථා රොපිතෛර්ග්‍රථිතා පදෛඃ
පරුෂා ලක්ෂණාස්තිත්වමාත්‍රව්‍යුත්පාදිතශ්‍රුතිඃ.

101 සඞ්ඛ්‍යාතා නාම සඞ්ඛ්‍යානං යත්‍ර ව්‍යාමෝහකාරණම්
අන්‍යථා භාසතෙ යත්‍ර වාක්‍යාර්ථඃ සා ප්‍රකල්පිතා.

---

98 පදසන්ධිනා, සුබන්ත තිඞන්ත පදයන්ගේ සටනාව හෙතු කොටගෙන; ගූඪාර්ථං, නොදතහැකි අර්ථ ඇති ප්‍රහෙලිකාව; සමාගතානාම, සමාගතා නමැයි; ආහුඃ, තඥයෝ කියත්; යත්‍ර, යම් ප්‍රහෙලිකාවෙක්හි; අන්‍යත්‍ර, අර්ථාන්තරයෙක්හි; රූඪේන, ප්‍රසිද්ධවූ; ශබ්දේන, ශබ්දයෙන්; වඤ්චනා, විවක්ෂිතවූ අර්ථයෙන් අනික් අර්ථයෙක්හි බුද්ධිය උපදවනහෙයින් වඤ්චනයද; (සා, ඒ ප්‍රහෙලිකා තොමෝ;) වඤ්චිතා, වඤ්චනාපරහෙයින් **වඤ්චිතා** නම් වේ.

99 අතිව්‍යවහිතප්‍රයෝගාත්, අත්‍යන්තයෙන් ප්‍රකෘෂ්ටවූ පදයන්ගේ කඨිනයෙන් නොහොත් යොජනයෙන්; (යා, යම් ප්‍රහෙලිකාවක් තොමෝ;) මෝහකාරිණී, විපරීතාර්ථප්‍රතීතිය කරනසුලුද; සා, ඒ ප්‍රහෙලිකා තොමෝ; ව්‍යුත්ක්‍රාන්තා, ව්‍යවහිතපදප්‍රාධාන්‍යයෙන් **ව්‍යුත්ක්‍රාන්තා** නම් වන්නීය; යස්‍යාඃ, යම් ප්‍රහෙලිකාවක් සම්බන්ධිවූ; පදාවලී, පදසමුදායතෙම; දුර්බෝධාර්ථා, දුකින්ම දතහැකි අර්ථ ඇත්තීද; සා, ඒ ප්‍රහෙලිකා තොමෝ; ප්‍රමුෂිතාස්‍යාත්, අපගිතවූ අර්ථ ඇතිබව හෙතුකොටගෙන **ප්‍රමුෂිතා** නම් වන්නීය.

100 ගෞණාර්ථ, මුඛ්‍යාර්ථයෙන් අනික් අනික් අර්ථයෙක්හි; ආරෝපිතෛඃ, එහිටුවනලද; පදෛඃ, ශබ්දයෙන්; ග්‍රථිතා, විරචිතවූ; (යා, යම් ප්‍රහෙලිකාවක් ඇද්ද;) සා, ඕ තොමෝ; සමානරූපා, සදෘශවූ අර්ථාන්තරප්‍රතිපාදනපරත්වය හෙයින් **සමානරූපා** නම් වෙයි; ලක්ෂණ, ශබ්දශාස්ත්‍රයන්ගේ; අස්තිත්වමාත්‍ර, සද්භාවමාත්‍රයකින්; ව්‍යුත්පාදිත, සංස්කෘතවූ; ශ්‍රුතිඃ, පදයන් ඇති; යම් ප්‍රහෙලිකාවක් ඇද්ද; සා, ඕ තොමෝ; පරුෂා, ප්‍රයොගප්‍රතීතාරසවිරහයෙන් **පරුෂා** නම් වන්නීයි.

101 යත්‍ර, යම් ප්‍රහෙලිකාවෙක්හි; සඞ්ඛ්‍යානං, එකත්වාදි සංඛ්‍යාව; ව්‍යාමෝහකාරණම්, අර්ථතත්වාප්‍රතිපත්තිය හෙයින්

---

* යස්‍යං-ක.

102 සා නාමාන්තරිතා යස්‍යා * නාමිනි නානාර්ථකල්පනා.
නිභෘතා නිභෘතාන්‍යාර්ථා තුල්‍යධර්ම්මස්පෘශා ගිරා.

103 සමානශබ්දෝපන්‍යස්ත ශබ්දපර්‍ය්‍යායසාධිතා·
සම්මූඪා නාම යා සාක්ෂාන්නිර්දිෂ්ටාර්ථාපි මූඪයෙ.

---

ව්‍යාමොහයට කාරණද; සා, ඕ තොමෝ; සඞ්ඛ්‍යාතා නාම, විවක්ෂිතාර්ථය සංඛ්‍යාමුඛයෙන්ම සමුනෙනය හෙයින් **සඞ්ඛ්‍යාතා** නම් වන්නීය; යත්‍ර, යම් ප්‍රහෙලිකාවෙක්හි; වාක්‍යාර්ථඃ, පදසමුදායයාගේ අර්ථය අනික්පරිද්දකින් අවස්ථිතවූයේ; අන්‍යථා, තද්විපරීතප්‍රකාරයකින්; භාසතෙ, වැටහේද; සා, ඒ ප්‍රහෙලිකාතොමෝ; ප්‍රකල්පිතා (ස්‍යාත්), අන්‍යථාවිකල්පනාපරත්වය හෙතුකොටගෙන **ප්‍රකල්පිතා** නම් වන්නීයි.

102 යස්‍යාඃ, යම් ප්‍රහෙලිකාවක් සම්බන්ධිවූ; නාමිනි, සංඥයෙහි; නානාර්ථකල්පනා, අනෙකාර්ථයන්ගේ උද්භාවනය වේද; සා, ඕ තොමෝ; නාමාන්තරිතා, නාමින් ව්‍යවස්ථිතවූ අර්ථ ඇතිහෙයින් **නාමාන්තරිතා** නම් වන්නීය; තුල්‍යධර්ම්මස්පෘශා, විවක්ෂිතාර්ථයට සදෘශවූ ගුණය ස්පර්ශකරන්නාවූ; ගිරා, වචනය හෙතුකොටගෙන; නිභෘතාන්‍යාර්ථා, ව්‍යවස්ථිතවූ අන්‍යාර්ථ ඇත්තී; නිභෘතා, **නිභෘතා** නම් වන්නීයි.

103 උපන්‍යස්ත, තදර්ථානුසාරයෙන් ප්‍රකල්පිතවූ; ශබ්දපර්‍ය්‍යාය, විවක්ෂිතාර්ථවාචකත්වයෙන් ප්‍රසිද්ධවූ ශබ්දයහට පර්‍ය්‍යායවූ ශබ්දාන්තරයෙන්; සාධිතා, රචිත වී; සමානශබ්ද, **සමානශබ්ද** නම් ප්‍රහෙලිකායි.

"උපන්‍යස්තපර්‍ය්‍යාය අර්ථසාධිතා" යන පාඨයකුදු ඇත, එහි- උපන්‍යස්ත, අර්ථානුක්‍රමයෙන් කල්පිතයහට; පර්‍ය්‍යායාර්ථා, පර්‍ය්‍යායවූ ශබ්දාන්තරයක්හුගේ අර්ථයෙහි; සාධිතා, ප්‍රයුක්තාවී සමානශබ්ද නාමැයි අර්ථ කියනු.

සා, යම් ප්‍රහෙලිකාවක්; සාක්ෂාත්, වාචකව්‍යාපාරයෙන්; නිර්දිෂ්ටාර්ථාපි, දක්වනලද්දාවූ අර්ථ ඇත්තීද; මූඪයෙ (ස්‍යාත්), තත්වාර්ථ සාගේ අප්‍රතිපත්තිය පිණිස වන්නීද; (සා, ඕතොමෝ;) සම්මූඪා නාම, **සම්මූඪා** නම් වේ.

---

* යස්‍යාං-ක.

104 යොගමාලාත්මිකා නාම යා ස්‍යාත් සා පාරිහාරිණී *
එකච්ඡන්නාශ්‍රිතං ව්‍යාජ † යස්‍යාමාශ්‍රයගොපනම්.

105 සා භවෙදුභයච්ඡන්නා යස්‍යාමුභයගොපනම්
සඞ්කීර්ණා නාම සා යස්‍යාං නානාලක්ෂණසඞ්කරඃ.

106 එතාඃ ෂොඩශනිර්දිෂ්ටාඃ පූර්වාචාර්‍යෛඃ ප්‍රහෙලිකාඃ
දුෂ්ටප්‍රහෙලිකාශ්චාන්‍යාසෙපරෛරධීතාශ්චතුර්දශ.

107 දොෂානපරිසංඛ්‍යෙයාන් මන්‍යමානා වයං පුනඃ
සාධ්වීරෙවාභිධාස්‍යාමස්තා දුෂ්ටා යාස්ත්වලක්ෂණාඃ.

---

104 යා, (යස්‍යාඃ,) යම් ප්‍රහෙලිකාවක් සම්බන්ධවූ; නාම, සංඥාව; යොගමාලාත්මිකා, සම්බන්ධයාගේ බාහුල්‍යයම ස්වරූපකොට ඇත්තීද; සා, ඒ ප්‍රහෙලිකාතොමෝ; පාරිහාරිණී ස්‍යාත්, පාරිහාර යොගයෙන් පාරිහාරිණී නම් වන්නීය; යස්‍යාං, යම් ප්‍රහෙලිකාවෙක්හි ලා; ආශ්‍රිතම්, ආදෙයවූවහු; ව්‍යාජං, ප්‍රකාශකොට හෙවත් ඉදුරා කියා; ආශ්‍රය, ආශ්ලෙෂ ආධාරයාගේ; ගොපනම්, තද්වාචකාභාවයෙන් සැඟවීමද; සා, ඒ ප්‍රහෙලිකා තොමෝ; එකච්ඡන්නා භවෙත්, එකක්හුම සඟවනලදහෙයින් **එකච්ඡන්නා** නම් වන්නීයි.

105 යස්‍යාං, යම් ප්‍රහෙලිකාවෙක්හි; උභයගොපනම්, ආශ්‍රය ආශ්‍රිත දෙන්නාගේ සැඟවීමද; සා, ඒ ප්‍රහෙලිකාතොමෝ; උභයච්ඡන්නා භවෙත්, උභයච්ඡන්නා නම් වන්නීය; යස්‍යාං, යම් ප්‍රහෙලිකාවෙක්හි; නානාලක්ෂණ සංකරඃ, සමාගතාවඤ්චිතාදීන් සම්බන්ධවූ නොයෙක් ලක්ෂණයන්ගේ එක්වීමද; සා, ඕතොමෝ; සඞ්කීර්ණා නාම භවෙත්, **සඞ්කීර්ණා** නම් වන්නීයි.

106 පූර්වාචාර්‍යෛඃ, රාමශර්මාදීන් විසින්; එතාඃ, මේ; ෂොඩශ ප්‍රහෙලිකාඃ, ප්‍රහෙලිකාවෝ සොලොස්දෙන; නිර්දිෂ්ටාඃ, දක්වනලදහ; පරෛඃ, ඒ පූර්වාචාර්‍යවරයන් විසින්; අන්‍යාඃ, සෙසු; චතුර්දශ දුෂ්ටප්‍රහෙලිකාඃ ච, දුෂ්ටප්‍රහෙලිකාවෝ තුදුස්දෙනෙක්ද; අධීතාඃ, දක්වනලදහු.

107 වයං පුනඃ, අපි වනාහි; අපරිසංඛ්‍යෙයාන්, ලක්ෂ්‍යලක්ෂණ හෙයින් අප්‍රතිපදුවූ; දොෂාන්, ප්‍රහෙලිකායෙහි වන්නාවූ දොෂයන්; මන්‍යමානාඃ, සිතන්නාවූ; සාධ්වීරෙව, ශොභනවූම ප්‍රහෙලිකාවන්; අභිධාස්‍යාමඃ, කියම්හ; යාස්තු, යම් ප්‍රහෙලිකා කෙනෙක් වනාහි; අලක්ෂණාඃ, ලක්ෂණරහිතවූවාහු; දුෂ්ටාඃ, දුෂ්ටයෝද; තාඃ, ඒ ප්‍රහෙලිකාවන්; නාභිධාස්‍යාමඃ, නොකියම්හ.

---

* පාරිහාරිකා-ඛ.   † ව්‍යක්තං-ක.

108 නා මියශොරසාභිඥං චෙතඃ කස්මාත් ප්‍රකුප්‍යසි
අස්ථානරුදිතෛරෙභිරලමාලොහිතෙක්ෂණෙ.

109 කුබ්ජාමාසෙව්මානස්‍ය යථා තෙ වඩිතෙ රතිඃ
නෛවං නිර්විශතො නාරීරමරස්ත්‍රීවිඩම්බිනීඃ.

110 දණ්ඩෙ චුම්බති පද්මින්‍යා හංසඃ කර්කශකණ්ටකෙ
මුඛං වල්ගුරවං කුර්වංස්තුණ්ඩෙනාඞ්ගානි ඝට්ටයන්.

111 ඛාතයඃ කනි කාලෙ තෙ ස්ථාතයඃ ස්ථාරධාරවාඃ *
වන්ද්‍ර සාක්ෂාද්භවත්‍යත්‍ර නාසවො† මම ධාරිණඃ.

108 ආලොහිතෙක්ෂණෙ, රත්වූ නෙත්‍ර ඇත්තිය; මෙ. මාගේ; චෙතඃ, සිත; අගොරසාභිඥං න, අපරාදරසදන්නේ නොවෙයි; එහෙයින් නිරපරාධවූ මට; කස්මාත්ප්‍රකුප්‍යසි, කුමට කිපෙසිද; එභිඃ අස්ථානරුදිතෛඃ, මේ අස්ථානයෙහි හැඩීමෙන්, අලම්, පමණි.

මෙහි මෙ අගොරසාභිඥං යන මේ පද දෙන්නාගේ අසාදෙශ ස්වරූපවූ සන්ධියෙන් විවක්ෂිතාර්ථය සඟවනලදහෙයින් මේ ප්‍රහෙලිකාතොමෝ **සමාගතා** නම් වන්නීයි.

109 කුබ්ජාං, කුදු; ආසෙව්මානස්‍ය, සෙවුනාවූ; තෙ, තට; රතිඃ, ප්‍රීතිතොමො; යථාවඩිතෙ, යම්සේ වඩනීද; අමරස්ත්‍රීවිඩම්බිනීඃ, දිව්‍යාඞ්ගනාවන් හා සමවූ; නාරීඃ, අඞ්ගනාවන්; නිර්විශතඃ, අනුභවකරන්නාවූ; තෙ. තාගේ; රතිඃ, ප්‍රීතිතොමෝ; එවනනවඩිතෙ, මෙසේ නොවඩනීයි;—

110 හංසඃ, හංසතෙම; කර්කශකණ්ටකෙ, ක්‍රෑරවූ කටු ඇති; දණ්ඩෙ, පද්මිනීනාලයෙහි; අඞ්ගානි, අවයවයන්; ඝට්ටයන්, ඝට්ටන්නේ; හෙවත් ශරීරකඬූතිය දුරුකරන්නේ; වල්ගු, මනොහරවූ; රවං, නාදය; කුර්වං, කරන්නේ; තුණ්ඩෙන, තුඩින්; පද්මින්‍යාඃ, පද්මිනී ලතාවගේ; මුඛම්, පද්මස්වරූපවූ මුඛය; චුම්බති, සිඹියේය.

මෙහි දණ්ඩෙ චුම්බති යනාදීන් ව්‍යවහිතප්‍රයොගය හෙතු කොටගෙන මොහවනහෙයින් මේ ප්‍රහෙලිකාතොමො **ව්‍යුත්ක්‍රාන්තා** නම් වන්නීයි.

111 කනි, කනිකාව; තෙ, තාගේ; වන්ද්‍ර, මනොඥවූ; කාලෙ, චරණයෙහි; ඛාතයඃ, නූපුරාදිස්වරූපවූ කිඞ්කිණීකයෝ; ස්ථාතයඃ,

* ස්ථාතයඃ ස්ථාහීවල්ගවඃ-ක. † වායවඃ-ක.

112 අන්‍යොද්‍යානෙ මයා දෘෂ්ටා වල්ලරී පඤ්චපල්ලවා
පල්ලවෙ පල්ලවෙ වාද්‍රා * යස්‍යාඃ කුසුමමඤ්ජරී.

113 සුරාඃ සුරාලයෙ ස්වෛරං භ්‍රමන්ති දශනාර්චිෂා
මජ්ජන්ත ඉව මත්තාස්තෙ සෞරෙ සරසි සම්ප්‍රති.

---

සිටියාවූ නොහොත් පසඹාපනාවූ ශොභා ඇත්තාවූ; සඵාරධාරවාඃ, මධුරධ්වනි ඇත්තාහු; සාක්ෂාද්භවන්ති, ප්‍රත්‍යක්ෂබවට පැමිණෙති; හෙවත් අසනුලැබෙතියි සේයි; අත්‍ර, මෙබඳුවූ මනොහරවූ වස්තූන් ප්‍රත්‍යක්ෂකිරීමෙහි; මම අසවඃ, මාගේ ප්‍රාණයෝ; න ධාරිණඃ, නො සිටිනාහුයි; යන්නාහුයයි සේයි.

මෙහි උක්තප්‍රකාරයෙන් නොදැනැකි අර්ථ ඇති පදයන්ගේම ප්‍රයොගය හෙතුකොටගෙන මෙම ප්‍රහෙලිකාතොමෝ ප්‍රමුෂිතා නම් වන්නීයි.

112 යස්‍යාඃ, යම් ලතාවකගේ; පල්ලවෙ පල්ලවෙ, පලුපත්හි පලුපත්හි; ආද්‍රා, ආර්ද්‍රවවූ; කුසුමමඤ්ජරී, මල්කැන් ඇද්ද; පඤ්චපල්ලවා, පලුපත්පසක් ඇති; සා වල්ලරී, ඒ ලතාතොමෝ; අන්‍යොද්‍යානෙ, මේ උයන්හි; මයා, මා විසින්; දෘෂ්ටා, දක්නාලද්දීය.

මෙහි ස්ත්‍රීත්වාදිසාධර්ම්‍යය හෙතුකොටගෙන වල්ලරීශබ්දයෙන් කිසිකාන්තාවක් විවක්ෂිතවූව එසේම පල්ලවශබ්දයෙනුදු සාධර්ම්‍යය හෙතුකොටගෙන අඟුලිහු විවක්ෂිතයහ. කුසුමමඤ්ජරීශබ්දයෙනුදු නඛයෝ විවක්ෂිතවූද එහෙයින් මෙසේ ගෞණාර්ථයෙහි ප්‍රයුක්ත වල්ලරී ආදිවූ ශබ්දයෙන් විරචිතහෙයින් මේ ප්‍රහෙලිකා තොමෝ සමානරූපා නම් වන්නීය.

113 තෙ සුරාඃ, ඒ සෞණ්ඩිකයෝ හෙවත් රාසොඬහු; මත්තාඃ, මත්වූවාහු; සුරාලයෙ, මදිරාමන්දිරයෙහි; සම්ප්‍රති, දැන්; සෞරෙ සරසි, සුරා නැමැති විල්හි ලා; මජ්ජන්ත ඉව, ගිලෙන්නවුන් වැන්නාහු; දශනාර්චිෂා, හාත්පසින් තෙවුනාහු; භ්‍රමන්ති, ඇවිදිත්.

මෙහි සෞණ්ඩිකවාචකවූ සුරාශබ්දයාගේද සරසට විශෙෂණත්වයෙන් සිටි සෞරශබ්දයාගේ ද අප්‍රසිද්ධය හෙතුකොටගෙන එබඳු ලක්ෂණයකුදු නොවනහෙයින් මේ ප්‍රහෙලිකා තොමෝ පරුෂා නම් වන්නීයි.

---

* තාම්‍රා-කා,

114 නාසික්‍යමධ්‍යා පරිතශ්චතුර්වර්ණවිභූෂිතා
අස්ති කාචිත් පුරී යස්‍යාමෂ්ටවර්ණාහ්වයා නෘපාඃ.

115 ගිරා ස්ඛලන්ත්‍යා නම්‍රේණ ශිරසා දීනයා දෘශා
තිෂ්ඨන්තමපි සොත්කම්පං වෘද්ධෙ! මාං නානුකම්පසෙ.

116 ආදෞ රාජත්‍යධීරාක්ෂි පාර්ථිවඃ කොපි ගීයතෙ
සනාතනශ්ච නෛවාසෞ රාජා නාපි සනාතනඃ.

---

114 නාසික්‍යමධ්‍යා, නාසිකාස්ථානවර්ණයක්හු මධ්‍යකොට ඇති; පරිතඃ, ආද්‍යන්තයෙන්; චතුර්වර්ණවිභූෂිතාඃ, සතරවර්ණකෙනෙකුන් විසින් ගොබවනලද්දාවූ; කාචිත් පුරී, කිසිපුරියෙක්; අස්ති, ඇත; යස්‍යාම්, ඒ පුරියෙහි; අෂ්ටවර්ණාහ්වයාඃ, අෂ්ටවර්ණකෙනෙකුන් සංඥාකොට ඇති; නෘපාඃ, රජදරුවෝ ඇත්තාහුයි.

මෙහි කාඤ්චී පුරිය එහි රජදරුවෝ පල්ලවයෝය යනු පරමාර්ථය; එහෙයින් චතුරාදිසංඛ්‍යාව ආදිකොට ගතයුතුකල්හි විවක්ෂිතාර්ථව්‍යාමොහයට වනහෙයින් මෝතොමෝ **සංඛ්‍යා** නම් වන්නීයි.

115 වෘද්ධෙ!, ලක්ෂ්මිය!; නොහොත් වෘද්ධාඞ්ගණාව!; ස්ඛලන්ත්‍යා, දෞර්ගීත්‍යොපහත රාගවෙෂය හෙතුකොටගෙන ව්‍යාකුලවූ; ගිරා, තෙප්ලෙන්ද; නම්‍රේණ, රසනයෙන් නොහොත් රාගවෙෂයෙන් නැමුණු; ශිරසා, හිසින්ද; දීනයා, සතුටු නැති; එහෙයින් නොහොත් අභිමත රාගවිෂයාගේ අසිද්ධියෙන් බාහ්‍යවූ; දෘශා, ඇසින් උපලක්ෂිතව; තිෂ්ඨන්තම්, සිටිනාවූ; සොත්කම්පමපි මාං, උත්කම්පා සහිතවූ මට නොහොත් කරුණාස්පදවූ මට; කිනනානුකම්පසෙ, කුමක්පිණිස අනුග්‍රහ නොකෙරෙහිද?

මෙහි එක්තරා දරිද්‍රයෙක් ලක්ෂ්මියට ආක්‍රොශ කෙරෙයි යනු කවිහු විසින් විවක්ෂිතාර්ථය; එක්තරා කාමුකයෙක් වෘද්ධාඞ්ගණාවක බෙණෙයි යන අනික් අර්ථයකුදු වැටහෙනහෙයින් මේ ප්‍රහෙලිකා තොමෝ **පරිකල්පිතා** නම් වන්නීයි.

